


# වාර්ෂික වාර්තාව 2024

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# අපගේ දැක්ම

කොළඹ වරාය දකුණු ආසියාවේ ප්‍රමුඛතම හරිත සමුද්‍රීය හා සේවා සැපයුම් කේන්ද්‍රීය වරාය බවට පත් කරමින් ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම වරාය 15 අතර ශ්‍රේණිගතවීම.

# අපගේ මෙහෙවර

නවෝත්පාදනය, තිරසරභාවය හා පාරිභෝගික කේන්ද්‍රීය කාර්යක්ෂමතාවයට ප්‍රමුඛතාවය ලබා දෙමින් ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා අඛණ්ඩව වර්ධනය කරගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට හා සෞභාග්‍යයට දායකවීම පිණිස තරඟකාරී වරාය පහසුකම් හා සේවා සැපයීම වෙනුවෙන් කැපවීම.

## පටුන


| | |
|---|---|
| අපගේ ආයතනික අරමුණු | 3 |
| අපගේ ආයතනික ක්‍රමෝපායයන් | 4 |
| හර වටිනාකම් - මාර්ගෝපදේශ ප්‍රතිපත්ති | 6 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය යනු | 8 |
| මෙහෙයුම් වැදගත් තොරතුරු | 9 |
| මූල්‍ය වැදගත් තොරතුරු | 12 |
| අපේ අමාත්‍යවරු | 13 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 14 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 22 |
| කළමනාකාරීත්ව කමිටුව | 28 |
| ව්‍යාපාර සංවර්ධන | 30 |
| සංවර්ධන ව්‍යාපෘති | 32 |
| මෙහෙයුම් සමාලෝචනය | 42 |
| මූල්‍ය සමාලෝචනය | 72 |
| මානව ප්‍රාග්ධනය | 77 |
| ආයතනික පාලන වාර්තාව | 78 |
| වැදගත් සංඛ්‍යාන | 80 |
| වරාය සංඛ්‍යාලේඛන | 87 |
| **මූල්‍ය සමාලෝචනය** | 91 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 92 |
| මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 94 |
| විගණන කමිටු වාර්තාව | 95 |
| ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය | 100 |
| වැදගත් මෙහෙයුම් කරුණු | 101 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 102 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 103 |
| ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය | 104 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 106 |
| පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති | 107 |
| මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන් | 128 |
| ප්‍රස්ථාරික සමාලෝචනය | 157 |
| විගණකාධිපති වාර්තාව | 159 |
| ආයතනික තොරතුරු | 175 |

# අපගේ ආයතනික අරමුණු

**අරමුණ 1:**

කොළඹ වරාය දකුණු ආසියානු කලාපයෙන් ඔබ්බෙහි ඇති වඩාත්ම ප්‍රශස්ත වූ හා තරඟකාරීත්වයෙන් යුත් කේන්ද්‍රීය වරාය ලෙස පුළුල් කිරීම.

**අරමුණ 2:**

අනාගත ඉල්ලුම් සපුරාලීමට හැකිවන පරිදි ජාත්‍යන්තර මට්ටමේ වරායක් ගොඩනැගීම සඳහා පොදුකාර්ය හා උපරි ව්‍යුහ සංවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා නඩත්තු කර පවත්වාගෙන යාම.

**අරමුණ 3:**

තාක්ෂණික අනුකලනය හා ඩිජිටල්කරණය වැඩි දියුණු කර එමඟින් වරායේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා පාරිභෝගික අපේක්ෂාවන් උපරිම වශයෙන් සපුරාලීම සඳහා නවීන තාක්ෂණික නවෝත්පාදන ක්‍රමෝපායන් අනුගමනය කිරීම.

**අරමුණ 4:**

ඵලදායීතාවය, සේවාවල ගුණාත්මකභාවය හා ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා නවෝත්පාදනය පදනම් වූ ධනාත්මක ආයතනික සංස්කෘතියක් තුළ නිපුණතාවයෙන් යුත් අභිප්‍රේරිත, සේවයට කැපවූ විවිධත්වයෙන් යුක්ත වූ ශ්‍රම බලකායක් සේවයේ යෙදවීම.

**අරමුණ 5:**

පාරිසරික තිරසරභාවය පවත්වාගෙන යමින් පරිසර හිතකාමී මනා පරිචයන් අනුගමනය කරමින් හරිත වරාය සංකල්පය මුදුන්පත් කර ගැනීමට කටයුතු කිරීම.

**අරමුණ 6:**

ආදායම් උත්පාදනය උපරිම මට්ටමින් පවත්වාගෙන යමින්, විචක්ෂණ මූල්‍ය හා පිරිවැය කළමනාකරණය තුළින් මූල්‍ය ස්ථායීතාවය හා තිරසරභාවය පවත්වාගෙනයාම සහතික කර එමඟින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛ දායකයෙකු වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීම.

**අරමුණ 7:**

ආයතනික පාලන කාර්ය රාමුව, ප්‍රතිපත්ති, විධික්‍රම සහ ක්‍රියාපටිපාටි වැඩි දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**අරමුණ 8:**

වරාය හා නාවික ක්ෂේත්‍රය හා සම්බන්ධ සේවාවන්/කාර්යයන් වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වරායයන් බහුවිධ සේවා සපයන වරායයන් ලෙස සංවර්ධනය කිරීම හා කලාපීය සංවර්ධනයට දායක වීම සඳහා ආදායම ඉහළ නැංවීම පිණිස නව ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම.

# අපගේ ආයතනික ක්‍රමෝපායයන්

අපගේ ආයතනික අරමුණු සහ කෙටිකාලීන හා දිගුකාලීන අරමුණු වෙත ළඟාවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් සමඟ ආයතනික, කොට්ඨාශීය හා කාර්යබද්ධ ක්‍රමෝපායයන් නිර්මාණය කර ඇත.

සමස්ත ආයතනික කාර්යයන් ආවරණය වන පරිදි සකස් කර ඇති මෙම ආයතනික ක්‍රමෝපායයන් පහත දක්වා ඇත.

**අළෙවි විනිවිද ක්‍රමෝපාය**

අළෙවි විනිවිද ක්‍රමෝපාය මගින් සංවර්ධන, මෙහෙයුම් හා අළෙවි කටයුතු පිළිබඳව තවදුරටත් අවධානය යොමු කිරීම තුළින් වත්මන් වෙළෙඳපොළෙහි පවතින වරාය සේවාවන් සඳහා පවතින වෙළෙඳ පොළ කොටස වැඩි කර ගැනීම අපේක්ෂා කෙරේ.

මෙම ක්‍රමෝපාය අනෙකුත් ක්‍රමෝපායන් සමඟ සහසම්බන්ධිතව යොදා ගනු ලැබේ.

දැනට ලබාදෙන සේවා සමඟ තරඟ කිරීමට නම්, වෙළෙඳපොළ විනිවිද ක්‍රමෝපාය යනු ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන ප්‍රබල ක්‍රමෝපායයන්ගෙන් එකකි.

**මෙම ක්‍රමෝපාය තුළ පහත දැක්වෙන කරුණු අන්තර්ගතවී ඇත:**

- ප්‍රතිඅපනයන කේන්ද්‍රීය ක්‍රමෝපාය
- සේවා සැපයුම් කේන්ද්‍රීය ක්‍රමෝපාය / Gateway Cargo වැඩි දියුණු කිරීම/ වටිනාකම වැඩි කිරීම
- හරිත හා තිරසර වරාය ක්‍රමෝපාය

**නිෂ්පාදන/ සේවා සංවර්ධන ක්‍රමෝපාය**

මෙය වත්මන් නිෂ්පාදන හෝ සේවා වැඩි දියුණු කිරීම මගින් හෝ නවීකරණය කිරීම මගින් ආදායම වැඩි කර ගැනීමට අපේක්ෂා කරන ක්‍රමෝපායයකි. මෙම ක්‍රමෝපාය සඳහා සම්පත් විශාල ප්‍රමාණයක් හා සංවර්ධන වියදමක් අවශ්‍ය කෙරේ. පහත සඳහන් කරුණු හේතුකොටගෙන මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඵලදායී ක්‍රමෝපායක් වනු ඇත.

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ පවතින වත්මන් නිෂ්පාදන හා සේවා සම්බන්ධයෙන් පවතින ධනාත්මක අත්දැකීම්වල ප්‍රතිඵලයක් වශයෙන් නව (වැඩි දියුණු කළ) නිෂ්පාදන හා නව සේවාවන් ලබා ගැනීම සඳහා තෘප්තිමත් පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම.

- තරඟකාරී ගාස්තු යටතේ වඩාත් හොඳ, ගුණාත්මකභාවයෙන් යුත් නිෂ්පාදන හා සේවා ලබා දීම.

- කඩිනමින් වර්ධනයක් වන ක්ෂේත්‍රයක් තුළ තරඟකාරී සේවයක් ලබා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකි වීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව ක්‍රියාකාරී පර්යේෂණ හා සංවර්ධන හැකියාවන් පැවතීම.

- මෙම ක්‍රමෝපාය ජාතික ආර්ථික වර්ධන ක්‍රමෝපායට අනුගතව කටයුතු කිරීම.

**ආශ්‍රිත විවිධාංගීකරණ ක්‍රමෝපාය**

තම සම්පත් භාවිතයට ගෙන පවත්නා වටිනාකම් ජාල තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තම මෙහෙයුම් වත්මන් වෙළෙඳපොළ හා සේවාවන් වලින් ඔබ්බට පුළුල් කරනු ඇත.

# අපගේ ආයතනික ක්‍රමෝපායයන්

- වටිනා විශේෂඥතාවය හා තාක්ෂණික ඥානය තරඟකාරීව පරිවර්තනයට ලක් කිරීම.
- කීර්තිමත් සන්නාමයෙන් උපරිම ඵල ලබා ගැනීම.
- තරඟකාරී වටිනාකමකින් යුත් ශ්‍රම සම්පතක් හා හැකියාවක් නිර්මාණය කිරීම සඳහා විවිධ ව්‍යාපාරික සහයෝගීතාවයක් පවත්වාගෙන යාම.
- නව විභව්‍ය වෙළෙඳපොළවල් සොයා ගැනීම.

**සහයෝගීතා ක්‍රමෝපාය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනත් ආයතන සමඟ ක්‍රියාකාරීව කටයුතු කිරීම තුළින් සමුද්‍රීය හා සේවා සැපයුම් ක්ෂේත්‍රය තුළ පවතින තරඟකාරී වාසිය අත්කර ගැනීමට සහයෝගීතා ක්‍රමෝපාය භාවිතා කරනු ඇත. සාමාන්‍ය සහයෝගීතා ක්‍රමෝපායන් පහත දැක්වෙන අයුරු වේ.

- **ක්‍රමෝපායික සන්ධානයන්:** මෙය අන්‍යෝන්‍ය ආර්ථික ලැබීම් සඳහා ව්‍යාපාරික කටයුතුවල නිරත ස්වාධීන සමාගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර එළඹෙන දිගුකාලීන සහයෝගීතා වැඩපිළිවෙළකි.

- **අන්‍යෝන්‍ය සේවා සුසංධානය:** නවීන තාක්ෂණය හා ඉදිකිරීම් වැනි තනිව අත්පත් කර ගැනීමට අපහසු ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ක්ෂේත්‍රයේ සමාගම් විසින් ඔවුන්ගේ සම්පත් දායකත්වය ලබා දෙන හවුල්කාරීත්වයකි.

- **රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය:** මෙය සහයෝගීතා ව්‍යාපාරයකි. මෙය ක්‍රමෝපායික අරමුණු උදෙසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිර්මාණය කරනු ලබන වෙනත් ආයතනයක් වන අතර එක් එක් සාමාජික ආයතනය වෙත අයිතිය, මෙහෙයුම් වගකීම්, මූල්‍ය අවධානම් සහ ප්‍රදානයන් ලබා දෙන අතරම ඔවුන්ගේ අනන්‍යතාවය හා ස්වාධීනත්වයත් පවත්වාගෙන යනු ඇත.

**බාහිර පාර්ශ්වයන්ගෙන් සේවා ලබා ගැනීමේ ක්‍රමෝපායන්**

පාර්ශ්ව දෙකක් අතර බාහිරින් සේවා ලබා ගැනීම සඳහා ඇති කරගනු ලබන ගිවිසුමකි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, පවත්නා අභ්‍යන්තර කාර්යයන් සඳහා වෙනත් සමාගමක් හෝ පුද්ගලයෙකුගේ සේවය ලබා ගනු ඇත. එම කාර්යයන් සාමාන්‍ය වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් මගින් ඉටු කෙරෙන හෝ පූර්වයෙන් ඉටු කරන ලද ව්‍යාපාර ක්‍රියාවලීන් සහ මෙහෙයුම් හෝ මූලික නොවන කාර්යයන්ට අයත් වනු ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය පහත දැක්වෙන හේතූන් සඳහා බාහිර පාර්ශ්වයන්ගෙන් සේවා ලබා ගැනීම තෝරා ගනු ඇත.

- පිරිවැය ඵලදායී වීම.
- කේන්ද්‍රීය ව්‍යාපාර පිළිබඳව අවධානය යොමු කිරීමට හැකිවීම.
- පාරිභෝගිකයිනට වඩා හොඳ සේවා සැපයීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකියාව ලැබීම.
- කාලානුරූපී කාර්යයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සඳහා කාලය කළමනාකරණය කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකිවීම.

# හර වටිනාකම් - මාර්ගෝපදේශ ප්‍රතිපත්ති

හර වටිනාකම - මාර්ගෝපදේශ ප්‍රතිපත්තිය මගින් ආයතනයේ දිශානතිය හැඩගස්වන අතර විශිෂ්ටත්වයෙන්, කාර්යක්ෂමතාවයෙන් හා තිරසරබවින් යුත් සංස්කෘතියක් අභිවර්ධනය කෙරෙනු ඇත.

## 1. පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශය

පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවයන් ඔවුන් විසින් අපේක්ෂා කරනු ලබන සීමාවන් ඉක්මවන, ජාත්‍යන්තර මට්ටමේ වරාය සේවා සැපයීමට ප්‍රමුඛතාවය ලබාදෙමින් කටයුතු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රයත්න දරනු ඇත. පාරිභෝගික තෘප්තිමත්භාවය, ප්‍රතිචාරාත්මකභාවය හා විශ්වසනීයත්වය සියළුම මෙහෙයුම්වල ප්‍රමුඛස්ථානය ගනු ඇත.

## 2. අවංකභාවය හා පාරදෘශ්‍යතාවය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි සියළුම ගනුදෙනුවලදී අවංකභාවය, සත්‍යවාදීභාවය හා පාරදෘශ්‍යතාවය උපරිම මට්ටමින් පවත්වාගෙන යනු ඇත. චර්යාත්මක හැසිරීම් රටාව හා වගකීම් සහිත තීරණ ගැනීම ආයතනයේ පාර්ශ්වීය අන්තර් කාර්යයන්හි අත්තිවාරම වනු ඇත.

## 3. ආරක්ෂාවට මුල්තැන

සියළුම වරාය මෙහෙයුම්වලදී ආරක්ෂාවට මුල්තැන ලබා දීම ඉහළම ප්‍රමුඛතාවයක් වනු ඇත. සේවකයින්, පාරිභෝගිකයින් හා පරිසරය ආරක්ෂාවන පරිදි දැඩි ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරනු ඇත.

## 4. නව්‍යතාවය හා අඛණ්ඩ දියුණුව

නව තාක්ෂණ හා මනා පරිචයන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට සේවකයින් දිරිමත් කෙරෙන නව්‍ය සංස්කෘතියක් අභිවර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරනු ඇත. අඛණ්ඩ දියුණුව තුළින් ආයතනය තුළ කාර්යක්ෂතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවෙනු ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභිවෘද්ධිය සඳහා වන නව්‍ය අදහස් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් තිළිණ ප්‍රදානය කෙරෙනු ඇත.

## 5. පාරිසරික භාරකාරීත්වය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය තිරසරභාවයෙන් හා පරිසර සංරක්ෂණය සඳහා කැපවීමෙන් කටයුතු කරනු ඇත. වරාය මෙහෙයුම් වලදී එහි පාරිසරික බලපෑම අවම කර පරිසර හිතකාමී පියවර ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

## 6. සහයෝගීතාවය හා හවුල්කාරීත්වය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, රජයේ නියෝජිතආයතන, පෞද්ගලික අංශයේ ආයතන සහ ජාත්‍යන්තර ආයතන ඇතුළු විවිධ පාර්ශ්වීය ආයතන සමඟ සහයෝගීතාවය ඇතිකර ගැනීමට ක්‍රියාකාරීව අපේක්ෂා කර සිටී. ශක්තිමත් හවුල්කාරීත්වයන් ගොඩනැගීම තුළින් වරායේ තරඟකාරීත්වය වැඩිදියුණු වන අතර ආයෝජන ආකර්ෂණය වනු ඇත.

### 7. ශ්‍රම බලකා සංවර්ධනය හා බලගැන්වීම්

සේවකයින්ගේ කාර්යභාරය හා වගකීම සම්බන්ධයෙන් විශිෂ්ටත්වය ප්‍රදර්ශනය කිරීමට ඔවුනට හැකිවන පරිදි, ආකල්ප, කුසලතා හා දැනුමින් බලගන්වමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සේවකයින්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා ආයෝජනය කර ඔවුන්ගේ යහපත හා විවිධත්වය ඇගයීමට ලක්කර ප්‍රවර්ධනය කිරීමට කටයුතු කෙරේ.

### 8. සමාජ වගකීම

සමාජ සංවර්ධන කටයුතු වලදී ප්‍රජා සහයෝගීතාවය ලබා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය බැඳී සිටින අතර, ප්‍රාදේශීය ජනතාවට ප්‍රතිලාභ සැලසෙන ව්‍යාපෘතිවල ක්‍රියාකාරීව කටයුතු කරමින් ඔවුන්ගේ යහපත උදෙසා කටයුතු කරනු ඇත.

### 9. මූල්‍ය විචක්ෂණය හා ක්‍රමෝපායික ආයෝජන

මූල්‍ය විචක්ෂණය හා මූල්‍ය ස්ථායීතාවය සහතික වන පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි වත්කම් වගකීමෙන් යුතුව කළමනාකරණය කරන අතර එහි ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණය අධිකාරියේ දිගුකාලීන තිරසරභාවයට හා වර්ධනයට උපකාරී වනු ඇත.

# ශ්‍රී ලංකා වරාය අධිකාරිය යනු

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් 1979 අගෝස්තු 01 වන දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවන ලද අතර 1984 අංක 7 සහ 35 දරණ පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 6 (1) වගන්තියෙන් එහි අරමුණු සහ කාර්යයන් පහත සඳහන් පරිදි නිර්වචනය කර ඇත.

- නැව් භාණ්ඩ වාහක, නැව්ගත කිරීම් සහ ප්‍රතිනැව්ගත කිරීම්, ගොඩබෑම් හා ගුදම්ගත කිරීම්, වාප්පු කටයුතු, නෞකා වලට ජලය, ඉන්ධන සහ විදුලිය සැපයීම, නෞකා වලට හා නෞකා වලින් ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදන සහ ලිහිසි තෙල් මෙහෙයුම් කිරීම බන්කර් සහ ඉන්ධන ගබඩා අතර කාර්යයන්, නියමු කටයුතු සහ නෞකා බැඳතැබීමේ කටයුතු, කිමිදුම් සහ නෞකා දිය යටදී අළුත්වැඩියා කිරීම හා එවැනි වෙනත් අනුශාංගික වූ ඕනෑම කාර්යයක් සඳහා කාර්යක්ෂම හා විධිමත් සේවා සැපයීම.

- සැසඳුම් හා ආරක්ෂක සේවා කාර්යක්ෂමව හා නිත්‍ය ලෙස සැපයීම.

- වරාය සීමාව තුළ හා වරාය ප්‍රවේශ මාර්ගයන්හි නැව් ගමනාගමනය විධිමත් කිරීම හා පාලනය කිරීම.

- වරාය ගොඩනැගිලි නඩත්තු කිරීම හා ඒවා හි භාවිතය ප්‍රවර්ධනය කිරීම, වරායයන් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම.

- කිසියම් නියමිත වරායක් තුළ රේගු දෙපාර්තමේන්තුවට අදාල කාර්යයන් හැර අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම.

- ඒ ඒ වරායන් තුළට හා ඉන් පිටතට යාත්‍රාකිරීම සඳහා නෞකාවලට මඟ පෙන්වීම හා ආරක්ෂාව සැපයීම සඳහා අවශ්‍ය ප්‍රදීපාගාර හා වෙනත් මාධ්‍යයන් ශ්‍රී ලංකා වෙරළෙහි හා ඉන් ඔබ්බෙහි ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.

- වරාය අධිකාරිය පනත මගින් පනවනු ලබන වෙනත් ඒ හා සමාන කාර්යයන් ඉටුකිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම් ප්‍රතිසම්පාදනය කිරීමටත්, නව ආයෝජන වල යෙදවීමටත්, අධිකාරියේ වියදමට නොඅඩු ආදායමක් ලැබෙන පරිදි වරාය අධිකාරිය පනතේ විධිවිධාන වලට අනුකූලව අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් සුදුසු පරිදි ගාස්තු අයකර ඒවා අධිකාරියේ ආදායමට බැර කර ප්‍රමාණවත් පොදු මූල්‍ය සංචිතයක් ඇති කර පවත්වාගෙන යාමට හැකිවන ආකාරයෙන් වරාය අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සහ;

- වරාය අධිකාරිය පනතෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සියළු විශේෂිත වරායන් බාහිර ආධාර අපේක්ෂාවෙන් තොරව, ඒ ඒ වරාය විසින්ම ස්වකීය ව්‍යවසාය ලෙස පවත්වාගෙන යාමට ප්‍රයන්ත දැරීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 5 (1) වගන්තිය ප්‍රකාරව, වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකුගෙන් සමන්විත වේ.

සභාපතිවරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර එහි සමස්ත පරිපාලනය ඔහු භාරයේ පවතී.

# මෙහෙයුම් වැදගත් තොරතුරු

**නෞකා පැමිණීම (සියළුම වරායයන්)**

| විස්තරය | 2023 | 2024 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 4,237 | 3,968 | -6.3 |
| ගාල්ල වරාය | 23 | 6 | -73.9 |
| ත්‍රිකුණාමල වරාය | 102 | 116 | 13.7 |
| කන්කසන්තුරය, මයිලඩි, පේදුරු තුඩුව හා කරෛනගර් | 14 | 43 | - |
| හම්බන්තොට වරාය | 447 | 472 | 5.6 |
| **එකතුව** | **4,823** | **4,605** | **-4.5** |

**කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය (විස්සේ සම ඒකක)**

| විස්තරය | 2023 | 2024 | වෙනස (%) |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA)** | | | |
| ආනයන | 115,864 | 154,472 | 33.3 |
| අපනයන | 92,519 | 130,732 | 41.3 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,729,272 | 2,042,577 | 18.1 |
| තැන් මාරු මෙහෙයුම් | 27,476 | 85,381 | 210.7 |
| **එකතුව** | **1,965,131** | **2,413,162** | **22.8** |
| **සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT)** | | | |
| ආනයන | 96,574 | 113,332 | 17.4 |
| අපනයන | 96,518 | 115,959 | 20.1 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,528,824 | 1,757,097 | 14.9 |
| තැන් මාරු මෙහෙයුම් | 41,947 | 39,452 | -5.9 |
| **එකතුව** | **1,763,863** | **2,025,840** | **14.9** |
| **කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT)** | | | |
| ආනයන | 282,666 | 322,122 | 14.0 |
| අපනයන | 305,865 | 332,638 | 8.8 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 2,496,151 | 2,515,521 | 0.8 |
| තැන් මාරු මෙහෙයුම් | 136,236 | 182,786 | 34.2 |
| **එකතුව** | **3,220,918** | **3,353,067** | **4.1** |
| **කොළඹ වරාය** | | | |
| ආනයන | 495,101 | 589,926 | 19.2 |
| අපනයන | 494,905 | 579,329 | 17.1 |
| ප්‍රතිනැව්ගත කිරීම් | 5,754,247 | 6,315,195 | 9.7 |
| තැන් මාරු මෙහෙයුම් | 205,659 | 307,619 | 49.6 |
| **එකතුව** | **6,949,912** | **7,792,069** | **12.1** |

# මෙහෙයුම් වැදගත් තොරතුරු

**නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය (සියළුම වරායයන්)**

| විස්තරය | 2023 | 2024 | වෙනස(%) |
|---|---|---|---|
| සමස්ත නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය (මෙ.ටො. මිලියන) | **103.8** | **120.2** | **15.8** |

**කොළඹ වරායේ නැව්බඩු ගොඩබෑම - ශ්‍රී.ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2023 | 2024 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 14,977 | 19,262 | 28.6 |
| තොග කඩන | 198 | 584 | 195.2 |
| වියළි තොග | 1,180 | 1,474 | 24.9 |
| දියර තොග | 4,489 | 4,591 | 2.3 |
| **එකතුව** | **20,844** | **25,911** | **24.3** |

**කොළඹ වරායේ නැව්බඩු පැටවුම් - ශ්‍රී ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2023 | 2024 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 13,010 | 17,226 | 32.4 |
| තොග කඩන | 5 | 10 | 117.5 |
| වියළි තොග | 4 | 0 | - |
| දියර තොග | 396 | 711 | 79.7 |
| **එකතුව** | **13,415** | **17,947** | **33.8** |

**කොළඹ වරායෙන් මෙහෙයවූ සමස්ත නැව්බඩු ප්‍රමාණය - ශ්‍රී ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)**

| විස්තරය | 2023 | 2024 | වෙනස(%) |
|---|---|---|---|
| බහළුගත | 27,987 | 36,488 | 30.4 |
| තොග කඩන | 202 | 594 | 193.4 |
| වියළි තොග | 1,183 | 1,474 | 24.5 |
| දියර තොග | 4,885 | 5,302 | 8.5 |
| **එකතුව** | **34,257** | **43,858** | **28.0** |

# මෙහෙයුම් වැදගත් තොරතුරු

ත්‍රිකුණාමලය වරායෙන් මෙහෙයවූ නැව්බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයන්)

| විස්තරය | 2023 | 2024 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 1,891 | 2,397 | 26.8 |
| පැටවීම් | 122 | 215 | 75.9 |
| **එකතුව** | **2,013** | **2,613** | **29.8** |

ගාල්ල වරායෙන් මෙහෙයවූ නැව්බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයන්)

| විස්තරය | 2022 | 2023 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 1 | 0.2 | --65.7 |
| පැටවීම් | 0 | 0.2 | - |
| **එකතුව** | **1** | **0.4** | **-54.8** |

හම්බන්තොට වරායෙන් මෙහෙයවූ නැව් බඩු ප්‍රමාණය - ( ටොන් දහසේ ප්‍රමාණයන්)

| විස්තරය | 2023 | 2024 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 1,303.62 | 1,990.43 | 52.7 |
| පැටවීම් | 802.12 | 1,041.72 | 29.9 |
| **එකතුව** | **2,105.74** | **3,032.15** | **44.0** |

සමස්ත සේවක සංඛ්‍යාව

| විස්තරය | 2023 | 2024 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 7,433 | 7,042 | -5.3 |
| ත්‍රිකුණාමල වරාය | 341 | 327 | -4.1 |
| ගාල්ල වරාය | 276 | 255 | -7.6 |
| **එකතුව** | **8,050** | **7,624** | **-5.3** |

## මූල්‍ය වැදගත් තොරතුරු

| සියළුම වරායයන් | | (රු. මිලියන) | |
|---|---|---|---|
| **විස්තරය** | **2024** | **2023** | **වෙනස (%)** |
| **ආදායම සහ වියදම** | | | |
| සමස්ත ආදායම | 103,179.3 | 93,635.3 | 10.2 |
| වියදම | (52,209.0) | (47,753.0) | (9.3) |
| **විදේශ ණය මත පොලී සහ විදේශ විනිමය (පාඩු) / ලැබීම් වලට පෙර ලාභ/(පාඩු)** | **50,970.3** | **45,882.3** | **11.1** |
| විදේශ ණය මත පොලිය | (3,546.2) | (4,217.9) | 15.9 |
| විදේශ විනිමය (පාඩු) / ලැබීම් | (689.6) | (1,305.2) | 47.2 |
| **බදු වලට පෙර සහ විදේශ විනිමය (පාඩු)/ලැබීම් වලට පසු ලාභ/(පාඩු)** | **46,734.4** | **40,359.2** | **15.8** |
| **බදු** | | | |
| ආදායම් බදු | (7,097.6) | (5,564.7) | (27.5) |
| විලම්භිත බදු | (783.2) | (6,180.8) | 87.3 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | (607.3) | (8,673.7) | 93.0 |
| **බදු සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු ශුද්ධ ලාභ/(පාඩු)** | **38,246.3** | **19,940.1** | **91.8** |
| **ශේෂ පත්‍රය** | | | |
| ජංගම නොවන වත්කම් | 650,517.9 | 611,653.5 | 6.4 |
| ජංගම වත්කම් | 113,650.4 | 127,777.7 | (11.1) |
| ජංගම වගකීම් | 29,205.2 | 34,029.3 | 14.2 |
| ස්කන්ධ සහ වෙනත් ප්‍රාග්ධන | 7,591.4 | 7,591.4 | - |
| සංචිත හා ප්‍රතිපාදන | 611,194.8 | 574,339.9 | 6.4 |
| ජංගම නොවන වගකීම් | 116,177.0 | 123,470.7 | 5.9 |
| **අනුපාත** | | | |
| ආදායමට මෙහෙයුම් ලාභ (%) | 47.1 | 43.4 | |
| වාර්ෂික ආදායම් වර්ධනය (%) | 10.2 | (5.8) | |
| ප්‍රාග්ධන යෙදවුම් මත ප්‍රතිලාභ (%) | 7.4 | 6.2 | |

# ගරු බිමල් රත්නායක
## ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය

**සහ**

# ඉංජිනේරු ජනිත් රුවන් කොඩිතුවක්කු
## වරාය හා සිවිල් ගුවන්සේවා නියෝජ්‍ය අමාත්‍ය

# සභාපතිතුමාගේ සමාලෝචනය

ගෝලීය සමුද්‍රීය කර්මාන්තයේ අඛණ්ඩව විකාශනය වෙමින් පැවති අතිශය වැදගත්කමින් යුත් 2024 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම භාග්‍යයක් ලෙස සලකමි.

2024 වර්ෂයේදී බහළුගත නැව් භාණ්ඩ කර්මාන්තයේ ප්‍රත්‍යස්ථිතික පාලනයක් සහිතව ගෝලීය සමුද්‍රීය කර්මාන්තයේ 2% ක තිර වර්ධනයක් පෙන්නුම් කෙරින. භූ-දේශපාලනමය අවිනිශ්චිතතාවයන් හා වර්ධනය වෙමින් පැවති පාරිසරික ගැටළු ඇතුළු සාර්ව ආර්ථික අභියෝග සමඟ මෙම වසර ගෙවුනු අතර මෙම සියළු කරුණු ගෝලීය ආර්ථික කාර්ය රාමුව නැවත හැඩගැන්වීමට දායක වී ඇත.

කොළඹ වරාය හා ඉන්දියාවේ ප්‍රධාන වරායයන් අතර ප්‍රතිනැව්ගත භාණ්ඩ විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම සහ ඉන්දියාවේ සිට පැමිණෙන ප්‍රතිනැව්ගත මෙහෙයුම් විශාල වශයෙන් ඉහළ යෑම හේතුවෙන් කොළඹ වරායට අඛණ්ඩව ප්‍රතිලාභ ලැබෙමින් පවතී. එක්සත් ජනපද ඩොලර් බිලියන 60 ක වැඩසටහනක් වන “සාගර්මාලා” වැනි පියවරයන් මගින් ශක්තිමත් වූ ඉන්දියානු සමුද්‍රීය දැක්ම තුළින් කලාපීය යටිතල පහසුකම් ශක්තිමත් කර වෙළෙඳ අවස්ථා වර්ධනය වනු ඇත. 2024 වසර තුළ ඉන්දියානු වරාය ක්ෂේත්‍රය නැව් භාණ්ඩ මෙහෙයුම් ධාරිතාවයේ 3.7% ක වර්ධනයක් අත් කර ගෙන ඇත. ප්‍රධාන ඉන්දියානු වරායයන් සහ බංගලාදේශය, මාලදිවයින හා පකිස්තානය වැනි අසල්වාසී රටවල්වල වරායයන් සමඟ පවතින සමීපතාවය භාවිතා කරමින්, ඉන්දියාවේ පුළුල් වෙමින් පවතින සමුද්‍රීය යටිතල පහසුකම් සමඟ සමගාමීව ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොළඹ වරාය සංවර්ධනය කරමින් සිටී. මෙම ක්‍රමෝපායික ස්ථානගත කිරීම තුළින් ප්‍රධාන ප්‍රතිනැව්ගත කිරීම් කේන්ද්‍රස්ථානයක් ලෙස කොළඹ වරායේ කාර්යභාරය වර්ධනය කිරීමට හා ගෝලීය සැපයුම් දාම තුළ කොළඹ වරායේ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම අරමුණු කරනු ලැබේ.

මෙයට සමගාමීව, චීනය ගෝලීය සමුද්‍රීය කර්මාන්තයේ බලවත් රටක් බවට පත් වී ඇත. දළ දේශීය නිෂ්පාදනයේ 5.5% ක වර්ධනයක් සහිතව එරටෙහි 2024 වසරේ ආර්ථික කාර්යසාධනය මගින් ගෝලීය නාවික ප්‍රවාහනයට දැඩි බලපෑමක් එල්ල වීම අඛණ්ඩව සිදුවෙමින් පවතී.

වෙනස් වන වෙළෙඳ ප්‍රතිපත්ති මගින් හඳුන්වාදෙනු ලැබූ අස්ථාවරතාවය හමුවේ වුවද, ඇමෙරිකානු එක්සත් ජනපදය ගෝලීය ආර්ථික හා සමුද්‍රීය පාරිසරික පද්ධතිය තුළ ප්‍රධාන ස්ථානයක් පවත්වාගෙන යමින් සිටී. 2024 වර්ෂයේ ඇ.එ.ජ. ඩොලර් ට්‍රිලියන 27.7 ක දළ දේශීය නිෂ්පාදනයක් සහිතව ඇමෙරිකානු එක්සත් ජනපද ආර්ථිකය තොග හා බහළුගත යන අංශ දෙකෙහිම වෙළෙඳාම තුළ ප්‍රධාන මෙහෙයුම්කරු බවට පත්වීමට අඛණ්ඩව කටයුතු කරයි.

අප්‍රිකාවේ, අග්නිදිග ආසියාවේ හා මැද පෙරදිග කලාපයේ නැගී එන වෙළෙඳපොළ මගින් ගෝලීය සමුද්‍රීය කේෂ්ත්‍රය විශාල වශයෙන් හැඩගැන්වෙමින් සිටී. කෙන්යාව, නයිජීරියාව සහ ඊජිප්තුව ඇතුළු අප්‍රිකාවේ වරාය යටිතල පහසුකම් සීඝ්‍රයෙන් පුළුල් වෙමින් පවතින අතර, 2026 වසර වන විට වෙළෙඳ ධාරිතාවය 4.5% කින් වර්ධනය වීමට අපේක්ෂා කරනු ලැබේ. පුළුල් වන නිෂ්පාදනයෙන් හා දියුණුවෙමින් පවතින මධ්‍යම පන්තිය තුළින් අග්නිදිග ආසියාවට ප්‍රතිලාභ ලැබෙන අතර ක්‍රමෝපායික ආයෝජන මගින් සවිමත් වූ මැද පෙරදිග කේන්ද්‍රීය වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස සිය තත්ත්වය තහවුරු කරගනිමින් සිටී. බාබ්-එල්-මැන්ඩෙබ් සමුද්‍ර සන්ධියේ භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන් සහ විශේෂයෙන්ම රතු මුහුද හා නැගෙනහිර අප්‍රිකාවේ ප්‍රධාන නාවික මාර්ගවල අවහිරතා ඇති වීම හේතුකොටගෙන ගෝලීය සමුද්‍රීය ක්ෂේත්‍රය දැඩි අවදානමකට මුහුණ පා සිටී. මෙම අභියෝග හේතුකොටගෙන ගෝලීය වෙළෙඳාමේ නව හැඩගැස්මක් අභිමිවීම, රක්ෂණ වාරික ගෙවීම්වල ඉහළයාමක් ඇති වීම හා යුරෝපය, ආසියාව සහ මැද පෙරදිග රටවල් අතර සාම්ප්‍රදායික නැව් මාර්ග ප්‍රතිඇගයීමට ලක් වීම සිදුවෙමින් පවතී.

## සභාපතිතුමාගේ සමාලෝචනය

ඉදිරි වර්ෂ තුළදී, ගෝලීය සමුද්‍රීය කර්මාන්තයේ එහි වාර්ෂික වර්ධන ගම්‍යතාවය 2025 සිට 2029 දක්වා 2.4% ක වාර්ෂික ප්‍රසාරණ ප්‍රතිශතයක් පවත්වාගෙන යාමට අපේක්ෂා කරනු ලැබේ. අපේක්ෂිත 3.3% ක දළ දේශීය නිෂ්පාදනය හා ගෝලීය භාණ්ඩ වෙළෙඳාමේ 3% ක වර්ධනයේ සහායෙන් බහළුගත වෙළෙඳාම 2.7% ක් වැනි අඩු වේගයකින් වර්ධනය වෙමින් පවතී. මෙවැනි අස්ථාවරභාවයන් හා අභියෝග පැවතියද, අන්තර්ජාතික වෙළෙඳපොලවල් හරහා භාණ්ඩ හා සේවා සඳහා පවත්නා ඉල්ලුම හේතුකොටගෙන ගෝලීය සමුද්‍රීය ක්ෂේත්‍රය ධනාත්මක වර්ධන මාවතක ගමන් කිරීමට අපේක්ෂා කරන අතර, අන්තර් සම්බන්ධිත ගෝලීය ආර්ථිකය තුළ ක්ෂේත්‍රයේ වැදගත් කාර්යභාරය මෙමඟින් අවධාරණය කෙරේ.

ඉහළ යමින් පවතින මෙම ගතික ස්වභාවයනට ප්‍රතිචාර ලෙස, පුළුල් වෙමින් පවතින වෙළෙඳපොල අවස්ථා තුළින්, උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා කොළඹ වරාය සම්බන්ධ වී ඇති බව තහවුරු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැපවී සිටී. කලාපය තුළ පවතින වරාය හා යටිතල යටිතල පහසුකම් මගින් ගෝලීය සැපයුම් දාමය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය තවදුරටත් වර්ධනය කිරීම සඳහා උපායමාර්ගික අවස්ථා ලැබී ඇත. මෙහෙයුම් කාර්යක්ෂමතාවය, ධාරිතාවය පුළුල් කිරීම හා පුළුල් කලාපීය සේවා සැපයුම් ජාල වෙත කොළඹ වරායේ සේවා ඒකාබද්ධ කිරීම තුළින් අන්තර්ජාතික වෙළෙඳාම තුළ වර්ධනය වෙමින් පවතින ඉල්ලුම සපුරාලීමට හා ගෝලීය සමුද්‍රීය වෙළෙඳාමේ වැදගත් සබඳතාවයක් ලෙස ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අරමුණු කර සිටී.

**නව මිනුම් සලකුණක්**

2024 වර්ෂයේදී කොළඹ වරාය අතිවිශාල ජයග්‍රහණයක් අත් කර ගත් අතර, 2023 වසරේ මෙහෙයුම් කරන ලද බහළුම් විස්සේ සම ඒකක මිලියන 6.9 ට සාපේක්ෂව 12.1% ක වැඩි වීමක් පෙන්නුම් කරමින් බහළුම් විස්සේ සම ඒකක මිලියන 7.79 ක මෙහෙයුම් ධාරිතාවයක් වාර්තා විය. මෙම සුවිශේෂී වර්ධනය තුළින් දකුණු ආසියානු සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ වැදගත් කේන්ද්‍රස්ථානයක් වශයෙන් කොළඹ වරායේ කාර්යභාරය තවදුරටත් තහවුරු කෙරෙන අතර ජාත්‍යන්තර නැව් සමාගම් සඳහා වඩා යෝග්‍ය පිවිසුම් මාර්ගයක් ලෙස එහි වැදගත්කම තහවුරු වේ.

2024 වර්ෂයේදී බහළුම් විස්සේ සම ඒකක මිලියන 2.41 ක් මෙහෙයුම් කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත කැපී පෙනෙන ජයග්‍රහණයක් අත් කර ගන්නා ලදී. 2023 වර්ෂයේ බහළුම් විස්සේ සම ඒකක මිලියන 1.96 සිට වසරින් වසර ඇතිවූ මෙම 23% ක වර්ධනය මගින් කොළඹ වරායේ වඩාත් සීග්‍රයෙන් පුළුල් වන පර්යන්ත ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්ත බව සනාථ කර ඇත. නැව් භාණ්ඩ මෙහෙයුම් ධාරිතාවයේ මෙම කැපී පෙනෙන වර්ධනය තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා යටිතල පහසුකම් අඛණ්ඩව ශක්තිමත් කිරීම පෙන්නුම් කරන අතර මෙමඟින් ඉහළ ශක්‍යතාවයකින් යුතුව ගෝලීය වෙළෙඳාමේ වර්ධනය වෙමින් පවතින ධාරිතාවය කළමනාකරණය කිරීමට කොළඹ වරායට හැකි බව පෙන්නුම් කරයි.

එක් එක් පර්යන්ත අතර බහළුම් විස්සේ සම ඒකක මිලියන 3.35 ක් මෙහෙයුම් කරමින් කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් පර්යන්තය ප්‍රධාන මෙහෙයුම්කරු බවට පත්වී ඇත. මේ අතර, වරායේ සමස්ත කාර්යසාධනයට සුවිශාල දායකත්වයක් ලබා දෙමින් කලාපයේ සමුද්‍රීය යටිතල පහසුකම් සැපයීමේ කාර්යභාරය නැවත තහවුරු කරමින් සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් පර්යන්ත සමාගම විසින් බහළුම් විස්සේ සම ඒකක මිලියන 2.02 ක් මෙහෙයුම් කරන ලදී.

## සභාපතිතුමාගේ සමාලෝචනය

**වරාය සතු හැකියාවන් වැඩිදියුණු කිරීම**

මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, සබඳහා ශක්තිමත් කිරීම හා ජාතික වරාය ජාලය ශක්තිමත් කිරීම සඳහා 2025 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීමේ ජාත්‍යන්තර කාර්යභාරයක් සැලසුම් කර ඇත. කොළඹ වරායේ ජය බහළු පර්යන්ත V අංගණ ප්‍රදේශයේ වර්ග මීටර් 31,000 ක් ගල් අතුරා තාර දැමීම මෙම ප්‍රධාන ව්‍යාපෘති වලින් එකකි. රුපියල් මිලියන 895.8 ක ඇස්තමේන්තුගත මූල්‍ය වියදමකින් මෙම කාර්යය 2025 මාර්තු 01 දින ආරම්භ කිරීමට නියමිත අතර, අවසන් කිරීමට අපේක්ෂිත කාලසීමාව දින 365 කි. නියමිත කාලරාමුව තුළ ව්‍යාපෘතියෙන් 75% ක් අවසන් කිරීම ඉලක්කගත කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2025 වසර සඳහා රුපියල් මිලියන 750 ක් වෙන් කර ඇත.

සේරම් වංගුවේ සිට සේරම් ගේට්ටුව දක්වා දිවෙන මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව තවත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ කටයුතුද සිදු කෙරෙමින් පවතී. නිර්මාණ කටයුතු සිදු කෙරෙන අතරතුර ඉදිකිරීම් කටයුතු 2025 මැයි 25 දින ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර ඉලක්කගත අවසන් කිරීමේ දිනය 2025 දෙසැම්බර් මස වේ. ත්‍රිකුණාමල වරායේ ආරම්භ කිරීමට අපේක්ෂිත කාර්යයන්ට සහාය වීම සඳහා, රුපියල් මිලියන 550 ක මුදලක් අයවැය මගින් වෙන් කිරීමක් සමඟ 2025 ජූලි මස ආරම්භ කිරීමට නියමිත නව වරාය ප්‍රවේශ මාර්ගය හා ගේට්ටු ව්‍යුහය ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කර ඇත. වැඩි දියුණු කරන ලද ප්‍රවේශ පහසුකම් සහ වරාය තුළ මෙහෙයුම් අඛණ්ඩව සිදු කිරීම සඳහා 55% ක ව්‍යාපෘති ප්‍රගතියක් වසර අවසානයේදී අත්පත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම සංවර්ධන කටයුතුවල අනුපිළිවෙල අනුව, වරාය මෙහෙයුම් සඳහා උපකාරී වන වැඩහල් හා පහසුකම් ගොඩනැගිලි ඉදිකිරීම මගින් කොළඹ නැගෙනහිර ජාත්‍යන්තර පර්යන්තයේ යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රමුඛතාවය ලබාදෙමින් සිටී. වැඩහල් ගොඩනැගිල්ල රුපියල් මිලියන 900 ක මුදලකට ඇස්තමේන්තුගත කර ඇති අතර, පහසුකම් ගොඩනැගිල්ල සඳහා රුපියල් මිලියන 750 ක අයවැය ප්‍රතිපාදන වෙන් කර ඇත. මේ වන විට, නිර්මාණ සැලසුම අවසන් අදියරේ පවතින අතර ඉදිකිරීම් 2025 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය. කලාපීය හා ගෝලීය සමුද්‍රීය කර්මාන්තයේ බලවත් ආධිපත්‍යයක් රඳවා ගැනීම තහවුරු කරමින්, ශ්‍රී ලංකාවේ වරාය යටිතල පහසුකම් නවීකරණය හා පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නොවෙනස්වන කැපවීම මෙම සාමූහික ප්‍රයත්න මගින් අවධානයට ලක් කෙරේ. සේවා සැපයුම් ජාල වැඩි දියුණු කිරීම, වරාය මෙහෙයුම් සුසංවිධිත කිරීම සහ වැදගත් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම මගින් මෙම ව්‍යාපෘති නිසැකවම ශ්‍රී ලංකාවේ වරාය ක්ෂේත්‍රයේ දීර්ඝ කාලීන වර්ධනය හා තරඟකාරීත්වය සඳහා දායක වනු ඇත.

කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තයේ (CWIT) මෙහෙයුම් 2025 වර්ෂයේදී ආරම්භ කිරීම කොළඹ වරායේ විශේෂ සංවර්ධන කාර්යයක් වන අතර මෙය වරායේ සමස්ත ධාරිතාවය හා මෙහෙයුම් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නැංවීමට සැලසුම් කල ව්‍යාපෘතියකි.

කොළඹ වරායේ ධාරිතාවය වර්ධනය කිරීමට හා ගෝලීය තරඟකාරීත්වය තහවුරු කිරීමේ අරමුණින් අනාගත ක්‍රමෝපායික දැක්මක් සහිත ජාතික වරාය ප්‍රධාන සැලැස්ම හා අනුකූල වන යටිතල පහසුකම් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සූදානම්ව සිටී. මෙම පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ වැදගත් පියවරක් වනුයේ පවත්නා දියකඩනය දීර්ඝ කිරීම වන අතර, මෙම ව්‍යාපෘතිය

සැලසුම් කර ඇත්තේ වරාය වැඩි දියුණු කිරීම, විශාල නෞකා සඳහා ඉඩ පහසුකම් සැලසීම හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කිරිම සඳහා වේ.

දියකඩනය දීර්ඝ කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගෝලීය වෙළෙඳාමේ ඉහළ යමින් පවතින ඉල්ලුම සපුරාලමින් කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය වර්ධනය කිරීම සඳහා අතිශය වැදගත් අංගයක් වන, බටහිර බහළු පර්යන්තය - II (WCT – II) සංවර්ධනය කිරීම ආරම්භ කරනු ඇත. මෙම පුළුල් කිරීමේ කටයුතු මගින් නවෝත්පාදන තාක්ෂණය ඒකාබද්ධ කරනු ලබන අතර, නෞකාවල භාණ්ඩ ගොඩබෑමේ හා පැටවීමේ මෙහෙයුම් කාලය අවම කරමින් ප්‍රමුඛතම කලාපීය ප්‍රතිනැව්ගත කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කොළඹ වරායේ තත්ත්වය තහවුරු වනු ඇත.

මෙම සංවර්ධන කටයුතු වලින් අනතුරුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කටයුතු වර්ධනය කිරීමේ ක්‍රමෝපායේ දැවැන්ත මුලපිරීමක් වන කොළඹ උතුරු වරාය සංවර්ධනය ආරම්භ කරනු ඇත. මෙම ව්‍යාපෘතිය මගින් වරාය යටිතල පහසුකම් පුළුල් කර අතිරේක ගැඹුරු නැංගුරම්පොලවල් හඳුන්වාදී, නව පරපුරේ අතිවිශාල බහළු නෞකා සඳහා ඉඩ පහසුකම් සැලසිය හැකි වන පරිදි නවීනතම පහසුකම් සලසනු ඇත. කොළඹ උතුරු වරාය සංවර්ධනය මගින් වැදගත් ආර්ථික වර්ධනයක් අත් කර ගැනීම, ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, රැකියා අවස්ථා උත්පාදනය කිරීම සහ ගෝලීය නාවික හා සේවා සැපයුම් ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ තත්ත්වය තවදුරටත් තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

**මූල්‍ය කාර්යසාධනය**

2024 මූල්‍ය වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පොළිවලට හා බදුවලට පෙර ඉපැයීම්වල සුවිශේෂී වර්ධනයක් වාර්තා කල අතර, එය 2023 වසරේ උපයන ලද රුපියල් බිලියන 36.33 හා සැසඳීමේදී රුපියල් බිලියන 46.07 ක වැඩිවීමකි. මෙහෙයුම් ආදායම් ඉහළ යෑම හේතුකොටගෙන මෙම වැඩිවීම සිදු වූ අතර එය 2024 වසරේදී රුපියල් බිලියන 74.6 ක එකතුවක් වූ අතර එය 2023 වසරේදී රුපියල් බිලියන 63.3 හා සැසඳීමේදී කැපීපෙනෙන වර්ධනයකි. ආදායම් ඉහළ යාමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා වර්ධනය වීම හේතුවී ඇත අතර මෙමගින් සියළුම පර්යන්ත තුළ ඉහළ බහළු මෙහෙයුම් ධාරිතාවයක් හා මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් අත් කර ගෙන ඇත. කෙසේ වුවද, ඍජු මෙහෙයුම් වියදම්ද ආසන්න වශයෙන් රුපියල් බිලියන 2 කින් ඉහළ ගිය අතර මෙයට හේතුව වන්නේ සාර්ව ආර්ථික සාධක මත බලපෑ උද්ධමනයේ ප්‍රතිඵල වන අතර, එමගින් නොයෙකුත් අංශවල මෙහෙයුම් පිරිවැයද ඉහළ යන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂය සඳහා රුපියල් බිලියන 20.4 ක වෙනත් මෙහෙයුම් ආදායමට වඩා වැඩිවීමක් පෙන්නුම් කරමින් මෙම වර්ෂය සඳහා වෙනත් මෙහෙයුම් ආදායම රුපියල් බිලියන 23.3 ක් විය. මෙම ආදායම මූලික වශයෙන් වරාය බලපත්‍ර වලින්, පරිපාලිත සමාගම් වලින් හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුළුල්වෙමින් පවතින කාර්යභාරයන් තුළ අතිරේක පර්යන්ත වලින් සිදු කරන මෙහෙයුම් මගින් උපයන ලදී. මූල්‍ය පිරිවැය පිළිබඳව සඳහන් කිරීමේදී, ශ්‍රී ලංකා රුපියලේ අගය අධි ප්‍රමාණය වීම හා විදේශ ණය කිහිපයක් මුළුමනින්ම ගෙවා නිම කිරීම හේතුකොටගෙන විදේශ ණය පොළියේ අඩුවීමක් සිදු විය. අඩු පොළී අනුපාතයක් තිබියදී වුවද, ආයෝජන ආදායමෙහි පසුබෑමක් සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2024 වර්ෂයේදී රුපියල් බිලියන 1.4 ක ශුද්ධ මූල්‍ය ලැබීමක් හිමි විය. මෙය පසුගිය වර්ෂයේ වාර්තාවූ රුපියල් බිලියන 4 ක ආදායමට වඩා අඩු වුවද එ.ජ.ඩොලර් තැන්පතු කොළඹ නැගෙනහිර ජාත්‍යන්තර පර්යන්තය සඳහා අරමුදල් ආයෝජනය කිරීම හේතුකොටගෙන මෙය 2023 වර්ෂයේ රුපියල් බිලියන 5.3 ක ලැබීම් වලට වඩා අඩු වීමක් පෙන්නුම් කරයි.

විදේශ විනිමය පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී, විනිමය අනුපාත උච්චාවචනය සම්බන්ධයෙන් කිසියම් ස්ථායීකරණයක් තිබිය යුතු බව හඟවමින් 2023 වර්ෂයේ රුපියල් බිලියන 1.3 ක පාඩුවට සාපේක්ෂව 2024 වර්ෂයේ පාඩුව රුපියල් මිලියන 690 ක් ලෙස වාර්තා විය. තවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඒකාබද්ධ අරමුදලට රුපියල් මිලියන 607 ක දායකත්වයක් ලබා දුනි. එය 2023 වසරේ රුපියල් බිලියන 8.67 සිට සැලකිය යුතු අඩු වීමක් වන අතර, මෙමඟින් සැලකිය යුතු ආර්ථික අභියෝග පෙන්නුම් කෙරේ. මෙම මූල්‍ය බාධක තිබියදීත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2024 වසරේදී රුපියල් බිලියන 38.2 ක බදු වලට පසු ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර මෙම සුවිශේෂී කාර්යසාධනය මගින් අභියෝගාත්මක ආර්ථික පරිසරයක් තුළ වර්ධනය ඉදිරියට ගෙනයන අතරම ස්ථාවරභාවය පවත්වාගෙන යාමටද ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඇති හැකියාව මැනවින් අවධාරණය වේ.

**සේවා සැපයුම් හා මෙහෙයුම් කාර්යසාධනය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාශය නියාමකවරයෙකු, පරිපාලකයෙකු, ඉඩම් හිමිකරුවෙකු මෙන්ම සේවා සැපයුම් මෙහෙයුම්කරුවෙකු ලෙසද කටයුතු සිදු කරමින් ආයතනය තුළ අතිශය වැදගත් කොට්ඨාශයක් ලෙස කටයුතු කරයි. වරාය සේවා සැපයුම් කිසිදු බාධාවකින් තොරව සිදු කිරීම අධීක්ෂණය කරමින් නියාමන කාලරාමුව සමඟ අනුකූල වන බවට සහතික වෙමින් මෙම කොට්ඨාශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම කොට්ඨාශයේ පුළුල් කාර්යභාරය අතරට නිෂ්කාශන නියෝජිතායතන ලියාපදිංචි කිරීම, අත්හල නැව් භාණ්ඩ විකිණීම සහ වෘත්තීය ගාස්තු අය කිරීම ඇතුළත් වේ. තවද, මෙම කොට්ඨාශය මගින් අර්ධ පූර්ණ බහළුම් විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම්, ප්‍රතිකාර්ය බහළුම් සහ හිස් බහළු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම ඇතුළු ප්‍රධාන සේවා සැපයුම් කළමනාකරණය කරනු ලබයි.

2024 වර්ෂයේදී, සේවා සැපයුම් කොට්ඨාශය නැව් භාණ්ඩ මෙහෙයුම් පිළිබඳව වැදගත් සන්ධිස්ථාන කිහිපයක් සනිටුහන් කරන ලදී. බහළුම් විස්සේ සම ඒකක 24,218 ක භාණ්ඩ හිස් කිරීමේ මෙහෙයුම් සිදු කරන ලදී. මෙම කාර්යයෙන් 60% ක් කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් විසින් කළමනාකරණය කරන ලදී. පූර්ණ බහළුම් විස්සේ සම ඒකක 124,472 ක් භාර දෙන ලදී. විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් වලින් විස්සේ සම ඒකක 3,709 ක භාණ්ඩ හිස් කිරීමේ මෙහෙයුම් සිදු කරන ලද අතර බහළුම් විස්සේ සම ඒකක 4,851 ක භාණ්ඩ පැටවීමේ මෙහෙයුම් සිදු කරන ලදී. මෙමඟින් ප්‍රතිඅපනයන මෙහෙයුම් සිදු කිරීමේදී පර්යන්තයේ පවතින කාර්යක්ෂමතාවය ප්‍රදර්ශනය විය. සිමෙන්ති මෙට්‍රික් ටොන් 784,656 ක් වානේ මෙට්‍රික් ටොන් 476,720 ක් සහ ව්‍යාපෘති නැව් භාණ්ඩ ඝන මීටර් මිලියන 1.18 කින් යුත් සම්ප්‍රදායික නැව් භාණ්ඩ මෙහෙයුම් කරන ලදී. අර්ධ පූර්ණ බහළු විස්සේ සම ඒකක 1,518 ක් සහ විස්සේ සම ඒකක 636 ක් වශයෙන් බැඳුම්කර ගුදම් මෙහෙයුම් කාර්යක්ෂම ලෙස සිදු කරන ලදී.

නියාමන අනුකූලතාවය හා කාර්ය පහසුව සඳහා වරාය භාවිතා කරන්නන්හට වාප්පු පරිපාලන අංශය මගින් බලපත්‍ර සහ අවසරපත්‍ර 1,370 ක් නිකුත් කරන ලදී.පර්යන්තවල ඉඩ ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා විකුණුම් අංශය මගින් අත්හල නැව් භාණ්ඩ වෙන්දේසි 179 ක් පවත්වන ලදී. මේ අතරතුර, පාරිභෝගික ගැටළු නිරාකරණය කිරීම සහ මෙහෙයුම්වල විනිවිදභාවය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කැපවීම අවධාරණය කරමින් හිමිකම් පෑමේ අංශය මගින් WIC I/II හිමිකම් පෑම් 255 ක් සාර්ථකව නිරාකරණය කරන ලදී.

## සභාපතිතුමාගේ සමාලෝචනය

**අළෙවිකරණ ක්‍රමෝපාය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයුම් සිදු කරන පර්යන්තවල බහළු මෙහෙයුම් ධාරිතාවය වර්ධනය කිරීම සඳහා 2024 වසර පුරා අළෙවි හා ව්‍යාපාර සංවර්ධන කොට්ඨාශය මගින් විශාල කාර්යභාරයක් ඉටු කරන ලදී. කොළඹ නැගෙනහිර ජාත්‍යන්තර පර්යන්තය හා අළුතින් සංවර්ධන කරන ලද ජය බහළු පර්යන්ත V සඳහා ප්‍රවර්ධන ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම තුළින් අප්‍රිකාව වෙත සේවා සපයනු ලබන නැව් සේවාවන් ඇතුළු නව නැව් සේවා ගණනාවක් මෙම කොට්ඨාශය මගින් සාර්ථකව ආකර්ෂණය කර ගන්නා ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත මෙතෙක් පැමිණි විශාලතම නෞකාව මෙහෙයවීම සුවිශේෂී ජයග්‍රහණයක් වූ අතර එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත ඒ හා සමාන විශාල නෞකා නටාකාංගණගත කිරීම සඳහා විශාල උත්ප්‍රේරණයක් විය.

විශේෂයෙන්ම මෙහෙයුම් කොට්ඨාශය සහ වෙනත් කොට්ඨාශ සමඟ සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කිරීමේදී, ජාත්‍යන්තර සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා අළෙවි හා ව්‍යාපාර සංවර්ධන කොට්ඨාශය මගින් ක්‍රමෝපායික කාර්යරාමුවක් සකස් කර ඇත. මෙම පියවර ප්‍රධාන පෙළේ නැව් සමාගම්වල ප්‍රධානීන් සමඟ සබඳතා වර්ධනය කර ගැනීම කේන්ද්‍ර කොට ගෙන සිදු කෙරෙන අතර එම හවුල්කාරීත්ව සබඳතා ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් මෙහෙයුම් සිදු කෙරෙන පර්යන්ත තුළ බහළු මෙහෙයුම් වේගවත් ලෙස වර්ධනය කිරීම සඳහා වැදගත් වේ. මෙම ක්‍රමෝපායේ මූලික සංරචකයන් වන්නේ ප්‍රධාන පෙළේ නැව් සමාගම් සමඟ ඉලක්කගත සබඳතා පවත්වා ගැනීම, පවත්නා සන්ධාන තවදුරටත් ශක්තිමත් කිරීම, සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා නව මාවත් සෙවීම සහ ගෝලීය නාවික හා සේවා සැපයුම් ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වඩාත්ම සුදුසු හා වඩාත්ම විශ්වාසනීය හවුල්කරු ලෙස ස්ථානගත කිරීම වේ.

මෙම අළෙවිකරණ මූලාරම්භයන් අනුපූරණය කරමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොළඹ වරායේ අනෙකුත් පර්යන්ත සමඟ සහයෝගීතාවයෙන් යුතුව 2024 වසරේදී වරාය සම්මාන උළෙලක් සාර්ථකව පවත්වන ලදී. මෙම විශේෂ අවස්ථාවට ක්ෂේත්‍රයේ ප්‍රබල පුද්ගලයින්, නැව් සමාගම්වල විධායක නිලධාරින් සහ ප්‍රධාන සමුද්‍රීය පාර්ශ්වකරුවන් සහභාගී වූ අතර සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ විශිෂ්ටත්වය සැමරීම හා ගෝලීය සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මෙයින් අතිශය වැදගත් වේදිකාවක් නිර්මාණය විය.

ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය චීනයේ ටියැන්ජින් සමුද්‍රීය ප්‍රදර්ශනය, සවුදි සමුද්‍රීය සංසදය ඇතුළු අවධානයට ලක්වන වැදගත් අවස්ථාවලදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී. තවද, ටියැන්ජින් වරාය, ඇමෙරිකාවේ වර්ජිනියා නෝෆෝල්ක් පර්යන්ත සහ දකුණු කොරියාවේ සමුද්‍රීය විශ්වවිද්‍යාලය වැනි සම්මානනීය ගෝලීය ආයතන සමඟ ක්‍රමෝපායික සංධාන ඇති කර ගන්නා ලදී. මෙම සහයෝගීතාවය මගින් මෙහෙයුම් තත්ත්වයන් වැඩි දියුණු කිරීම සහ ගෝලීය සමුද්‍රීය ජාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි වැදගත්කම තවදුරටත් තහවුරු කිරීමට සූදානම් ව සිටී.

**මානව සම්පත් විශිෂ්ටතාවය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාර්ථකත්වයට මූලික වශයෙන් බලපානු ලබන්නේ එහි මානව ප්‍රාග්ධනය බව හඳුනාගෙන ඇත. සමුද්‍රීය ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතනයක් වශයෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉහළ කාර්යසාධනයක් පවත්වා ගෙනයෑම හා ආයතනයේ දීර්ඝ කාලීන සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන නිපුණතාවයෙන් යුත්, අභිප්‍රේරිත ශ්‍රම බලකායක් සේවයේ යෙදවීමට කටයුතු කර ඇත.

## සභාපතිතුමාගේ සමාලෝචනය

විවිධ පසුබිම් තුළින් පැමිණි, විශේෂඥතාවයෙන් යුත් සේවකයන්ගෙන් සමන්විත, විවිධත්වයෙන් යුත් ශ්‍රම බලකායක් සමඟ නවෝත්පාදනය හා මෙහෙයුම් කාර්යක්ෂතාවය වර්ධනය කිරීම සඳහා සාමූහිකව කටයුතු කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එක් ප්‍රධාන ශක්තියක් වේ. කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කිරීම, සාධාරණත්වය සහ අන්‍යෝන්‍ය ගෞරවය යනාදියට ආයතනය ප්‍රමුඛතාවයක් ලබා දී ඇති අතර එමඟින් ඵලදායීතාවය වර්ධනය වන ආයතනික සංස්කෘතියක් ප්‍රවර්ධනය කර සේවක තෘප්තිය වර්ධනය කිරීම අරමුණු කෙරේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ යහපැවැත්ම ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කර ඇති සුභසාධක වැඩසටහන්, සෞඛ්‍ය හා නිරාපද ක්‍රියාපිළිවෙත් තුළින් ආරක්ෂිත හා සහයෝගීතාවයෙන් යුත් කාර්යය පරිසරයක් පවත්වා ගෙන යෑමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැපවී සිටී.

මීට අමතරව, ස්වකීය සේවකයින්ගේ අඛණ්ඩ වෘත්තීය දියුණුව වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැපවී සිටී. ඉලක්කගත පුහුණුවීම්, ධාරිතා වර්ධනය සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් තුළින් සිය ශ්‍රම බලකාය නවතම ක්ෂේත්‍ර සංවර්ධනයන් හා මනා පරිචයන් අනුගමනය කරන බවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහතික වේ. මෙම පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශය මගින් වරාය මෙහෙයුම් හා සේවා සැපයුම් කළමනාකරණය ප්‍රශස්තකරණය පිණිස ඵලදායී ලෙස දායකත්වය ලබා දීම සඳහා සේවකයින් බලගැන්වෙන අතර මෙමඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමුද්‍රීය ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම සිටින බවට තහවුරු කෙරේ.

**නිමාව**

පරිවර්තනයට ලක්වන සැපයුම් දාම, තාක්ෂණික නවෝත්පාදන, පාරිසරික අභියෝග මෙන්ම භූ-දේශපාලනික ගතිකත්වයන් හා වෙළෙඳ ප්‍රතිපත්ති හේතුකොටගෙන ගෝලීය නාවික හා සමුද්‍රීය ක්ෂේත්‍රය පරිවර්තනීය වෙනස්කම් වලට භාජනය වෙමින් පවතී. මෙම වෙනස්වීම් වලට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇතුළු ලොව පුරා වරායයන්, ප්‍රධානපෙළේ ප්‍රතිඅපනයන කේන්ද්‍රස්ථාන වශයෙන් තම ස්ථාවරය ශක්තිමත් කර ගැනීම සඳහා ක්‍රමෝපායික වශයෙන් අනුවර්තනය වෙමින් පවතී. 2027 වර්ෂය වන විට ප්‍රක්ෂේපිත ධාරිතාවය බහළුම් විස්සේ සම ඒකක මිලියන 14 ක වර්ධනයක් සනිටුහන් කරමින් කොළඹ වරාය සැලකිය යුතු වර්ධනයක් අත් කර ගැනීමට සූදානම්ව සිටී. මෙම පුළුල් වීම, සේවා සැපයුම් යටිතල පහසුකම්වල වැදගත් වර්ධනයක් මගින් අවධාරණය වන අතර එමඟින් විශේෂයෙන්ම ආසියානු ආර්ථිකය තුළ, ගෝලීය වෙළෙඳාම වර්ධනය කිරීම සඳහා කොළඹ වරායට ඇති හැකියාව ඉහළ යනු ඇත. දකුණු ආසියාවේ විශිෂ්ටතම වරාය ලෙස කලාපයේ ආර්ථික හා සමුද්‍රීය සංවර්ධනය මෙහෙයවීම සඳහා කොළඹ වරාය ක්‍රමෝපායික වශයෙන් ස්ථානගත වී ඇති අතර, එමඟින් කලාපීය හා අන්තර්ජාතික සමුද්‍රීය කර්මාන්තය තුළ කොළඹ වරායේ කාර්යභාරය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොළඹ වරාය සහ ත්‍රිකුණාමලය වරාය වැනි සෙසු කලාපීය වරායවල් වැඩි දියුණු කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමෙහි යෙදී සිටී. ත්‍රිකුණාමලය වරාය සඳහා වන සවිස්තරාත්මක සංවර්ධන සැලසුම් මගින් යටිතල පහසුකම් වැඩි දියුණු කර, ජාතික ප්‍රවාහන ජාල සම්බන්ධතාවය ශක්තිමත් කර ශ්‍රී ලංකාවේ වරායාවල් ගෝලීය සමුද්‍රීය ක්ෂේත්‍රයේ තරඟකාරී තත්ත්වයක පවතින බව තහවුරු කිරීමට කටයුතු කරමින් සිටී. 2024 වසරේදී අත්දුටු ධනාත්මක ගමන්මග අඛණ්ඩව පවත්වාගෙන යමින් නැව් භාණ්ඩ ධාරිතාවයේ වර්ධනය පවත්වාගෙන යාමට අපේක්ෂා කරන අතර එමඟින් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය හා ආර්ථික ක්‍රියාවලීන් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැදගත් දායකත්වය තවදුරටත් තහවුරු කිරීමට අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන්, ගරු ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමන්, ගරු නියෝජ්‍ය

## සභාපතිතුමාගේ සමාලෝචනය

අමාත්‍යතුමන් සහ සමස්ත කාර්ය මණ්ඩලය ලබාදුන් අනගි නායකත්වය හා සහාය වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාවය ඔවුන් වෙත පල කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ කැපවීම අපගේ දියුණුවට හේතුවන අතර අනාගත සාර්ථකත්වය ලගාකර ගැනීම සඳහා අපගේ වටිනා පාර්ශ්වකරුවන් හා හවුල්කරුවන් සමඟ අඛණ්ඩ සහයෝගීතාවය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වයේ හා සමස්ත කාර්ය මණ්ඩලයේ කැපවීම අපේක්ෂා කරමි.

**අද්මිරාල් රණසිංහ (විශ්‍රාමික)**
**සභාපති**

# අධ්‍යක්ෂ මණ්ඩලය

**අද්මිරාල් සිරිමෙවන් සරත්චන්ද්‍ර රණසිංහ (විශ්‍රාමික)**
**සභාපති**

අනුරාධපුරයේ උපත ලද විශ්‍රාමික අද්මිරාල් සිරිමෙවන් සරත්චන්ද්‍ර රණසිංහ මහතා 1982 නොවැම්බර් මස 15 දින ශ්‍රී ලංකා නාවික හමුදාවට බැඳී ත්‍රිකුණාමලයේ නාවික හා සාගර විද්‍යාපීඨයෙන් සහ එංගලන්තයේ ඩාට්මවුත්හි බ්‍රිටැනියා රාජකීය නාවික විද්‍යාලයෙන් (1984 – 1985) මූලික පුහුණුව ලබා ඇත.

අදිමිරාල් සිරිමෙවන් රණසිංහ මහතා කෝච්චිහි වෙන්දුරුත්ති ඉන්දියානු නාවික සේවාවෙහි පුහුණුව ලත් සම්මැරීන් නාශක යුද විශේෂඥයෙකු වන අතර, ආරක්ෂක සේවා මාණ්ඩලික පාඨමාලාව ඉන්දියාවේ වෙලින්ටන්හිදීද, යුද පාඨමාලාව පාකිස්ථානයේ ඉස්ලාමාබාද්හි ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන්ද, ජාතික ආරක්ෂක පාඨමාලාව ඉන්දියාවේ නවදිල්ලියේ ජාතික ආරක්ෂක විද්‍යාලයෙන්ද හදාරා ඇත.

ඔහුගේ සේවා කාලය තුළදී විදහා දැක්වූ වීරත්වය වෙනුවෙන් ඔහු වෙත වීර වික්‍රම විභූෂණ හා රණ වික්‍රම යන පදක්කම් පිරිනමනු ලැබ ඇත. ඔහුගේ විශිෂ්ට සේවය උදෙසා ද විවිධ සම්මාන ලබා ඇති අතර විශිෂ්ට කාර්යසාධනය වෙනුවෙන් සහ නාවික සේවයට ලබාදුන් විශේෂ දායකත්වය වෙනුවෙන් නාවික හමුදාපතිවරයාගේ ප්‍රශංසාවටද ලක් වී ඇත. ඔහු 2017 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ සිට 2018 දෙසැම්බර් මාසය දක්වා නාවික හමුදාපති ලෙස කටයුතු කර ඇත. 2019 වර්ෂයේදී වරාය, නාවික හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන්ද පත් කරනු ලැබ තිබිණ.

**ඉංජිනේරු හේරත් එම් පී ජයවර්ධන මහතා**
**උප සභාපති**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් ලබා ඇති හේරත් එම් පී ජයවර්ධන මහතා කාර්මික ක්ෂේත්‍රයේ භාවිතා කරන ටයර් සහ රිම් නිශ්පාදන ක්ෂේත්‍රයේ වසර 27 කට අධික පළපුරුද්දක් ලබමින් මෙම ක්ෂේත්‍රයේ කළමනාකාර අධ්‍යක්ෂ තනතුර දක්වා උසස් වීම් ලබා ඇත. ඔහු පිරිවැය ඵලදායී නිශ්පාදන ක්‍රම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කරන අතර, මෙම ක්ෂේත්‍රයේ දියුණුව එහි අනාගතයට විශේෂ වැදගත්කමක් හිමිවන බව විශ්වාස කරමින් තරුණ වෘත්තිකයින්හට උපදෙස් ලබා දීමට කැපවීමෙන් කටයුතු කරන ඉංජිනේරුවරයෙකි.

ඔහුගේ ජාත්‍යන්තර පළපුරුද්ද තුළ යුරෝපයේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ ආසියාවේ අදාළ සහයෝගීතාවය අන්තර්ගතව පවතී. කළමනාකරණ උපදේශකත්වය, නිශ්පාදන ක්‍රියාවලිය, කර්මාන්තශාලා සංවර්ධනය, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, පුහුණු කිරීම, ව්‍යාපාර ක්‍රියාපද්ධති වැඩි දියුණු කිරීම, සැලසුම් සංවර්ධනය හා පාරිභෝගික සබඳතා පිළිබඳ විශේෂඥතාවයක් ඔහු සතුව ඇත.

ඕ ටී ආර් වීල් ඉංජිනියරින් ලංකා සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂ (2011 – 2021) තනතුර දැරීම, කොමොප්ලාස්ට් සෝලීඩියල් ආයතනයේ රෝද නිශ්පාදන කොට්ඨාශයේ විධායක අධ්‍යක්ෂ (2008 – 2011) තනතුර දැරීම, කාර්මික රිම් සහ රෝද කොට්ඨාශයේ කොමොප්ලාස්ට් සෝලීඩියල් / ලෝඩ්ස්ටාර් ආයතනයේ සාමාන්‍යාධිකාරී (2006 – 2008) තනතුර දැරීම,ලෝඩ්ස්ටාර් ආයතනයේ කාර්මික රිට් සහ රෝද අංශයේ කර්මාන්තශාලා කළමනාකරු (2001 – 2006) තනතුර දැරීම සහ ජිනසේන/ ලෝඩ්ස්ටාර් ආයතනයේ නිශ්පාදන ඉංජිනේරු (1994 – 2001) තනතුර දැරීම ජයවර්ධන මහතාගේ වෘත්තීය ගමන් මාර්ගයට අන්තර්ගත වේ.

# අධ්‍යක්ෂ මණ්ඩලය

**ඉංජිනේරු ටී කේ ජී එල් හේමචන්ද්‍ර මහතා**
**කළමනාකාර අධ්‍යක්ෂ**

ඉංජිනේරු ටී කේ ජී එල් හේමචන්ද්‍ර මහතා ශ්‍රී ලංකාවේ පොදුකාර්ය ව්‍යුහ සහ සමුද්‍රීය ක්ෂේත්‍ර තුළ ඉංජිනේරු කටයුතු හා විධායක නායකත්වය පිළිබඳ වසර 25 කට අධික විශේෂ පළපුරුද්දක් ලබා ඇති වරලත් ඉංජිනේරුවරයෙකි. මේ වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන හේමචන්ද්‍ර මහතා ස්වකීය තාක්ෂණික නිපුණතාවය හා ක්‍රමෝපායික දූරදර්ශීභාව ජාතික සංවර්ධනයට සුවිශේෂී ලෙස දායක කර ඇත.

ස්වකීය සේවා කාලය තුළදී ප්‍රධාන ඉංජිනේරු (විදුලි හා විද්‍යුත්) තනතුර, ත්‍රිකුණාමලය හා ගාල්ල වරායයන්හි නේවාසික කළමනාකාර තනතුර ඇතුළු ප්‍රධාන පෙළේ තනතුරු දරා ඇත. ඔහුගේ සේවා දායකත්වය වරාය මෙහෙයුම් වැඩිදියුණු කිරීම, ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි යටිතල පහසුකම් නවීකරණය කිරීමට ඉවහල් වී ඇත.

ඔහුගේ විශේෂඥතාවය විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කටයුතු, ව්‍යාපෘති කළමනාකරණය, විදුලිය බෙදාහැරීම, තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන පද්ධති සහ පුනර්ජනනීය බලශක්තිය යන ක්ෂේත්‍රයන් පුරා විහිදේ. ඔහු අධ්‍යාපන අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ලංකා විදුලි බල මණ්ඩලය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව සහ ලංකා බැංකුව ඇතුළු ආයතන ගණනාවක අදාළ ක්ෂේත්‍රයන්හි තාක්ෂණ ධාරිතාවය වැඩි දියුණු කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශකවරයෙකු ලෙස කටයුතු කර ඇත.

ඉංජිනේරු හේමචන්ද්‍ර මහතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාපති (ගෞරව) උපාධියක්ද, මහා බ්‍රිතාන්‍යයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක්ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වරලත් සාමාජිකයෙකු වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ සංස්ථාපිත සාමාජිකයෙකු ද (Corporate Member) වේ.

ක්ෂේත්‍රයේ හැකියාවන් සනාථ කල නායකයෙකු හා ඉදිරි දැක්මක් සහිත ඉංජිනේරුවරයෙකු වන හේමචන්ද්‍ර මහතා, ජාතියේ අභිවෘද්ධිය උදෙසා ඉංජිනේරු ක්ෂේත්‍රයේ හා සමුද්‍රීය පොදුකාර්යයන්හි නවෝත්පාදනය හා විශිෂ්ටතාවය අඛණ්ඩව වර්ධනය කිරීමේ නියැලී සිටී.

**ආර් එම් දමිතා කුමාරි මහත්මිය**
**අධ්‍යක්ෂ**

ආර් එම් දමිතා කුමාරි රත්නායක මහත්මිය රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පෘථුල පළපුරුද්දක් ලබා ඇති මූල්‍ය ක්ෂේත්‍රයේ අති දක්ෂ වෘත්තීයවේදිනියෙකි. දැනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස කටයුතු කrන රත්නායක මහත්මිය ජාතික මුදල් ප්‍රතිපත්ති හා මුදල් ප්‍රවාහ මෙහෙයුම්කරණයේ වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

ශක්තිමත් අධ්‍යාපනික පසුබිමක් සතු රත්නායක මහත්මිය, ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී උපාධියට අමතර වශයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය වශයෙන් ශාස්ත්‍රපති උපාධි දෙකක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අවසන් විභාගයද සමත්වී ඇති අතර, ඕස්ට්‍රේලියා රජය මගින් පිරිනමන ගෞරව ශිෂ්‍යත්වලාභියෙකුද වේ.

# අධ්‍යක්ෂ මණ්ඩලය

ඇයගේ සේවා කාලය ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මුදල් ප්‍රවාහ කළමනාකරණ අධ්‍යක්ෂ, රාජ්‍ය ණය කළමනාකාර අධ්‍යක්ෂ සහ වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු ඇතුළත් වන ප්‍රධාන පෙළේ නායකත්ව කාර්යභාරයන් ඇයගේ දශක දෙකක වෘත්තීය ජීවිතය පුරා විහිද පවතී. තවද, ඇය ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා මහජන බැංකුව ඇතුළු විවිධ පාලන මණ්ඩලවලද සේවය කර ඇත.

ඇය සතුව පවතින සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය හා ආයතනික යහපාලනය පිළිබඳ විශේෂඥතාව මගින් රටෙහි භාණ්ඩාගාර මෙහෙයුම්වල මූල්‍ය ස්ථාවරභාවයට හා ක්‍රමෝපායික තීරණ ගැනීම පිළිබඳව සුවිශේෂී දායකත්වයක් ලැබී ඇත.

**පී බී එස් සී නෝනිස් මහතා**
**අධ්‍යක්ෂ**

සරත් නෝනිස් මහතා දශක තුනකට අධික වූ ස්වකීය වෘත්තීය සේවා කාලය තුළ රාජ්‍ය සේවයේ තනතුරු දරමින් කටයුතු කරන අත්දැකීම් සහිත කීර්තිමත් නිලධාරියෙකු වේ. දැනට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ඉහළම තනතුර වන රේගු අධ්‍යක්ෂ ජනරාල් ධූරය දරණ ඔහු වෙත රේගු ආදායම් එකතු කිරීමේ, අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ හා දෙදහසක් ඉක්ම වන කාර්යමණ්ඩලය පරිපාලනය කිරීමේ ඍජු අධිකාරී බලය පැවරී ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ලැබූ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධිය හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් ලබාගත් ආවසරික සහතිකයද සහිතව ඔහු ස්වකීය වෘත්තීය ගමන ආරම්භ කල අතර ඉන් අනතුරුව AUSAID ශිෂ්‍යත්වය ලබා ඔස්ට්‍රේලියාවේ ඇඩිලේඩ්හි ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ලෙස 1988 වර්ෂයේදී රාජ්‍ය සේවයට බැදුණු සරත් නෝනිස් මහතා 1997 වර්ෂයේදී ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයට ඇතුළත් විය. වෘත්තියේ ඉහළම තලයට සීඝ්‍රයෙන් පැමිණ 1998 දී ධීවර හා සාගර සම්පත් අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුරට පත් වී පසුව මුදල් අමාත්‍යාංශයේ සේවයට පත් විය. එම අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු හා වෙළෙඳ තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති වැනි අතිශය වැදගත් දෙපාර්තමේන්තුවල සේවයේ නියැලෙමින් නොමැකෙන සටහන් තබා ඇත.

2017 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම පාලක ජෙනරාල්වරයා ලෙස එම තනතුරෙහි විශිෂ්ටත්වයට පත් නෝනිස් මහතා වෙත රජයේ වත්කම් කාර්යක්ෂම, ප්‍රතිඵලදායක හා පිරිමැසුම්දායක ලෙස භාවිතා කිරීම සහතික කිරීමේ වගකීම පවරන ලදී. එහිදී අවකළමනාකරණය හා නාස්තිය පිටුදැකීම අරමුණුකොට රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා කේන්ද්‍රීය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම ඔහු විසින් ගන්නා ලද නවෝත්පාදන ක්‍රියාමාර්ග වලට ඇතුළත් වේ.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට උසස් කිරීමෙන් අනතුරුව, ඔහුගේ වගකීම් ජාතික අයවැය සම්පාදනය, රාජ්‍ය වියදම් කළමනාකරණය, වාණිජ ගබඩා පිළිබඳ සීමා, රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සහ අයවැය අධීක්ෂණය කිරීම පුළුල් කරන ලදී.

ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් ස්වකීය සේවා කාලය තුළ සංකීර්ණ ආරක්ෂක ප්‍රතිපත්තිමය කටයුතු ඔහු ප්‍රශස්ත ලෙස මෙහෙයවීය. ද්වීපාර්ශ්වික හා බහුපාර්ශ්වික ආරක්ෂක

සහයෝගීතාව, යුද උපකරණ ප්‍රසම්පාදනය සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ පරිපාලනමය ගැටළු විසඳීම ඔහුගේ වගකීම් වලට ඇතුළත් විය.

තවද, ඔහු ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික ආයතනයේ ෆුලර්ටන් සංසදය (IISS Fullerton Forum) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ/ ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම්, ලෝක වෙළෙඳ සංවිධාන කවුන්සිලයේ රැස්වීම්, ආසියා හා නිරිත දිග ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා වූ යටිතල පහසුකම් මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රතිපත්ති කතිකාවත සඳහා වූ රැස්වීම් ආදී ජාත්‍යන්තර සංසද වලදී ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA) හා සවිස්තරාත්මක ආර්ථික හවුල්කාරීත්ව ගිවිසුම (CEPA) ආදී වෙළෙඳ ගිවිසුම් ගණනාවක් සකස් කිරීමටද සම්බන්ධ වී ඇත.

**ඊ එම් එස් බී ජයසුන්දර මහතා**
**අධ්‍යක්ෂ**

ඊ එම් එස් බී ජයසුන්දර මහතා රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ආයතනික කළමනාකරණය සහ පරිපාලන කාර්යක්ෂමතාවය පිළිබඳ මනා පළපුරුද්දක් ලබා ඇති රජයේ ප්‍රවීණ පරිපාලන වෘත්තීයවේදියෙකු වේ. ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ වත්මන් අතිරේක ලේකම්වරයා ලෙස සේවය කරන ජයසුන්දර මහතා ජාතික සංවර්ධන කාර්යයන් ප්‍රගමනය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

මනා අධ්‍යාපනික පසුබිමක් ඇති ජයසුන්දර මහතා, කැළණිය විශ්ව විද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද, රුහුණු විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියද ලබා ඇති අතර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු ද වේ. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ කටයුතු වලටද ඔහු විශේෂ දායකත්වයක් සපයා ඇත.

විශාල පරාසයකින් යුත් ඔහුගේ පළපුරුද්ද තුළ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පාලක හා විවිධ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් වැනි ප්‍රධාන පෙළේ තනතුරු අන්තර්ගත වේ. ඔහු විවිධ අමාත්‍යාංශවල වැඩ බලන ලේකම් වශයෙන් කටයුතු කර ඇති අතර ස්වාධීන රූපවාහිනීය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතනවල සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කර ඇත.

රාජ්‍ය සේවයට දැක්වූ දායකත්වය වෙනුවෙන් පිළිගැනීමට ලක් වී ඇති ජයසුන්දර මහතා, ඵලදායීතාවය හා විශිෂ්ටතාවය සඳහා ජාතික සම්මාන රාශියක් ලබා ඇත. දින තුනේ ගමන් බලපත්‍ර සංකල්පය, රාජ්‍ය සේවකයින් සඳහා නව අධීක්ෂණ හා ඇගයුම් ක්‍රමය හඳුන්වාදීම හා ජාතික හා ප්‍රාදේශීය සංවර්ධනයට ඉවහල්වන මහා පරිමාණ ආර්ථික හා යටිතල පහසුකම් ව්‍යාපෘති ඔහු විසින් හඳුන්වාදුන් විශිෂ්ට නව්‍යතාවයනට ඇතුළත් වේ.

# අධ්‍යක්ෂ මණ්ඩලය

**එන් ඒ ඒ පී එස් නිස්සංකා මහත්මිය**
**අධ්‍යක්ෂ**

රාජ්‍ය සේවයෙහි, සමාජ සංවර්ධනය සහ සමූපකාර සංවර්ධන ක්ෂේත්‍රවල දීර්ඝ පළපුරුද්දක් ලබා ඇති එන් ඒ ඒ පී එස් නිස්සංකා මහත්මිය රාජ්‍ය පරිපාලනයේ කීර්තිමත් වෘත්තීමය නිලධාරිනියකි. ඇය දැනට ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සමාජ සංවර්ධන) වශයෙන් කටයුතු කරන අතර තිරසර ප්‍රජා සංවර්ධනය සඳහා සහ වැඩසටහන් සකස් කිරීම පිළිබඳව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරමින් සිටී.

ශක්තිමත් අධ්‍යාපනික පදනමක් සතු නිස්සංකා මහත්මිය ශාස්ත්‍රපති උපාධියක්, ශාස්ත්‍රවේදී උපාධියක් සහ අධ්‍යාපනවේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද ලබා ඇත. 1990 වර්ෂයේ රාජ්‍ය සේවයට හා 1998 ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුනු නිස්සංකා මහත්මිය 2017 වර්ෂයේ සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විශේෂ ශ්‍රේණියේ) සුවිශේෂී නිලධාරිනියක් වශයෙන් කටයුතු කර ඇත.

ඇයගේ වෘත්තීය සේවා කාලයට, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්, සහකාර ප්‍රාදේශීය ලේකම් සහ මහව හා නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය ලේකම් තනතුර ඇතුළු ප්‍රධාන පෙළේ විවිධ නායකත්ව කාර්යභාරයන් ඇතුළත් වේ. පරිපාලන නායකත්ව තනතුරු වලින් සහ රාජ්‍ය සේවයෙන් ලබාගත් සුවිශාල පළපුරුද්ද ප්‍රජා සංවර්ධනයට හා ආයතනික කාර්යක්ෂමතාවයට සුවිශේෂී ලෙස දායක වී ඇත.

සමාජ සංවර්ධනය, යහපාලනය සහ සමූපකාර ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම පිළිබඳව ඇයගේ කැපවීම හා විශේෂඥතාවය මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනයේ වැදගත් වෙනස්කම් සිදු කිරීමට දායක වී ඇත.

**උපුල් ධම්මික ජයතිස්ස මහතා**
**අධ්‍යක්ෂ**

උපුල් ජයතිස්ස මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද, ස්වීඩන්හි වර්ල්ඩ් මැරිටයිම් විශ්වවිද්‍යාලයෙන් වරාය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද, එක්සත් රාජධානියේ Wigan & Leigh College ආයතනයෙන් අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇති අතර සේවා සැපයුම් හා ප්‍රවාහනය පිළිබඳ වරලත් ආයතනයේ වරලත් සාමාජිකයෙකු ද වේ.

දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව 1986 වසරේදී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට සම්බන්ධ වූ උපුල් ජයතිස්ස මහතා වසර 36ක් වරාය ක්ෂේත්‍රයේ සේවය කර ඇත. 2002 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අලෙවි හා ව්‍යාපාර සංවර්ධන කොට්ඨාශය ස්ථාපිත කිරීම ඇතුළුව වැදගත් කාර්යයන් ගණනාවක් ස්වකීය වෘත්තීය සේවා කාල පරිච්ඡේදයට අයත් වේ. උපුල් ජයතිස්ස මහතා 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

මැදපෙරදිග වරායවල, කුවේට් වරාය අධිකාරියේ Shuaiba බහළු පර්යන්තයේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සාජාහි Khorfakkan බහළු පර්යන්තයෙහි පර්යන්ත සැලසුම්කරු ලෙස වසර පහක පළපුරුද්දක් ද ඔහු සතුව ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

උපුල් ජයතිස්ස මහතා රජයේ හා පෞද්ගලික විශ්වවිද්‍යාල හා වෘත්තීය ආයතන 14 කට අධික සංඛ්‍යාවක වරාය කළමනාකරණය, මෙහෙයුම් හා සැලසුම් ක්ෂේත්‍රයන්හි බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කර ඇත.

**යූ එල් අනුර බණ්ඩාර මහතා**
**අධ්‍යක්ෂ**

යූ එල් අනුර බණ්ඩාර මහතා, ඉහළ ධාරිතාවයෙන් යුත් බහළු පර්යන්ත මෙහෙයුම් පිළිබඳ වසර 23 ක විශේෂඥ දැනුමක් හා මනා පළපුරුද්දක් ලබා ඇති ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් කළමනාකරුවෙකි. සැපයුම් සේවා උපරිම මට්ටමින් පවත්වාගෙන යාම, මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හා නැව්බඩු ප්‍රවාහය අඛණ්ඩව සිදු කෙරෙන බව තහවුරු කරමින් කටයුතු කිරීම සම්බන්ධයෙන් සනාථ වූ පළපුරුද්දක් ඔහු සතුව ඇත.

නියැලෙන කාර්යභාරයන් වලින් උපරිම ප්‍රතිඵල ලබාදීමේ හැකියාව ඇති බණ්ඩාර මහතා විවිධ කාර්යයන් සඳහා යොදවා ඇති කණ්ඩායම් කළමනාකරණය කිරීම, සැලසුම් ක්‍රියාපද්ධති සුසංවිධිත කිරීම සහ ඵලදායීතාවය ඉහළ නැංවීමේ නවෝත්පාදන ක්‍රම ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කටයුතු වලදී විශේෂ දක්ෂතාවයක් පෙන්නුම් කරයි. සුරක්ෂිතභාවය හා සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීම, සම්පත් කළමනාකරණය සහ ක්ෂෙත්‍ර සම්මතයනට හා පාරිභෝගික අපේක්ෂාවනට අනුකූලවීම සහතික කරමින් විවිධ කාර්යයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම ඔහුගේ විශේෂඥතාවයට අයත් වේ.

ක්ෂෙත්‍රය පිළිබඳව බණ්ඩාර මහතා සතුව පවතින දැනුම හා ක්‍රමෝපායික ප්‍රවේශය උපයෝගී කරගනිමින් මෙහෙයුම් විශිෂ්ටතාවය හා තිරසර වර්ධනය උදෙසා සුවිශේෂී කාර්යභාරයක් ඔහු විසින් ඉටු කරනු ලබයි.

**ෂෙහාරා නවරත්න මහත්මිය**
**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**

# කළමනාකාරීත්ව කමිටුව

| | |
|---|---|
| අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික) | **සභාපති** |
| ඉංජිනේරු හේරත් එම් පී ජයවර්ධන | **උප සභාපති** |
| ඉංජිනේරු ටී කේ ජී එල් හේමචන්ද්‍ර | **කළමනාකාර අධ්‍යක්ෂ** |
| ඩී එල් ආර් වීරසිංහ මහතා | **අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)** |
| ඩබ්. එම් නලින් අපෝන්සු මහතා | **අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පරිපාලන/මානව සම්පත් කළමනාකරණ)** |
| ජේ ඒ චන්ද්‍රරත්න මහතා | **අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (තාක්‍ෂණ)** |
| ජී වී ටී නානායක්කාර මහතා | **අධ්‍යක්ෂ (තාක්‍ෂණ)** |
| ජී ඉසෙඩ් මිස්කින් මහත්මිය | අධ්‍යක්ෂ (මෙහෙයුම්) |
| ජී එන් ලියනගේ මහත්මිය | **අධ්‍යක්ෂ (මුදල්)** |
| කපිතාන් කේ එම් එන් පී සිල්වා | **හාබර් මාස්ටර්** |
| එච් ජේ කේ යූ කුමාර මහතා | **අධ්‍යක්ෂ (අළෙවි හා ව්‍යාපාර සංවර්ධන)** |
| නිර්මාල් ද ෆොන්සේකා මහතා | **අධ්‍යක්ෂ (සේවා සැපයුම්)** |
| එම් ආර් එම් රම්සීන් මහතා | **අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)** |
| එයාර් වයිස් මාෂල් එම් ඩී ජේ වාසගේ | **අධ්‍යක්ෂ (ආරක්ෂක)** |
| අපර්ණා තිලකරත්න මහත්මිය | **ප්‍රධාන නීති නිලධාරිනී** |
| ඩී ජී ආර් එම් පතිවිල මහතා | **ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්)** |
| විත්‍රාල් ජයවර්ණ මහතා | **ප්‍රධාන කළමනාකරු (සන්නිවේදන හා මහජන සබඳතා)/** අළෙවි හා ව්‍යාපාර සංවර්ධන |
| ටී සී කේ පරණවිතාන මහතා | **ප්‍රධාන ඉංජිනේරු (සිවිල්)** |
| එෆ් එම් හුසේන් මහත්මිය | **ප්‍රධාන ඉංජිනේරු ( සැලසුම් හා සංවර්ධන)** |
| කේ එස් හෙට්ටිආරච්චි මහතා | **ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික වැඩ)** |
| එල් පී එස් චන්දන මහතා | **ප්‍රධාන මෙහෙයුම් කළමනාකරු (බහළු මෙහෙයුම්)** |
| එන් එන් ජේ ඒ කුමාර මහතා | **ප්‍රධාන ඉංජිනේරු (නාවික)** |
| සී එල් දසනායක මහතා | **ප්‍රධාන ඉංජිනේරු (සංවර්ධන)** |
| ජී එච් ආර් පෙරේරා මහත්මිය | **ප්‍රධාන අභ්‍යන්තර විගණක** |
| එම් වී එස් ප්‍රනාන්දු මහතා | **ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ)** |
| ඒ බී එම් අස්වර් මහතා | **ප්‍රධාන අභ්‍යාස කළමනාකරු** |
| පී පී ප්‍රදීප් නිශාන්ත මහතා | **ප්‍රධාන මෙහෙයුම් කළමනාකරු (සාම්ප්‍රදායික නැව්බඩු)** |
| ඩබ් පී එස් පෙරේරා මහතා | **ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්)** |
| ප්‍රසාද් සුභවික්‍රම මහතා | **ප්‍රධාන කළමනාකරු (පරිශ්‍ර හා දේපළ කළමනාකරණ)** |
| ටී ආර් ඩබ්. ඇලපාත මහතා | **ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා)** |

# කළමනාකාරීත්ව කමිටුව

| | |
|---|---|
| එම් එම් පී එම් ගුණරත්න මහත්මිය | **ප්‍රධාන මුදල් කළමනාකරු** |
| කේ ඒ කේ එම් ඩබ් වීරසිංහ මහතා | **නේවාසික කළමනාකරු (ත්‍රිකුණාමලය)** |
| යූ එල් ඩී චාමිකර සිල්වා මහතා | **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)** |
| ආර් ඒ පී පී රූපසිංහ මහතා | **ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ)** |
| වෛද්‍ය පී ජී පී පී කන්දෙගෙදර | **ප්‍රධාන වෛද්‍ය නිලධාරී** |
| කපිතාන් එස් බී වයි එම් වයි ලක්ෂි වසන්ත | **අතිරේක හාබර් මාස්ටර්** |
| ආර් එල් අනුර ශාන්ත මහතා | **ප්‍රධාන කළමනාකරු (පරිපාලන)** |
| එම් ජී සරත් කුමාර මහතා | **නේවාසික කළමනාකරු (ගාල්ල)** |

**2024 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වෙනස්වීම්**

**විශ්‍රාම ගැනීම්**

**නෙළුම් අනවරත්න මහත්මිය,** ප්‍රධාන කළමනාකරු (පරිපාලන) ශ්‍රී ලංකා වාරය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.
**කේ ජී එස් දයානන්ද මහතා,** අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) ශ්‍රී ලංකා වාරය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.
**එම් පී මදාරසිංහ මහත්මිය,** ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති) ශ්‍රී ලංකා වාරය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.
**මේජර් ජෙනරාල් සුදත් පෙරේරා ,** අධ්‍යක්ෂ (ආරක්ෂක) ඔහුගේ ධූර කාලය අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.

**පත් කිරීම්**

**ඉංජි. ටී කේ ජී එල් හේමචන්ද්‍ර මහතා** කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
**ජී ඉසෙඩ් මිස්කින් මහත්මිය,** අධ්‍යක්ෂ (මෙහෙයුම්) ලෙස පත් කරන ලදී.
**එච් ජේ කේ යූ කුමාර මහතා,** අධ්‍යක්ෂ (අලෙවි හා ව්‍යාපාර සංවර්ධන) ලෙස පත් කරන ලදී.
**නිර්මාල් ද ෆොන්සේකා මහතා,** අධ්‍යක්ෂ (සේවා සැපයුම්) ලෙස පත් කරන ලදී.
**එම් ආර් එම් රම්සීන් මහතා,** අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) ලෙස පත් කරන ලදී.
**එයාර් වයිස් මාෂල් එම් ඩී ජේ වාසගේ,** අධ්‍යක්ෂ (ආරක්ෂක) ලෙස පත් කරන ලදී.
**ඒ බී එම් අස්වර් මහතා,** ප්‍රධාන පුහුණු කළමනාකරු ලෙස පත් කරන ලදී.
**පී පී ප්‍රදීප් නිශාන්ත මහතා,** ප්‍රධාන මෙහෙයුම් කළමනාකරු සාම්ප්‍රදායික නැව්බඩු) ලෙස පත් කරන ලදී.
**ඩබ් පී එස් පෙරේරා මහතා,** ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්) ලෙස පත් කරන ලදී.
**ටී ආර් ඩබ් ඇලපාත මහතා,** ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා) ලෙස පත් කරන ලදී.
**එම් එම් පී එම් ගුණරත්න මහත්මිය,** ප්‍රධාන මුදල් කළමනාකරු ලෙස පත් කරන ලදී.
**ආර් එල් අනුර ශාන්ත මහතා,** ප්‍රධාන කළමනාකරු (පරිපාලන) ලෙස පත් කරන ලදී.
**යූ එල් ඩී චාමිකර සිල්වා මහතා,** ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) ලෙස පත් කරන ලදී.
**කේ ඒ කේ එම් ඩබ් වීරසිංහ මහතා,** නේවාසික කළමනාකරු (ත්‍රිකුණාමලය) ලෙස පත් කරන ලදී.
**එම් ජී සරත් කුමාර මහතා,** නේවාසික කළමනාකරු (ගාල්ල) ලෙස පත් කරන ලදී.
**කපිතාන් එස් බී වයි එම් වයි ලක්ෂි වසන්ත මහතා,** අතිරේක හාබර් මාස්ටර් ලෙස පත් කරන ලදී.

## ව්‍යාපාර සංවර්ධන

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මගින් මේ වසරේදී මෙහෙයවන ලද නැව්බඩු ධාරිතාවයේ සැලකිය යුතු වෙනස්කම් අත්කර ගැනීමෙහිලා අළෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන කොට්ඨාශය සුවිශේෂී කාර්යභාරයක් ඉටුකර ඇත. කොළඹ නැගෙනහිර බහළු පර්යන්තය හා මෑතකාලීනව සංවර්ධනය කරන ලද ජය බහළු පර්යන්ත V (JCT –V) ක්‍රියාකාරී ලෙස ප්‍රවර්ධනය කිරීම මගින් ඉහළ ධාරිතාවයක් සහිත නෞකා සේවා සාර්ථකව ආකර්ෂණය කර ගෙන ඇත. විශේෂයෙන් අප්‍රිකාව සම්බන්ධ සේවා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත හඳුන්වාදී ඇති අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවන ලද විශාලතම නෞකාව නැගෙනහිර බහළු පර්යන්තය වෙත ගෙන එන ලදී. මෙම වැදගත් අවස්ථාවෙන් ධෛර්යමත් වීමෙන්, ඊට සමාන විශාල නෞකා වර්තමානයේදී නිතිපතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත පැමිණේ.

මීට අමතරව 2024 වසර තුළ ගන්නා ලද අළෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන ක්‍රියාමාර්ගයන්හි සාර්ථකත්වය හේතුකොටගෙන නෞකා සේවා වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වලට නව සේවා හඳුන්වාදීමට එකඟවී ඇත. කැපීපෙනෙන කරුණක් නම්, මීට පෙර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත සේවා ලබා නොගත් ලෝකයේ ඉහළ පෙළේ නෞකා සේවා ඉදිරි වසර තුළ දී වරාය අධිකාරියේ පර්යන්ත යොදවා මෙහෙයුම් ආරම්භ කිරීමට මේ වන විට සූදානම්ව ඇත. මීට අමතරව ,එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කීර්තිමත් නෞකා සේවාවන්ගේ ප්‍රාදේශීය කාර්යාල වෙත ගොස් ඒවායෙහි ප්‍රධානීන් සමඟ සාර්ථක සාකච්ඡා පවත්වන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වලට නව සේවා ගෙන ඒමේදී මෙම සම්බන්ධතාවයන් ඵලදායී වී ඇත. මෙම ප්‍රතිඵල 2024දී ක්‍රියාත්මක කරන ලද නවෝත්පාදක අළෙවිකරණ ක්‍රමෝපායන්හි ඍජු ප්‍රතිඵලයක් වේ. 2024 වර්ෂයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත තුළ වාර්තා වන ලද ජයග්‍රහණ සැලකිය යුතු මට්ටමක පවතී. බහළු නෞකා 3,522 ක් පැමිණි අතර සාම්ප්‍රදායික නැව්බඩු නෞකා පැමිණීම 68.8% කින් සැලකිය යුතු ලෙස වර්ධනය වන ලදී.

කොළඹ වරාය විස්සේ සම ඒකක 7,792,069 ක සමස්ත බහළු මෙහෙයුම් ධාරිතාවයක් වාර්තා කළ අතර මෙය පෙර වසරේ වාර්තා කරන ලද විස්සේ සම ඒකක 6,949,912 ට සාපේක්ෂව 12.1% ක වර්ධනයකි. මෙම විස්සේ සම ඒකක මිලියන 7.7 ක ධාරිතාවය කොළඹ වරාය විසින් අත්පත් කර ගන්නා ලද ඉහළම බහළු මෙහෙයුම් ධාරිතාවය වේ. වෙන් වෙන් වශයෙන් දත්ත සලකා බැලීමේදී ජය බහළු පර්යන්තය හා නැගෙනහිර බහළු පර්යන්තය ඒකාබද්ධව විස්සේ සම ඒකක 2,413,162 ක් මෙහෙයවන ලද අතර, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් මගින් විස්සේ සම ඒකක 2,025,840 ක් සහ කලම්බු ඉන්ටර්නැෂනල් ටර්මිනල් මගින් විස්සේ සම ඒකක 3,353,067 ක් මෙහෙයවන ලදී.

කොළඹ වරායේ මෙහෙයවන ලද ටොන් ප්‍රමාණය 114,593,910 දක්වා වර්ධනය වූ අතර එය පෙර වසරේ ධාරිතාවය වූ ටොන් 99,673,588 හා සැසඳීමේදී 15% ක වර්ධනයක් සනිටුහන් කෙරේ. තොග කඩන නැව් බඩු මෙහෙයුම් 193.5% ක සුවිශාල වර්ධනයක් අත්පත් කර ගන්නා ලද අතර ද්‍රව තොග නැව් බඩු ටොන් ප්‍රමාණය 8.5% කින් සහ වියළි තොග ටොන් ප්‍රමාණය 24.5% කින් වර්ධනය වන ලදී. මීට අමතරව, මෙම කාලසීමාව තුළදීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත තුළ මෙහෙයුම් කරන ලද බහළුම්ගත නැව්බඩු ටොන් ප්‍රමාණය 30.4% කින් වර්ධනය වන ලදී.

සමුද්‍රීය කර්මාන්තයේ වර්ධනය වෙමින් පවතින ඩිජිටල් අළෙවිකරණයේ වැදගත්කම හඳුනාගනිමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අළෙවි කණ්ඩායම 2024 වර්ෂයේදී "Connect X" නමින් ඩිජිටල් අළෙවිකරණ සම්මුඛ සාකච්ඡා මාලාවක් දියත් කරන ලදී. මෙම සම්මුඛ සාකච්ඡා මාලාව මගින් විශේෂයෙන්ම නැව් සමාගම්වල සුවිශේෂී තනතුරු දරන්නන් වශයෙන් පෙනීසිටින සමුද්‍රීය කර්මාන්තයේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීමේ වේදිකාවක් නිර්මාණය වී ඇත. මෙම වැඩපිළිවෙල මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල LinkedIn පිටුව ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා

## ව්‍යාපාර සංවර්ධන

මහජන සම්බන්ධතා කොට්ඨාශයේ සහයෝගය ඇතිව Facebook" සහ Youtube ඔස්සේ අළෙවි ව්‍යාපාර පවත්වාගෙන යන ලදී.

වරායේ අනෙකුත් පර්යන්ත සමඟ සමීපව කටයුතු කිරීම මගින් කොළඹ වරාය ගෝලීය වශයෙන් උසස් මට්ටමකට ගෙන ඒම අපගේ උත්සාහයයි. ජාත්‍යන්තර නැව් සමාගම් ප්‍රධානීන් මෙන්ම දේශීය සමුද්‍රීය හා සේවා සැපයුම් පාර්ශ්වකරුවන් සහභාගී වූ ඉතා සාර්ථකව සංවිධානය කළ වරාය සම්මාන උළෙල 2024 වසරේ කැපීපෙනෙන එක් ප්‍රධාන අවස්ථාවක් විය. මෙම ගෞරවනීය අවස්ථාවේදී කොළඹ වරායේ මෙහෙයුම් සිදු කරන ප්‍රධාන නෞකා සේවා හා පෝෂක නෞකා සේවා 10ක් ඇගයීමට ලක්කර සම්මාන ප්‍රදානය කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ සමුද්‍රීය ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා දේශීය විශ්වවිද්‍යාල හා ආයතන සඳහා ආසන්න වශයෙන් වරාය නැරඹීමේ අවස්ථා 100ක් සංවිධානය කරන ලදී. මෙම නැරඹීම් අවස්ථා තුළින් සමුද්‍රීය හා සේවා සැපයුම් ක්ෂේත්‍රයේ නියැලි ශිෂ්‍යයින්ට හා පාර්ශ්වකරුවන්හට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් පිළිබඳ ප්‍රායෝගික අවබෝධය සෘජුවම ලබා දෙන ලදී .එසේම, විදේශ තානාපති නිලධාරීන්, ආයෝජකයින් හා නැව් සමාගම් ප්‍රධානීන් ඇතුළුව ජාත්‍යන්තර නියෝජිත කණ්ඩායම් වලට වරාය නැරඹීම සඳහා පහසුකම් සලසා දෙන ලදී.

අපගේ ජාත්‍යන්තර අළෙවිකරණ ක්‍රමෝපායේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අළෙවි හා ව්‍යාපාර ප්‍රවර්ධන කොට්ඨාශයේ නිලධාරීන් චීනයේ Tianjin Maritime Exhibition හා Saudi Maritime Forum හිදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී. එසේම ටියැන්ජින් වරාය, එක්සත් ජනපදයේ Virginia Norfolk පර්යන්ත සහ දකුණු කොරියාවේ සමුද්‍රීය විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීතා ගිවිසුම් ඇතුළුව ක්‍රමෝපායික හවුල්කාරීත්වයන් කිහිපයක් ආරම්භ කරන ලදී. මෙම සහයෝගීතාවයන් හරහා අපගේ මෙහෙයුම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා ගෝලීය වශයෙන් සමුද්‍රීය සම්බන්ධතාවයන් තවදුරටත් වර්ධනය කර ගැනීම අරමුණු කොට ඇත.

# 2024
# සංවර්ධන ව්‍යාපෘති

# සංවර්ධන ව්‍යාපෘති

ගෝලීය මට්ටමේ සමුද්‍රීය යටිතල පහසුකම් දියුණු කිරීමට මෙන්ම ශ්‍රී ලංකාවේ වරායයන්හි ශක්‍යතාවයන් පුළුල් කිරීමෙහිලා ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැපවීමෙන් කටයුතු කරනු ලැබේ. රටේ සමුදීය ක්ෂේත්‍රය දියුණු කිරීම හා සංවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අඛණ්ඩ ප්‍රයත්නය, 2024 වර්ෂය තුළ සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් මගින් ගන්නා ලද සාර්ථක පියවර මගින් වඩාත් පැහැදිලි වේ. ක්‍රමෝපායික හවුල්කාරීත්වය හා තිරසර සංවර්ධන මොඩල වර්ධනය කිරීම මගින් ගෝලීය වෙළඳාමේ වර්ධනය වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා ආර්ථික වර්ධනය වේගවත් කිරීම මෙම පියවර තුළින් අරමුණු කෙරේ.

## 1. නැගෙනහිර බහළු පර්යන්තය - අදියර II

### 1.1 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැගෙනහිර බහළු පර්යන්තය සඳහා උපකරණ ප්‍රසම්පාදනය කිරීම

නැගෙනහිර බහළු පර්යන්තය සඳහා නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 12 ක් සහ රේල් පීලි මත සවිකර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 40 ක් පිරිසැකසුම් කිරීම සඳහා වන ගිවිසුමට කොන්ත්‍රාත්කරු වන Shanghai Zhenhua Heavy Industries Co. Ltd., සමඟ 2021.12.20 දින අත්සන් තබන ලදී. කෙසේ වුවද, මෙම කාලසීමාව තුළ රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ලංකා බැංකුව විසින් අත්තිකාරම් ගෙවීම ප්‍රමාද වීමෙන් පිරිසැකසුම් වැඩ 2022.12.01 දින ආරම්භ කරන ලදී.

මේ වන විට, පළමු තොගයට නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 06 ක් සහ රේල් පීලි මත සවිකර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 20 ක් ලැබී ඇති අතර, දෙවැනි දොඹකර තොගය ලෙස (නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 03 ක් සහ රේල් පීලි මත සවිකර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 06 ක්) 2025 ජනවාරි මස ලැබීමට නියමිත අතර ඉතිරිය ප්‍රතිශෝධිත උපලේඛනය අනුව 2025 මැද භාගයේදී ලැබීමට නියමිතය. දැනටමත් ලැබී ඇති නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර සවි කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර පෙර භාවිතා කරන ලද රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකර හා ප්‍රයිම් මූවර් රථ සමඟ දැනට පවත්නා අංගණය තුළ මෙහෙයුම් සිදු කරනු ලැබේ. නැගෙනහිර බහළු පර්යන්ත ව්‍යාපෘතියේ සිවිල් වැඩ කොන්ත්‍රාත්කරු විසින් නව අංගණයේ ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර සඳහා වන රේල් පීලි සවි කර අවසන් කළ පසු රේල් පීලි මත සවිකර ඇති නව ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර සවි කිරීම පියවරින් පියවර 2025 වසරේ මුල් කාර්තුව තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

2024.12.31 දිනට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

| **ව්‍යාපෘතියේ නම** | **ව්‍යාපෘති පිරිවැය (රු. මිලියන)** | **2024.12.31 දිනට සමුච්චිත භෞතික හා මූල්‍ය ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **භෞතික ප්‍රගතිය (%)** | **මූල්‍ය ප්‍රගතිය (එ.ජ.ඩො. මිලියන)** |
| නැගෙනහිර බහළු පර්යන්තය - උපකරණ ප්‍රසම්පාදනය කිරීම - නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන දොඹකර 12 ක් සහ රේල් පීලි මත සවිකර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 40 ක් | එක්සත් ජනපද ඩොලර් මිලියන 282 | 89% (පිරිසැකසුම් - 68%) | එක්සත් ජනපද ඩොලර් මිලියන 183.664 |

### 1.2 නැගෙනහිර බහළු පර්යන්තය අදියර - II - සිවිල් වැඩ

| අංකය | අපේක්ෂිත ප්‍රතිඵල | භෞතික ප්‍රගතිය (%) | | |
|---|---|---|---|---|
| | | 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | 2024 වර්ෂය තුළ ප්‍රගතිය | 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය |
| 1 | සාමාන්‍ය අයිතමයන් | 77% | 11% | 88% |
| 2 | හැරීම සහ ගොඩ කිරීම | 67% | 12% | 79% |
| 3 | ජැටි බැම්ම ඉදිකිරීම | 19% | 42% | 61% |
| 4 | ගොඩබිම පැත්තේ සවි කරන ලද දොඹකර බාල්කය | 5% | 22% | 27% |
| 5 | රැඳවුම් බැම්ම ඉදිකිරීම | 0% | 0% | 0% |
| 6 | බහළු අංගණය ඉදිකිරීම | 8% | 23% | 31% |
| 7 | ජල හා ගිනි නිවාරණ සේවා | 0% | 62% | 62% |
| 8 | විදුලි, දත්ත හා සන්නිවේදන පද්ධතිය | 2% | 19% | 21% |
| 9 | වැසි ජලය බැසයාම සඳහා කාණු ඉදිකිරීම | 6% | 18% | 24% |
| | **සමස්ත ප්‍රගතිය** | **25%** | **20%** | **45%** |

### 1.3 කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තය සඳහා මෙහෙයුම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම - සිවිල් වැඩ

අමාත්‍ය මණ්ඩල අනුමැතියට හා ශ්‍රී ලංකාවේ ජාතික වරාය ප්‍රධාන සැලැස්මට අනුකූලව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැගෙනහිර බහළු පර්යන්තය අදියර - II ආරම්භ කර ඇති අතර ඉදිකිරීම් වැඩ සිදු කෙරෙමින් පවතී. නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර II හි මෙහෙයුම් ජූලි මාසයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමේ අදහස ඇතිව මෙහෙයුම් කටයුතු සිදු කරන කාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩල සඳහා මෙන්ම මෙහෙයුම් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සඳහා ඉඩකඩ සැලසීම පිණිස මහල් හතරකින් යුත් මෙහෙයුම් ගොඩනැගිල්ල සැලසුම් කර ඇත.

ආසන්න වශයෙන් වර්ග මීටර් 4,500 ක වපසරියකින් යුත් තට්ටු හතරක ගොඩනැගිල්ලකි. රුපියල් මිලියන 499 ක ටෙන්ඩරය ASSET-AMSK හවුල් ව්‍යාපාරය වෙත ප්‍රදානය කර ඇත. මෙහි ඉදිකිරීම් වැඩ 2023 ජූනි 21 දින වැඩ ආරම්භ කර ඇති අතර 97% ක පමණ වැඩ නිම කොට ව්‍යාපෘතිය අවසන් කිරීමට ආසන්නව පවතී. වහල ටෙරසයේ ඉතිරි වැඩ සිදු කෙරෙමින් පවතී.

### 1.4 කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තය සඳහා මෙහෙයුම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම - නිමා කිරීමේ හා විවිධ වැඩ

නැගෙනහිර බහළු පර්යන්තය සඳහා ඉදිකිරීමට නියමිත ඉහත සඳහන් සිව් මහල් මෙහෙයුම් ගොඩනැගිල්ලේ ප්‍රධාන වශයෙන් නිමා කිරීමේ හා විවිධ වැඩ මෙම ව්‍යාපෘති වැඩ වලට ඇතුළත් වේ.

කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 202 ක කොන්ත්‍රාත් මිලකට M/s S D S Construction සමාගම වෙත ප්‍රදානය කරන ලදී. එහි ඉදිකිරීම් වැඩ 2023.11.02 දින ආරම්භ කර ඇති අතර සෝපානයේ වැඩ, පොළව මට්ටම් කිරීමේ වැඩ, පින්තාරු වැඩ, සිවිලිම සවි කිරීම සහ ගොඩනැගිල්ලේ අභ්‍යන්තර කොටස් වෙන් කිරීමේ වැඩ (Partitioning) අවසන් කර ඇති ප්‍රධාන කාර්යයන් වේ. 97% වැඩ අවසන් කිරීමට ආසන්නව ඇත. බිත්ති පින්තාරු කිරීමේ ඉතිරි වැඩ සිදු කෙරෙමින් පවතී.

## 2. බටහිර බහළු පර්යන්තය - I (WCT – I)

කොළඹ දකුණු වරායේ බටහිර බහළු පර්යන්තය පර්යන්තය - I ව්‍යාපෘතිය අති විශාල බහළු නෞකා මෙහෙයවීම සඳහා වරායේ ධාරිතාවය පුළුල් කිරීමේ අරමුණ සහිත සුවිශේෂී යටිතල පහසුකම් ව්‍යාපෘතියකි. මීටර් 400 ක් හෝ ඊට වඩා වැඩි දිගින් හා මීටර් 20 ක ගැඹුරින් යුත් අති විශාල බහළු නෞකා තුනකට පහසුකම් සැපයීමට හැකිවන ලෙස සැලසුම්කරන ලද මීටර් 1400 ක් දිග ජැටි බැම්මක් සහිත පර්යන්තයකි. මෙම පර්යන්තය ආසන්න වශයෙන් හෙක්ටයාර 65 ක වපසරියක් ආවරණය කරන අතර බහළු විස්සේ සම ඒකක මිලියන 3.0 ක වාර්ෂික බහළු මෙහෙයුම් ධාරිතාවයක් සතු වනු ඇත.

මෙම ව්‍යාපෘතිය වසර 35 ක් සඳහා ඉදිකර මෙහෙයුම් කර පවරා දීමේ (BOT) පදනම යටතේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් ලෙස සංවර්ධනය කෙරෙනු ලැබේ. මෙම හවුල් ව්‍යාපාරයට ශ්‍රී ලංකා වරාය අධිකාරිය, Adani Ports Special Economic Zone Ltd., සමාගම ඔවුන්ගේ දේශීය පාර්ශ්වකරු වන John Keells Holdings PLC සමාගම (APSEZ Consortium) ඇතුළත් වේ. බටහිර බහළු පර්යන්තය - I සංවර්ධනය කර මෙහෙයුම් කිරීමේ වගකීම සහිත පර්යන්ත මෙහෙයුම්කරු ලෙස කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්ත (පුද්.) සමාගම (CWIT) නමින් සමාගමක් ඒකාබද්ධ කර ඇත.

ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ ගිවිසුම, කොටස්හිමියන්ගේ ගිවිසුම, වැඩබිම් කල්බදු ගිවිසුම හා ණය හිමි ඍජු ගිවිසුම ඇතුළු ප්‍රධාන ගිවිසුම් පිළිවෙලින් 2021.09.30 හා 2022.02.25 යන දිනයන්හි ක්‍රියාත්මක කරන ලදී. ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ කොන්ත්‍රාත්තුව 2022.02.26 දින සිට බලපැවැත්වෙන ලදී.

2024.12.31 දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 75% කි. ප්‍රධාන කාර්යයන්වල ප්‍රගතිය සවිස්තරාත්මකව පහත දැක්වේ.

| ප්‍රධාන කාර්යයන් | 2024.12.31 දින භෞතික ප්‍රගතිය |
|---|---|
| ගොඩකර සංවර්ධනය කිරීම | 100% |
| හැරීම | 98% |
| සමුද්‍රීය වැඩ - ජැටි බැම්ම හා රැඳවුම් බැම්ම | 72% |
| භූමිය වැඩි දියුණු කිරීම හා සුදානම් කිරීම | 73% |
| ඉදිකිරීම් වැඩ | 59% |
| උපස්ථ අංගණ වැඩ | 67% |

## 3. බටහිර බහළු පර්යන්තය - II සඳහා දියකඩනය දීර්ඝ කිරීම

ජාතික වරාය ප්‍රධාන සැලැස්ම - 2019 ට අනුව, බටහිර බහළු පර්යන්තය II නිර්මාණය කිරීම සඳහා කොළඹ දකුණු වරායේ බටහිර දියකඩනය දීර්ඝ කිරීම මෙම සංවර්ධන කාර්යයෙහි මීලඟ අදියරට ඇතුළත් වේ. බටහිර බහළු පර්යන්ත - II පිටුපසින් හෙක්ටයාර 50 – 70 භූමි ප්‍රදේශයක් ඇතුළත් වන පරිදි මෙම දියකඩනය තවදුරටත් ගැඹුරු මුහුද දෙසට දීර්ඝ කෙරෙනු ඇත. විස්සේ සම ඒකක මිලියන 3.5 මෙහෙයුම් ධාරිතාවයක් සහිත මීටර් 20 ගැඹුරින් යුත් හා මීටර් 1200 – 1400 ක් දිග ජැටි බැම්මක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ.

සේවා සැපයුම් පහසුකම් සඳහා WCT – II පර්යන්තය පිටුපස හෙක්ටයාර 50 – 70 භූමි ප්‍රදේශයක් සමඟ මීටර් 18 – 20 ගැඹුරින් යුතු මීටර් 2600 – 2800 දිග ඒකාබද්ධ ජැටි බැම්මක් කොළඹ වරාය සතු වනු ඇත. (WCT – I සහ WCT II) දියකඩනය දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘතිය ආරම්භයේ සිට වසර 5 ක කාලයක් ගතවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2028 වසරෙන් පසුව ඇති වියහැකි ධාරිතා සීමා හා ව්‍යාපාර පාඩු ඇතිවීමේ විභව්‍යතා වළකාලීම සඳහා 2030 වසරේදී මෙහෙයුම් ආරම්භ කිරීමේ ඉල්ක්කය ඇතිව 2025 වසරේදී බටහිර බහළු පර්යන්ත - II ආරම්භ කිරීම අත්‍යාවශ්‍ය වේ.

සාධාරණ අධ්‍යයනයක් සිදු කර අවසන් කර ඇතත් මෙම ව්‍යාපෘතිය වර්තමානයේ දී සංකල්පමය අදියරේ පවතී. සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් අවශ්‍යවන අතර ඒ සඳහා ආසන්න වශයෙන් වසර 2 ක් ගතවනු ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය ඇතිව මෙම අධ්‍යයනය සඳහා උපදේශකයෙකු තෝරා ගැනීම පිණිස ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම උදෙසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. ප්‍රසම්පාදන ආයතනය ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය අභිප්‍රාය ප්‍රකාශ කිරීම හා යෝජනා සඳහා ඉල්ලීම් (RFP) ක්‍රියාවලිය අවසන් කර ඇති අතර යෝජනා සඳහා ඉල්ලීම්හි තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් සිදු කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන උපදේශක කමිටුව විසින් කොන්ත්‍රාත්තුව ඉහළ මට්ටමේ ශ්‍රේණිගත උපදේශක සමාගමට පිරිනැමීමට නිර්දේශ කර ඇත. තෝරාගත් උපදේශක සමඟ කොන්ත්‍රාත්තුවේ සාකච්ඡා සම්මුතීන් ඇති කර ගැනීම අවසන් කර ඇත. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැත.

### 4. ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

ගාල්ල වරාය කලාපීය වාණිජ වරායක් ලෙස එහි මෙහෙයුම් අඛණ්ඩව සිදු කරන අතරම සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කිරීම ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම සංවර්ධන ව්‍යාපෘතිය විනෝදාස්වාද කටයුතුවල සහ ඉඩම් දේපළ සංවර්ධන කටයුතුවල පෞද්ගලික අංශය විසින් කරනු ලබන ආයෝජන සාම්ප්‍රදායික වරාය සේවා සමඟ ඒකාබද්ධ කරමින් තිරසර ආකෘතියක් ලෙස සැලසුම් කර ඇත. ගාල්ල බොක්කේ ක්‍රමෝපායික භූගෝලීය වාසි උපයෝගී කර ගනිමින් සුවිශේෂී ආයෝජනයන් ආකර්ෂණය කර ගැනීමටත් ප්‍රදේශයේ ආර්ථිකමය ශක්‍යතාවය පුළුල් කර ගැනීමටත් මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ.

- ගැඹුරු මුහුද මගී පර්යන්තයක් ඉදිකිරීම
- රැඳවුම් බැම්ම හා දියකඩන සංවර්ධනය
- පිවිසුම් ඇළ හා ද්‍රෝණිය කැණීම
- ඉඩම් ගොඩකර සංවර්ධනය කිරීම හා පසුව ගොඩකර සංවර්ධනය කරන ලද ඉඩමේ මිශ්‍ර භාවිත සංවර්ධනය සිදු කිරීම
- අතිරේක වරාය ආශ්‍රිත පහසුකම් ස්ථාපිත කිරීම

යෝජිත සංවර්ධන කාර්යයන්ට ඇතුළත් වේ.

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු එය සංචාරක වෙළෙඳ හා ආයෝජන අවස්ථා වැඩි දියුණු කරමින් ගාල්ල ප්‍රදේශයට මෙන්ම සමස්තයක් ලෙස මුළු ශ්‍රී ලංකාවේම ආර්ථික වර්ධනය සඳහා දායක වනු ඇත.

ආයෝජයෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් මෙම ව්‍යාපෘතිය සඳහා ලැබී ඇත.

- අභිප්‍රාය ප්‍රකාශ කිරීම (EOI) සාර්ථකව අවසන් කර ඇත.
- යෝජනා සඳහා ඉල්ලීම් (RFP) මේ වන විට සිදු කෙරෙමින් පවතී.

### 5. කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශක සේවාව ලබා ගැනීම

නැව්බඩු ධාරිතාවයේ ප්‍රක්ෂේපිත වැඩි වීම වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා නැගෙනහිර බහළු පර්යන්තය අදියර II සහ බටහිර බහළු පර්යන්ත - I ක්‍රියාත්මක කිරීමේ කටයුතු වර්තමානයේදී

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආරම්භ කර ඇත. මෙම පර්යන්ත ද්විත්වය නිම කිරීමෙන් පසු බටහිර බහළු පර්යන්ත II හි සංවර්ධන කටයුතු 2028 වසරේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. කොළඹ වරායේ බහළු ධාරිතාවය පිළිබඳ ප්‍රක්ෂේපනයන්ට අනුව, සමස්ත වරාය 2030 වසරේදී පූර්ණ ධාරිතාවයට ළඟාවනු ඇති බවට අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රක්ෂේපනයන්ට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ වරායේ උතුරු ප්‍රදේශයෙහි නව වරායක් ඉදිකිරීමට කටයුතු භාරගෙන ඇත. යෝජිත කොළඹ උතුරු වරාය මෝදර ප්‍රදේශයේ කැළණි ගඟේ සිට කොළඹ වරායේ උතුරු දියකඩනය දක්වා දීර්ඝ කිරීමට අපේක්ෂා කෙරේ. මෙම නව වරාය ද්‍රව තොග, වියළි තොග, රෝල් ඔන් රෝල් ඕෆ් (රෝ-රෝ) නැව්බඩු හා බහළු මෙහෙයුම් කිරීම සඳහා සැලසුම් කර ඇත. අවශ්‍යතාවය ඇතිවීමට පෙරාතුව යටිතල පහසුකම් හා වරාය සේවාවන් සැපයීම තහවුරු කරමින් වෙළෙඳපොල ඉල්ලුම මත පදනම්ව අදියර වශයෙන් කොළඹ උතුරු වරාය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කෙරෙනු ඇත.

මෙම පියවරෙහි වැදගත්කම හඳුනාගනිමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ආරම්භ කර ඇත. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයනු ලබන ප්‍රවාහන ව්‍යාපෘති ප්‍රාරම්භක පහසුකම් යටතේ AECOM Infrastructure හා Envirnoment UK Limited යන සමාගම් විසින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ.

උපදේශක විසින් ශක්‍යතා අධ්‍යයනය හා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව අවසන් කර ඇත. සංවර්ධන කාර්ය සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය මහජනතාවගේ අදහස් ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරන ලද අතර මහජනතාවගේ අදහස් එම වාර්තාවට මෙතෙක් ඇතුළත් කර නොමැත.

## 6. දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය (SAC & LH)

චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංග්ස් (CM Port) මගින් මෙහෙයවනු ලබන ආයෝජකයන් සමූහයක් විසින් දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය සංවර්ධනය කරමින් පවතී. දකුණු ආසියාවේ විශාලතම වාණිජ හා සේවා සැපයුම් සංකීර්ණය බවට පත් කරමින් සැලසුම් කරන ලද 530,000 ඝන අඩි (CBM) ගබඩා ධාරිතාවයක් සහිත තට්ටු 8 ක් හා වර්ග අඩි මිලියන 5 කින් යුත් සංකීර්ණයක් වනු ඇත.

දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයේ ඉදිකිරීම් හා මෙහෙයුම් සඳහා මූලික ගිවිසුම් ආයෝජනය කරනු ලබන සමාගම් ත්‍රිත්වය එනම් CM Port, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා Access Engineering PLC (Access) යන සමාගම්වල නියෝජිතයින් විසින් කොළඹ දී අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය වසර 50 ක් සඳහා ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ වැඩ පිළිවෙළක් ලෙස ක්‍රියාත්මක කරමින් පවතී.

වැඩබිම් කල්බදු ගිවිසුම 2023 ජූලි මස දී අත්සන් කරන ලද අතර භූමියෙන් කොටසක් කොන්ත්‍රාත්කරු වෙත භාර දී ඇත. වාහන ගමනාගමනය සඳහා ඇතිවන බලපෑම පිළිබඳ මූලික තක්සේරුව (TIA) අවසන් කර ඇති අතර ඉවත් කිරීම් සඳහා මූලික සැලසුම නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගෙන ඇත. මීට අමතරව, වෙරළ සංරක්ෂණ හා වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් සංවර්ධන කටයුතු සඳහා බලපත්‍ර ලබා ගෙන ඇත. වැඩ බිමෙහි භූවිද්‍යාත්මක සමීක්ෂණ හා සීමා වැට ඉදිකිරීමේ වැඩ මේ වන විට සිදු කෙරෙමින් පවතී.

## 7. තලෙමන්නාරම පියරය සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකා හා ඉන්දීය රජය අතර මගී යාත්‍රා සේවාවක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත. මෙම වැඩසටහනට අනුකූලව ප්‍රවාහන මහාමාර්ග වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය විසින් මගීන්

හා නැව් බඩු; විශේෂයෙන් කුඩා නැව් බඩු පාර්සල් යන අංශ දෙක සඳහා වරායක් ලෙස තලෙයිමන්නාරම වරාය සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කර ඇත. මෙම සංවර්ධන කාර්යය ශ්‍රී ලංකා රජයේ ක්‍රමෝපායික ප්‍රතිපත්ති මාලාවට අනුකූල වේ. වරාය යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා කෙටි කාලීන හා දීර්ඝ කාලීන ක්‍රමෝපායන් මෙම සංවර්ධන රාමුව මගින් ආවරණය කරනු ලැබේ.

වානේ තට්ටු සහිත කුළුණු මත ඉදිකරන ලද පවත්නා තලෙමන්නාරම පියරය සැලකිය යුතු ලෙස දිරාපත්වී ඇති අතර තට්ටු වල ව්‍යුහය සඳහා යොදා ගන්නා ලද වානේ හා කුළුණුවල ඉහළ කොටස් යන දෙකම දැඩි ලෙස අබල් තත්ත්වයේ පවතී. තලෙමන්නාරම හා දණුෂ්කොඩි අතර මගී යාත්‍රා සේවා ආරම්භ කිරීම සඳහා කඩිනමින් පියරය හා ආශ්‍රිත යටිතල පහසුකම් අළුත්වැඩියා කිරීම අත්‍යාවශ්‍ය වේ. මගීන් සම්බන්ධ මෙහෙයුම් කටයුතු සිදු කරන්නේ නම් අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් ද වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ.

මෙම සැලසුම් කරන ලද වරාය සංවර්ධන කාර්යයට සහාය දැක්වීම පිණිස පහත දැක්වෙන ප්‍රසම්පාදන කාර්යයන් ත්‍රිත්තවය මේ වන විට සිදු කෙරෙමින් පවතී.

**තලෙමන්නාරම ජැටිය හා ආශ්‍රිත වරාය යටිතල පහසුකම් සඳහා ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම.**

- අභිප්‍රාය ප්‍රකාශ කිරීම හා යෝජනා සඳහා ඉල්ලීම් ක්‍රියාවලිය අවසන් කර ඇත.
- මධ්‍යම ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණ කමිටුව විසින් සිදු කරන ලද ඇගයීමත් සමඟ උපදේශකවරයෙකු තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර ඇත.
- තෝරාගත් උපදේශක වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට රේඛීය අමාත්‍යාංශය අනුමත කර ඇති අතර කෙසේ වුවද, මේ වන තෙක් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොමැත.

**ආයෝජකයෙකු විසින් තලෙමන්නාරම වරාය සංවර්ධන කිරීම**

- විභව්‍ය ආයෝජකයින් සඳහා අභිප්‍රාය ප්‍රකාශ කිරීම් නිකුත් කරන ලද අතර එහි ඇගයීම් ක්‍රියාවලිය අවසන් කර ඇත.
- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් ආයෝජකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ කටයුතු මෙතෙක් අවසන් කර නොමැත.

**නව තලෙමන්නාරම පියරය ඉදිකිරීම - අදියර I**

- කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ලංසු ක්‍රියාවලිය අවසන් කර ඇත.
- ඉදිරිපත් කරන ලද ලංසු මේ වන විට ඇගයීමට ලක් කෙරෙමින් පවතී.

මෙම ව්‍යාපෘතීන් බාධාවකින් තොරව අඛණ්ඩව සිදු කිරීම තහවුරු කිරීම සඳහා ඊළඟ පියවර ආරම්භ කිරීම පිණිස උපදෙස් අපේක්ෂා කරමින් අමාත්‍ය මණ්ඩලය වෙත නව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

## 8. ජය බහළු පර්යන්තයේ ගැඹුරු නැංගුරම්පොල ධාරිතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (JCT – V) - සිවිල් වැඩ

මීටර් 330 කට වඩා වැඩි දිගින් යුත් නෞකා දෙකකට එකවර පහසුකම් සැලසීම සඳහා පවත්නා ජය බහළු පර්යන්ත IV බහළු ජැටි බැම්ම අවම අද්දර ගැඹුර මීටර් 16 (LWOST) සහිතව මීටර් 120 කින් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කරන ලදී. ජය බහළු පර්යන්තයේ මෙම සංවර්ධනය, කොළඹ වරායේ ජය බහළු පර්යන්තය වෙත පැමිණෙන විශාල බහළු නෞකා මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට තරඟකාරී වාසියක් ලැබෙනු ඇත.

ඒ අනුව, M/s China Harbour Engineering Company Ltd., වෙත ඉහත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ අතර 2020.11.16 දින අත්සන් කරන ලද පරිශිෂ්ටයට අනුව 2020.11.23 දින ව්‍යාපෘතියේ ආරම්භක දිනය බවට එකඟ විය. කොන්ත්‍රාත් ගිවිසුමේ (2018.11.29) ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 5,035 කි.

මෙම ව්‍යාපෘති ප්‍රමාණාත්මක ලෙස අවසන් කරන ලදී. අවසන් කරන දිනය 2024.05.15 වූ අතර නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර ස්ථාපනය කිරීමෙන් පසුව මෙහෙයුම් සඳහා නිදහස් කර ඇත.

**9. ත්‍රිකුණාමලය වරායේ ඉංජිනේරු වැඩබිම් ගොඩනැගිල්ල ඉදිකිරීම.**

ඉංජිනේරු කොට්ඨාශයේ සමස්ත කාර්ය මණ්ඩලය සහ අදාළ පහසුකම් ත්‍රිකුණාමලය වරායේ මෙහෙයුම් ගොඩනැගිල්ලට යාබදව ඇති එක් ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. අනවශ්‍ය ගමන් අවම කිරීමටත් දෛනික මෙහෙයුම්වලට ප්‍රමාදයන් සිදු වීමට අවම කිරීමටත් මෙලෙස වෙනත් ස්ථානයකට මාරුවීම මගින් අපේක්ෂා කරන ලදී.

ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩරය ඉඩම් සංවර්ධන සංස්ථාවට ප්‍රදානය කරන ලදී. ඉදිකිරීම් වැඩ 2023.04.03 දින ආරම්භ කරන ලද අතර 2024.08.15 දින අවසන් කරන ලදී. ව්‍යාපෘතිය ප්‍රමාණාත්මක ලෙස අවසන් කර ඇති අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ත්‍රිකුණාමලය වරාය වෙත භාර දී ඇත. සමස්ත කොන්ත්‍රාත් වටිනාකම රු. 252,851,266/- කි.

**10. ත්‍රිකුණාමලය වරායේ ජල සැපයුම් පද්ධතිය හා පොම්පාගාරය ඉදිකිරීම - පොම්පාගාරය ස්ථාපිත කිරීම.**

ත්‍රිකුණාමලය වරායේ ජලය සඳහා පවතින ඉල්ලුම සපුරාලීම සඳහා වසරේදී ඝන මීටර් 500 ක ධාරිතාවයකින් යුත් ජල පොම්පය 2020/2021 දී ඉදිකරන ලද අතර ඉදිකරන ලද ජල පොම්පය ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත අවශ්‍ය පීඩනය ඇති කරන පොම්ප පද්ධතිය හා නල ජලය ඉහත ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කිරීමට නියමිතව ඇත.

වරාය මෙහෙයුම් බාධාවකින් සිදු කරගෙන යාම සඳහා ප්‍රධාන වශයෙන් නෞකාවකින් ජලය පිටවන කාලය සඳහා නල සැපයීම හා ස්ථාපනය කිරීම අෂ්රෆ් ජැටිය සඳහා ජලනල එලීම සහ විදුලි හා ජලනල එලීම වැනි සේවාවන් සහ කාණු පද්ධතිය සමඟ කොන්ත්‍රාත්තුවේ කාර්යයන් වලට ඇතුළත් වේ.

මෙම කොන්ත්‍රාත්තුව M/s Puritas (Pvt) Ltd සමාගම වෙත ප්‍රදානය කරන ලද අතර ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව 2023 දෙසැම්බර් 02 දින වැඩබිම වෙත සේවකයින් යොදවා වැඩ ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය 2024.08.17 දින ප්‍රමාණාත්මක ලෙස වැඩ අවසන් කරන ලද අතර සමස්ත කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු44,040,795/- ක් විය.

**11. කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීම.**

කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ඉන්දියාවේ එක්සිම් බැංකුව විසින් එ.ජ.ඩො. මිලියන 45 ක මූල්‍ය දායකත්වයක් මගින් අරමුදල් සැපයීමෙන් සුවිශේෂී යටිතල පහසුකම් ව්‍යාපෘතියකි. කන්කසන්තුරය වරාය වාණිජ වරායක් ලෙස මෙහෙයුම් කිරීම සඳහා දියකඩනය හා පියරය ප්‍රතිසංස්කරණය කිරීම, නව වාණිජ නැංගුරම්පොල ඉදිකිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ.

මෙම ව්‍යාපෘතිය සඳහා එ.ජ.ඩො. මිලියන 45.27 ක මූල්‍ය සහායක් ලබා ගනිමින් ශ්‍රී ලංකා රජය හා ඉන්දියාවේ එක්ස්පෝට් ඉම්පෝට් බැංකුව සමඟ 2018.01.10 දින ඩොලර් ණය ගිවිසුමකට

එළැඹෙන ලදී. මෙම ව්‍යාපෘතිය උපදේශක කොන්ත්‍රාත්තුව හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව වශයෙන් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් හා උපදේශක සේවාව ලබා ගැනීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් Haskoning DHV Consulting Pvt., Ltd සමාගම සමඟ 2020.06.30 දින උපදේශක සේවා ගිවිසුම අත්සන් කරන ලදී. උපදේශක සේවා කටයුතු 2020.10.12 දින ආරම්භ කරන ලදී. 2024 දෙසැම්බර් වන විට, මූලික සැලසුම් කටයුතු, පූර්ව සුදුසුකම් ලේඛන සකස් කිරීම සහ සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සැකසීමේ කටයුතු අවසන් කරමින් 47% ක ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි. කෙසේ වුවද, ඇස්තමේන්තුගත අධි පිරිවැය සහ පූර්ව සුදුසුකම් ලේඛනය සඳහා ඉන්දියාවේ එක්සිම් බැංකුවේ අනුමැතිය නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතිය දැනට නවත්වා ඇත.

මෙම ගැටළුවට පිළියම් වශයෙන්, ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා ඉන්දියානු රජය විසින් එ.ජ.ඩො. මිලියන 63.65 ක ප්‍රදානයක් ලබා දීමට යෝජනා කර ඇත. මෙම ප්‍රදානය ලබා ගැනීම සඳහා ඉන්දියානු රජය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2024.04.29 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

මීට අමතරව, පවත්නා ඩොලර් ණය ගිවිසුම අවලංගු කරන ලෙස ඉන්දීය රජය වෙත ඉල්ලීමක් කර ඇත.

මේ වන විට අවබෝධතා ගිවිසුම අවසන් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ආධාර ලබා ගැනීම පිළිබඳ කටයුතු අවසන් වූ පසු ඉදිකිරීම් කාර්යයන් සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කෙරෙනු ඇත.

**12. කන්කසන්තුරය හා ඉන්දියාව අතර මගී ප්‍රවාහන සේවාව ආරම්භ කිරීම (පර්යේෂණාත්මක පදනමින්)**

කන්කසන්තුරය වරායේ මගී පර්යන්ත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කොට 2023.06.16 දින උත්සවාකාරයේන විවෘත කරන ලදී. මෙම පර්යන්තය බාහිරින් ලබා ගත් බිම් සෝව හරහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කොට්ඨාශය විසින් මේ වන විට මෙහෙයුම් කටයුතු සිදු කරමින් පවතී.

මෙම මෙහෙයුම්වල සාර්ථකත්වය හා අනාගතයේ ඇතිවන ඉල්ලුම මත පදනම්ව යාත්‍රා සහ මගී නෞකා මෙහෙයවීම පිණිස විශාල ප්‍රමාණයේ මගී පර්යන්ත මෙහෙයුම් කිරීම වෙනුවෙන් යෝජනා සඳහා ඉල්ලීම් නිකුත් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කර ඇත. අභිනවයෙන් ඉදිකරන ලද පර්යන්ත ගොඩනැගිල්ල භාවිතා කරමින් මගී ප්‍රවාහන මෙහෙයුම් සාර්ථකව සිදු වෙමින් පවතී.

**13. වරාය පිවිසුම් අධිවේගී ගුවන්මාර්ග ව්‍යාපෘතිය යටතේ සිදු කරන ව්‍යාපෘති**

වරාය පිවිසුම් අධිවේගී ගුවන්මාර්ග ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාකාරීව නියැලී සිටින කාර්යයන්ට,

- මාර්ග සංවර්ධන අධිකාරිය සහ වරාය පිවිසුම් අධිවේගී ගුවන්මාර්ග ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු සමඟ සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.
- නව වැඩබිම් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම

ඇතුළත් වේ.

වරාය පිවිසුම් අධිවේගී ව්‍යාපෘතිය හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩබිම් ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය විය. රුපියල් මිලියන 2,089 ක ඇස්තමේන්තුගත පිරිවැය (මිල ඉහළ යෑම ඇතුළුව) සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයන ලද අරමුදලින් ගොඩනැගිලි හතරකින් සමන්විත නව වැඩබිම් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකරන ලදී.

මෙම කොන්ත්‍රාත්තුව 2021.09.09 දින BEL-DGES JV සමාගම වෙත පිරිනමන ලද අතර ඉදිකිරීම් 2023 වසර අවසානයේදී අවසන් කරන ලදී. අවසන් බිල්පත් ගෙවීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

**සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යාල ගොඩනැගිල්ල)**

වරාය පිවිසුම් අධිවේගී ගුවන්මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලට පහසුකම් සැලසීම සඳහා සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙනත් ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීම සඳහා කැනල් යාඩ් ප්‍රදේශයේ මහල් 17 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම් සිදු කෙරෙමින් පවතී. ව්‍යාපෘතිය රුපියල් මිලියන 4,999 කට ඇස්තමේන්තුගත කර ඇති අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍ය පහසුකම් යොදවනු ලැබූ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ව්‍යාපෘති සම්බන්කරණය හා සේවා යෝජකයාගේ අවශ්‍යතාවය පිළිබඳ කටයුතු අවසන් කිරීමේ වගකීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දරණු ලැබේ. 2024.12.31 දිනට 48% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර 2025 මැයි මාසයේදී ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා ගෘහභාණ්ඩ මිලදී ගැනිම.**

සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය සඳහා ගෘහභාණ්ඩ අවශ්‍යතාවය පිළිබඳ කටයුතු අවසන් කිරීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ හා අභ්‍යන්තර අලංකරණ ශිල්පියෙකුගේ සේවාව ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. 3D මොඩලයක් හා පිරිවිතර මේ වන විට සකස් කරමින් පවතී. 2025 මැයි මාසය තුළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කිරීමෙන් පසුව ගෘහභාණ්ඩ ප්‍රසම්පාදනය කිරීම ආරම්භ කෙරෙනු ඇත.

## 14. වැඩහල් ගොඩනැගිලි සංකීර්ණයේ මාර්ග හා අංගන ගල් අතුරා තාර දැමීම

අභිනවයෙන් ඉදිකරන ල ද වැඩහල් ගොඩනැගිලි පරිශ්‍රයේ මාර්ග හා අංගන වලට ගල් අතුරා තාර දැමීමේ කටයුතු සඳහා ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 83 ක් (බදු රහිතව) වන අතර ව්‍යාපෘති කාලසීමාව දින 90 කි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන අතර 2024.04.29 දින ආරම්භ කරන ලදී. 2024.12.17 දින ව්‍යාපෘතිය අවසන් කරන ලද අතර අවසන් ගෙවීම 2025 දී නිදහස් කිරීමට නියමිතව ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති මගින් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කර්මාන්තයන්හි අනාගතය පිළිබඳ පැහැදිලි දැක්මක් පිළිඹිබු කරන අතර මෙම ව්‍යාපෘති යටිතල පහසුකම්වල වත්මන් අවශ්‍යතාවය වෙනුවෙන් පිළියම් සපයනු පමණක් නොව අනාගත අභියෝග හා අවස්ථාවන් වෙනුවෙන් ක්‍රමෝපායිකව සූදානම් වීමක් සිදු කෙරේ. වරාය ධාරිතාවය, මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා තිරසර පරිචයන් වැඩි දියුණු කිරීම තුළින් ගෝලීය සමුද්‍රීය වෙළෙඳාමේ වැදගත් ක්‍රියාකරුවෙකු ලෙස ශ්‍රී ලංකාවේ ස්ථානය තහවුරු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සූදානමින් සිටී. දැනට ක්‍රියාත්මකව පවතින පියවර සහ සාමූහික ප්‍රයත්නයන් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තිරසර ආර්ථික වර්ධනයක් හා අන්තර්ජාතික සම්බන්ධතාවයන් සඳහා අඛණ්ඩව අඩිතාලම දමමින් පවතී.

# 2024
# මෙහෙයුම් සමාලෝචනය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## බහළු මෙහෙයුම් කොට්ඨාශය

කොළඹ වරායේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවනු ලබන ජය බහළු පර්යන්තය හා නැගෙනහිර බහළු පර්යන්තය මගින් වරාය පරිශ්‍රය තුළදී පුද්ගලික පර්යන්ත මෙහෙයුම්කරුවන් හා ප්‍රාදේශීය තරඟකාරී මෙහෙයුම්කරුවන්ගේ දැඩි තරඟකාරීත්වය හමුවේ වුවද ස්වකීය වෙළෙඳපොල කොටස සාර්ථකව පවත්වාගෙන යාමට සමත්වී ඇත.

2024 වර්ෂයේදී, ජය බහළු පර්යන්තය බහළු විස්සේ සම ඒකක 1,913,445 ක් මෙහෙයුම් කළ අතර, නැගෙනහිර බහළු පර්යන්තය විසින් බහළු විස්සේ සම ඒකක 496,631 ක් මෙහෙයුම් කරන ලදී. 2023 වසරේදී මෙහෙයුම් කරන ලද බහළු ධාරිතාවයට සාපේක්ෂව, සුවිශේෂී සාර්ථකත්වයක් සනිටුහන් කරමින්, 22.8% ක වර්ධනයක් වාර්තා කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත විසින් බහළු විස්සේ සම ඒකක 2,413,162 ක් මෙහෙයුම් කරන ලදී. කොළඹ වරාය තීරණාත්මක ඇවුරුම් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රමෝපායිකව ස්ථානගත කිරීමට හේතුවූ රතු මුහුද කලාපයේ යුද ගැටුම් හේතුකොටගෙන, සුවස් ඇළ මාර්ගයේ සිට බලාපොරොත්තුවේ තුඩුව (Cape of Good Hope) දක්වා නෞකා ප්‍රතිගමනය කිරීම මෙම ජයග්‍රහණයට හේතුවී ඇත. තවද, විශේෂයෙන්ම නැගෙනහිර බහළු පර්යන්තය සඳහා වන නව ගැඹුරු නැව් සේවාවල සාර්ථක ආකර්ෂණය මෙම සාර්ථකත්වයට දායක වී ඇත. තවද, 2024 වර්ෂයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත 2023 වර්ෂයේ අත්කරගෙන තිබූ වෙළෙඳපොල කොටස 28% සිට 31% දක්වා වර්ධනය වී ඇත.

2024 වර්ෂයේදී, බහළුම් ධාරිතාවයේ සුවිශේෂී වර්ධනය, අංගණ හා උපකරණ උපරිමයෙන් භාවිතා කිරීම සහ පර්යන්ත අතර සිදුවන අන්තර් පර්යන්ත ට්‍රක් සේවා ප්‍රධාන කාර්යසාධන දර්ශකයට බලපා ඇත. 2023 වර්ෂයට සාපේක්ෂව, 2024 වර්ෂයේදී ජය බහළු පර්යන්තයේ පෝෂක නැව් සේවා 16.7% ක අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර ප්‍රධාන නැව් සමාගම්වල දළ දොඹකර ඵලදායීතාවය 14.6% කින් අඩු විය. ඒ හා සමානවම නැගෙනහිර බහළු පර්යන්තයේ පෝෂක සේවා 18.6% කින් අඩු වූ අතර දළ දොඹකර ඵලදායීතාවය 16.7% කින් පසුබෑමට ලක් විය.

සාම්ප්‍රදායික නැව්බඩු පර්යන්තවල මෙහෙයවන ලද වියළි තොග නැව්බඩු 2023 වසරට සාපේක්ෂව 2024 වසරේදී 24.5% කින් වැඩිවී ඇත. 2023 වසරේදී ටොන් 1,183,490 ක් ලෙස සඳහන් වූ වියළි නැව්බඩු ප්‍රමාණය 2024 වසරේදී ටොන් 1,473,873 ක් ලෙස වාර්තා විය.

2023 වර්ෂයේදී ටොන් 4,884,677 ක් වූ ද්‍රව තොග නැව්බඩු ප්‍රමාණය 2024 වර්ෂයේදී ටොන් 5,302,293 ක් දක්වා වැඩි වූ අතර එය 8.5% ක වැඩි වීමකි. 2023 වසරට සාපේක්ෂව 2024 වර්ෂයේදී තොගකඩන නැව්බඩු ප්‍රමාණය 193.5% කින් වැඩිවිය. එය සංඛ්‍යාත්මකව 2024 වර්ෂයේදී ටොන් 593,815 ක් වූ අතර 2023 වර්ෂයේදී ටොන් 202,355 ක් විය. 2023 වසරට සාපේක්ෂව 2024 වර්ෂයේදී කොළඹ වරායේ මෙහෙයුම් කරන ලද සමස්ත ටොන් ප්‍රමාණය 2024 වර්ෂයේදී ටොන් 114,593,910 ක් වූ අතර එය 2023 වර්ෂයේදී ටොන් 99,673,588 ක් විය. එනම් 15% ක වර්ධනයකි.

**නැව් භාණ්ඩ මෙහෙයුම් ධාරිතාවයන් හා අපේක්ෂිත ඵලදායීතා මට්ටම් පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයේදී ගන්නා ලද ක්‍රියාමාර්ග**

- නැගෙනහිර බහළු පර්යන්තය හා ජය බහළු V ව්‍යාපෘතිය යන ව්‍යාපෘති ද්විත්වය සැලසුම් කළ පරිදිම අපගේ පාරිභෝගිකයින්හට උසස් මට්ටමේ සේවා සැපයීමේ අරමුණ ඇතිව පවත්වාගෙන යනු ලබයි.

- 2024 වර්ෂයේදී, MAERSK, CMA CGM, MSC සහ EVERGREEN සමාගම් විසින් මූලිකව මෙහෙයවන ලද නව නැව් සේවා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත සාර්ථකව ආකර්ෂණය කර ගනු ලැබීය. මෙම කාර්යය මගින්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල වඩා ගැඹුරින් යුත් අතිවිශාල ප්‍රවාහන නෞකා මෙහෙයුම් කිරීම මගින් සුවිශේෂී සංවර්ධන සන්ධිස්ථානයක් සලකුණු කෙරේ. මෙය මෙහෙයුම් ධාරිතාවයෙහි වර්ධනයට ද දායක වේ.

- ඵලදායීතාවය වර්ධනය කර ගැනීමට තීරණාත්මක ලෙස බාධාවක්ව පැවති ජය බහළු පර්යන්තයේ මංතීරු පිළිසකර කිරීමේ හා නඩත්තු කිරීමේ කටයුතු 2024 වර්ෂය තුළදීද අඛණ්ඩව සිදු කෙරින.

- දේශීය හා ගෝලීය මට්ටමින් පැවති අසීරු තත්ත්වයන් හමුවේ, සේවකයින් දිරිගැන්වීම සඳහා සහ පාරිභෝගිකයින්හට වඩා උසස් සේවයක් සැපයීම සඳහා මෙහෙයුම්වල තරඟකාරීත්වය ඇති කරලීමට සේවක බලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## සේවා සැපයුම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාශය ශ්‍රී ලංකා රේගුවේ හා වෙනත් වරාය සේවා ආශ්‍රිත නියාමන අනුකූලතාවයනට අනුව කටයුතු කරන අතරම වරාය මෙහෙයුම් කාර්යක්‍ෂමව සිදු කිරීමේ නියාමනකරුවෙකු, පරිපාලකවරයෙකු, ඉඩම් හිමිකරුවෙකු සහ සේවා සැපයුම්කරුවෙකු ලෙස ක්‍රියාත්මක වේ. නිෂ්කාශන නියෝජිතායතන සහ වාප්පු ලිපිකරුවන් ලියාපදිංචි කිරීම, අත්හල නැව් භාණ්ඩ හා ඉවතලන ද්‍රව්‍ය විකිණීම කළමනාකරණය කර ගොඩබෑම් හා භාරදීමේ ගාස්තු, නාවික හා වෘත්තීය ගාස්තු අය කිරීම සිදු කරනු ලබන්නේද මෙම කොට්ඨාශය විසිනි. තවද, මෙම කොට්ඨාශය අර්ධ පූර්ණ බහළුම්/ විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් (LCL/MCC), මෙහෙයුම් කිරීම මෙන්ම බහළුවකින් භාණ්ඩ බෑම සහ බහළුවකට භාණ්ඩ පැටවීම සහ හිස් බහළුම් කළමනාකරණය කිරීම සහ සේවා ගාස්තු මගින් ආදායම ඉපයීමද මෙම කොට්ඨාශයේ කාර්යභාරයකි. සියළුම නියාමන හා මෙහෙයුම් අවශ්‍යතාවයන් සමඟ අනුකූල වන පරිදි කටයුතු කිරීමට වගබලා ගනිමින් වරාය සේවා සැපයුම් ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙනයාම ප්‍රධාන කාර්යභාරයක් මෙම කොට්ඨාශය විසින් ඉටු කරනු ලබයි.

### සේවා සැපයුම් කොට්ඨාශයේ මාර්ග සිතියම

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාශය තුළ ප්‍රවාහන හා සේවා සැපයුම් ක්‍ෂේත්‍රයේ වරාය හා සමුද්‍රීය අංශයේ මෙහෙයුම් විශිෂ්ටත්වය, නියාමන අනුකූලතාවය සහ මූල්‍ය තිරසරභාවය මුදුන්පත් කර ගැනීමට මෙම මාර්ග සිතියම මගින් ව්‍යුහගත ප්‍රවේශයක් ලබා දීම සහතික කෙරේ.

### 2024 වර්ෂයේ සේවා සැපයුම් කොට්ඨාශයේ මෙහෙයුම් කාර්යසාධනය

හිස් කරන ලද බහළුම් විස්සේ සම ඒකක: බහළුම් විස්සේ සම ඒකක 24,218 තරම් විශාල ප්‍රමාණයක් - එනම්;

- ජය බහළු පර්යන්තය/ නැගෙනහිර බහළු පර්යන්තය - විස්සේ සම ඒකක 4,641 ක්
- කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් - විස්සේ සම ඒකක 14,525 ක්
- සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් - විස්සේ සම ඒකක 5,052 ක් ආදී වශයෙන්

ප්‍රධාන දායකත්වයක් දරමින් මෙහෙයුම් කරන ලදී.

භාර දෙන ලද පූර්ණ බහළුම්: විස්සේ සම ඒකක 124,472 ක් තරම් වූ විශාල ප්‍රමාණයක් මෙහෙයුම් කරන ලදී.

### විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් මෙහෙයුම් (MCC)

- බහළුම් වලින් භාණ්ඩ හිස් කිරීමේ මෙහෙයුම් : විස්සේ සම ඒකක 3,709
- බහළුම් තුළට භාණ්ඩ පැටවීමේ මෙහෙයුම් : විස්සේ සම ඒකක 4,851

### තොග හා තොග කඩන නැව් භාණ්ඩ භාර දීමේ මෙහෙයුම්

- සිමෙන්ති: මෙ.ටො. 784,656 (අනාගතය ගොඩ නැගීම)
- වානේ: මෙ.ටො. 476,720 (වර්ධනය සඳහා සවිමත් පදනම)
- පොහොර: මෙ.ටො. 320,548 ( කෘෂිකර්මාන්තය නගාසිටුවීම)
- ව්‍යාපෘති නැව්බඩු: ඝන මීටර් 1,188,601 ( සුවිශාල ව්‍යාපෘති සඳහා සුවිශාල පියවර)

## මෙහෙයුම් සමාලෝචනය

**බැඳුම්කර ගුදම් කටයුතු**

- මෙහෙයුම් කළ පූර්ණ බහළුම්: විස්සේ සම ඒකක 1,518
- මෙහෙයුම් කළ අර්ධ පූර්ණ බහළුම්: විස්සේ සම ඒකක 636

**වාප්පු පරිපාලන අංශය**

- අළුත් නිෂ්කාශන බලපත්‍ර 109 ක්ද, අළුත් කළ නිෂ්කාශන බලපත්‍ර 1,261 ක්ද නිකුත් කරන ලදී.
- අළුත් A බලපත්‍ර 578 ක්ද අළුත් කළ A බලපත්‍ර 2,588 ක්ද සැකසුම් කරන ලදී.
- අළුත් B  බලපත්‍ර 28 ක්ද අළුත් කළ B බලපත්‍ර 232 ක්ද නිකුත් කරන ලදී.

**අත්හල නැව්බඩු හා ඉවතලන ද්‍රව්‍ය වෙන්දේසියේ විකිණීම**

- අත්හල නැව්බඩු වෙන්දේසියේ විකිණීම් 179 ක්ද, ඉවතලන ද්‍රව්‍ය වෙන්දේසියේ විකිණීම් 34 ක්ද පවත්වන ලදී.
- හිමිකම් නොපෑ භාණ්ඩ පිළිබඳව කාර්යක්ෂමව කටයුතු කළ බව තහවුරු කරමින් අත්හල නැව්බඩු සඳහා ටෙන්ඩර් 324 ක් කළමනාකරණය කරන ලදී.

**කුලී අයකිරීම් අත්හැරීම්**

අවශ්‍යතාවය පරිදි පාර්ශ්වකරුවනට සහායවීමක් වශයෙන්, කුලී ගෙවීමෙන් නිදහස් කරන ලෙස ඉදිරිපත් කළ ඉල්ලීම් 40 ක් සමාලෝචනයට භාජනය කරන ලදී.

**වාප්පු රක්‍ෂණ හිමිකම් පෑම්**

හිමිකම්පෑම්වල නිරවද්‍යතාවය තහවුරු කරමින් වාප්පු රක්‍ෂණ හිමිකම් පෑම්  I ඉල්ලීම් 102 ක්ද  වාප්පු රක්‍ෂණ හිමිකම් II  ඉල්ලීම් 153 ක් පිළිබඳ කටයුතු සිදු කරන  ලදී.

**විමසීම්**

පාර්ශ්වකරුවන්හට නියමිත වේලාවට හා නිවැරදිව සහයෝගය දක්වමින් විමසීම් 1,900 කට ප්‍රතිචාර දක්වන ලදී.

**නැව්බැඩු මෙහෙයුම් ආදායම**

- විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළු මෙහෙයුම්
    - භාණ්ඩ හිස් කිරීම් වලින් ලද ආදායම: රු. 130,234,392
    - භාණ්ඩ පැටවීම් වලින් ලද ආදායම: රු. 120,281,796
- සාමාන්‍ය මෙහෙයුම්: රු. 22,301,159
- විශේෂ මෙහෙයුම්: රු. 16,027,849
- අර්ධ පූර්ණ බහළුම් මෙහෙයුම් (භාණ්ඩ හිස්කිරීම්): රු. 530,871,640
- හිස්/ ප්‍රතිඅපනයන බහළුම් කුලිය: රු. 46,014,818
- ප්‍රතිඅපනයන නැව්බඩු කුලී සහ වෙනත් ගාස්තු: රු. 46,031,443

**බැඳුම්කර ගුදම් ආදායම - රු 142,587,321**

**ආනයන මෙහෙයුම් ආදායම**

- පූර්ණ බහළුම්  ආදායම (ගොඩබෑම් හා භාරදීමේ ගාස්තු): රු. 6,531,297,479
- අර්ධ පූර්ණ බහළුම් ආදායම (ගොඩබෑම් හා භාරදීමේ ගාස්තු): රු. 4,488,947,736

**පරිපාලන හා විකුණුම් ආදායම**

- වාප්පු පරිපාලන ආදායම: රු. 110,572,460
- විකුණුම් ආදායම: රු. 113,163,193

**මූලික පියවරයන්**

- ධාරිතා වර්ධනය: ජපන් ගුදම හා බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන VI භාවිතා කිරීමට සැලසුම් කිරීම.
- පිටස්තර පාර්ශ්වයන්ගෙන් කම්කරු ශ්‍රමය ලබා ගැනීම: පිරිවැය අවම කිරීමට ගුදම් මෙහෙයුම් සඳහා යෝජනා කර ඇත.

**2025 සිට 2028 දක්වා ක්‍රමෝපායික අරමුණු**

- හරිත වරාය සංකල්පය: බලශක්ති කාර්යක්‍ෂමතා පරිචයන් මගින් මිනිස් ක්‍රියාකාරකම් තුළින් වායුවට එකතු වන කාබන් ප්‍රමාණය අඩු කිරීම.
- ඩිජිටල් පරිවර්තනය: අංග සම්පූර්ණ කාර්යසාධන ඇගයීම සහ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ නවෝත්පාදන ක්‍රියාත්මක කිරීම.
- පාර්ශ්වකාර සහයෝගීතාවය: අඛණ්ඩ මෙහෙයුම් සඳහා හවුල්කාරීත්වයන් ශක්තිමත් කිරීම.
- සේවක බලකායෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම: අනුමත සේවක සංඛ්‍යාවට අනුකූලව සේවකයින් සේවයේ යෙදවීම හා ශ්‍රමය ක්‍රමෝපායිකව බාහිරින් සපයා ගැනීම.

මෙහෙයුම් කාර්යක්‍ෂමතාවය හා මූල්‍ය තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම තුළින් සේවා සැපයුම් කොට්ඨාශය 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වර්ධනය සඳහා කටයුතු කරන ලදී. ධාරිතාවය පුළුල් කිරීම, තිරසර ක්‍රියාපිළිවෙත් අනුගමනය කරමින් හා තාක්‍ෂණයෙන් උපරිම වාසි ලබා ගැනීම මගින් කොළඹ වරායේ ගෝලීය ස්ථාවරභාවය ශක්තිමත් කිරීමට කටයුතු කරන අතරම, ශ්‍රී ලංකාවේ ආර්ථික අභිලාෂයන්ට අනුගතව කටයුතු කිරීම මෙම කොට්ඨාශයේ අරමුණ වේ.

## නාවික කොට්ඨාශය

**නියමු සේවා**

සමාලෝචිත 2024 වර්ෂය තුළ කොළඹ වරාය සියළුම වර්ගයේ යාත්‍රා සඳහා සතියේ දින 7 තුළ දවසේ පැය 24 පුරාම නියමු සේවා ලබා දී ඇත.

**ටග් යාත්‍රාපති අංශය**

ටග් යාත්‍රාපති අංශය, සමාලෝචිත වර්ෂය තුළ අඛණ්ඩ සේවා සැපයීම සහතික කරමින් යාත්‍රා මෙහෙයුම් සඳහා කාර්යක්‍ෂමව ක්‍රියාත්මක විය. තවද, වර්ගීකරණ සමාගම්වල රෙගුලාසි වලට අනුකූලව ටග් යාත්‍රාවල නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කටයුතුද සිදුකරන ලද අතර, භාවිතයෙන් ඉවත් කරන ලද මූරින් කඹ වලින් කලාළ නිශ්පාදනය කරන ලද අතර, ටග් යාත්‍රා සඳහා කැන්වස් වියන්ද සාදන ලදී. දෛනික ටග් යාත්‍රා මෙහෙයුම්ද ක්‍රියාත්මක කරන ලද අතර, හදිසි අවස්ථා සඳහා සේවයේ යෙදවීමට එක් ටග් යාත්‍රාවක්ද පොරොත්තු සේවයේ තබන ලදී.

වර්ෂය තුළදී, නැංගුරම් ටග් යාත්‍රා ගමන් වාර 18,786 ක් සිදු කරන ලද අතර මෙයට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගමන් වාර 7, 984 ක් හා කුලී පදනම මත ලබාගත් ටග් යාත්‍රා මගින් ගමන් වාර 10,802 ක් ඇතුළත් වේ. ටග් යාත්‍රා සේවාවන්ගෙන් උපයා ගත් ආදායම රුපියල් මිලියන 3,469.81 ක් වේ.

**වරාය ගිනි නිවන හමුදාව**

වරාය ගිනි නිවන හමුදාව විසින් 2024 වර්ෂය තුළදී, සම්මත ගිනි නිවීම් රෙගුලාසි අනුගමනය කරමින් ගිනි ගැනීමේ සිද්ධි වලට ක්‍ෂණිකව ප්‍රතිචාර දක්වමින් ගිනි නිවීම් සේවා සපයන ලද අතර අදාළ වර්ෂය තුළදී සිදු වූ හදිසි ගිනි ගැනීම් 14 ක් මැඩ පැවැත්වීමට කටයුතු කළ අතර තෙල් නැව්, ගෑස් නැව්, තාප වැඩ (විදුලි ආරෝපිත) සහ දේශීය තාප වැඩ හා අන්තරාදායක නැව්බඩු සඳහා පොරොත්තු සේවා සපයන ලදී.

## මෙහෙයුම් සමාලෝචනය

අවස්ථා කිහිපයකදී පාලම් සහ ගුදම් සෝදා පිරිසිදු කිරීම සඳහා ජල පොම්ප මගින් ජලය සපයන ලදී.තෙල් දූෂණ මැඩ පැවැත්වීමේ කාර්යයන්, තෙල් නැව් පරීක්ෂා කිරීම් හා අන්තරාදායක නැව් භාණ්ඩ අන්තර්ගත බහළුම් පරීක්ෂා කිරීම්ද මෙම කොට්ඨාශය මගින් ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතර වශයෙන්, වරාය ගිනි නිවන හමුදාව විසින් ISPS පෙරහුරු අභ්‍යාස, පුද්ගලයන් ඉවත් කිරීමේ පෙරහුරු අභ්‍යාස හා ඒකාබද්ධ ගිනි හා රසායනික ද්‍රව්‍ය පෙරහුරු අභ්‍යාසද පවත්වන ලදී. 2024 වර්ෂය තුළදී, වරාය ගිනි නිවන හමුදාව රුපියල් මිලියන 118.79 ක් ඉපැයීමට සමත්විය.

**වරාය නිරාපද අංශය**

වරාය තුළ මෙහෙයුම් කරනු ලබන සෑම වර්ගයකටම අයත් අන්තරායකාරී නැව්භාණ්ඩ මෙහෙයුම් පිළිබඳව විමසිලිමත් වන අතර, සෑම අවස්ථාවකදීම ආරක්ෂිත මෙහෙයුම් ව්‍යවහාරයන් නිරීක්ෂණය කිරීම සහතික කරනු ලබයි.

තාප වැඩ බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම, පූර්ණ වැඩබිම් පරීක්ෂණ සිදු කරන ලද අතර, ඒවාහි ප්‍රතිඵලයක් වශයෙන් අනවසර තාප වැඩ සිදු කරමින් තිබූ බව හඳුනාගෙන ඒවා නැවැත්වීමට පියවර ගන්නා ලදී. සමුද්‍ර දූෂණය අධීක්ෂණය කර ඒවාට විසඳුම් සෙවීමටද කටයුතු කරන ලදී. තවද, සේවකයින් හා සම්බන්ධ සිදුවීම් හා සමුද්‍රීය මෙහෙයුම් සඳහා අංගසම්පූර්ණ පරීක්ෂණ හා විශ්ලේෂණ ද ක්‍රියාත්මක කරන ලදී.

**විශේෂයෙන් සඳහන් කළ යුතු වැදගත් කරුණු**

- කොළඹ වරායට පැමිණි නෞකා වලින් දේශීය අනතුරුදායක නැව් භාණ්ඩ මෙ.ටො. 287,709,511 සහ ප්‍රතිනැව්ගත නැව් භාණ්ඩ මෙ.ටො. 861,292,196 ක් ගොඩබාන ලදී.

- ප්‍රතිනැව්ගත අනතුරුදායක නැව් භාණ්ඩ ප්‍රවාහන කළ බහළුම් 40,814 ක් මෙහෙයුම් කරන ලදී.

- කොළඹ වරායට හා ත්‍රිකුණාමලය වරායට තෙල් නැව් දෙසිය අසූහතක් (287) පැමිණි අතර මෙම තෙල් නැව් වලින් පහත දැක්වෙන ආකාරයට නැව් භාණ්ඩ ගොඩබාන ලදී.

| නැව් භාණ්ඩ වර්ගය | බර (මෙ.ටො.) |
|---|---:|
| ද්‍රව පෙට්‍රෝලියම් වායු | 350,225.593 |
| ගෑස් ඔයිල්/ Jet Ai/ගැසොලින්/භූමිතෙල් | 2,208,182.542 |
| බොර තෙල් | 1,667,849.000 |
| ඉන්ධන තෙල් | 789,245.014 |
| මූලික තෙල් | 11,020,073 |

- අධිබල පුපුරණ ද්‍රව්‍ය (GPIE) මෙ.ටො. 7,200 ක් හා පුපුරණ ස්වභාවයේ ද්‍රව්‍ය (GP IAE/IIE) මෙ.ටො. 67,124.134 ක් මෙහෙයම් කරන ලදී.

- වරාය ගිනි නිවන හමුදාවේ සහාය ඇතිව රසායන ද්‍රව්‍ය ජලයට මිශ්‍රවීම, ප්‍රති-කාර්ය මෙහෙයුම්, ගිනි ගැනීම් ආදී සිද්ධි ගණනාවක් කළමනාකරණය කිරීමට කාර්යක්ෂමව කටයුතු කරන ලදී.

- වරාය නිරාපද පරීක්ෂකයින්ගේ සහ සහකාර වරාය නිරාපද පරීක්ෂකයින්ගේ සහාය ඇතිව අනතුරුදායක නැව් භාණ්ඩ ගුදම් ඇතුළු සියළුම ගුදම් පරීක්ෂණයට භාජනය කරන ලදී.

- තාප වැඩ සඳහා අවසර ලබා දීමට ප්‍රථම වැඩ බිම් පරීක්ෂණ ක්‍රියාත්මක කරන ලදී. සමුද්‍ර දූෂණය හා සම්බන්ධ සිද්ධීන් වැලැක්වීම කාර්යක්ෂමව සිදු කිරීම සඳහා හඳුන්වාදී ඇති මඟපෙන්වීම හා අධීක්ෂණ ක්‍රමවේද භාවිතා කරමින් සමුද්‍ර දූෂණය වැලක්වීමට කටයුතු කරන ලදී.

- කාර්මික හා සමුද්‍රීය යන අංශ දෙකෙහිම සිදුවන අනතුරු පරීක්ෂා කරන ලදී.

- පුද්ගල ආරක්ෂණ උපකරණ (PPE) භාවිතා කරමින් නාවික කොට්ඨාශයට අනුයුක්ත නැව් බඳින කණ්ඩායම්වල ආරක්ෂාව සමීපව අධීක්ෂණය කරන ලදී. සේවකයින් අතර ආරක්ෂණ හා පරිචයන් පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය හරහා පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

- නිරාපද ප්‍රමිතීන් හා අනුගත වීම සහතික කරමින් ද්‍රව පෙට්‍රෝලියම් වායු හා පෙට්‍රෝලියම් තෙල් ගොඩබෑමේ කටයුතුවල අඛණ්ඩව පරීක්ෂා කිරීම් සිදු කරන ලදී.

- නෞකාවලින් බැහැර කරන අපද්‍රව්‍ය (කසල, අපිරිසිදු තෙල්, මලපහ) සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියේ අනුමැතිය සහිතව කොන්ත්‍රාත්කරුවන් මගින් ඉවත්කිරීම අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී.

- ජය බහළු පර්යන්තයේ, සමගි බහළු පර්යන්තයේ සහ නැගෙනහිර බහළු පර්යන්තයේ අංගනවල අන්තරාදායක නැව් භාණ්ඩ අඩුක් කිරීම්, සහකාර වරාය නිරාපද පරීක්ෂකගේ සහාය ඇතිව අඛණ්ඩව පරීක්ෂා කරන ලදී. අප්‍රකාශිත අන්තරාදායක නැව් භාණ්ඩ සඳහා නෞකා නියෝජිතවරයාට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**ප්‍රදීපාගාර අංශය**

ප්‍රධාන ජාත්‍යන්තර නැව් මාර්ග ඔස්සේ පිහිටා ඇති දකුණු හා බටහිර වෙරළාසන්න ප්‍රදීපාගාර, වර්ෂය තුළදී නිතිපතා නඩත්තු කරන ලදී. එමෙන්ම, නාවික ඇළ මාර්ගවල පවතින ආලෝක බෝයාද ක්‍රමානුකූලව පරීක්ෂාවට භාජනය කර නඩත්තු කරන ලදී. සිදුවන ඕනෑම අකර්මන්‍යවීමක්, සිලෝන් ඇසෝසියේෂන් ඔෆ් ෂිපින් ඒජන්ට්ස් (CASA), ශ්‍රී ලංකා ඇසෝසියේෂන් ඔෆ් වෙසෙල් ඔපරේටර්ස් (SLAVO) , (LASO) සහ එක්සත් රාජධානියේ හයිඩ්‍රොග්‍රැෆික් අංශය වෙත නිකුත් කර ඇති චක්‍රලේඛ මාර්ගයෙන් නාවිකයින් වෙත නිසිලෙස සන්නිවේදනය කරන ලදී.

2024 වර්ෂයේදී මෙම අංශයේ ප්‍රදීපාගාර ගාස්තු වශයෙන් රුපියල් මිලියන 2,772.37 ක ආදායමක් උපයා ඇත.

**වරාය යාත්‍රා අංශය**

වරාය යාත්‍රා අංශය කොළඹ වරායේ මෙහෙයුම් පවත්වාගෙන යාම සහතික කරමින් අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එහි මූලික වගකීම් තුළ කොළඹ වරායට පැමිණෙන සියළුම නෞකා බැඳීම හා ලිහීම සඳහා මූරින් කණ්ඩායම් සැපයීම හා සහාය වීම, දූපත් දියකඩනය වෙත හා නිරිතදිග දියකඩනය වෙත විවිධ සේවා කණ්ඩායම් ප්‍රවාහනය කිරීම, මුහුදු ජලය පවිත්‍ර කිරීමේ කටයුතු පවත්වාගෙන යාම සහ "ජීරාෆ්" පාවෙන දොඹකරය භාවිතා කරමින් බර එසවුම් මෙහෙයුම් කිරීම ඇතුළත්වේ. නියමු යාත්‍රාවල සහ සහ මූවරින් දියත් යාත්‍රා සේවයේ යෙදවීම සූදානම් කිරීම සහතික කරමින්, ඒවාහි නඩත්තු කටයුතු ද කාර්යක්ෂමව සිදු කිරීමද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

**ජලමිතික සමීක්ෂණ අංශය**

බහුවිධ නැව්තොටවල් හරහා අවශ්‍යතා රාශියක් සඳහා සේවා සපයමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයුම් කරනු ලබන වරායවල් සඳහා ඉඩම් සහ ජලමිතික සමීක්ෂණ සේවා සැපයීම මෙම අංශය විසින් ඉටු කරනු ලබයි. මෙම අංශයේ විෂය පථය ඇතුළත වරාය ද්‍රෝණිය හා නැංගුරම් ධ්වනි පරීක්ෂාව, බෝයා ස්ථානගත කිරීම් සමීක්ෂණ, සිතියම් සමාලෝචන, ව්‍යාපෘති උපදේශක සේවා, කල්බදු ගිවිසුම් සමීක්ෂණ හා වෙනත් විවිධ අදාළ කාර්යයන් ඇතුළත් වේ.

## මෙහෙයුම් සමාලෝචනය

**නාවික අංශය**

2024 වර්ෂයේදී, නාවික අංශය විසින් වාර්ෂික ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ නාවික ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීම අධීක්ෂණය කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ බලපත්‍ර 418 ක් නිකුත් කරන ලද අතර එමගින් වර්ෂය සඳහා රුපියල් මිලියන 74.5 ක ආදායමක් උත්පාදනය කරන ලදී.

### යාන්ත්‍රික වැඩ ඉංජිනේරු කොට්ඨාශය

සියළුම වරායවල මෙහෙයුම් උපකරණ හා මෙහෙයුම් නොවන උපකරණ සහ ව්‍යුහ නිසි පරිදි නඩත්තු කර ක්‍රියාත්මක තත්ත්වයෙන් පවත්වා ගෙන යාමේ වගකීම දැරීම යාන්ත්‍රික වැඩ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ. නැංගුරම් වග් යාත්‍රා, නියමු දියත් යාත්‍රා සහ හැරම් යාත්‍රාවල වානේ අළුත්වැඩියා ඇතුළු පුළුල් සේවා පරාසයක් මෙම කොට්ඨාශය විසින් සපයනු ලබන අතර, ජය බහළු පර්යන්තයේ සහ සමගි බහළු පර්යන්තයේ සේවයෙහි යොදවා ඇතිබහළු මෙහෙයුම් දොඹකරවල සහ අර්ධ ට්‍රේලර් රථවල ව්‍යුහ අළුත්වැඩියා කටයුතු ද සිදු කරනු ලබයි. තවද, පැරණි වානේ ගොඩනැගිලි හා ව්‍යුහ කඩා ඉවත් කිරීම් සිදු කරන අතර, නව වානේ ගොඩනැගිලි, ගුදම් හා වෙනත් ව්‍යුම ඉදිකිරීම්ද මෙම කොට්ඨාශය විසින් සිදු කරනු ලබයි.

නැව්බඩු මෙහෙයුම් උපකරණ, නාවික යාත්‍රා සහ වෙනත් වරාය ආශ්‍රිත යන්ත්‍ර සඳහා අවශ්‍ය කරනු ලබන අළුත් අමතර කොටස් යන්ත්‍රානුසාරයෙන් නිපදවීම, පිරිසැකසුම් කිරීම හා වාත්තු කිරීම ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි. මෙහෙයුම් අවශ්‍යතාවයන් සඳහා ග්‍රැබ් යන්ත්‍ර නඩත්තු කිරීම මෙන්ම දම්වැල් සහ විලංගු (chains & shackles) පරීක්‍ෂා කිරීම ද මෙම කොට්ඨාශයේ වගකීම වේ.

**2024 වර්ෂයේ ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්**

මෙම වර්ෂය තුළදී, යාන්ත්‍රාක වැඩ ඉංජිනේරු කොට්ඨාශය විසින් පහත සඳහන් ප්‍රධාන හා සුළු පරිමාණයේ ව්‍යාපෘති සාර්ථකන නිම කර ඇත.

- අංක J = 07 දරණ ගැන්ට්‍රි දොඹකරයේ ට්‍රොලි පීලි (trolley rails) ඉවත් කර අළුතින් ස්ථාපිත කිරීම.
- අංක 09,10,12 සහ 14 දරණ ගැන්ට්‍රි දොඹකරවල මෙන්ම හුවමාරු දොඹකර කිහිපයකි ව්‍යුහ නවීකරණය කිරීම.
- ජය බහළු පර්යන්තයේ බහළු ට්‍රේලර් රථ 30 ක් ප්‍රතිසංස්කරණය කර නවීකරණය කිරීම.
- බණ්ඩාරනායක පාලමෙහි ගුදම් ප්‍රතිසංස්කරණය කිරීම. (මෙහි වැඩ 75% කින් නිමවී ඇත)
- බදුල්ල දිස්ත්‍රික්කයෙහි පාලම් කිහිපයක් පිරිසැකසුම් කිරීම.
- නැගෙනහිර බහළු පර්යන්තය සඳහා උදුන් බහාළුම් (Strove pockets) පිරිසැකසුම් කිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාහන කිහිපයක වැසි අළුත්වැඩියා කිරීම.
- පහත් මට්ටමකින් තට්ටුව ඇති (low-bed) ට්‍රේලර් රථ දෙකක් නවීකරණය කිරීම.

ඉහත සඳහන් කාර්යයනට අමතරව, කොට්ඨාශයට අයත් වැඩහල් හතක් ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.

- ප්‍රධාන වානේ අළුත්වැඩියා ව්‍යාපෘති 100 කට අධික ප්‍රමාණයක්
- ප්‍රධාන යාන්ත්‍රික වැඩ 50 කට වැඩි ප්‍රමාණයක්
- ප්‍රධාන වෑද්දුම් වැඩ 50 කට වැඩි ප්‍රමාණයක්

මෙම ප්‍රයත්නයන් මගින් වෙනත් විවිධ යාන්ත්‍රික වැඩ ද සමගින්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ටාශයන්හි මෙහෙයුම් කාර්යක්‍ෂමතාවයට මෙම කොට්ඨාශයේ දායකත්වය ලබා දී ඇත.

## යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය

බහළු මෙහෙයුම් උපකරණ හා වෙනත් විවිධ උපකරණ විශ්වාසනීය ක්‍රියාකාරී තත්ත්වයක පවත්වාගැනීම යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශයේ මූලික අරමුණ වේ. ඉදිකිරීම් උපකරණ, සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් උපකරණ, ජංගම හා පොදුකාර්ය දොඹකර, විදුලි ජනක යන්ත්‍ර සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාහන සංචිතය මීට ඇතුළත් වේ.

මෙහෙයුම් කොට්ඨාශයට හා සේවා සැපයුම් කොට්ඨාශයට සිය දෛනික මෙහෙයුම් සිදු කිරීමට සහාය වීම සඳහා යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය සේවා සපයනු ලැබේ. මෙම සේවාවන් ප්‍රධාන වශයෙන් ජය බහළු පර්යන්තය, නැගෙනහිර බහළු පර්යන්තය, සමඟි බහළු පර්යන්තය හා බණ්ඩාරනායක ජැටිය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සියළුම ගුදම්වල සිදු කෙරේ. මීට අමතරව, අනෙකුත් වරායයන් හා ප්‍රදීපාගාර වලට සම්බන්ධ උපකරණ හා වාහන ද අප කොට්ඨාශය මඟින් නඩත්තු කරනු ලැබේ. තවද, විශේෂිත සේවා බාහිරින් ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්තු කළමනාකරණය සහ වාහන කුලී පදනම මත ලබා ගැනීම, රක්ෂණය කිරීම් සම්බන්ධ කටයුතු පෞද්ගලික ප්‍රයිම්මූවර් රථ හා ට්‍රේලර් සඳහා පරීක්ෂණ/ ප්‍රවීණතා සහතික නිකුත් කිරීම ආදී කටයුතු මෙම කොට්ඨාශය විසින් කළමනාකරණය කරනු ලැබේ.

මෙම කොට්ඨාශය පහත සඳහන් ප්‍රධාන හා සුළු කාර්යයන් වසර තුළ නිම කර ඇත.

- නැගෙනහිර බහළු පර්යන්තය (E 01 සිට E 06 දක්වා) සඳහා නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර 6 ක් ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ටොන් 2.5 අඩු එසවුම් යන්ත්‍ර 13 ක් සහ ටොන් 6 අඩු එසවුම් යන්ත්‍ර 2 ක් ප්‍රසම්පාදනය, ස්ථාපනය හා ක්‍රියාත්මක කිරීම.
- මීටර් 25 High Bucket Elevator සහ මීටර් 70 High Mobile Aerial Work Platform ප්‍රසම්පාදනය, ස්ථාපනය හා ක්‍රියාත්මක කිරීම.
- ජය බහළු පර්යන්තයේ රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකර වලට සවි කර ඇති ඩීසල් එනජින් 14 ක් අළුත්වැඩියා කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම.
- ජය බහළු පර්යන්ත මෙහෙයුම්වල ඇති ප්‍රයිම්මූවර් සහ අංගණ ට්‍රක්රථ වලට සවි කර ඇති ඩීසල් එන්ජින් 13 ක් සහ ස්වයංක්‍රීය සම්ප්‍රේෂණ අළුත්වැඩියා කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම.
- නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර හා රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකරවල anti-sway gearboxes, ට්‍රොලි රෝද හා චලනය සඳහා යෙදූ දම්වැල් ප්‍රතිස්ථාපනය කිරීම.
- ජය බහළු පර්යන්තයේ ඩීසල් විදුල ජනක යන්ත්‍රයේ නඩත්තු හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම.
- බහළු ට්‍රේලර් රථ අළුත්වැඩියාව හා නවීකරණය කිරීම.

ඉහත කටයුතු වලට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශ යටතේ මෙහෙයුම් කෙරෙන සියළුම යන්ත්‍රෝපකරණ, උපකරණ, බර වාහන සහ ද්විත්ව කාර්ය වාහන සඳහා අළුත්වැඩියා කටයුතු, නඩත්තු කටයුතු, පිරිසැකසුම් කිරීම, රක්ෂණය කිරීමේ කටයුතු කළමනාකරණය හා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගැනීමේ කටයුතු යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය මඟින් සිදු කර ඇත.

## සිවිල් ඉංජිනේරු කොට්ඨාශය

වරාය ආශ්‍රිත යටිතල පහසුකම්වල මෙහෙයුම් කාර්යක්ෂමතාවය, ආරක්ෂාව හා තිරසරභාවය සහතික කිරීම සඳහා සිවිල් ඉංජිනේරු කොට්ඨාශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. වරාය ව්‍යුහයන්, පහසුකම් සලසන ගොඩනැගිලි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල නිවාස, වරාය ද්‍රෝණිය හා පිවිසුම් ඇළ මාර්ගවල ගැඹුර, අභ්‍යන්තර මාර්ග, බහළු අංගණ, ජැටි බැම්, ජල සැපයුම් පද්ධති හා වෙනත් අත්‍යවශ්‍ය

සේවා නඩත්තු කිරීම මෙම කොට්ඨාශයේ මූලික වගකීම වේ. මීට අමතරව, ශ්‍රී ලංකාව පුරා ඇති ප්‍රදීපාගාර නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාම ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ඇති සියළුම වරායයන්හි සමුද්‍රීය ව්‍යුහයන්ගේ නඩත්තු සේවා මෙම කොට්ඨාශය මගින් ලබා දෙනු ලැබේ.

ටෙන්ඩර් ක්‍රියාවලීන්, ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, ඉදිකිරීම් වැඩ අධීක්ෂණය, තත්ත්ව පාලනය සහ කොන්ත්‍රාත් කළමනාකරණය ඇතුළුව ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතුද මෙම කොට්ඨාශය මගින් අධීක්ෂණය කරනු ලැබේ. අළුතින් සිදු කරන සුළු ඉදිකිරීම් ව්‍යාපෘති, කොට්ඨාශය තුළින්ම සපයාගත් සම්පත් භාවිතා කරමින් ක්‍රියාත්මක කරන අතර ප්‍රධාන නඩත්තු කටයුතු පූර්වයෙන් හඳුනාගත් අවශ්‍යතාවයන් මත පදනම්ව සැලසුම් කරනු ලැබේ. හදිසි සුළු නඩත්තු වැඩ කොට්ඨාශයේ කාර්ය මණ්ඩලය විසින් අප්‍රමාදීව සිදු කරනු ලැබේ. තවද, මෙම කොට්ඨාශය විසින් පාරිසරික තිරසරභාවය පවත්වාගෙන යාමට දායකවෙමින් ඵලදායී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සාර්ථකව ස්ථාපිත කර ඇත.

**2024 වසරේ දී සිදු කරන ලද ප්‍රධාන ප්‍රතිසංස්කරණ හා නඩත්තු කටයුතු**

2024 වර්ෂය තුළ වරාය යටිතල පහසුකම්වල ක්‍රියාකාරීත්වය සහ කල්පැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා සිවිල් ඉංජිනේරු කොට්ඨාශය විසින් වැදගත් ප්‍රතිසංස්කරණ හා නඩත්තු ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කරන ලදී.

**1. ජය බහළු පර්යන්ත අංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු**
බහළු මෙහෙයුම් සඳහා උපරිම මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මංතීරු (A-B) සහ මංතීරු (K-L) ප්‍රතිසංස්කරණය කිරීම.

**2. වරාය අභ්‍යන්තර මාර්ග වලට නැවත තාර දැමීම**
රථවාහන ගමනාගමනය පහසුකිරීම හා මාර්ගයට සිදුවන හානිදායක තත්ත්වයන් අවම කිරීම සඳහා සමගි බහළු පර්යන්ත ගේට්ටුව ඉදිරිපස අභ්‍යන්තර මාර්ගයට නැවත තාර දැමීම.

**3. කොළඹ වරායේ මායිම් තාප්පය අළුත්වැඩියා කිරීම**
ආරක්ෂාව හා බාහිර පෙනුම වඩා වර්ධනය කිරීම සඳහා මායිම් තාප්පය ප්‍රතිසංස්කරණය කිරීම.

**4. බණ්ඩාරනායක ජැටියේ ගුදම් පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම**
බණ්ඩාරනායක ජැටියේ ගුදම් ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීමට හා නවීකරණය කිරීම සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම.

**5. යෝජිත ප්‍රධාන සිවිල් ගබඩා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු**
ද්‍රව්‍ය ගබඩා කිරීම හා බෙදාහැරීම ක්‍රමවත් කිරීම සඳහා අළුතින් ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

**6. ප්‍රදීපාගාර අළුත්වැඩියා කිරීම හා තීන්ත ආලේප කිරීම**
මෙහෙයුම් සඳහා සූදානම් කිරීම හා ව්‍යුහාත්මක ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා බේරුවල හා දෙවුන්දර තුඩුව ප්‍රදීපාගාර අළුත්වැඩියාව හා තීන්ත ආලේප කිරීම.

**7. පැරණි නියමු මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම**
ක්‍රියාකාරීත්වය හා බාහිර පෙනුම පවත්වාගැනීම සඳහා පැරණි නියමු මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම හා තීන්ත ආලේප කිරීම.

**8. මැකලම් ලොක්හි ලොක් ගේට්ටු අළුත්වැඩියාව**
බාධාවකින් තොරව යාත්‍රා කිරීම හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහතික කිරීම පිණිස ලොක් ගේට්ටු සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීම.

**9. ප්‍රවේශ ඇළ මාර්ගයේ බෝයා නඩත්තු කිරීම**

වරාය ඇතුළත ආරක්ෂාකාරීව යාත්‍රා පැදවීම තහවුරු කිරීම පිණිස ප්‍රවේශ ඇළ මාර්ගයේ බෝයා අළුත්වැඩියා කිරීම හා තීන්ත ආලේප කිරීම.

## විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉංජිනේරු ව්‍යාපෘතිවල විදුලි, විද්‍යුත්, සන්නිවේදන හා ස්වයංක්‍රීයකරණ පද්ධති සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශයේ කාර්යභාරය වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම වරායයන්හි පවත්නා යන්ත්‍රෝපකරණවල හා සවි කිරීම්වල ස්ථාපිත කර ඇති මෙම පද්ධතිවල අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරීම ද මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ.

වරාය කටයුතුවලට අදාළ වන අතිශය වැදගත් වන විදුලි, විද්‍යුත්, සන්නිවේදන හා ස්වයංක්‍රීයකරණ පද්ධති හා අදාළ සියළුම සේවා 95% කට වැඩි ප්‍රතිශතයකින් පවතින බව සහතික කිරීම සඳහා සුදුසුකම්ලත් වෘත්තීය විශේෂඥ කණ්ඩායමක් දවසේ පැය 24 පුරා සේවයේ නියැලී සිටී.

2024 වසර තුළ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශය පහත ව්‍යාපෘති සාර්ථකව අවසන් කර ඇත.

- නැගෙනහිර බහළු පර්යන්තයේ පරිපාලන ගොඩනැගිල්ල සඳහා මධ්‍යම, අඩු සහ අතිශයෙන්ම අඩු වෝල්ටීයතාවයෙන් යුත් වාතාශ්‍ර සහ වායු සමීකරණ පද්ධති සවි කිරීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- CFS – IV සහ CFS – V ගුදම්, ප්‍රවේශ ගේට්ටු අංක 1A, ගේට්ටු අංක 3 සහ කොළඹ සහ කන්කසන්තුර වරායයන්හි කාර්යාල ප්‍රදේශ තුළ CCTV කැමරා පද්ධති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකර අංක 48 හි Festoon කේබල් පද්ධතිය වෙනුවට IGUS විදුලිබල පද්ධතිය යෙදවීම.

- යාන්ත්‍රික වැඩහලෙහි දොඹකරය (overhead crane) සඳහා විද්‍යුත් බල පද්ධතියක් (E chain power supply) සවි කිරීම.

- නැගෙනහිර බහළු පර්යන්ත අදියර II හි සිවිල් වැඩ ව්‍යාපෘතියේ මධ්‍යම, අඩු සහ අතිශයෙන්ම අඩු වෝල්ටීයතා පද්ධති සඳහා වැඩ බිම් සැලැස්ම, ද්‍රව්‍ය සැපයීම සහ ක්‍රමවේද ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ අනුමැතිය ලබා දීම.

- නැගෙනහිර බහළු පර්යන්තය අදියර - II සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අංගන දොඹකර සහ පර්යන්ත මෙහෙයුම් පද්ධතිය ඒකාබද්ධ කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම වරායයන් තුළ අඩු වෝල්ටීයතාවයෙන් යුත් විදුලිය බෙදා හැරීම, දුරකථන ජාල, දත්ත සන්නිවේදන ජාල, වායු සමීකරණ හා වාතාශ්‍ර පද්ධති උත්ශ්‍රේණි කිරීම.

- ජය බහළු පර්යන්තයේ රැහැන් රහිත හා රැහැන් සහිත දත්ත සන්නිවේදන ජාල වැඩි දියුණු කිරීම, ප්‍රයිම් මූවර් රථ සඳහා NAVIS N4 ප්‍රයිම් රූට් පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පාවෙන වත්කම්වල විදුලි, විද්‍යුත්, සන්නිවේදන හා නාවික පද්ධතිවල අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදු කිරීම.

- රේඩාර් සහ ගුවන් විදුලි සන්නිවේදන පද්ධති සවි කිරීම හා නඩත්තු කිරීම සහ දිවයින වටා ඇති සියළුම ප්‍රදීපාගාර නඩත්තු කටයුතු පවත්වාගෙන යාම.

## නාවික ඉංජිනේරු කොට්ඨාශය

නාවික ඉංජිනේරු කොට්ඨාශය ශ්‍රී ලංකාවේ වාණිජ වරායයන් වෙත පැමිණෙන සියළුම නෞකාවල ආරක්ෂාව හා කාර්යක්ෂම ගමනාගමනය සහතික කිරීම සඳහා නාවික කොට්ඨාශය සමඟ සමීපව කටයුතු කරන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොට්ඨාශ අතුරින් එක් වැදගත් කොට්ඨාශයකි. වරාය අධිකාරියට අයත් පාවෙන යාත්‍රා 48 හි මෙහෙයුම් සඳහා සූදානම දෛනික නිවාරක හා නිරවද්‍යාකාරක නඩත්තු වැඩසටහන් මගින් නිසිලෙස පවත්වාගෙනයාම මෙම කොට්ඨාශයේ මූලික වගකීම වේ. නාවික, මෙහෙයුම්, සිවිල් ඉංජිනේරු හා ආරක්ෂක යන කොට්ඨාශ වලට අවශ්‍ය කරනු ලබන පාවෙන යාත්‍රා උපරිම මට්ටමින් පවතින බවට සහතික වෙමින් වරායේ ගතික ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාමට කැපවීමෙන් සේවයේ යෙදෙන ඉහළ නිපුණතාවයෙන් යුත්, වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් හා පවරන කාර්යයෙන් උපරිම ප්‍රතිඵල ගෙනදිය හැකි සේවකයින් 251 ක් දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් මෙම කොට්ඨාශය මගින් 2024.12.31 දිනට සේවයේ යොදවන ලදී.

මෙම කොට්ඨාශය 2024 වර්ෂයේදී නාවික කොට්ඨාශයේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රමාණවත් පාවෙන යාත්‍රා පද්ධතියක් සේවයේ යෙදවීම සාර්ථකව ඉටු කරන ලදී. මෙම යාත්‍රා පද්ධතියට කොළඹ වරාය සඳහා නැංගුරම් ටග් යාත්‍රා හතරක් සහ නියමු දියත් යාත්‍රා තුනක්, ගාල්ල වරාය සඳහා එක් ටග් යාත්‍රාවක් සහ එක් නියමු දියත් යාත්‍රාවක් සහ ත්‍රිකුණාමලය වරාය සඳහා නැංගුරම් ටග් යාත්‍රා දෙකක් සහ එක් නියමු දියත් යාත්‍රාවක් ඇතුළත් වේ.

ජාත්‍යන්තර වර්ගීකරණ සංවිධානය විසින් සකස් කර ඇති නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව පාවෙන යාත්‍රාවල වර්ගීකරණය පවත්වාගෙන යාමේ වගකීමද මෙම කොට්ඨාශය විසින් දරණු ලබයි. මෙම වර්ගීකරණය පවත්වාගෙන යාම, නැව් සමාගම් වලට සහ නැව් සංධාන සඳහා ආරක්ෂිත හා නිරුපද්‍රිත නාවික ගමනාගමනයක් තහවුරු කිරීම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර වරායක් වශයෙන් පිළිගැනීම සඳහා වැදගත් සාධකයක් වේ.

කොට්ඨාශයේ කාර්යභාරය මනාලෙස කළමනාකරණය කිරීමට හැකිවනු පිණිස සමුද්‍රීය ඉංජිනේරු කොට්ඨාශය සමුද්‍රීය - I සමුද්‍රීය - II වශයෙන් ප්‍රධාන අංශ දෙකකට බෙදා ඇත. පාවෙන යාත්‍රාවල මෙහෙයුම් කටයුතු හා නඩත්තු කටයුතු ප්‍රශස්ත මට්ටමක පවතින බව සහතික කිරීම සඳහා මෙම අංශ ද්විත්වය විසින්ම විශේෂිත කාර්යභාරයක් මෙන්ම වගකීම් රාශියක් ඉටු කරනු ලබයි.

**නාවික I අංශය**

**වැද්දුම් (Refit) ඉංජිනේරු අංශය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයුම් කරන සියළුම නැංගුරම් ටග් යාත්‍රාවල, හාරන යාත්‍රාවල සහ ගිනි නිවීම් සේවාවල නිරත "මේස" පාවෙන යාත්‍රාවේ මෙන්ම යාත්‍රාවල පිටතින් සවිකල සියළුම මෝටර්වල නිවාරක හා නිරවද්‍යාකාරක නඩත්තු කිරීම් මෙම අංශය වෙත පවරනු ලැබ ඇත. වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ, "හංසකාවා" හාරන යාත්‍රාව (Trailing Suction Dredger) සහ "දියකොවුලා" ග්‍රැබ් හොපර් හාරන යාත්‍රාව ප්‍රශස්ත මට්ටමින් නඩත්තු කර පවත්වාගෙන යන ලදී. ආරක්ෂක කොට්ඨාශය හා නාවික කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන පිටත සවිකර ඇති මෝටර්වල දෛනික අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ද උසස් අන්දමින් සිදු කරන ලදී.

ටග් යාත්‍රා සඳහා සිදු කරන තටාකාංගන සමීක්ෂණ වලට විකල්පයක් වශයෙන් සිදු කරන වියළි තටාකාංගන සහ ජලය අභ්‍යන්තරයේ සිදු කරන අළුත්වැඩියා ඇතුළු ප්‍රධාන අළුත්වැඩියා වර්ගීකරණ සංවිධානයේ සහයෝගය ලබා ගනිමින් සිදු කරන ලදී. ඒවාහි සියළු අවශ්‍ය යාන්ත්‍රික නඩත්තු හා අළුත්වැඩියා කටයුතුද නිම කරන ලදී. "දියකොවුලා" හාරන යාත්‍රාව කොළඹ නැව් තටාකාංගනයේදී පූර්ණ අළුත්වැඩියාවකට ලක් කරන ලද අතර, එහිදී ජලය යට සවි කර ඇති යාන්ත්‍රික උපකරණවල කොටස් අළුත්වැඩියා කරන ලද අතර, ගෙවුනු කොටස් හා තහඩු ඉවත් කර වර්ගීකරණ සංවිධානයේ රෙගුලාසි වලට අනුකූල වන අන්දමින් අළුතින් සවි කරන ලදී. වර්ෂයේ ප්‍රධාන ජයග්‍රහණ අතරට විදුලි ජනක යන්ත්‍ර පූර්ණ ලෙස අළුත්වැඩියා කිරීම හා හංසකාවා හාරන යන්ත්‍රයේ එන්ජිම අළුත්වැඩියා කිරීම

මෙන්ම බරණ II සහ නන්දිමිත්‍ර ටග් යාත්‍රාවල ප්‍රධාන එන්ජින් කොටස් සාර්ථකව අළුත්වැඩියා කිරීමද ඇතුළත් වේ.

**ඉංජිනේරු වරාය යාත්‍රා අංශය**

නියමු යාත්‍රා, මූවරිං යාත්‍රා සහ අනෙකුත් කුඩා ප්‍රමාණයේ යාත්‍රා අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීමේ වගකීම මෙම අංශයට පැවරී ඇත. මෙම වර්ෂයේදී, නාවික කොට්ඨාශයේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන වෙනත් වරායයන්හි මෙහෙයුම් අවශ්‍යතා සාර්ථකව ඉටු කිරීමට සමත් විය. සුවිශේෂී ජයග්‍රහණ ලෙස Mooring III සහ Donald Neish යන මූවරිං යාත්‍රාවල පූර්ණ අළුත්වැඩියාවන් ඇතුළත් විය. 2024 වර්ෂයේදී ත්‍රිකුණාමලය සහ ගාල්ල වරායයන්හි යාත්‍රාවල අළුත්වැඩියා කටයුතු ඇතුළු සියළුම නියමු යාත්‍රා, මූවරිං යාත්‍රා සහ වෙනත් යාත්‍රාවල දෛනික නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. වර්ෂය තුළදී, නියමු යාත්‍රා සඳහා සියළුම වර්ගීකරණ සමීක්ෂණ ද සාර්ථකව සිදු කරන ලදී.

**නාවික II**

**නැව්බඩු යාත්‍රා අංශය**

නාවික කොට්ඨාශය විසින් මෙහෙයුම් කරනු ලබන සියළුම යාත්‍රාවල මෙන්ම මෙහෙයුම් කොට්ඨාශයේ භාවිතා කරනු ලබන ඇදගෙන යාමේ ටග් යාත්‍රා, මෝටර් දියත් යාත්‍රා, වතුර බත්තල් සහ ඩෙක් බත්තල්වල වානේ සහ ව්‍යුහ අළුත්වැඩියා, පිටතල සැකසුම් කිරීම හා තීන්ත අලේප කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි. 2024 වර්ෂයේදී, නියමු යාත්‍රා (13 සහ 17), Mooring 3 මූවරිං යාත්‍රාව, කන්වදේව සහ අයිරාවණ යන නැංගුරම් ටග් යාත්‍රා සහ හංසකාවා සහ දියකොවුලා යන භාරන යාත්‍රා, අංක 16 වතුර බත්තලය සහ Tanac ටග් යාත්‍රාව ඇතුළු යාත්‍රා කිහිපයක විශාල ප්‍රමාණයේ අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

නැව්බඩු යාත්‍රා අංශයේ දියත් මගෙහි පියස්ස මුළුමනින්ම අළුත්වැඩියා කරන ලද අතර, දියත්මංවල අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. මෙයට අමතරව, මෙම අංශය විසින් පෞද්ගලික බෝට්ටු සඳහා ඇදගෙනයාමේ සේවාද සපයන ලදී. තවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා බාහිර ආයතන සඳහා රැහැන් පටි (wire slings) නිපදවා සැපයීම සහ මෙම කොට්ඨාශයේ අවශ්‍යතාවයන් සඳහා දොර/ජනෙල් තිර, කැන්වස් ආවරණ සහ කූඩාරම් රෙදි නිශ්පාදනය කිරීමද මෙම අංශයෙන් සිදු වේ. ගෑස් උදුන්, බත් පිසින බොයිලේරුද, ඇලුමිනියම් සාස්පාන් ඇතුළු මුළුතැන්ගෙවල් උපකරණ නඩත්තු කිරීම මෙම අංශයේ වගකීම් වලින් කොටසක් වේ.

**නව බේරේ අංශය**

මෙහෙයුම් කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන වානේ නැව්බඩු බත්තල් නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම නව බේරේ අංශයේ වගකීම වේ. 2024 වර්ෂයේදී, අංක 07 භාරන යාත්‍රාවේ බඳ කොටස මුළුමනින්ම නවීකරණය කරන ලද අතර, බත්තල්වල හා වතුර බත්තල්වල වානේ නවීකරණ කටයුතු නව බේරේ වානේ පිරිසැකසුම් වැඩහලේදී සිදු කරන ලදී.

**නැව් තැනීමේ අංශය (Shipwright)**

පාවෙන යාත්‍රාවල දැව සහ ෆයිබර්ග්ලාස් ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් විශේෂඥතාවයක් නැව් තැනීමේ අංශය සතුව ඇත. තවද, නාවික කොට්ඨාශය යටතේ භාවිතා වන නැංගුරම් ටග් යාත්‍රාවල සහ දියත් යාත්‍රාවල දැව ගෘහ භාණ්ඩ හා දැව වලක්නාවල අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන්නේද මෙම අංශය විසිනි. වර්ෂය තුළදී, Mooring III සහ Donald Neish දියත් යාත්‍රාවල යාත්‍රාවේ දැව ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු මෙම අංශය විසින් සාර්ථකව නිම කරන ලදී.

# මෙහෙයුම් සමාලෝචනය

## පරිශ්‍ර හා ඉඩම් කළමනාකරණ කොට්ඨාශය

**විෂය ක්ෂේත්‍රය හා කාර්යයන්**

- සියළුම වරායයන්වල ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත්ව පවතින සියළුම නිශ්චල දේපොළ කළමනාකරණය කිරීම.

- පවතින වෙළෙඳපොල ඉල්ලුම හා අනාගත විභව්‍යතාවය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම්වල සහ පරිශ්‍රවල ප්‍රතිලාභ ශ්‍රී ලංකා වරාය අධිකාරියට උපරිමයෙන් ලැබෙන පරිදි ඒවා තිරසර ලෙස භාවිතයෙහි යෙදවීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම් සහ පරිශ්‍ර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම ඉහළ නැංවෙන පරිදි හා වත්කම් කළමනාකරණ පිරිවැය ආවරණය කිරීමට හැකිවන පරිදි බාහිර පාර්ශ්වයනට කල්බදු පදනම / කුලී පදනම මත ලබා දීම.

- කිසියම් වූ ව්‍යාපෘතියක්, කිසියම් වූ බාහිර පාර්ශ්වයක අවශ්‍යතාවයක්, ඉඩම් කල්බදු පදනම මත ලබා දීම, පරිශ්‍ර කුලී පදනම මත ලබා දීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල නිවාස වෙන්කිරීමට තීරණ ගැනීම සඳහා ඉඩම් හා ගොඩනැගිලි කමිටු හා නිවාස කමිටු රැස්වීම් පැවැත්වීමට පහසුකම් සැලසීම හා කළමනාකරණය කිරීම.

- පරිශ්‍ර සඳහා රජයේ තක්සේරු වාර්තා කැඳවීම, කල්බදු ගිවිසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතුළුව වෙනත් උපචාරයන් සහ අවශ්‍ය මිනුම් සැලසුම් සකස් කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මාර්ගෝපදේශ හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන සැලැස්මට අනුකූලව නියමිත කාලවකවානු තුළ කල්බදු ගිවිසුම්, හිඟ බදු ගෙවීම් සහ ගිවිසුම් අළුත් කිරීම් පරිපාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම.

- ප්‍රමිතිගත ක්‍රියාපටිපාටි වලට අනුව වත්කම් මාරුකිරීම් ඇතුළුව ශ්‍රී ලංකා රජයේ / ශ්‍රී ලංකා වරාය අධිකාරියේ චක්‍රලේඛ වලට අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම්, පරිශ්‍ර සහ ව්‍යුහ භාරදීම/ භාරගැනීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත හා 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය පවරා ගැනීම) පනතේ විධිවිධාන ප්‍රකාරව නීති කොට්ඨාශය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් හා පරිශ්‍රවල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම් හා ගොඩනැගිලි සඳහා (වරිපනම් බදු හා කුලී ගෙවීම, ජල හා විදුලි බිල්පත් ගෙවීම) නාගරික සංවර්ධන අධිකාරිය, පලාත් පාලන ආයතන හා වෙනත් අදාළ ආයතන සමඟ නියාමන උපචාර මෙහෙයවීම.

- ප්‍රමිතිගත මාර්ගෝපදේශ ප්‍රකාරව කොළඹ වරාය, ගාල්ල වරාය, ත්‍රිකුණාමලය වරාය, ඔලුවිල් වරාය සහ කන්කසන්තුරය වරාය යන වරායවල්වල දේපොළ ඇතුළු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ගොඩනැගිලි, ඉඩම් හා ව්‍යුහ පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පැවැත්වීම.

- කලින් කලට සිදුවන වෙනස්වීම් නිරවද්‍ය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම් හා වත්කම් ලේඛනය යථාවත් කිරීම.

- නිවාස කමිටුවේ නිර්දේශ මත සේවකයින් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල නිවාස වෙන් කිරීම හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිවාස ලේඛනය කළමනාකරණය කිරීම.

## මෙහෙයුම් සමාලෝචනය

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා වෙන් කරදී ඇති නිල නිවාසවල පදිංචි සේවකයින් සත්‍යාපනය කිරීමට සහ ඔවුන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීති රීති වලට පටහැනිව නීති විරෝධී ක්‍රියාවන්හි යෙදෙනවාද යන්න හඳුනාගැනීමට කාලීන විමර්ශන පැවැත්වීම.

- සේවකයින් සඳහා වෙන් කරදී ඇති නිල නිවාසවල පදිංචිව සිටින සේවකයින් විසින් නිල නිවාස වලට අදාළ නීති රීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ඔවුනට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම/ විමර්ශන සඳහා කැඳවීම.

**කළමනාකරණය කිරීමට ඇති ඉඩම් වපසරිය**

| කලාපීය වරාය | වපසරිය / (හෙක්ටයාර) |
|---|---:|
| කොළඹ වරාය | 405.00 |
| ගාල්ල වරාය | 38.18 |
| ත්‍රිකුණාමලය වරාය | 2278.60 |
| ඔලුවිල් වරාය | 65.90 |
| කන්කසන්තුරය වරාය | 10.09 |

**නිල නිවාස වෙන් කිරීම**

| කාණ්ඩය | නිල නිවාස සංඛ්‍යාව |
|---|---:|
| I වන ශ්‍රේණිය | 03 |
| II වන ශ්‍රේණිය | 33 |
| III වන ශ්‍රේණිය | 27 |
| IV වන ශ්‍රේණිය | 06 |
| V වන ශ්‍රේණිය | 102 |
| VI වන ශ්‍රේණිය | 190 |
| VII වන ශ්‍රේණිය | 273 |
| **එකතුව** | **634** |

**2024 වර්ෂය තුළ පරිශ්‍ර හා ඉඩම් කළමනාකරණ කොට්ඨාශයේ ආදායම**

| ආදායම් මාර්ගය | ආදායම (රු.) |
|---|---:|
| ඉඩම් වලින් | 6,020,916,488.00 |
| ගොඩනැගිලි වලින් | 104,051,393.00 |
| ජල ප්‍රදේශ වලින් | 7,446,946.00 |
| නිල නිවාස වලින් | 40,674,790.00 |
| **එකතුව** | **6,173,089,617.00** |

**හඳුනාගත් ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | ඉඩමේ වපසරිය (හෙක්ටයාර) |
|---|---:|
| ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල නිවාස ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළුව මහර පිහිටි ඉඩම සංවර්ධනය කිරීම. | 8 |
| බ්ලූමැන්ඩල් සේවා සැපයුම් මධ්‍යස්ථානය | 2.2 |
| ජාත්‍යන්තර වරාය ආශ්‍රිත සේවා සැපයුම් මධ්‍යස්ථානය සඳහා කොළඹ වරාය තුළ හඳුනාගත් ඉඩම් | 4.0 |
| ත්‍රිකුණාමලය ප්‍රදේශයේ වරාය ආශ්‍රිත කර්මාන්ත හා සූර්ය බලශක්ති ව්‍යාපෘති | 950 |

| | |
|---|---|
| ඔලුවිල් වරාය සඳහා ඉඩම් වෙන්කිරීම් | 40 |
| බේරේ වැව අවට ඉඩම් සංවර්ධනය කිරීම | 10 |
| කොළඹ වරාය තුළ පිහිටි ඉඩම් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සහ ව්‍යාපාර සඳහා ඉඩම් වෙන් කිරීම | හඳුනාගත යුතුව ඇත. |

**2024.12.31 දිනට කල්බදු ගිවිසුම් පරිපාලනය**

| | කොළඹ | ගාල්ල | ත්‍රිකුණාමලය | ඔලුවිල් | කන්කසන්තුරය | එකතුව |
|---|---|---|---|---|---|---|
| කෙටිකාලීන (අවු. 10 ට අඩු) | 70 | 03 | 02 | 01 | - | **76** |
| දිගුකාලීන (අවු. 10 ට වැඩි) | 21 | 01 | 07 | - | 02 | **31** |
| **එකතුව** | **91** | **04** | **09** | **01** | **02** | **107** |

## සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාශය

**ක්‍රියාකාරීත්වය**

කොළඹ, ගාල්ල හා ත්‍රිකුණාමලය යන වරායයන් ඇතුළුව සමස්ත ආයතනයටම ද්‍රව්‍ය, උපකරණ හා ඉන්ධන අඛණ්ඩව සැපයීම සහතික කිරීම සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාශයේ මූලික වගකීම වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම කොට්ඨාශ හා අංශ වලට ඉන්ධන, යන්ත්‍ර, උපකරණ, අමතර කොටස් සහ අනෙකුත් අවශ්‍ය අයිතම ප්‍රසම්පාදනය කිරීම (දේශීය හා විදේශීය), ගබඩා කිරීම හා අංශ සඳහා බෙදාහැරීම ඇතුළුව විවිධ කාර්යයන් වල මෙම කොට්ඨාශය ක්‍රියාකාරීව නියැලී සිටී. දේශීය ප්‍රසම්පාදන, විදේශීය ප්‍රසම්පාදන/ වාජ්පු, පරිපාලන, වවුචර්, තොග පාලනය හා ප්‍රධාන ගබඩා වැනි උප-අංශ කිහිපයක් අතර සියළුම වගකීම් බෙදා දී ඇත.

**2024 වසරේ ප්‍රගතිය**

සමාලෝචිත වර්ෂය තුළ අනුමත කරන ලද ටෙන්ඩර් ගණන

| ටෙන්ඩරයේ නම | ටෙන්ඩර් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව | ටෙන්ඩර් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් සංඛ්‍යාව |
|---|---|---|
| DPC (රු. 20,000,000 ට වැඩි) | 14 | 4,160 |
| mPC – A (රු. 500,000 සිට රු. 20,000,000 දක්වා) | 45 | 2,074 |
| mPC – B (රු. 500,000 ට වඩා අඩු අනුමත සීමාව) | 87 | 3,413 |

**2024 වසරේ විදේශීය මිලදී ගැනීම් සඳහා සමස්ත වියදම**

- පිරිවැය සහ භාණ්ඩ ප්‍රවාහන අගය

  ප්‍රාග්ධන නොවන භාණ්ඩ - 767,166,144.79
  ප්‍රාග්ධන භාණ්ඩ - 69,627,159.20

- විවෘත කරන ලද ණයවර ලිපි ගණන (D/A,D/P ඇතුළුව) - 79
- විවෘත කරන ලද ටෙලිග්‍රැෆික් හුවමාරු ඇණවුම් - 28

**2024 වසරේ වාප්පු අංශය මගින් නිෂ්කාශනය කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු**

- මුහුදු ප්‍රවාහනය - 68
- ගුවන් ප්‍රවාහනය - 42
- පාර්සල් තැපැල - 03

**ප්‍රධාන ගබඩාව සහ තොග පාලනය**

| | |
|---|---|
| ගබඩාව වෙත ලැබූ භාණ්ඩවල වටිනාකම (2024 වර්ෂය තුළ ( ප්‍රාග්ධන නොවන)) | රු. 7,225,097,584.93 |
| ගබඩාව වෙත ලැබූ භාණ්ඩවල වටිනාකම (2024 වර්ෂය තුළ ( ප්‍රාග්ධන)) | රු. 721,879,373.71 |
| භාණ්ඩ භාවිතා කරන අංශ වෙත නිකුත් කරන ලද භාණ්ඩවල වටිනාකම (ප්‍රාග්ධන නොවන) | රු. 7,178,510,297.52 |

## ලේකම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක වන ලේකම් කොට්ඨාශය සභාපති, උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ හා අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ කාර්යාල වලට සුවිශේෂී සහයෝගයක් දක්වමින් කටයුතු කරන කොට්ඨාශයකි. අධිකාරියේ සමස්ත පරිපාලන කාර්යයන් කළමනාකරණය කිරීමේදී, ආයතනයේ ක්‍රියාකාරීත්වයේ ක්‍රමානුකූල පැවැත්ම සහතික වන ආකාරයෙන් සුවිශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය, විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ වෙනත් බාහිර පාර්ශ්වීය ආයතන ඇතුළු අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට නිවැරදි හා කාලීන තොරතුරු ලබා දීමේ වගකීම දරනු ලබන්නේද මෙම කොට්ඨාශය විසිනි. මෙම කොට්ඨාශය විසින් පරිපාලන කටයුතු මෙහෙයවීමේ වගකීම දරමින් කටයුතු කිරීම පමණක් නොව වෙනත් කොට්ඨාශ සමඟ සමීප සම්බන්ධීකරණයෙන් යුක්තව අධිකාරියේ අත්‍යාවශ්‍ය ලිපි ලේඛන අනුසාරයෙන් වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම, විගණන වාර්තාව සඳහා පිළිතුරු, මාසික හා ත්‍රෛමාසික ප්‍රගති වාර්තා සහ පාර්ලිමේන්තු කමිටු සඳහා අවශ්‍ය වාර්තා පිළියෙල කිරීමේදී ද වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. තවද, පාර්ලිමේන්තු සැසිවාර වලදී ගරු අමාත්‍යතුමාගෙන් විමසනු ලබන ප්‍රශ්න වලට පිළිතුරු සැකසීම, විශේෂ වැදගත්කමක් ඇති උත්සව සංවිධානය කිරීම, පරිපාලනය අධීක්ෂණය කිරීම, සංචාරක බංගලා පිළිබඳ පරිපාලනය සහ ඉහළ කළමනාකාරීත්වයේ රැස්වීම් වලට අවශ්‍ය පහසුකම් සැලසීම ආදී කටයුතුද ඉටු කරනු ලබන්නේ මෙම කොට්ඨාශය විසින් වන අතර ආයතනික හා සමාජීයීය වගකීම් පිළිබඳ කාර්යයන් සම්බන්ධයෙන්ද පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශයකින් යුතුව කටයුතු කරයි.

ලේකම් කොට්ඨාශය 2024 වර්ෂයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා අග්‍රහාර (රන්) සේවක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගෙවීම් පියවීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය සමඟ එකඟතාවයකට එළඹින. මෙම ප්‍රතිපූර්ණ කිරීම් මගින් රෝහල්ගතවීම්, අසාධ්‍ය රෝග, දරු උපත්, හදිසි අනතුරු සහ මරණ ඇතුළු විවිධ රෝග ආවරණය කෙරේ. මෙම රක්ෂණ යෝජනා ක්‍රමයෙන් සේවකයින් 1,079 දෙනෙකු ප්‍රතිලාභ ලැබූ අතර හිමිකම් පෑ මුළු මුදල රු120,380,508/- ක් විය. ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වෙන අයුරු වේ.

| විස්තරය | | සේවක සංඛ්‍යාව | හිමිකම් පෑ මුදල (රු.) |
|---|---|---|---|
| රෝහල් ගතවීම් | පෞද්ගලික | 645 | 58,008,439.00 |
| | රජයේ | 265 | 3,882,576.00 |
| බරපතල රෝග | හදවත් සැත්කම් | 41 | 34,825,154.00 |
| | පිළිකා | 8 | 1,055,341.00 |
| | මොලයේ සැත්කම් | 1 | 1,200,000.00 |

| විස්තරය | | සේවක සංඛ්‍යාව | හිමිකම් පෑ මුදල (රු.) |
|---|---|---|---|
| | වකුගඩු රෝගාබාධ | 12 | 227,805.00 |
| දරු උපත් | සීසේරියන්/ සාමාන්‍ය | 62 | 4,731,193.00 |
| හදිසි අනතුරු | සුළු අකර්මන්‍ය | 1 | 750,000.00 |
| | උකුල් ඇට/දණහිස් බද්ධ කිරීම | 2 | 500,000.00 |
| මරණ | සාමාන්‍ය | 36 | 11,200,000.00 |
| | හදිසි අනතුරු | 6 | 4,000,000.00 |
| **එකතුව** | | **1,079** | **120,380,508.00** |

2024 වර්ෂය මුළුල්ලේම ලේකම් කොට්ඨාශය 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව, 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම, විගණන වාර්තාවට පිළිතුරු, පාර්ලිමේන්තු කමිටු වාර්තා සහ පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු, ඇතුළු වැදගත් ලිපි ලේඛන සකස් කර අවසන් කිරීමට ඒ ඒ කොට්ඨාශ සමඟ යුහුසුළුව කටයුතු කරන ලදී. මාසික හා ත්‍රෛමාසික ප්‍රගති වාර්තාද විශේෂ අවධානයකින් යුතුව පිළියෙල කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.

විනය ක්‍රියාමාර්ග වලට යටත් කරන ලද විධායක ශ්‍රේණිගත නොවන සේවකයින් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳවද මෙම කොට්ඨාශය කටයුතු කරන ලදී. වර්ෂය තුළ අභියාචනා 16 ක් ලැබුනු අතර 2024 වර්ෂය අවසානය වන විට එම අභියාචනා වලින් 13 ක් සාර්ථකව විසඳන ලදී. ඉතිරි අභියාචනා 03 අභියාචනා කමිටුව යටතේ විමර්ශනය කරන ලදී. තවද, 2024 තුළදී විගණන විමසුම් 52 ක් කොට්ඨාශය වෙත ලැබුණු අතර ඉන් 49 කට කඩිනමින් පිළිතුරු සපයන ලදී.

ඉහළ කළමනාකාරීත්වයේ උපදෙස් අනුව, විධිමත් පරිපාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ කාර්යක්ෂම පරිපාලනයක් සහතික කිරීම අරමුණු කොටගෙන චක්‍රලේඛ 35 ක් නිකුත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ග මගින් ඉහළ මට්ටමේ පරිපාලන කාර්යක්ෂමතාවයක් පවත්වාගෙන යාමට හා ස්ථාපිතව පවතින ක්‍රියාපිළිවෙත් වලට අනුකූලව කටයුතු කිරීමට කොට්ඨාශය තුළ ඇති කැපවීම මෙම ක්‍රියාමාර්ග වලින් පිළිඹිබු වේ.

## මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගෝලීය වශයෙන් අත්කර ගෙන ඇති සාර්ථකත්වය සඳහා මානව ප්‍රාග්ධනය අතිශය වැදගත් සම්පතක් වේ. විවිධත්වයෙන් හා ඉහළ නිපුණතාවයෙන් යුත් වෘත්තීයවේදීන්, වැඩිදියුණු කරන ලද පුහුණු කිරීමේ වැඩසටහන් සහ නවෝත්පාදනය හා තිරසරභාවය පිළිබඳව ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් නියෝජනය කරනු ලැබේ. මෙම අංග මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් විශිෂ්ටත්වය හා ගෝලීය වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස එහි තත්ත්වය මෙහෙයවනු ලැබේ. සේවක බලකායේ වැදගත් කොටසක් මෙහෙයුම්, නාවික හා ඉංජිනේරු කටයුතුවල නිරතව සිටී. මෙහෙයුම් සඳහා ඉහළම දක්ෂතාවයන්ගෙන් හා කුසලතාවයන්ගෙන් හෙබි සේවකයින් ආකර්ෂණය කර රඳවා ගැනීමේ ක්‍රමෝපායන් හා අනුකූලව ඉහළ වැටුප් හා විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබා දෙන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රසිද්ධියක් උසුලයි. මෙහෙයුම් විශිෂ්ටත්වය හා ගෝලීය කීර්තිය ප්‍රවර්ධනය කිරීමට අත්‍යාවශ්‍ය වන ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන්, ස්ත්‍රී පුරුෂ භාවය, වෘත්තිය කණ්ඩායම් ආදිය නියෝජනය කරනු ලබන විවිධත්වයෙන් යුත් සේවක බලකායක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයට බඳවා ගෙන ඇත. 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සංඛ්‍යාව 7,624 කි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව වන 6,987 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර 2023.12.11 දින සිට බලාත්මක වේ. මීට අමතරව, සේවක බලකාය පිළිබඳ ඉල්ලුම, නිපුණතාවයෙන් යුත් සේවකයින් ආකර්ෂණය කර ගැනීම සහ වරාය ක්ෂේත්‍රයේ වෙනස් වන අවශ්‍යතායන් සපුරාලීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රමෝපායික අරමුණු

වන කාර්යක්ෂමතාවය, නවෝත්පාදනය හා ගෝලීය තරඟකාරීත්වය සමඟ අනුකූල වන ලෙස විධායක හා විධායක නොවන සේවකයින් සඳහා නව බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර ඇත.

සමාලෝචිත වර්ෂය තුළ, විධායක හා විධායක නොවන සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

| සේවක කාණ්ඩය | ස්ථිර | කොන්ත්‍රාත් | ද්විතීයකරණය | එකතුව |
|---|---|---|---|---|
| විධායක | 562 | 23 | 1 | **586** |
| විධායක නොවන | 4,039 | | 9 | **4,048** |
| තාක්ෂණික/ තාක්ෂණික නොවන | 2,990 | | | **2,990** |
| **එකතුව** | **7,591** | **23** | **10** | **7,624** |

සමුද්‍රීය නාවිකත්වය, තාක්ෂණික කුසලතා, ආරක්ෂාව, වරාය මෙහෙයුම්, කළමනාකරණය, උපකරණ මෙහෙයුම් සහ තොරතුරු පද්ධති ඇතුළුව විවිධ ක්ෂේත්‍ර පිළිබඳව අංග සම්පූර්ණ පුහුණු පාඨමාලා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායාතනය විසින් ලබා දෙනු ලැබේ. ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට හා සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ නිපුණතාවයෙන් යුත් වෘත්තිකයන් නිර්මාණය කිරීම සඳහා දායකවීම පිණිස නවීනතම පහසුකම් සමඟ "සයුර" නම් අධ්‍යාපනික ගොඩනැගිල්ල ස්ථාපිත කර ඇත.

2024 වසරේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලද සේවකයින්හට ඔවුන්ගේ සේවා කාලය මත පදනම්ව රු. 63,093,750/- ක මුදල් ප්‍රදානයක් ලබා දෙන ලදී. මීට අමතරව, සේවා කාලය වසර 15 ට වඩා අඩු විශ්‍රාම ගන්නා ලද සේවකයින්හට රු. 76,000/- ක මුදලක් ගෙවා ඇත. වසර තුළ මරණයට පත් වූ සේවකයන්ගේ යැපෙන්නන් සඳහා පාරිතෝෂිත ගෙවීම් ලෙස රු. 904,500/- ක මුදලක් ගෙවා ඇත.

විනයානුකූල සේවක පිරිසක් පවත්වාගෙනයාම සඳහා විනය පරීක්ෂණ 134 ක් මානව සම්පත් කොට්ඨාශය විසින් 2024 වසර තුළ පවත්වා ඇත.

2024 වර්ෂය තුළ සේවයෙන් ඉවත්ව යන මුළු සේවක සංඛ්‍යාව 507 ක් වූ අතර එම අයගේ විස්තර පහත දැක්වේ.

| හේතුව | එකතුව |
|---|---|
| විශ්‍රාම ගැනීම් (අනිවාර්ය හා නියමිත දිනට ප්‍රථම විශ්‍රාම යෑම) | 373 |
| මරණ | 23 |
| සේවයෙන් පහ කිරීම | 8 |
| ඉල්ලා අස්වීම් | 46 |
| සේවය අත්හැර යෑම | 46 |
| වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම් | 10 |
| සේවය අවසන් කිරීම | 1 |
| **එකතුව** | **507** |

සාමූහිකව රැස්වීමේ හා සාමූහිකව කේවල් කිරීමේ අයිතිය හඳුනාගැනීම හා ඒ සඳහා සහාය පළ කිරීම තුළින් සේවක අයිතීන් පිළිබඳ කැපවීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය පෙන්නුම් කරනු ලැබේ. වෘත්තීය සමිති නියෝජනය කිරීම තුළින් සහයෝගීතා කාර්යය පරිසරයක් පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රවේශය පිළිඹිබු කරන අතර සේවකයින්හට ඔවුන්ගේ ගැටළු සහ සාධාරණ වැටුප්, ප්‍රතිලාභ සහ වැඩ කිරීමේ තත්ත්වයන් පිළිබඳ සාකච්ඡා කිරීමට ඉඩ සලසා දෙනු ලැබේ. කම්කරු අයිතීන් සහ අන්තර්ජාතික ප්‍රමිතීන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සැමවිටම අනුගමනය කරන අතර එමඟින් කළමනාකාරීත්වය හා සේවකයින් අතර අන්‍යෝන්‍ය ගරුත්වය හා සහයෝගීතාවය සහතික කෙරෙනු ලැබේ.

## සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය අරමුණු මුදුන්පත්කර ගැනීමේදී මානව සම්පත කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරනු ලබයි. භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන්ට වඩා මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයන් හාත්පසින්ම වෙනස්ය. ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරමින් ස්වකීය සේවකයන්ගේ තෘප්තිමත්භාවයට වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබාදීමට ඉවහල් වන්නාවූ පහසුකම් හා ප්‍රස්ථාවන් ලබා දීම අරමුණු කරගෙන සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශයේ කාර්යභාරය විවිධ පැතිකඩනයන් ඔස්සේ 2024 වසර තුළ විහිද ගියේය.

කාර්යාල ගණයේ සේවකයින්ට දිවා සහ රාත්‍රී ආහාර පමණක්ද, සේවා මුර පදනමෙහි යොදවන සේවකයින්ට දිවා, රාත්‍රී, උදෑසන ආහාර සහ කැවිලි සමඟ තේ සැපයීම මධ්‍යම මුළුතැන්ගෙවල් අංශයෙන් සිදු කරනු ලබයි. 2024 වසර තුළ, දිවා රාත්‍රී සහ උදෑසන ආහාර වේල් 2,792,757 ක් වෙනුවෙන් රු. 1,388,221,421/- ක් ද තේ සහ කැවිලි 3,439,555 ක් වෙනුවෙන් රු. 620,378,498/- ක් ද වැය කර ඇත. ඒ අනුව, වසරේ සමස්ත ආහාර වියදම රු. 2,008,599,919/- කි.

2024 වර්ෂය තුළ ඇස් කණ්ණාඩි ලබා දීම වෙනුවෙන් රු. 8,190,100/- ක් ද අනෙකුත් බාහිර වෛද්‍ය බිල්පත් වෙනුවෙන් රු. 21,545,974/- ක් ද වශයෙන් මුළු මුදල වූ රු. 29,736,074/- ක් කාර්ය මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්ගේ දරුවන්ගේ ද්විතියික හා උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ආයතනය විසින් අඛණ්ඩව සිදු කර ඇත.

- අ.පො.ස. (උසස්.පෙළ) හදාරන සිසුන් සඳහා රු. 990,000/- ක් වැය කර ඇත.
- විශ්ව විද්‍යාල විෂයයන් සඳහා රු. 6,525,000/- ක් වැය කර ඇත.
- වසර තුළ ශිෂ්‍යත්ව සඳහා වැය වූ සමස්ත වියදම රු. 7,515,000/- කි.

පහළොස් වසරකට වැඩි සේවා කාලයක් හිමි විශ්‍රාම යන හෝ ඉල්ලා අස්වන සේවක මහත්ම/ මහත්මීන්ට සේවා කාලය අනුව රන් පවුම් ලබා දීම වෙනුවට මුදල් ප්‍රදානය කිරීම සිදු කරනු ලබන අතර, 2024 වසරේදී සේවක මහත්ම/ මහත්මීන් 305 ක් සඳහා රු. 44,187,500/- ක මුදලක් ගෙවීම් කර ඇත. වසර 30 ක සේවා කාලය සම්පූර්ණ කරන සියළු සේවක මහත්ම/ මහත්මීන්ට අගනා පෝසිලේන් තේ කට්ටල ප්‍රදානය කෙරේ. 2024 වසර තුළ දී පෝසිලේන් කට්ටල 53 ක් ප්‍රදානය කර ඇත.

වරාය පරිශ්‍රය තුළ ස්ථාපිත සුභසාධක ආපනශාලා මගින් 2024 වසර තුළ වාර්ෂික මුළු බදු මුදල ලෙස රු. 4,684,513/- ක මුදලක් අය කර ඇත.

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා කෞතුකාගාරය නැරඹීම සඳහා ශ්‍රී ලාංකිකයන් 46,230 දෙනෙකු සහ විදේශීය ජාතිකයින් 4,875 දෙනෙකු පැමිණ ඇත.

සුභසාධක නිවාඩු අනුමත කිරීම සඳහා 2024 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා අයදුම්පත් 119 ක් ලැබී ඇති අතර ඉන් අනුමත අයදුම්පත් 104 ක් සඳහා වැටුප් සහිත නිවාඩු දින 3,632 ක් සඳහා අනුමැතිය ලැබී ඇත.

2024 වසරේදී බාහිර ආයතන වෙත අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් වරාය පරිශ්‍රය තුළ පැවැත්වීමට අවසර ලබා දීමෙන් රු. 470,050/- ක මුදලක් අය කර ගෙන ඇත.

## වෛද්‍ය කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෛද්‍ය කොට්ඨාශය එහි සේවකයින්හට පරිපූර්ණ වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා කැපවී සිටී. එමඟින්, ප්‍රාරම්භක සෞඛ්‍ය ප්‍රතිකාර මෙන්ව සතියේ දින හත පැය විසි හතර පුරා

හදිසි වෛද්‍ය සේවා ලබා දෙන අතර පුහුණු වෘත්තිකයන්ගෙන් යුත් කාර්ය මණ්ඩලයක් විසින් ගිලන් රථ සේවාව මෙහෙයවනු ලැබේ. මෑතකදී සංක්‍රමණ සඳහා ජාත්‍යන්තර සංවිධානය විසින් නවීන ගිලන් රථයක් මෙම කොට්ඨාශයට පරිත්‍යාග කරන ලදී.

දෛනික සෞඛ්‍ය ප්‍රතිකාර වලට අමතරව, සෞඛ්‍ය අධ්‍යාපනය සහ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම, රාජකාරී සඳහා වෛද්‍ය යෝග්‍යතා තක්සේරු සිදු කිරීම, වෛද්‍ය නිවාඩු අනුමත කිරීම හා වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය සඳහා පහසුකම් සැපයීම මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. ඩෙංගු සහ ජලභීතිකාව පාලනය සහ ඒ ඒ කාලවකවානු වලදී මතුවන වසංගත වලට ප්‍රතිචාර දැක්වීම වැනි රෝග වැළැක්වීමේ සෞඛ්‍ය පියවර අවශ්‍ය පරිදි ගනු ලැබේ.

**පසුගිය වසර තුළ සිදු කළ ප්‍රධාන කාර්යයන්**

1. **සේවක සෞඛ්‍ය තක්සේරුව -** පූර්ව මැදිහත් වීම් මගින් බරපතල සෞඛ්‍ය ගැටළු හඳුනාගනිමින් හා විසඳුම් ලබා දෙමින් ඉහළ අවධානම් සහිත මෙහෙයුම්වල නියුතු සේවකයින් සඳහා යෝග්‍යතා ඇගයීම් සිදු කරන ලදී.

2. **මත්ද්‍රව්‍ය භාවිතය කළමනාකරණය -** මත්ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා විස්තීර්ණ ශ්වසන පරීක්ෂණ සිදු කිරීම ඇතුළුව ඒ පිළිබඳ අධ්‍යාපනය ලබා දීම, උපදේශනය, ප්‍රතිකාර ලබා දීම හා පුනරුත්තාපනය කිරීම. පුනරුත්තාපනය වීමෙන් පසුව සේවකයින් කිහිපදෙනෙක් සාර්ථකව තම දෛනික රාජකාරී කටයුතු සිදු කිරීමට නැවත පැමිණෙන ලදී.

3. **උපද්‍රව හඳුනාගැනීමේ සැලසුම් -** අදාළ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව රැකියා ස්ථානය තුළ සෞඛ්‍ය උපද්‍රව හඳුනාගෙන ඒවාට පිළියම් ලබා දීම.

4. **උපදේශන සේවා -** කාන්තා, ළමා කටයුතු සහ සමාජ බලගැන්වීමේ අමාත්‍යාංශයේ සහාය ඇතිව සේවකයින්හට උපදේශන සේවා සැසි පැවැත්වීම සඳහා සැලසුම් ආරම්භ කරන ලදී.

පූර්වක්‍රියාකාරී සහ ප්‍රතිචාරාත්මක සෞඛ්‍ය ප්‍රතිකාර මුලපිරීම් හරහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්ගේ සෞඛ්‍යහා යහපැවැත්ම ආරක්ෂා කිරීමට වෛද්‍ය කොට්ඨාශය කැපවී සිටී.

## මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය යනු ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ISO 9001:2015 තත්ත්ව සහතිකය ලත් පුහුණු කිරීමේ කොට්ඨාශයකි. එම ආයතනය, වරාය, සමුද්‍රීය හා වෘත්තීය පුහුණුවෙහි විශිෂ්ටත්වය වර්ධනය කිරීමට කැප වී සිටියි. මෙම විද්‍යායතනයෙහි මූලික අරමුණ නම් වරාය සේවකයින්ට සහ වරාය පරිශීලනය කරන පුද්ගලයින්හට පුහුණු පහසුකම් සලසා දෙමින් වරාය ක්ෂේත්‍රයේ මෙහෙයුම් සඳහා කුසලතාවලින් පරිපූර්ණ ශ්‍රමබලකායක් ගොඩනැංවීම වේ. මෙයට අමතරව, මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් වරාය, සමුද්‍රීය හා වෘත්තීය ක්ෂේත්‍ර පිළිබඳව උනන්දුවක් දක්වන දේශීය හා විදේශීය අභ්‍යාසලාභීන් සඳහා පුහුණු අවස්ථා සලසා දෙනු ලැබේ. තවද, මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් වරාය ක්ෂේත්‍රයේ නියැලී සිටින දේශීය හා විදේශීය වෘත්තිකයන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීමේ හා යාවත්කාලීන කිරීමේ අරමුණින් වරාය, සමුද්‍රීය හා සේවා සැපයුම් ක්ෂේත්‍ර හා අදාළ පශ්චාත් උපාධි, උපාධි, උපාධි ඩිප්ලෝමා සහ වරාය ආශ්‍රිත වෙනත් ඩිප්ලෝමා හඳුන්වාදීම සඳහා සැලසුම් කර ඇත. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් යටතේ සුදුසුකම් ලැබීමේ අපේක්ෂාවෙන් සිටින අපේක්ෂකයින් සඳහා ප්‍රවීණතාවය මත පදනම්වූ ඇගයීම් වැඩසටහන්ද මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් පවත්වනු ලබයි.

### ISO 9001:2015 තත්ත්ව සහතිකය

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ පුහුණු කිරීමේ වැඩසටහන්හි ගුණාත්මකභාවය ඉහළ නංවාලීමට සහ අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය (IMO) සහ International Convention on Standards

of Training, Certification and Watchkeeping for Seafarers (STCW) සම්මුතීන් යටතේ නාවික පුහුණුව පැවැත්වීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයන් සපුරාලීමේ අරමුණින් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් තත්ත්ව සහතික පද්ධතීන් පිළිබඳ ඉන්දියානු රෙජිස්ට්‍රාර්වරයා (IRQS) විසින් ලබා දෙන ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය ලබා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සමුද්‍රීය පුහුණු හා අධ්‍යාපන විද්‍යායතනයක් වශයෙන් මෙම සහතිකය මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ පුහුණු කිරීමේ කටයුතු ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාමට මෙම ආයතනයේ පවතින කැපවීම පිළිඹිබු කරනු ලබයි.

### 2024 වර්ෂය තුළ ලැබූ ජයග්‍රහණ

රට සාමාන්‍යකරණයට නැවත පැමිණීමෙන් පසු නැවුම් ආරම්භයක් සනිටුහන් කරමින්, 2024 වර්ෂය මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය සඳහා වැදගත් වසරක් බවට පත් විය. මෙම වසර තුළ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය, සැලකිය යුතු සන්ධිස්ථාන අත්පත්කර කරමින් තත්ත්වය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් කිහිපයක් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරාය සේවකයන්, නාවිකයන්, උපාධි අපේක්ෂකයන් හා වෘත්තීය අභ්‍යාසලාභීන්හට සැලකිය යුතු පුහුණු වීම් වැඩසටහන් සංඛ්‍යාවක් පැවැත්වීම මෙයට ඇතුළත් වේ. මෙම ආයතනය මගින් සියළුම පුහුණු ක්‍රියාවලීන් සුසංවිධිත කිරීම සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) හඳුන්වා දී ඇත. මෙයට අමතරව, නවීන පහසුකම් සහිත නව පන්ති කාමර සකස් කර ශ්‍රවණාගාරය හා වැසිකිළි අළුත්වැඩියා කටයුතු අවසන් කරන ලදී. වරාය හා සමුද්‍රීය ක්ෂේත්‍ර සඳහා වර්ධනය වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම සඳහා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් නව සේවක සංඛ්‍යාවක් හඳුන්වාදී පුහුණු කාර්ය මණ්ඩල ප්‍රමාණය වැඩි කරන ලදී.

### 2024 වර්ෂයේ මූල්‍ය කාර්යසාධනය

2024 වසර තුළ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් ගාස්තු අයකරන ලද පාඨමාලා මගින් රු. 122,321,802/- ක් උපයා ගත් අතර ගාස්තු අය නොකරන පාඨමාලා මගින් රු. 30,936,013/- ක් උපයා ගෙන ඇත.

### 2024 වසරේ පුහුණු කාර්යසාධනය

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් මිනිස් පැය 326,382 සම්පූර්ණ කරමින් අපේක්ෂකයන් 12,924 දෙනෙකු සඳහා විවිධ විෂයධාරාවන් පිළිබඳව පුහුණු වැඩසටහන් 606 ක් පවත්වන ලදී. සමුද්‍රීය හා නාවිකත්වය, වෘත්තීමය සෞඛ්‍යය සහ ආරක්ෂාව, වරාය මෙහෙයුම් සහ සේවා සැපයුම්, කළමනාකරණය, තොරතුරු පද්ධති සහ තාක්ෂණික පුහුණු විෂයධාරා මෙයට ඇතුළත් වේ.

### 2025/2026 වසර සඳහා කෙටි කාලීන සැලසුම්

කෙටි කාලීන සැලසුම් යටතේ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය පුහුණු අංශය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම පිළිබඳ අවධානය යොමු කිරීමට සැලසුම් කර ඇත. පුහුණුව ලබා දීම පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී, වරාය හා සේවා සැපයුම් ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කරනු ලබන අතර, වරාය ක්ෂේත්‍රයේ නියැලි සේවකයින් සඳහා උපාධි ඩිප්ලෝමා හඳුන්වා දෙනු ඇත. සිවිල්, විදුලි හා විද්‍යුත්, යාන්ත්‍රික සහ නාවික ඉංජිනේරු යන ක්ෂේත්‍රයන් යටතේ කාර්මික තාක්ෂණය සඳහා නව ඩිප්ලෝමා වැඩසටහනක්ද හඳුන්වා දෙනු ඇත. තවද, මෙම ආයතනය මගින් සමුද්‍රීය ක්ෂේත්‍රයට අදාළ නව පුහුණු වැඩසටහන් දියත් කර වරාය ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති මත පදනම් වූ සේවාස්ථ පුහුණු වැඩසටහන් විධිමත් කිරීමද, ක්ෂේත්‍රයේ අවශ්‍යතා සමඟ අනුකූල වන පරිදි දැනට පවතින පාඨමාලා විෂය මාලාව පිළිබඳ නැවත සලකා බැලීම සහ සාකච්ඡා කිරීම හා සියළු ක්‍රියාවලීන් සඳහා ප්‍රමිතිගත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOP) නැවත සකස් කිරීමද සිදු කරනු ලැබේ.

යටිතල පහසුකම් අංශය දෙස අවධානය යොමු කරන කල්හි, මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය අලංකරණය කිරීමේ කටයුතු වැඩි දියුණු කිරීම, නව්‍ය සංවර්ධන තාක්ෂණය සමඟ පවතින විද්‍යාගාර උත්ශ්‍රේණී කිරීම හා පවතින සූර්ය බල පද්ධතිය පුළුල් කිරීමටද අපේක්ෂා කෙරේ.

## මෙහෙයුම් සමාලෝචනය

**මධ්‍ය කාලීන සැලසුම්**

මධ්‍ය කාලීන සැලසුම් අතර, මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් වරාය ක්ෂේත්‍රයේ නියැලි සේවකයින්හට වරාය හා සේවා සැපයුම් ක්ෂේත්‍රයට අදාළ උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි සැලසුම් කර පැවැත්වීම මගින් එහි පුහුණු අවස්ථා පුළුල් කිරීම අඛණ්ඩව සිදු කර ගෙන යනු ඇත. විදුලි හා විද්‍යුත් සහ වෘත්තීමය සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳව නව පුහුණු වැඩසටහන් හඳුන්වා දෙනු ලබන අතර ජාතික වෘත්තීය සුදුසුකම් දැනට පවතින පුහුණු වැඩසටහන් හා ඒකාබද්ධ කරනු ඇත. මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ උසස් අධ්‍යාපන විද්‍යායතනයක් ලෙස ලියාපදිංචි කිරීමට, රාජ්‍ය විශ්වවිද්‍යාල සමඟ සාමූහික ගිවිසුම් අත්සන් තැබීමට හා සවස් සහ සති අන්ත පදනම මත පුහුණු වැඩසටහන් හඳුන්වාදීමටද සැලසුම් කර ඇත.

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ සුන්දරත්වය වැඩි දියුණු කිරීම, පාලම්, ගැන්ට්‍රි දොඹකර, ප්‍රයිම් මූවර්, අඩු එසවුම් වැනි පුහුණු අනුකාරක ක්‍රියාත්මක කිරීම සහ අංග සම්පූර්ණ Toastmaster Laboratory) ස්ථාපිත කිරීමද සිදු කර ඇත. මෙම විද්‍යායතනය තුළ අභ්‍යාසලාභීන් සඳහා නවාතැන් පහසුකම් ලබා දෙනු ඇති අතර යෝජිත තෙමහල් ගොඩනැගිල්ල සම්පූර්ණ කර මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය වෙත නව ප්‍රවේශ මාර්ගයක් ඉදි කෙරෙනු ඇත.

## නීති කොට්ඨාශය

නීති නිලධාරීන් යනු, 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් විශේෂයෙන් සඳහන් කර ඇති කොළඹ වරාය, ගාල්ල, ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරය/ පේදුරු තුඩුව යන වරායවල නීති උපදේශකයින් වන අතර, මෙම නීති උපදේශකයින් විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට, අධ්‍යක්ෂවරුන් වෙත, කොට්ඨාශ ප්‍රධානීන් වෙත හා අංශ ප්‍රධානීන් වෙත නීති උපදෙස් දීම සිදු කරනු ලබයි.

**නීති උපදෙස්**

2024 වර්ෂය තුළ කළමනාකාරීත්වයට හා කොට්ඨාශ ප්‍රධානීන් වෙත නීති උපදෙස් 200 කට වැඩි උපදෙස් සඛ්‍යාවක් ලබා දී ඇත.

ඊට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන කොන්ත්‍රාත්තු, ගිවිසුම්, ඔප්පු (පැවරුම්, බදු, ප්‍රකාශන, උගස්) කෙටුම්පත් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඒ හා සම්බන්ධ වෙනත් කටයුතු ද නීති කොට්ඨාශයේ විෂය පථය යටතට ගැනේ.

**කොන්ත්‍රාත්, ගිවිසුම්, බැඳුම්කර සහ ඔප්පු**

2024 වර්ෂය තුළ කල් බදු ගිවිසුම් 52 ක්, ගිවිසුම්/කොන්ත්‍රාත් 39 ක්, පරිශිෂ්ට, ව්‍යාපාර සමපේක්ෂණ, කොටස්හිමිකාර ගිවිසුම්, ඍජු ගිවිසුම් ආදිය සහ අවබෝධතා ගිවිසුම් නීති කොට්ඨාශය විසින් ක්‍රියාත්මක කර ඇත.

- විදේශ රැකියා/ පුහුණු වීම්/ අධ්‍යාපන හා සම්බන්ධ වැටුප් රහිත නිවාඩු පිළිබඳ ගිවිසුම් හා බැඳුම්කර 13 ක්.
- පූර්ණ වැටුප් සහිත විදේශීය/දේශීය අධ්‍යාපන කටයුතු සඳහා ගිවිසුම් හා බැඳුම්කර 03 ක්.
- අවබෝධතා ගිවිසුම් 03 ක්
- කොන්ත්‍රාත් ගිවිසුම් 17 ක්
- පරිපූරක ගිවිසුම් 02 ක්
- සාමූහික ගිවිසුම් 01 ක්

## මෙහෙයුම් සමාලෝචනය

**අධිකරණ ක්‍රියාමාර්ග**

2023.01.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, නීති උපදේශකයින්ගේ සහාය ඇතිව හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ, මහාධිකරණ, දිසා අධිකරණ සහ කම්කරු විනිශ්චය සභා, ආදී අධිකරණමය කටයුතු වලට සම්බන්ධ සියළුම කටයුතු නීතිපති හා නීති කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ.

ඉහත සඳහන් නඩු වලට අමතරව, කම්කරු දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිසම, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (Ombudsman), කම්කරු උසාවි, කම්කරු වන්දි හා රේගු විමර්ශන පිළිබඳ කටයුතු ද නීති කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. 2024.12.31 දින වන විට එම ආයතනවල නිම නොවූ නඩු /පැමිණිලි/අයදුම් 358 ක් ඇත.

**ශ්‍රේෂ්ඨාධිකරණ නඩු**

2024 වසර තුළ ශ්‍රේෂ්ඨාධිකරණයේ අළුත් නඩු 06 ක් පවරා ඇති අතර නඩු 09 ක් අවසන් කර ඇත. 2024.12.31 දිනට නිම නොවී තිබූ නඩු ගණන 19 ක් විය.

**අභියාචනාධිකරණ නඩු**

2024 වර්ෂය තුළ, අළුතින් නඩු 12 ක් ගොනු කරන ලද අතර, නඩු 22 ක් අවසන් විය. 2024.12.31 දිනට නඩු 24 ක් අවසන් නොවී පැවතින.

**මහාධිකරණ නඩු**

2024 වර්ෂය තුළ, අළුතින් නඩු ගොනු කර නොමැති අතර නඩු 02 ක් නිම විය. 2024.12.31 දිනට පැවති නඩු ගණන 05 ක් විය.

**දිසා උසාවි නඩු**

2024 වර්ෂය තුළ, අළුත් නඩු 04 ක් ගොනු කරන ලද අතර නඩු 03 ක් නිම විය. 2024.12.31 දිනට නිම නොවී පැවති නඩු ගණණ 29 ක් විය.

**මහේස්ත්‍රාත් උසාවි නඩු**

2024 වර්ෂය තුළ, අළුත් නඩු 96 ක් ගොනු කරන ලද අතර, නඩු 01 ක් නිම විය. 2024.12.31 දිනට නිම නොවී පැවති නඩු 138 ක් විය.

**කම්කරු විනිශ්චය සභා නඩු**

2024 වර්ෂය තුළ අළුතින් නඩු ගොනු කර නොමැති අතර කිසිදු නඩුවක් නිම නොවන ලදී. 2024.12.31 දිනට විමසුම් නිම නොවී පැවති නඩු 02 ක් විය.

**මානව හිමිකම් කොමිසම් සහා අයදුම්පත්, කම්කරු ආරවුල් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සහ කම්කරු වන්දි විනිශ්චය සභා කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම්**

**මානව හිමිකම් කොමිසම**

2024 වර්ෂය තුළ, අළුත් නඩු 07 ක් ගොනු කරන ලද අතර නඩු 04 ක් නිම කරන ලදී. 2024.12.31 දිනට නිම නොවී පැවති නඩු ගණන 37 ක් විය.

**කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි**

2024 වර්ෂය තුළ, අළුත් නඩු 07 ක් ගොනු කරන ලද අතර, නඩු 03 ක් නිම විය. 2024.12.31 දිනට පැමිණිලි 82 ක් නිම නොවී පැවතින.

**බේරුම්කරණ (වාණිජ)**

2024 වර්ෂය තුළ, අළුත් නඩු ගොනු නොවීය. නිම වූ නඩුද නොවීය. 2024.12.31 දිනට නඩු 01 ක් නිම නොවී පැවතින.

**බේරුම්කරණ (කාර්මික)**

2024 වර්ෂය තුළ, අළුතින් නඩු කිසිවක් ගොනු කර නොමැත. නඩු 04 ක් නිම විය. 2024.12.31 දිනට නඩු 01 ක් නිම නොවී පැවතින.

**රේගු විමර්ශන**

2024 වර්ෂය තුළ, අළුත් නඩු ගොනු නොකරන ලදී. කිසිදු නඩුවක් නිම නොවන ලදී. 2024.12.31 දිනට නොවූ නඩු 02 ක් නිම නොවී පැවතින.

**කම්කරු වන්දි**

2024 වර්ෂය තුළ, අළුත් නඩු ගොනු නොවුණු අතර නඩු කිසිවක් නිම නොවිය. 2024.12.31 දිනට නිම නොවූ නඩු කිසිවක් නොමැත.

**පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (Ombudsman)**

2024 වර්ෂය තුළ, අළුත් පැමිණිලි ඉදිරිපත් නොවිණ. නඩු කිසිවක් නිම නොවිය. 2024.12.31 දිනට නිම නොවී පැවති පැමිණිලි ගණන 19 ක් විය.

## තොරතුරු පද්ධති කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තොරතුරු පද්ධති කොට්ඨාශය 2024 වසරේදී තාක්‍ෂණික යටිතල පහසුකම් නවීකරණය කිරීම, මෙහෙයුම් කාර්යක්‍ෂමතාවය ඉහළ නැංවීම හා නවෝත්පාදන පද්ධති හඳුන්වාදීම සම්බන්ධයෙන් විශිෂ්ට ප්‍රගමනයක් අත්පත් කර ගන්නා ලදී. මෙම කොට්ඨාශය අත්කරගත් ප්‍රධාන ජයග්‍රහණ පහත දැක්වේ.

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිවාඩු නිකේතන වෙන් කරවා ගැනීමේ පද්ධතිය ආරම්භ කිරීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්හට ශ්‍රී ලංකාව පුරා පවතින ප්‍රධාන වැදගත් ස්ථානයන්හි නවාතැන් පහසුකම් බාධාවකින් තොරව වෙන්කරවා ගැනීම සඳහා නිවාඩු නිකේතන වෙන්කරවා ගැනීමේ පද්ධතිය තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

මෙම පද්ධතිය මගින් පහත නිවාඩු නිකේතන ලබා දෙනු ලැබේ.

- රුමස්සල: VIP සහ VVIP (ගාල්ල)
- ගාල්ල 01: ගාලු කොටුවේ පිහිටා ඇත.
- කතරගම: VIP (වනරාජා), කතරගම 02 සහ කතරගම ශාලාව (පුද්ගලයින් 12 දෙනෙකු සඳහා ඉඩ පහසුකම් ඇත.
- නුවරඑළිය: VIP සහ Standard
- ඔලුවිල්: VIP සහ Standard (අම්පාර)
- ඕරස් හිල් ත්‍රිකුණාමලය : VIP (ත්‍රිකුණාමලය)

## මෙහෙයුම් සමාලෝචනය

මෙම ක්‍රියාමාර්ගය මගින් නවාතැන් අවශ්‍ය කරනු ලබන සේවකයින් සඳහා සුව පහසුව හා කාර්යක්ෂමතාවය සැලකිය යුතු ලෙස වැඩි දියුණු කර ඇත.

**වැටුප් සකස් කිරීමේ පද්ධතිය (Payroll) උත්ශ්‍රේණිගත කිරීම හා මානව සම්පත් පරිගණක යෙදවුම් සංවර්ධනය කිරීම**

තොරතුරු පද්ධති කොට්ඨාශය මගින් වැටුප් සකස් කිරීමේ පද්ධතිය උත්ශ්‍රේණි කල අතර එමඟින් එහි නිරවද්‍යතාව, විශ්වසනීයතාව හා නවීන ප්‍රමිතීන් හා අනුකූලතාවය වැඩිදියුණු කරන ලදී. මීට අමතරව, මෙම කොට්ඨාශය මගින් මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය සුසංවිධිත කිරීම සඳහා සහ සමස්ත සේවක ඵලදායීතාවය වර්ධනය කර ගැනීම සඳහා මානව සම්පත් යෙදවුමක් නිර්මාණය කරමින් පවතී.

**විද්‍යුත් තැපැල් පද්ධතිය උත්ශ්‍රේණි කිරීම සහ වළාකුළු මත පදනම්වූ (Cloud based) විද්‍යුත් තැපැල**

ගෝලීය තාක්ෂණික දියුණුව හා අනුගත වෙමින්, තොරතුරු පද්ධති කොට්ඨාශය මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විද්‍යුත් තැපැල හා අදාළ යටිතල පහසුකම් උත්ශ්‍රේණිගත කරන ලද අතර වළාකුළු මත පදනම්වූ (Cloud based) පරිගණක යෙදවුමක් හඳුන්වා දෙන ලදී. මෙම උත්ශ්‍රේණිගත කිරීම මගින් ආයතනය තුළ වඩා යහපත් සන්නිවේදනයක් හා සහයෝගීතාවයක් ඇතිකරමින් විද්‍යුත් තැපෑලෙහි (email) විශ්වසනීයතාව, ප්‍රවේශතාව (accessibility) සහ සුරක්ෂිතභාවය වැඩිදියුණු වී ඇත.

**නැගෙනහිර බහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතියේ ප්‍රගතිය**

අර්ධ ස්වයංක්‍රීය නැගෙනහිර බහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතිය සඳහා අවශ්‍ය සියළුම දෘඩාංග හා යටිතල පහසුකම්, තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් සාර්ථකව ප්‍රසම්පාදනය කර ඇත. කෙසේ වුවද, සිවිල් ඉදිකිරීම්වල ප්‍රමාදයන් හේතුවෙන් පර්යන්ත මෙහෙයුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම කල් දමා ඇත. නැගෙනහිර බහළු පර්යන්තය 2025 ජූලි මස වන විට මෙහෙයුම් තත්ත්වයට ගෙන ඒම සඳහා තොරතුරු පද්ධති කොට්ඨාශය කැපවීමෙන් කටයුතු කරනු ලැබේ.

**වරාය සන්නිවේදන පද්ධතිය සංවර්ධනය කිරීම**

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය හා සේවා සැපයුම් අංශයන් අතර සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් වරාය සන්නිවේදන පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව, සුදුසුකම් ප්‍රකාශ කිරීම් (EOQ) කැඳවන ලද අතර, එම ව්‍යාපෘතිය මේ වන විට යෝජනා සඳහා ඉල්ලීම් නිකුත් කිරීම් අදියරේ පවතී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු නියම කරන ලද කාලසීමාවට අනුකූලව සිදු කෙරෙනු ඇත.

මෙම ජයග්‍රහණ හරහා තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් ඉලක්ක සපුරාගැනීම සඳහා මෙන්ම ඉදිරි දැක්මක් සහිත හා තාක්ෂණය භාවිතයෙන් ඉදිරියෙන් සිටින ආයතනයක් ලෙස කීර්තිය රඳවාගැනීම සඳහා සහාය දැක්වීමට කැපවී සිටී.

## ආරක්ෂක කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පවත්නා සියළුම වරායයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යය භාරව සිටින ආරක්ෂක කොට්ඨාශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැදගත් කොට්ඨාශයකි. එම කොට්ඨාශයේ කාර්යභාරයන් අතරට වරාය දේපළ, මානව සම්පත්, වරාය පරිශීලකයන් හා සමුද්‍රීය සීමා ආරක්ෂා කිරීම අයත් වේ. වරායයන්ගේ ක්‍රමෝපායික අරමුණු හා මෙහෙයුම් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය පල කිරීමට අවශ්‍ය වන පරිපූර්ණ ආරක්ෂක ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මෙම කොට්ඨාශයේ වගකීම වේ. මූලික ආරක්ෂක කටයුතු වලට අමතරව, විවිධ උපයෝගී සේවා ලබා දීම තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම් උත්පාදනයට මෙම කොට්ඨාශය සිය දායකත්වය ලබා දෙනු ලැබේ.

## මෙහෙයුම් සමාලෝචනය

2024 වර්ෂයේදී ආරක්ෂක කොට්ඨාශය මගින් සිදු කරන ලද මුලපිරීම් හා ජයග්‍රහණ පහත දක්වා ඇත.

**ප්‍රවේශ පාලනය සහ නව තාක්ෂණය හඳුන්වාදීම**

ආරක්ෂාව තහවුරු කිරීමට හා ප්‍රවේශ පාලනය සුසංවිධිත කිරීම සඳහා පහත තාක්ෂණික ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලදී.

- **CCTV කැමරා පද්ධති**: කොළඹ වරායේ ප්‍රධාන දොරටු සඳහා CCTV කැමරා පද්ධති ස්ථාපිත කර ඇති අතර, අධ්‍යක්ෂ(ආරක්ෂක) කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද නව "CCTV කැමරා අධීක්ෂණ මෙහෙයුම් මැදිරිය" මගින් නිරන්තරයෙන් එම කැමරා අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

- **Bluetooth ස්කෑන් පද්ධති:** අංක 01A, අංක 02, අංක 03, අංක 05, අංක 08 දොරටුවල Bluetooth ස්කෑන් යන්ත්‍ර හා පරිගණක යන්ත්‍ර ස්ථාපිත කර පරිගණක මෘදුකාංග යෙදවුමක් සමඟ ඒකාබද්ධ කරමින් කේත ස්කෑන් ක්‍රමය භාවිතා කරමින් වරාය ප්‍රවේශ බලපත්‍ර (පුද්ගල/වාහන) පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි. එමගින් වරාය පරිශීලකයන්ගේ අනන්‍යතාවය හා බලපත්‍රවල නීත්‍යානුකූලභාවය තහවුරු කරනු ලැබේ.

**බලපත්‍ර නිකුත් කිරීම හා ආදායම් උත්පාදනය**

ආරක්ෂක කොට්ඨාශය යටතේ පවතින තාවකාලික හා වාර්ෂික බලපත්‍ර කාර්යාලය මගින් පුද්ගල බලපත්‍ර හා වාහන බලපත්‍ර 448,517 ක් නිකුත් කර ඇති අතර, එමගින් උපයා ඇති සම්පූර්ණ ආදායම රු. 425,006,731/- කි. මුදල් අයකිරීමකින් තොරව නිකුත් කර ඇති නිදහස් වාහන බලපත්‍ර සංඛ්‍යාව 10,298 වන අතර නිදහස් පුද්ගල බලපත්‍ර සංඛ්‍යාව 9,432 ක් වේ. කාර්යක්ෂමතාවය හා ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා මාර්ගගත බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියක් වෙත මාරු වීම සඳහා සැලසුම් සකස් කෙරෙමින් පවතී.

**රථවාහන පාලනය හා මාර්ග තදබදය කළමනාකරණය**

රථ වාහන පාලන අංශය මගින් කොළඹ වරායේ මහාමාර්ග හා පර්යන්ත තුළ රිය අනතුරු 86 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කර ඇති අතර, ඉන් වරාය දේපළ සඳහා සිදු වූ අලාභයන් වෙනුවෙන් රු. 22,765,740/- ක් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර රථ වාහන නීති කඩකරමින් සිදු කරන ලද වරදවල් 20 ක් සම්බන්ධයෙන් නෛතික කටයුතු ආරම්භ කර ඇත.

**ආරක්ෂක නාවික අංශය**

ආරක්ෂක නාවික අංශය මගින්, වරාය පොලීසිය සහ නාවික හමුදාව ඒකාබද්ධව කොළඹ වරාය පරිශ්‍රය තුළ හා මුහුදු සීමාවන් හි ආරක්ෂාව තහවුරු කර ඇත. සමුද්‍රීය ආරක්ෂාව පවත්වාගෙන යෑම සහ අනවසර ඇතුළුවීම් වැළැක්වීම සඳහා විශාල කාර්යභාරයක් මෙම ඒකාබද්ධ මෙහෙයුම් තුළින් සිදු කර ඇත.

**විමර්ශන කටයුතු හා නඩු පැවරීම්**

2024 වසරේ මාර්ග නීති උල්ලංඝනය කිරීම හේතුවෙන් ගරු අධිකරණයේ නඩු පැවරීම් 18 ක් සිදු කර ඇති අතර ගරු අධිකරණය මගින් රු. 49,000/- ක දඩ මුදලක් අය කරගෙන ඇත.

**පුහුණුව හා සංවර්ධනය**

- නව පත්වීම් ලද සහකාර අධිකාරිවරුන් (ආරක්ෂක) 20 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වූ අතර ආරක්ෂක නිලයින් 62 දෙනෙකු ආරක්ෂක සැරයන් තනතුරට උසස් කරන ලදී.

- කණ්ඩායමකට 06 දෙනෙකු බැගින් දින 06 ක් පුරා ආරක්ෂක නියාමකයින් 300 දෙනෙකු සඳහා වායු රයිෆල් වෙඩි පුහුණු අභ්‍යාස පවත්වන ලදී.

- ආරක්ෂක නිලයින් 333 ක් සඳහා කඩවත ගෝනහේන පොලිස් විශේෂ කාර්ය බලකායේ කඳවුරු වෙඩි පිටියේදී, 2024 ජූනි 08/09/15/16 දිනයන්හිදී වෙඩි අභ්‍යාස පුහුණුවක් පවත්වන ලදී.

- ආරක්ෂක පුහුණු පාසල් වෙඩි පිටිය බාහිර පාර්ශ්වයන් වෙත ලබා දීමෙන් 2024 වර්ෂයේ රු. 654,800/- ක ආදායමක් උපයා ඇත.

## සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය එහි ආරම්භයේ සිටම අභ්‍යන්තරික වශයෙන් සේවකයින් සමඟද බාහිර වශයෙන් ප්‍රධාන පෙළේ පාර්ශ්වකරුවන් සමඟ ද ධනාත්මක සබඳතා ගොඩනගා ගැනීමට කටයුතු කරන අතරම, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. පසුගිය වසර පුරාම මෙම කොට්ඨාශය මාධ්‍ය ආයතන, සාමාන්‍ය ජනතාව, රජයේ නියෝජිතායතන හා ක්ෂේත්‍රයේ පාර්ශ්වීය ආයතන සමඟ පවත්වනු ලබන ක්‍රමෝපායික සබඳතා තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුණු ඉටු කිරීමේ වගකීම දරමින් කොට්ඨාශයේ සන්නිවේදන හා මහජන සබඳතා ශක්තිමත් කිරීමේ කාර්යයෙහි අඛණ්ඩව නිරත වී ඇත.

මෙම කොට්ඨාශය වෙත පැවරී ඇති මූලික වගකීම වන්නේ මාධ්‍ය ආයතන, රජයේ දෙපාර්තමේන්තු, ක්ෂේත්‍රයේ පාර්ශ්වීය ආයතන හා සාමාන්‍ය ජනතාව සමඟ සබඳතා කළමනාකරණය කිරීම හා ශක්තිමත් කිරීමය. මෙයට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කටයුතු හා ජයග්‍රහණ කාර්යක්ෂමව සන්නිවේදනය කළ හැකි බවට සහතික කිරීම සඳහා ජනමාධ්‍යවේදීන්, විශ්ලේෂකයින්, සාමාන්‍ය ජනතාව හා වෙනත් ප්‍රබල පුද්ගලයින් හා ආයතන සමඟ අවශ්‍ය කටයුතුවල නිරතවීම ඇතුළත් වේ. 2024 වර්ෂයේදී, පහත සඳහන් කටයුතු මගින් සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මේ පිළිබඳව වැදගත් පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කටයුතු හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා සන්නිවේදහ හා මහජන සම්බන්ධතා කොට්ඨාශය දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය ආයතන සමඟ ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කර ඇත. මාධ්‍ය සංචාර, මාධ්‍ය සාකච්ඡා සහ පිළිගැනීමේ උත්සව සංවිධානය කිරීම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ධනාත්මක ප්‍රචාරයක් සාර්ථකව ලබා දී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්ෂේත්‍ර ප්‍රවීණතාවය, ඵලදායීතාවය හා වත්මන් සහ අනාගත ව්‍යාපෘති පිළිබඳව විශේෂ ප්‍රචාරණයක් ලබා දීම සඳහා මාධ්‍ය නිවේදන, වීඩියෝ වාර්තා චිත්‍රපට, ඡායාරූප පොත් (photo album) ආදිය නිෂ්පාදනය කර ඇත.

2024.03.14 දින සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ ලෝටස් බෝල්රූම් ශාලාවේ පවත්වන ලද “Port of Colombo Award Night” සම්මාන උලෙළ සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී. ජය බහළු පර්යන්තය, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සහ කලම්බු ඉන්ටර්නැෂන්ල් කන්ටේනර් ටර්මිනල් සමාගම් යන සමාගම්වල සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අනුග්‍රාහකත්වය දක්වන ලද මෙම උත්සවය හේතුකොටගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කීර්තිනාමය දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද තවදුරටත් ඉහළ නැංවෙන ලදී.

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට සමුද්‍රීය ක්ෂේත්‍රයේ වැදගත්කම පිළිබඳව දැනුවත්භාවය ඉහළ නංවමින් අධ්‍යාපනික ප්‍රදර්ශන මාර්ගයෙන් මහජනතාව හා පාසැල් ප්‍රජාව සමඟ ක්‍රියාකාරීව කටයුතු කිරීමට මෙම කොට්ඨාශය කටයුතු කර ඇත. මෙම ක්‍රියාමාර්ග මගින් වරාය ක්ෂේත්‍රයේ අනාගත අවස්ථා යන්න පැහැදිලිව දැක්වීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්මන් හා අනාගත වරාය සංවර්ධන ව්‍යාපාර මොනවාද යන්න පෙන්වා දී ඇත.

## මෙහෙයුම් සමාලෝචනය

2023 වර්ෂයේදී, මෙම කොට්ඨාශය විසින් ප්‍රධාන පෙළේ මාර්ගගත සමුද්‍රීය ව්‍යාපාර විචාර සඟරාවක් වන නාවික, සමුද්‍රීය හා සේවා සැපයුම් ප්‍රවෘත්ති සඟරාව එළිදක්වන ලදී. මෙම සඟරාව ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා තොරතුරු ලබා ගත හැකි වටිනා සම්පතක් ලෙස මෙහෙවරක් ඉටු කරමින් දේශීය හා ජාත්‍යන්තර පාරිභෝගිකයින් අතර ආකර්ෂණය දිනාගෙන ඇත.

මෙම කොට්ඨාශය මගින් සාම්ප්‍රදායික හා සමාජ මාධ්‍ය ව්‍යාපාර ක්‍රියාවට නංවා ඇත. ඉලක්කගත තොරතුරු බෙදාහැරීම, මාධ්‍ය උපක්‍රම සැලසුම් කිරීම සහ මාධ්‍ය ව්‍යාපාර කාර්යසාධනය අධීක්ෂණය කරමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයග්‍රහණ හා අනාගත දැක්ම විශාල ප්‍රේක්ෂක සමූහයක් වෙත සන්නිවේදනය කර ඇත.

ආයතනයේ වැදගත්කම හා බලපෑම තවදුරටත් විස්තාරණය කරමින් ප්‍රවෘත්ති මාධ්‍ය ඔස්සේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන හා වැදගත් අවස්ථා විකාශය කිරීමට සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය කටයුතු කර ඇත.

සන්නිවේදන හා මහජන සබඳතා කොට්ඨාශයේ 2024 වර්ෂයේ ප්‍රයත්නයන් මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය ඉහළ නැංවීමට හා පාර්ශ්වකරුවන් සමඟ පවත්වන ධනාත්මක සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමටත් සුවිශේෂී අන්දමින් දායක වී ඇත. ක්‍රමෝපායික සන්නිවේදනය, මාධ්‍ය හැසිරවීම හා මහජන දැනුවත් කිරීමේ උපක්‍රම තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් සමුද්‍රීය ක්ෂේත්‍රයට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දක්වනු ලබන දායකත්වය හා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය පිළිබඳ මෙම කොට්ඨාශය මගින් සාර්ථකව අවධාරණය කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වර්ධනය හා විකාශනය වීමට ලක්වන අතරම, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දිගුකාලීන අරමුණු ජය ගැනීමට උපකාරී වන සන්නිවේදන උපාය මාර්ග හා මහජන සබඳතා වැඩි දියුණු කිරීමට සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය කැපවී සිටී.

## අභ්‍යන්තර විගණන කොට්ඨාශය

අධිකාරියේ අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණ කාර්යරාමු සහ පාලන ක්‍රියාවලි පිළිබඳව ස්වාධීන ඇගයීම් කටයුතු සිදු කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර විගණන කොට්ඨාශය අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අදාළ නීති, රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති පිළිපදින බවට තහවුරු කිරීම සහ ඒ හා සමගාමීව ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා ප්‍රතිඵලදායීබව ආරක්ෂා කිරීම මෙම කොට්ඨාශයේ මූලික වගකීම වේ. අරමුණු සහගත සහතිකවීම හා නිරවද්‍යතාවය හෙළිදරව් කිරීමට ඉවහල්වන නිර්දේශ හරහා ඉහළ ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, අවදානම් අවම කිරීම සහ මෙහෙයුම් කාර්යසාධනය උපරිම වශයෙන් වර්ධනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත මෙම කොට්ඨාශය සහාය පල කරනු ලැබේ. තවද, පාලනය, මෙහෙයුම් සහ තොරතුරු පද්ධතිවල අවදානම් මෙම කොට්ඨාශය මගින් තක්සේරු කරන අතර එමඟින් පාරදෘශ්‍යභාවය, වගවීම හා අනුකූලතාවයට දායක වේ.

අභ්‍යන්තර විගණන කොට්ඨාශය, විගණන කමිටුව මගින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලද අවදානම මත පදනම් වූ වාර්ෂික විගණන සැලැස්මක් සමඟ කටයුතු ක්‍රියා කරනු ලැබේ. ප්‍රධාන අභ්‍යන්තර විගණනක විසින් සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ වෙත ඍජුව වාර්තා කරන අතර ඔහු විසින් කොට්ඨාශය මෙහෙයවනු ලබයි. තවද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශ තුළ විගණන කටයුතු සිදු කරන අතර ස්වාධීන බව හා අපක්ෂපාතීත්වය තහවුරු කරනු ලැබේ.

**ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්**

- **අභ්‍යන්තර පාලන හා අවදානම අවම කිරීම -** මෙම කොට්ඨාශය මගින් ආයතනයේ පවතින අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමට ලක් කර තවදුරටත් ශක්තිමත් කරන අතර මෙමඟින් මූල්‍ය සාවද්‍ය ප්‍රකාශ, වංචා හෝ අකාර්යක්ෂමතා වැළැක්වීම, පරීක්ෂා කිරීම හා නිවැරදි කිරීම කරනු ලැබේ.

- **මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම -** මූල්‍ය වාර්තා හා ක්‍රියාවලිවල නිරවද්‍යතාවය හා විශ්වාසනීයතාවය තහවුරු කිරීම සඳහා ගනුදෙනු, ශේෂ හා ක්‍රියාවලි සවිස්තරාත්මක ලෙස පරීක්ෂා කිරීම ඇතුළුව එක් එක් අයිතමයන් පිළිබඳව විශේෂිත විමර්ශනය හා මූල්‍ය තොරතුරු හඳුනාගැනීම, තක්සේරු කිරීම, වර්ගීකරණය කිරීම හා වාර්තාකරණය සිදු කරන ලද ක්‍රමවේද විගණනය මගින් තක්සේරු කෙරේ.

- **අවදානම් කළමනාකරණය සහ පාලනය -** මෙම කොට්ඨාශය මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව හා පාලන ව්‍යුහයන් සක්‍රියව  ඇගයීමට ලක් කර වැඩි දියුණු කරනු ලබන අතර එමගින්  මනා පරිචයන්ට හා  ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රමෝපායික අරමුණු හා අනුකූල වන බවට තහවුරු කෙරේ.

- **අනුකූලතා පාලනය -** රාජ්‍ය ආයතන සඳහා  වන ආයතනික පාලනය පිළිබඳ  මාර්ගෝපදේශ, මූල්‍ය රෙගුලාසි හා වෙනත් නියාමන අවශ්‍යතා  පිළිපදින බවට නිතිපතා විගණන කටයුතු තුළින් සත්‍යාපනය කර ගනු ලබන අතර මෙමඟින්  මෙහෙයුම් හා නෛතික අනුකූලතාවය තහවුරු කරනු ලැබේ.

- **ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලදායක බව ගැන අවධානය යොමු කිරීම -** ප්‍රසම්පාදනය, ගබඩා කළමනාකරණය සහ ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය ඇතුළුව අතිශය වැදගත් ක්‍රියාවලි හා ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කරමින් විගණන කටයුතු සිදු කරනු ලබන අතර එමඟින් ප්‍රතිඵලදායී ක්‍රියාත්මක කිරීම  හා පරිපාලනය තහවුරු කරනු ලැබේ.  මීට අමතරව, කාර්යක්ෂතාවය ඉහළ නැංවීම හා අවදානම් අවම කිරීම සඳහා විශේෂිත මෙහෙයුම් ක්ෂේත්‍ර තක්සේරු කරනු ලැබේ.

- **විශේෂ විමර්ශන -** විගණන කමිටුවේ හෝ ඉහළ කළමනාකාරීත්වයේ  ඉල්ලීම මත ඉලක්කගත විමර්ශන පැවැත්වීම මෙම කොට්ඨාශයේ වගකීම වන අතර කිසියම් අක්‍රමිකතාවයක් පවතී නම් ඒවා වහාම විසඳන බවට සහතික කරනු ලැබේ.

**වසරේ කාර්යසාධන විශේෂ අවස්ථා**

සමාලෝචිත වර්ෂය තුළ විවිධ ක්‍රියාකාරී ක්ෂේත්‍ර ගණනාවක් හරහා පූර්ව විගණන ඇතුළුව විගණන විමසුම් හා වාර්තා  152 ක් මෙම කොට්ඨාශය මගින් අවසන් කර ඇත.

| කාණ්ඩය | ගණන |
|---|---:|
| විගණන විමසුම් | 38 |
| විගණන වාර්තා | 21 |
| පූර්ව විගණන වාර්තා | 93 |
| **එකතුව** | **152** |

අවසාන වශයෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාලනය හා මෙහෙයුම් විශිෂ්ටත්වය සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන කොට්ඨාශය වැදගත් වේ.  පූර්ණ විගණන හා ක්‍රමෝපායික නිර්දේශ හරහා මෙම කොට්ඨාශය මගින් අධිකාරියේ සම්පත් ආරක්ෂා කර, මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කර හා දීර්ඝ කාලීන ආයතනික තිරසරභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ස්වාධීනභාවය, අරමුණුගතභාවය සහ ඍජු අවදානම් පාදක ප්‍රවේශයක් පවත්වාගෙන යමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම නියාමන අවශ්‍යතා හා අභ්‍යන්තර ප්‍රතිපත්ති අනුගමනය කරන බවට අභ්‍යන්තර විගණන කොට්ඨාශය තහවුරු කරන අතර, එමඟින් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය හා අධිකාරියේ කීර්තිනාමය ආරක්ෂා කරනු ලැබේ.

# 2024

# මූල්‍ය සමාලෝචනය

## මූල්‍ය සමාලෝචනය

**ආදායම (සියළු වරායයන්)**

**(වරාය කටයුතු සාරාංශය)**
**රු. මිලියන**

| විස්තරය | 2024 | 2023 | විස්තරය | 2024 | 2023 |
|---|---|---|---|---|---|
| රාය කටයුතු වලින් ආදායම | 74,567 | 63,261 | නාවික | 20,477 | 21,146 |
| වෙනත් ආදායම් | 28,612 | 30,374 | නැව් භාණ්ඩ වාහක මෙහෙයුම් | 33,901 | 27,400 |
| | | | වාප්පු මෙහෙයුම් | 9,098 | 8,000 |
| | | | වරාය පහසුකම් | 7,951 | 4,445 |
| | | | වෙනත් සේවා මෙහෙයුම් | 3,558 | 2,849 |
| | | | | **74,985** | **63,840** |
| **මුළු ආදායම** | **103,179** | **93,635** | විදේශ විනිමය ලාභ / (පාඩු) | (418) | (579) |
| | | | | **74,567** | **63,261** |

**මෙහෙයුම් සහ වෙනත් වියදම් (සියළු වරායයන්)** **රු. මිලියන**

| | 2024 වියදම | 2023 වියදම | (වැඩිවීම)/ අඩුවීම් | % |
|---|---|---|---|---|
| වත්කම් නඩත්තුව | 2,893 | 2,879 | (14) | 0 |
| ඉන්ධන, විදුලිය, සහ ජලය | 6,451 | 6,937 | 486 | 7 |
| විදේශ ණය මත පොලිය | 3,546 | 4,218 | 672 | 16 |
| අතිකාල | 7,989 | 6,320 | (1,669) | (26) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 4,049 | 5,303 | 1,254 | 24 |
| වේතන, වැටුප් සහ දීමනා | 22,494 | 19,833 | (2,661) | (13) |
| වෙනත් | 8,333 | 6,482 | (1,851) | (29) |
| **වියදම** | **55,755** | **51,971** | **(3,784)** | **(7)** |
| විදේශ විනිමය පාඩු / (ලාභ) | 690 | 1,305 | 615 | 47 |
| **විදේශ විනිමය (පාඩු)/ ලාභ ඇතුළුව මුළු වියදම** | **56,445** | **53,276** | **(3,169)** | **(6)** |

# මූල්‍ය සමාලෝචනය

## වරායයන් අනුව කාර්යසාධනය

### කොළඹ වරාය

2024 වර්ෂයේදී කොළඹ වරාය රුපියල් මිලියන 45,565 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී. 2023 වර්ෂයේ මුළු ආදායම වූ රුපියල් මිලියන 89,632 ට සාපේක්ෂව 2024 වසරේ මුළු ආදායම රුපියල් මිලියන 99,448 ක් වූ අතර එය රුපියල් මිලියන 9,816 ක වැඩි වීමකි.

2023 වසරේදී මුළු වියදම රුපියල් මිලියන 51,085 ක් (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 1,449 ඇතුළුව) වූ අතර 2024 දී බදු වලට පෙර මුළු වියදම රුපියල් මිලියන 53,925 ක් (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 810 ඇතුළුව) විය. එය 6% ක වැඩි වීමකි.



## මූල්‍ය සමාලෝචනය

### ගාල්ල වරාය

2024 වර්ෂයේදී ගාල්ල වරාය රුපියල් මිලියන 426 ක මෙහෙයුම් පාඩුවක් වාර්තා කරන ලදී. 2023 වසරේ රුපියල් මිලියන 1,512 සාපේක්ෂව 2024 වර්ෂයේ මුළු ආදායම රුපියල් මිලියන 901 ක් විය. එය රුපියල් මිලියන 611 ක අඩු වීමකි.

2023 වර්ෂයේ වියදම රුපියල් මිලියන 843 (විදේශ විනිමය ලැබීම් රුපියල් මිලියන 144 ඇතුළුව) වූ අතර 2024 වසරේ බදු වලට පෙර මුළු වියදම රුපියල් මිලියන 952 (විදේශ විනිමය ලැබීම් රුපියල් මිලියන 121 ඇතුළුව) විය. එය 13% ක වැඩි වීමකි.



### ත්‍රිකුණාමල වරාය

2024 වසරේදී ත්‍රිකුණාමලය වරාය රුපියල් මිලියන 926 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී. 2023 වසරේ රුපියල් මිලියන 2,491 ට සාපේක්ෂව 2024 වසරේ මුළු ආදායම රුපියල් මිලියන 2,831 ක් විය. එය රුපියල් මිලියන 340 ක වැඩි වීමකි.

2023 වසරේ වියදම රුපියල් මිලියන 1,348 ක් වූ අතර 2024 වසරේ බදු වලට පෙර වියදම රුපියල් මිලියන 1,568 ක් විය. එය 16% ක වැඩිවීමකි.



# මානව ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය යනු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාර්ථකත්වයේ මූලික පදනම වේ. සමුද්‍රීය ක්ෂේත්‍රයේ ප්‍රධාන කාර්යභාරයක් සිදු කරන ආයතනයක් ලෙස උපරිම කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට සහ ආයතනයේ දිගු කාලීන සාර්ථකත්වය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිපුණතාවයෙන් හා විවිධත්වයෙන් යුත්, අභිප්‍රේරිත සේවක බලකායක් අභිවර්ධනය කිරීම පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමු කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු විවිධත්වයෙන් යුත් සේවක බලකාය ආයතනයේ මූලික ශක්තිය වන අතර විවිධ පසුබිම්, අත්දැකීම් සහ විශේෂඥතාවයෙන් යුත් සේවකයින් විසින් කාර්යක්ෂමතාවය හා නවෝත්පාදන කටයුතු ප්‍රගමනය කිරීම සඳහා සහයෝගීතාවයෙන් කටයුතු කරනු ලැබේ. සමස්ත සේවක ඵලදායීතාවය සහ රැකියා තෘප්තිය වැඩි දියුණු කරනු ලබන සාමූහිකව කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීම, සාධාරණත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය යනාදියේ අගය පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලකිල්ලට ගනු ලබයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් ස්වකීය සේවකයින්ගේ යහපැවැත්ම පිළිබඳ ප්‍රමුඛතාවය ලබාදෙමින් ආරක්ෂිත හා සහයෝගයෙන් කටයුතු කරන කාර්යය පරිසරයක්, සේවක සුභසාධන වැඩසටහන් හා සෞඛ්‍ය හා ආරක්ෂක ක්‍රියාමාර්ග ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව ප්‍රාග්ධනය පිළිබඳ ක්‍රමෝපායේ මූලික අංගයක් වන සේවකයින්ගේ වෘත්තීය සංවර්ධනය සහතික කරමින් සේවක දායකත්වය හඳුනාගැනීම සඳහා තවදුරටත් පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පුහුණු වැඩසටහන්, ධාරිතා වර්ධන වැඩසටහන් සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් හරහා සේවකයින්ගේ වෘත්තීය සංවර්ධනය පිළිබඳව නිරතුරුව ආයෝජන සිදු කරන අතර එමගින් නවතම ක්ෂේත්‍රීය දියුණුව, තාක්ෂණය හා මනා පරිචයන් සමඟ සේවකයන්ගේ අනුකූලතාව තහවුරු කරන අතර ඒ තුළින් වරාය මෙහෙයුම් හා සේවා සැපයුම් කළමනාකරණය සඳහා ඵලදායී ලෙස දායකත්වය ලබා දීමට හැකියාව ලැබෙනු ඇත.

2024 දෙසැම්බර් මස වන විට, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක පිරිස ආසන්න වශයෙන් 7,624 කි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් ක්‍රමෝපායයන් සේවකයින්ගේ කාර්යසාධනය හා ඵලදායීතාවය උපරිම වශයෙන් ලබා ගත හැකි ආකාරයට සැලසුම් කර ඇත. නිසි පුද්ගලයින් නිසි තනතුරු වලට නිසි වේලාවේදී පත් කරන බවට සහතික වීම සඳහා විධායක සහ විධායක නොවන ශ්‍රේණිවල සේවකයින් සඳහා නව සේවක බඳවා ගැනීම් පටිපාටියක් සකස් කර ඇත. අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව, මෙම යෝජනාවන් ආයතනය තුළ ක්‍රියාත්මක කෙරෙනු ඇත.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය බාහිරින් සේවකයන් 66 ක් බඳවා ගත් අතර, සේවකයින් 373 දෙනෙකු අනිවාර්ය විශ්‍රාම යැමේ වයස හේතුවෙන් සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්ත්‍රී පුරුෂ භාවය, ජන වර්ගය, ආගම හෝ ආබාධිතබව නොසලකා හැර සේවකයන්හට සමාන අවස්ථා ලබා දෙන බවට සහතික වේ.

# ආයතනික පාලන වාර්තාව

**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා අනු කමිටු**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබිය යුතුය. එනම්;

(අ) පුළුල් අත්දැකීම් ඇති වරාය මෙහෙයුම් සංවර්ධනය පිළිබඳව හෝ නෛතික හෝ මූල්‍ය කරුණු හෝ නාවික, වාණිජ හෝ ඉංජිනේරු කටයුතු හෝ පරිපාලනමය හෝ කම්කරු සබඳතා පිළිබඳ පුළුල් අත්දැකීම් සහිත සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු සහ තවත් අධ්‍යක්ෂවරු හතරදෙනෙකු (04) විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

(ආ) ප්‍රවීණ හා පළපුරුද්ද සහිත පුද්ගලයෙකු කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කළ යුතුය.

(ඇ) මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම සඳහා මහා භාණ්ඩාගාර නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩල නියෝජිතයා මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් වශයෙන් පත් කළ යුතුය.

(ඈ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(ඉ) ධීවර විෂය සඳහා නියෝජිතයෙකු ධීවර විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කළ යුතුය.

සමාලෝචනයට යටත් වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ඔවුන්ගේ වෘත්තීය විස්තර පිටු අංක 22 සිට 27 දක්වා සඳහන් කර ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රධාන වගකීම් වන්නේ:**

- ක්‍රමෝපායික අරමුණු, ප්‍රතිපත්ති හා ඉලක්ක ස්ථාපනය කිරීම තුළින් මඟ පෙන්වීම.
- ඉල්ක්ක හා අරමුණු අරභයා සිදු කෙරෙන කාර්යසාධනය අධීක්ෂණය කිරීම.
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන රටාවක් හා උපරිම ආචාර ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාමට වගබලා ගැනීම.
- අරමුණු ඉටු කිරීම පිණිස මාර්ගෝපදේශ සකස් කර ඒවාහි කාලසීමාව තහවුරු කිරීම.
- සියළුම ප්‍රධාන ව්‍යාපාරික අවදානම් හඳුනා ගැනීම සහ ඒවා පිළිබඳව කටයුතු කිරීම සඳහා සුදුසු සහ ප්‍රමාණවත් පාලන, අධීක්ෂණ හා වාර්තාකරණ යාන්ත්‍රණ පවතින බවට තහවුරු කිරීම.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරීත්වය පහත දැක්වෙන ආකාරයට වේ:**

සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම සාමාජිකයින් සමඟ සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙළ කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිතිපතා පවත්වනු ලබන අතර, සමාලෝචනයට යටත් වර්ෂය තුළ සාමාන්‍ය පරිදි පැවැත්වීමට නියමිත හා විශේෂ රැස්වීම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විසි තුනක් (23) පවත්වනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත, අධ්‍යක්ෂ මණ්ඩල සංදේශ, පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ වල ප්‍රගති වාර්තාව, මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනයේ දර්ශක, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති හා යෝජනා ආදිය අතුළත් වන Board PAC නමින් පරිගණක යෙදවුමක් නිර්මාණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් තොරතුරු වෙත පිවිසීමේ අවස්ථාව ලැබේ.

අවසන් අනුමැතිය හා/හෝ නිර්දේශ ලබා දීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. කෙසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇතැම් වගකීම් ප්‍රධාන වශයෙන් ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව (TLMC),

විගණන කමිටුව හා අභ්‍යන්තර පාලන හා අවධානම් කළමනාකරණ කමිටුව වැනි අනු කමිටු ගණනාවක් වෙත විමධ්‍යගත කර ඇත.

**ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව (TLMC)**

ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව එහි ලේකම් වශයෙන් කටයුතු කරන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ඇතුළුව සාමාජිකයින් පහළොස් (15) දෙනෙකුගෙන් සමන්විත වේ. එනම්;

(අ) සභාපති, උප සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකු (03).

(ආ) පූර්ණ කාලීන අධ්‍යක්ෂවරු එකොළොස් දෙනෙකු (11) එනම්;

- අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)
- අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පරිපාලන/මානව සම්පත් කළමනාකරණ)
- අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)
- අධ්‍යක්ෂ (මෙහෙයුම්)
- අධ්‍යක්ෂ (තාක්ෂණ)
- අධ්‍යක්ෂ (මුදල්)
- අධ්‍යක්ෂ (අළෙවි හා ව්‍යාපාර සංවර්ධන)
- අධ්‍යක්ෂ (සේවා සැපයුම්)
- අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)
- අධ්‍යක්ෂ (ආරක්ෂක)
- හාබර් මාස්ටර්

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට පෙර මාසයකට එක් වරක් ඉහළ මට්ටමේ කළමනාකාර කමිටුවේ රැස්වීම් පැවැත්වේ. සමාලෝචනයට යටත් වර්ෂය තුළ මෙම රැස්වීම් දහඅටක් (18) පැවැත්විණ.

**ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවේ ප්‍රධාන කාර්යභාරය**

(අ) ප්‍රතිපත්තිමය ගැටළු සම්බන්ධයෙන් අවසන් අනුමැතිය/ නිර්දේශ ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම ඒවා සමාලෝචනය කර සාකච්ඡා කිරීම.

(ආ) වරාය පරිශීලකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ සේවා තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා සම්පත් වල උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම, ඵලදායීතාවය ඉහළ දැමීමට අදාළ සාමාන්‍ය පරිපාලන හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීම.

(ඇ) වාණිජමය වශයෙන් සාධ්‍ය ආයතනයක්ව පවතින අතරතුරදීම සාමාන්‍ය වගකීම් දරණ රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස කටයුතු කිරීමේ තීරණ ගැනීම.

# වැදගත් සංධිස්ථාන

1505 පෘතුගීසීන් විසින් නාවික කඳවුරක්/වරායක් ලෙස භාවිතයට ගැනීම ආරම්භ කිරීමෙන් පසුව කොළඹ වරාය අපරදිග රටවල ප්‍රසිද්ධියට පත්විය.

1875 VII එඩ්වඩ් රජු විසින් දෙසැම්බර් 09 වන දින නිරිත දිග දියකඩනයට මුල් ගල තබන ලදී.

1882 කොළඹ වරාය පරිපාලනය කිරීම සඳහා වරාය මණ්ඩලය පිහිටුවන ලදී.

1885 මීටර් 1285 ක් දිග නිරිත දිග දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1898 මීටර් 335 ක් දිග ඊසාන දිග දියකඩනයේ ඉදිකිරීම නිම කරන ලදී.

1899 වියළි තටාකාංගයේ ඉදිකිරීම් ආරම්භ කිරීම.

1906 මීටර් 814 ක් දිග අයිලන්ඩ් දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1906 වියළි තටාකාංගනයේ ඉදිකිරීම නිම කිරීම.

1909 වියළි තටාකාංගය සඳහා මීටර් 250 ක් දිග නියමු පාලම ඉදිකර නිමකිරීම (පළමු වැනි ගැඹුරු දිය අද්දර නැංගුරම් පොළ).

1912 වත්මන් ජයබහළු පර්යන්තය පිහිටි ස්ථානයේ ගල් අඟුරු ජැටි 18 ක් ඉදිකර නිමකිරීම.

1912 නිරිත දිග දිය කඩනයේ මීටර් 550 ක් දිග දිගුව ඉදිකර නිමකිරීම.

1913 වරාය සංවර්ධන හා නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා කොළඹ වරාය කොමිෂන් සභාව පිහිටුවීම.

1922 ඛනිජ තෙල් මෙහෙයුම් පහසුකම් සැලසීමේ කාර්යය නිම කිරීම.

1950 මීටර් 9-11 දියඹක් සහිත අද්දර නැංගුරම්පළවල් පහළොවක් සහ මීටර් 7.5 ක දියඹක් සහිත වෙරළාසන්න යාත්‍රා නැංගුරම් පොළවල් දෙකක්ද, වර්ග මීටර 55.800ක යාබද මාර්ගස්ථ බඩු ගබඩා සහ ගුදම් ඉඩ පහසුකම් ඉදිකිරීම ආරම්භ කිරීම.

1954 නිරිතදිග දිය කඩනයෙහි ඉදිකර නිමකළ අද්දර නැංගුරම්පළවල් II වැනි එළිසබෙත් මහ රැජිණ විසින් විවෘත කිරීම සහ එය “එළිසබෙත් රැජින ජැටිය” යනුවෙන් නම් කිරීම. (“ගොතික්” රාජකීය රුවල් යාත්‍රාව එළිසබෙත් රැජිණ ජැටියෙහි නැංගුරම් ලෑ පළමු යාත්‍රාව විය)

1956 අද්දර නැංගුම්පළවල් 17 ක්, මාර්ගස්ථ බඩු ගබඩා හා ගුදම් තනා නිම කිරීම.

1958 කොළඹ වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කර වරාය (නැව්බඩු) සංස්ථාව පිහිටුවීම.

1964 ගාලු වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1967 වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව පිහිටුවීම.

# වැදගත් සංධිස්ථාන

1967 ත්‍රිකුණාමලය වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1979 කොළඹ වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංස්ථාව සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීම.

1980 කොළඹ වරාය සඳහා ප්‍රධාන සැලැස්ම ජපන් රජයේ සහයෝගය ඇතිව පිළියෙළ කිරීම.

1980 එළිසබෙත් රැජිණ ජැටියේ නව පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

1982 පළමු වැනි ග්‍රැන්ට් දොඹකරය - ටැන්ගෝ 80 සේවය සඳහා යෙදවීම.

1982 නව බහළු පර්යන්ත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ජපානයේ පෙන්ටා ඕෂන් වකවිකු ඒකාබද්ධ සමාගම සමඟ අත්සන් කිරීම.

1983 සම්පූර්ණ උපකරණ සහිත බහළු පර්යන්තයේ I වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

1984 සම්පූර්ණ උපකරණ සහිත අංග සම්පූර්ණ බහළු පර්යන්තයේ II වැනි අදියරෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

1984 එළිසබෙත් රැජිණ ජැටියේ බහළු නැංගුරම්පොළෙහි “හිටාචි” හුවමාරු දොඹකර හතරක් (04) සේවය සඳහා යොදා ගැනීම.

1985 ජයබහළු පර්යන්තයේ 1 වැනි අදියර උත්සවාකාරයෙන් විවෘත කිරීම.

1987 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය ආරම්භ කිරීම.

1987 ජයබහළු පර්යන්තයේ II වැනි අදියර විවෘත කිරීම.

1988 වෙරළෙන් ඔබ්බෙහි ඒක ලක්ෂිත බෝයා නැංගුරම්පළ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.

1994 නව වරාය ප්‍රවේශ මාර්ගය තනා නිම කිරීම.

1995 ජයබහළු පර්යන්තයේ III වැනි අදියර විවෘත කිරිම.

1996 ජයබහළු පර්යන්තයේ IV වැනි අදියර විවෘත කිරිම.

1998 සමඟි බහළු පර්යන්තය ආරම්භ කිරිම.

1998 අනුබද්ධිත වරාය සමූළුව පැවැත්වීම.

1999 නැගෙනහිර වෙරළ තීරයෙහි ඔලුවිල් ප්‍රදීපාගාරය ක්‍රියාත්මක කිරීම සහ ඔලුවිල් සමුද්‍රීය අභ්‍යාස පුහුණු ආයතනය විවෘත කිරිම.

# වැදගත් සංධිස්ථාන

1999 රජිණ බහළු පර්යන්තයේ සවුත් ඒෂියා ගේට්වේ ටර්නමිල් (SAGT) සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

1999 ත්‍රිකුණාමල වරායේ අද්දර නැංගුරම්පළ ව්‍යාපෘතියේ ඉදිකිරීම ආරම්භ කිරීම.

2000 දකුණු කොළඹ වරාය ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කිරීම.

2000 ගාලු වරායේ නව නැංගුරම්පොළක් ආරම්භ කිරීම.

2000 පැලියගොඩ බහළු නැව්බඩු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2000 කළාපීය වරායක් වශයෙන් ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම.

2000 උතුරු පාලම සංවර්ධන ව්‍යාපෘතියෙහි II වැනි අදියර ආරම්භ කිරීම.

2000 තනි-නැවතුම් ලේඛණ කටයුතු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2001 ගාලු වරායේ නව ජැටිය ආරම්භ කිරීම.

2003 ඔලුවිල් වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ආරම්භ කිරීම.

2003 අර්ධ පූර්ණ බහළු (LCL) සහ තොග-කඩන නැව්බඩු සඳහා ගණුදෙනුකාර සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2003 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමුද්‍රීය කෞතුකාගාරය විවෘත කිරීම.

2003 සිවිල් වැඩ කටයුතු සම්පූර්ණ වීමත් සමඟ සමඟි බහළු පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 සමඟි බහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 25 වන සංවත්සරික උත්සවය පැවැත්වීම.

2004 මහා පරිමාණ සේවා අංශයේ ජාතික ඵලදායීතා සම්මානය ජයබහළු පර්යන්තය විසින් දිනා ගැනීම.

2004 කොළඹ වරායේ බහළු දසලක්ෂ 2 ක් (මිලියන 02 ක්) මෙහෙයවීම.

2005 ඔලුවිල්හි වරාය හා නිවාස යෝජනා ක්‍රමයෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

2005 මධ්‍යම පරිමාණ සේවා අංශය යටතේ කුසලතා සහතිකයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය වෙත ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කිරීම.

# වැදගත් සංධිස්ථාන

2006 කොළඹ වරායේ බහළු ආරක්ෂක උපනයනයන් සහ මෙගා පෝර්ට් උපනයනයන් ක්‍රියාත්මක කිරීම.

2006 කොළඹ දකුණු වරාය ඉදිකිරීම සඳහා යෝජිත කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

2006 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි අදියර I සඳහා විස්තරාත්මක සැලසුම් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

2007 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම හා මූල්‍ය ගිවිසුම අත්සන් කිරීම.

2008 ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම.

2008 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වීම.

2008 හම්බන්තොට වරායෙහි නැව් තෙල් සැපයීමේ පහසුකම් සැලසීම සඳහා සහ තෙල් ටැංකි සංකීර්ණය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම.

2009 හම්බන්තොට වරායේ නැව්තෙල් සැපයීමේ පහසුකම හා තෙල් ටැංකි ව්‍යාපෘතිය සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

2009 ජයබහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතිය “NAVIS” පද්ධතිය දක්වා වර්ධනය කිරිම.

2010 2010.08.15 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ වරාය ද්‍රෝණියට මුහුදු ජලය පිරවීමේ උත්සවය.

2010 2010.11.18 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය උත්සවාකාරයෙන් විවෘත කිරිම.

2010 ජයබහළු පර්යන්තයේ බහළු මිලියන 02 ක් මෙහෙයුම් කිරීම.

2010 කොළඹ වරායේ බහළු මිලියන 04 ක් මෙහෙයුම් කිරිම.

2011 නව ගැන්ට්‍රි දොඹකර 06 ක් සහ හුවමාරු දොඹකර 30 ක් වරායට ගෙන ඒම.

2011 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ පිහිටි තෙල් පර්යන්තයේ ධාරිතාවය වැඩිකිරීම.

2011 පර්යන්ත ට්‍රැක්ටර් 50 ක් වරායේ සේවය සඳහා යෙදවීම.

2011 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සඳහා ගිවිසුම අත්සන් කිරීම.

## වැදගත් සංධිස්ථාන

2011 නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2011 දකුණු බහළු පර්යන්තයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2012 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ රෝ - රෝ නෞකා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

2012 බ්ලූමැන්ඩල් තෙල් ටැංකි සංකීර්ණයේ සිට කොළඹ වරාය දක්වා වූ ඉතා අබලන් තත්ත්වයේ පවතින ඉන්ධන නළ මාර්ගය නැවත එලීම.

2013 කිලෝ මීටර් 6.8 අතිවිශාල දියකඩනය සහ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමඟ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 ඔලුවිල් වරාය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 නැව්බඩු කළමනාකරණ පද්ධතියේ ආනයන පූර්ණ බහළු පැටවුම් මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

2013 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පරිපාලන ගොඩනැගිල්ල උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ නැව් තෙල් සැපයීමේ පහසුකම් සහ තෙල් ටැංකි සංකීර්ණය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

2015 නැගෙනහිර බහළු පර්යන්තය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා ISO 9001 – 2008 තත්ත්ව සහතිකය ලබා ගැනීම.

2015 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය දෙවන අදියරෙහි වරාය ද්‍රෝණියේ කරදියවර පිරවීමේ මංගල්‍යය පැවැත්වීම.

2015 කොළඹ වරාය තුල බහළු විස්සේ සම ඒකක මිලියන 05 මෙහෙයවීම.

2016 CFS 1මෙහෙයුම් මධ්‍යස්ථානය ප්‍රති ස්ථාපිත කිරීම. (2016.08.10)

2016 යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශය මගින් ජයබහළු පර්යන්තයේ උසින් අඩු නව ට්‍රේලරයක් නිෂ්පාදනය කිරීම. (2016.08.31)

2016 විශාලතම බහළු නෞකාව වන MSC Maya කොළඹ වරායේ, කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය වෙත පැමිණීම. (2016.09.16)

## වැදගත් සංධිස්ථාන

2017 පූර්ණ වශයෙන් නැවත ඉදි කරන ලද බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයේ 01-(CFS-01) මෙහෙයුම් ආරම්භ කිරීම. (2017.05.31)

2017 හම්බන්තොට වරායේ වරාය මෙහෙයුම් සඳහා චීනය සහ ශ්‍රී ලංකාව අතර සහන ගිවිසුම අත්සන් කිරීම. (2017.07.29)

2017 19 වැනි Internaltional Network of Affliated Ports (INAP) සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අනුග්‍රහය දැක්වීම. (2017.11.07-08.

2017 හම්බන්තොට වරායේ කොටස්කරුවන්ගේ ගිවිසුම (Shareholders Agreement) සහ ඉඩම බදු දීමේ ගිවිසුම (Land Lease Agreeement) අත්සන් කිරීම (2017.12.08).

2017 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් සමාගම අතර හම්බන්තොට වරාය සහන ගිවිසුම යටතේ පළමු ගෙවීම සිදු කිරීම (2017.12.09).

2017 කොළඹ වරාය විසින් විස්සේ සම ඒකක මිලියන 06 ක් මෙහෙයවීම (2017.12.20).

2018 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සී/ස චයිනා මර්චන්ටස් පෝට් හෝල්ඩිංග්ස් සමාගම අතර ඇති කරගත් හම්බන්තොට වරාය අනුග්‍රාහක ගිවිසුම යටතේ 02 වන ගෙවීම උත්පාදනය කිරීම.

2018 කොළඹ වරාය සාමූහිකව සංවර්ධනය කිරීම සඳහා සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමාගම සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අවබෝධතා ගිවිසුමකට එළඹීම.

2018 2018 වසරේ හොඳම වරායට හිමි සම්මානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෝලීය වරාය සංසදයේදී (Global Ports Forum) දිනා ගැනීම.

2018 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට්ස් පෝට් හෝල්ඩිංග්ස් සමාගම අතර ඇති කර ගන්නා ලද හම්බන්තොට වරාය අනුග්‍රාහක ගිවිසුම යටතේ ගෙවිය යුතු අවසන් කොටස (last tranche) උත්පාදනය කිරීම.

2018 කොළඹ වරාය විසින් ප්‍රථම වරට පවත්වන ලද “ Colombo Port Award Night” සම්මාන ප්‍රදානෝත්සව රාත්‍රිය සංවිධානය කිරීම.

2018 2018 වසරේ පළමු භාගයේදී ලෝකයේ වැඩිම බහළු ප්‍රමාණයක් මෙහෙයවන වරාය ලෙස කොළඹ වරාය ශ්‍රේණිගත කිරීම - ඇල්ෆාලයිනර් ශ්‍රේණිගත කිරීමට අනුව.

2018 කොළඹ වරාය විස්සේ සම ඒකක මිලියන 7ක් මෙහෙයවීමට සමත්වීම.

2019 ගෝලීය වරාය සංසදය විසින් පවත්වන ලද සම්මාන උළෙලේදී “2019 වසරේ වරාය අධිකාරිය” ට හිමි සම්මානය දෙවන වරටත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජයග්‍රහණය කිරීම.

# වැදගත් සංධිස්ථාන

2019 ගෝලීය වරාය සංසදය සම්මාන උළෙලේදී 2019 වසරේ වරාය රාජ්‍ය හවුල්කාරීත්වයට හිමි සම්මානය විසින් පවත්න ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජයග්‍රහණය කිරීම.

2019 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කිරීම.

2019 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 40 වන සංවත්සරය සැමරීම.

2019 කොළඹ වරාය විසින් දෙවන වරටත් කොළඹ වරාය සම්මාන රාත්‍රිය අගෝස්තු 31 වන දින පැවැත්වීම.

2020 ජය බහළු පර්යන්ත V අදියරෙහි ජැටි බැම්ම මීටර් 120 කින් දීර්ඝ කිරීමේ ඉදි කිරීම් ආරම්භ කිරීම.

2020 ජය බහළු පර්යන්ත V අදියර සඳහා ගෙන්වන ලද නව ගැන්ට්‍රි දොඹකර තුන නැගෙනහිර බහළු පර්යන්තයේ මෙහෙයුම් සඳහා සවි කිරීම.

2021 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා මහල් 17 කින් යුත් සමුද්‍රීය සේවා සැපයුම් මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කිරීම.

2021 කොළඹ වරායේ බටහිර බහළු පර්යන්තය ඉදිකිරීම සඳහා Adani Ports Economis Zone Limited සමාගම, දේශීය හවුල්කරුවන් වන ජෝන් කීල්ස් සමූහය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර එළැඹෙන ලද ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ, ගිවිසුමට අත්සන් කිරීම.

2022 කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තයේ 2 වන අදියර ආරම්භ කරන ලදී.

2022 කොළඹ වරායේ කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් පර්යන්තයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කරන ලදී.

2022 වසරේ හොඳම වරාය අධිකාරිය හා 2021 වසරේ හොඳම පොදු බහළු පර්යන්තය සඳහා වූ "Global Port Forum Awards" සම්මානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දිනා ගන්නා ලදී.

2023 වසරේ හොඳම වරාය අධිකාරිය හා 2023 වසරේ හොඳම පොදු බහළු පර්යන්තය සඳහා වූ "Global Port Forum Awards" සම්මානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දිනා ගන්නා ලදී.

2023 ගරු වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තොරතුරු විමසීම් මධ්‍යස්ථානය විවෘත කරන ලදී.

**2024 කොළඹ වරාය විසින් මිලියන 7.79 ක බහළු මෙහෙයුම් සිදු කිරීම.**

**2024 නැගෙනහිර බහළු පර්යන්තය සඳහා ද්විත්ව QC 06 ක් සහ රේල් පීලි මත සවි කර ඇති ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 20 ක් ගෙන ඒම.**

# වරාය සංඛ්‍යාලේඛන

## කොළඹ වරාය

**වරාය පරිමාණය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| වරාය ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 199 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 810 |
| ඊසාන දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 330 |
| බටහිර පිවිසුම | මීටර් 230 X මීටර් 15 |
| උතුරු පිවිසුම | මීටර් 190 X මීටර් 13 |

## කොළඹ නව වරාය

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| වරාය ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 192 |
| නිරිත දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 5,140 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 1,550 |
| ප්‍රධාන පිවිසුම | 570 මීටර් X මීටර් 18 |

**නැංගුරම්පොළ පහසුකම්**

| පර්යන්තය | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| නැගෙනහිර බහළු පර්යන්තය | 1,300 | 18 |
| දකුණු බහළු පර්යන්තය | 1,200 | 18 |
| බටහිර බහළු පර්යන්තය | 1,450 | 18 |

**ගුදම් පහසුකම්**

| ගුදමේ නම | නැව්බඩු මෙහෙයුම් වර්ගය | ධාරිතාවය -වර්ග මීටර් |
|---|---|---|
| බණ්ඩාරනායක ගුදම් 01 | සාමාන්‍ය නැව්බඩු | 5,000 |
| බණ්ඩාරනායක ගුදම් 02 | අන්තරාදායක නැව්බඩු | 5,000 |
| බණ්ඩාරනායක ගුදම් 03 | සාමාන්‍ය නැව්බඩු | 5,000 |
| බණ්ඩාරනායක ගුදම් 04 | විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන නැව්බඩු | 5,000 |
| CFS 01 | සාමාන්‍ය නැව්බඩු/ අන්තරාදායක නැව්බඩු | 7,000 |
| CFS 03 | බැඳුම්කර නැව්බඩු | 1,300 |
| CFS 04 | සාමාන්‍ය නැව්බඩු | 2,388 |
| CFS 05 | බැඳුම්කර නැව්බඩු | 2,397 |
| CFS - පැලියගොඩ | සාමාන්‍ය නැව්බඩු/ පුද්ගලික භාණ්ඩ | 19,500 |

**වැඩ කරන වේලාවන්**

කොළඹ වරාය වසරේ සෑම දිනකම දවසේ පැය 24 පුරා සේවා සැපයීමේ පදනම මත ක්‍රියාත්මකව පවතී.

# වරාය සංඛ්‍යාලේඛන

## ගාල්ල වරාය

**වරාය පරිමාණය**

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 15.3718 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 140 |
| ගොඩබිම ප්‍රදේශය | හෙක්ටයාර් 17.1914 |
| සමස්ත උපරිම දිග ප්‍රමාණය | මීටර් 130 |
| උපරිම ගැඹුර | මීටර් 7.3 |

**අපගමන වේලාව**

නැගෙනහිර - බටහිර ප්‍රධාන මාර්ගයෙන් නැත.

**වැඩ කරන වේලාවන්**

ලෝක කම්කරු දිනය හැර එහෙත් එදින දිවා නාවික කටයුතු පමණක් සහිතව ගාල්ල වරාය වසරේ සෑම දිනකම පැය 24 සේවා සැපයීම් පදනම මත ක්‍රියාත්මකව පවතී.

**නැංගුරම් පහසුකම්**

**සමස්ත අද්දර නැංගුරම්පළ සංඛ්‍යාව** 05

| නැංගුරම්පොළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ක්ලෝසන්බර්ග් ජැටිය | 420 | 8.9 |
| නව පාලම | 162 | 8.9 |
| නව පාලම/ හරස් | 84 | 8.9 |

**ගුදම් පහසුකම්**

| ගුදමේ නම හෝ පිහිටා ඇති ස්ථානය | ඒකක ප්‍රමාණය | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය (වර්ග අඩි) | ධාරිතාවය (ඝන අඩි) | බහළු තැන්පත් කිරීමේ උස (අඩි) |
|---|---|---|---|---|---|
| අංක 01 | 06 | 23 | 20,000 | 460,000 | 10 උස |
| අංක 02 | 12 | 23 | 40,000 | 920,000 | 10 උස |
| ගාල්ල වරායේ සබ්මැරීන කේබල් මධ්‍යස්ථානය (GSCD) | 10 | 23 | 33,333.3 | 766,666.68 | 10 උස |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 02 | 23 | 6,666.7 | 153,333.3 | 10 උස |

## වරාය සංඛ්‍යාලේඛන

## ත්‍රිකුණාමලය වරාය

**වරාය පරිමාණය**

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර්1,536 |
| ප්‍රවේශ ඇළ මාර්ගය (අවම පළල) | මීටර් 500 |
| ගොඩබිම් ප්‍රදේශය | හෙක්ටයාර් 2,254 |

**නැංගුරම්ලෑමේ පහසුකම්**

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැංගුරම්පොළවල්**

| නැංගුරම්පොළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| අෂ්රෆ් ජැටිය | 250 | 12.5 |
| පැති නැංගුරම්පොළ- අෂ්රෆ් ජැටිය | 90 X 2 | 8.5 |
| මඩිකොව් ප්‍රදේශයේ පිහිටි ජැටිය | 45 | 3.5 |
| ටීටීඒ හි පිහිටි ජැටිය ( TTA) | 190 | 2.0-4.0 |
| සිලෝන් ජැටිය | 50 | 2.5 |
| නගර ජැටිය | 50 | 2.5 |
| තෙල් ජැටිය | 200 | 9.75 |

**වෙනත් නැංගුරම්පොළවල්**

| නැංගුරම්පොළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ප්‍රිමා ජැටිය (ඇතුළ්) | 122 | 5.9 |
| ප්‍රිමා ජැටිය (පිටත) | 227 | 14.3 |
| ප්‍රිමා ජැටිය (බහුකාර්ය) | 170 | 10.3 |
| ටෝකියෝ සිමෙන්ති ජැටිය | 160 | 9.5 |

**ගුදම් විස්තර - TTA**

| ගුදම | ඉඩ ප්‍රමාණය (අඩි) | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය (වර්ග අඩි) | අඩුක් කිරීමේ උස (අඩි) | ධාරිතාවය (ඝන අඩි) |
|---|---|---|---|---|---|
| අංක 01 | 315 x 78 | 30 | 24,570 | 25 | 614,250 |
| අංක 04 | 190 x 95 | 19 | 18,050 | 14 | 252,700 |
| අංක 05 A | 150 x 110 | 25 | 16,500 | 15 | 247,500 |
| අංක 05 B | 150 x 80 | 15 | 12,000 | 12 | 144,000 |
| අංක 07 | 96 x 36 | 12 | 3,456 | 12 | 41,472 |

**වැඩ කරන වේලාවන්**

ලෝක කම්කරු දිනය හැර එහෙත් එදින දිවා නාවික කටයුතු පමණක් සහිතව ත්‍රිකුණාමලය වරාය වසරේ සෑම දිනකම පැය 24 සේවා සැපයීම් පදනම මත ක්‍රියාත්මකව පවතී.

# වරාය සංඛ්‍යාලේඛන

## හම්බන්තොට වරාය

**අදියර - I**

**වරාය පරිමාණය**

වරාය ප්‍රදේශය

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 70 |
| බටහිර දියකඩනයේ දිග | මීටර් 988 |
| නැගෙනහිර දියකඩනයේ දිග | මීටර් 312 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 |
| හැරවුම් පෙදෙස | මීටර් 600 |

**පාලම්වල දිග**

| | |
|---|---|
| සාමාන්‍ය නැව්බඩු පාලම | මීටර් 600 |
| සේවා පාලම | මීටර් 105 |
| තෙල් පාලම 1 | මීටර් 310 |
| තෙල් පාලම 2 | මීටර් 300 |
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 16 |
| නෞකා නිර්මාණය | ද.බ. ටො. 100,000 |

## හම්බන්තොට වරාය - දෙවන අදියර

**වරාය පරිමාණය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| සම්පූර්ණ කිරීමෙන් පසු මුළු ජල ප්‍රදේශය | හෙක්ටයාර් 77 |
| හැරවුම් චක්‍රය | මීටර් 600 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 |

**පාලම් වල දිග**

| | |
|---|---|
| ප්‍රධාන බහළු නැංගුරම්පොළ | මීටර් 838.5 |
| පෝෂක බහළු පර්යන්තය | මීටර් 460 |
| බහුකාර්ය නැංගුරම්පොළ | මීටර් 838.5 |
| භූවමාරු නැංගුරම්පොළ | මීටර් 208 |

| | |
|---|---|
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 17 |
| නෞකා නිර්මාණය | ද.බො.ටො. 100,000 |

# 2024

# මූල්‍ය සමාලෝචනය

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2024.12.31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

**අද්මිරාල් එස් එස් රණසිංහ**
සභාපති

**ඉංජි. හේරත් එම් පී ජයවර්ධන මහතා**
උප සභාපති

**ඉංජි. ටී කේ ජී එල් හේමචන්ද්‍ර මහතා**
කළමනාකාර අධ්‍යක්ෂ

**ආර් එම් දමිතා කුමාරි මහත්මිය**
අධ්‍යක්ෂ

**පී බී එස් සී නෝනිස් මහතා**
අධ්‍යක්ෂ

**ඊ එම් එස් බී ජයසුන්දර මහතා**
අධ්‍යක්ෂ

**ඒ ඒ පී එස් නිස්සංකා මහත්මිය**
අධ්‍යක්ෂ

**උපුල් ධම්මික ජයතිස්ස මහතා**
අධ්‍යක්ෂ

**යූ එල් අනුර බන්ඩාර මහතා**
අධ්‍යක්ෂ

2024 වර්ෂය තුළ, පවත්වන ලද මුළු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන විසි තුනක් (23) ක් විය. මීට අමතරව, මෙම කාල පරිච්ඡේදය තුළම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව රැස්වීම් දහ අටක් (18) ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ තවත් අනු කමිටුවක් වන විගණන කමිටුව 2024 වර්ෂය තුළ රැස්වීම් පහක් (05) පවත්වා ඇත.

කොළඹ වරාය පෙර වර්ෂයේ මෙහෙයුම් කල බහළුම් විස්සේ සම ඒකක 6,949,912 ට වඩා 12.1% ක වැඩි වීමක් පෙන්නුම් කරමින් 2024 වර්ෂයේදී බහළුම් විස්සේ සම ඒකක 7,792,069 ක් මෙහෙයුම් කරන ලදී. මෙය කොළඹ වරායේ වාර්තා වූ ඉහළම මෙහෙයුම් ධාරිතාවය වේ.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත - විස්සේ සම ඒකක 2,413,162
- සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් - විස්සේ සම ඒකක 2,025,840
- කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් - විස්සේ සම ඒකක 3,353,067

2023 වර්ෂයේ කොළඹ වරාය මෙහෙයවූ නැව්බඩු ධාරිතාවය වූ ටොන් 99,673,588 ට සාපේක්ෂව 15% ක වැඩි වීමක් සනිටුහන් කරමින් නැව්බඩු ප්‍රමාණය ටොන් 114,593,910 දක්වා ඉහළ යන ලදී. නැව්බඩු ටොන් ප්‍රමාණයේ වර්ධනය වීම වෙන් වෙන් වශයෙන් පහත දක්වේ.

- තොග කඩන නැව්බඩු ටොන් ප්‍රමාණය : 193.5% කින් වැඩි විය
- ද්‍රව නැව්බඩ් ටොන් ප්‍රමාණය : 8.5% කින් වැඩි විය
- වියළි තොග ටොන් ප්‍රමාණය : 24.5% කින් වැඩි විය
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල බහළුම්ගත නැව්බඩු ටොන් ප්‍රමාණය: එම කාලය තුළ 30.4% ක වැඩි වීමක් වාර්තා විය.

බහළුම් ධාරිතාවයේ කැපී පෙනෙන වර්ධනයක් පැවතියද 2024 වසරේදී කොළඹ වරාය වෙත පැමිණි නෞකා සංඛ්‍යාවේ අඩු වීමක් සිදු විය. 2023 වර්ෂයට සාපේක්ෂව මෙය 6% ක පහල යාමක් වූ අතර වර්ෂය තුළ වරාය වෙත පැමිණි මුළු නෞකා සංඛ්‍යාව 3,968 ක් විය. එක් ගමන් වාරයකදී විශාල

ධාරිතාවයක් ප්‍රවාහනය කළ හැකි අති විශාල බහළු නෞකා පැමිණෙන වාර ගණන වැඩිවීම මෙම අඩුවීමට හේතුවිය හැක. සමස්තයක් ලෙස, බහළු ධාරිතාවයේ හා නැව්බඩු ටොන් ප්‍රමාණයේ සුවිශේෂී වර්ධනය හේතුකොටගෙන 2024 වර්ෂය කොළඹ වරායට සුවිශේෂී වසරක් විය. කෙසේ වුවද, නෞකාවල පැමිණීම සුළු වශයෙන් අඩු වුවද, වඩා විශාල නෞකා වරාය වෙත පැමිණීමේ වත්මන් ප්‍රවණතාවය නාවික මෙහෙයුම්වල කාර්යක්ෂමතාවයට දායක වන බව පෙන්නුම් කෙරේ.

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල අලෙවිකරණ හා ව්‍යාපාර සංවර්ධන ක්‍රමෝපාය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත විසින් ක්‍රියාත්මක කරන ලද අලෙවිකරණ හා ව්‍යාපාර සංවර්ධන ක්‍රමෝපාය මගින් අළුත් නෞකා සේවාවන් විශේෂයෙන් වර්තමානයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත පැමිණෙන විස්සේ සම ඒකක 24,000 ක් දක්වා ධාරිතාවය සහිත නෞකා ඇතුළත් වන ලෝකයේ විශාලතම නෞකා සාර්ථකව ආකර්ෂණය කරගෙන ඇත. තවද, පිළිගත් ජාත්‍යන්තර නෞකා සේවා කිහිපයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත පිළිබඳ උනන්දුවක් දක්වා ඇති අතර එම තත්ත්වය සමුද්‍රීය කර්මාන්තය තුළ පර්යන්ත පිළිබඳ කීර්තිනාමය වර්ධනය වීමට දායක වේ. කලාපීය තරඟකාරීත්වයට ප්‍රතිචාර දැක්වීමක් ලෙස, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවාවන් පුළුල් කිරීම සඳහා වැඩි අවධානයක් ඇති කරන නව අලෙවිකරණ ක්‍රමෝපායන් හඳුන්වා දී ඇත. මෙම පියවරයන් මගින් අන්තර්ජාතික නාවික මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත ආකර්ෂණය වැඩි වෙමින් පවතින විකල්පයක් බට පත් කරමින් ගෝලීය වශයෙන් ප්‍රමුඛ ස්ථානයේ පවතින නෞකා සේවාවන් සමඟ සන්ධාන ශක්තිමත් කර ඇත.

ගෝලීය නාවික ක්ෂේත්‍රයේ ඉහළයමින් පවතින ඉල්ලුම සමඟ පෙළගැසෙමින් මෙම පූර්ව ක්‍රියාකාරී පියවරයන් මගින් තරඟකාරී පරිසරයක් තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වඩා වාසිදායක ස්ථානයක පිහිටුවීමට කටයුතු කෙරේ.

2023 වර්ෂයේ රුපියල් මිලියන 93,635.3 ක ආදායමට සාපේක්ෂව 10.2% ක සමස්ත ආදායම් වර්ධනයක් පෙන්නුම් කරමින් 2024 වර්ෂයේ මූල්‍ය කාර්යසාධනය රුපියල් මිලියන 103,179.3 ක සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කරන ලදී. රුපියල් මිලියන 52,209.4 ක මුළු වියදමෙහි වැඩිවීම 9.3% ක් වුවද, විදේශ ණය පොලියට පෙර හා විදේශ විනිමය ගැලපුම් වලට පෙර ලාභය රුපියල් 50,970.3 ට සාපේක්ෂව 11.1% කින් වැඩි විය. රුපියල් මිලියන 46,734.44 ක්ව පැවති බදු වලට පෙර ලාභය 15.8% කින් වැඩි වෙමින් විදේශ විනිමය පාඩු 47.2% කින් අඩු වූ අතර, විදේශ ණය පොලී වියදම 15.9% කින් අඩු විය. ආදායම් බදු, විලම්භිත බදු සහ ඒකාබද්ධ අරමුදලට දායකත්වය සඳහා ගණනය කිරීමෙන් පසුව, 2023 වර්ෂයේ රුපියල් මිලියන 19,940.1 ට සාපේක්ෂව රුපියල් මිලියන 38,246.34 ක් දක්වා ලඟා වෙමින් ලාභය 91.81% කින් වැඩි විය.

# මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සියළු ගණුදෙනු පිළිබඳ ගිණුම් පොත් නිසියාකාරව පවත්වාගෙන යනු ලබන බවටත්, පවතින තත්ත්වය හා වර්ෂයේ ලාභය/පාඩුව පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දෙන අයුරින් එහි මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන බවටත්, සහතික කිරීමේ වගකීම 1971 අංක 38 දරණ මුදල් පනතේ (12) හා (13.6) වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව, ගිණුම් පොත් නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා අධිකාරියට අධ්‍යක්ෂ මණ්ඩලය මගපෙන්වා ඇති අතර, නිතිපතා පවත්වන ලද රැස්වීම් වල දී විගණන කමිටුව හරහා මූල්‍යමය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලදී.

මෙම වාර්තාවෙහි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් හා ඇස්තමේන්තු මගින් ගිණුම්කරන ප්‍රතිපත්ති අඛණ්ඩ පදනමක් මත පිළිගැනීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ල යොමු වී ඇත.

අධිකාරියේ වත්කම් ආරක්ෂා කරගැනීම, වංචා හා වෙනත් අක්‍රමිකතා වලක්වා ගැනීම හා අනාවරණය කර ගැනීමත්, උදෙසා තමන්ට ගත හැකි සෑම පියවරක්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාර කටයුතු විධිමත් ක්‍රමවේදයකට ගෙනයාමට සහ අපගේ ලේඛනයන්හී නිරවද්‍යතාවය හා විශ්වාසවන්තභාවය හැකිතාක් දුරට ප්‍රායෝගික වන පරිදි ආරක්ෂා කිරීම සඳහා, අභ්‍යන්තර පරීක්ෂා කිරීම්, අභ්‍යන්තර විගණනයන් සහ මූල්‍ය හා අනෙකුත් පාලනයන් ඇතුළත් සඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



**ෂෙහාර නවරත්න මහත්මිය**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

# විගණන කමිටු වාර්තාව

**විගණන කමිටුවේ අරමුණ**

විගණන කමිටුව අධිකාරියේ මූල්‍ය වාර්තාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් සිදු කිරීම හා අවශ්‍ය විටදී නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරන ලද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවකි. ආයතනික අරමුණු ඉටු කර ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ දෝෂ පිළිබඳ වගකීම සඳහා සහාය වීම පිණිස විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ වාර්තා කරනු ලැබේ.

මහා භාණ්ඩාගාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් රජයට අයත් ව්‍යාපාර සඳහා නිකුත් කර ඇති ආයතනික යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ මගින් විගණන කමිටුවේ බලතල හා වගකීම් පාලනය වේ.

**විගණන කමිටුවේ කාර්යාභාරය**

අභ්‍යන්තර පාලන, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, අවධානම් කළමනාකරණය, මහා භාණ්ඩාගාරයේ සහ වෙනත් අධිකාරීන්වල නීති රීති හා උපදෙස් පිළිපැදීම/ අනුගත වීම ආදියේ කාර්යක්ෂමතාවය සහතික කිරීම පිණිස ප්‍රධාන වශයෙන් විගණන කමිටුව වෙත බලය පැවරී ඇත.

ඉහත සඳහන් කළ අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම විමර්ශනයක් සිදු කිරීම හා සියළුම අභ්‍යන්තර පද්ධති හා ක්‍රියවලීන්, අනුකූලතා වාර්තා, අවධානම් කළමනාකරණ වාර්තා ආදිය පරීක්ෂා කිරීම සඳහා විගණන කමිටුව වෙත බලය පැවරී ඇත.

**විගණන කමිටුව - 2024 වර්ෂයේ සංයුතිය**

| |
|---|
| පි ඒ එස් අතුල කුමාර මහතා *<br>සභාපති/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ<br>මහා භාණ්ඩාගාර නියෝජිත |
| පී බී එස් සී නෝනිස් මහතා<br>සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ<br>(විධායක අධ්‍යක්ෂ - රේගු අධ්‍යක්ෂ ජෙනරාල්) |
| නීල් රාජකරුණා හේවාතන්ත්‍රී මහතා *<br>සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ |
| පී එස් කේ වටවල මහතා *<br>සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ |
| සටහන:<br>* 2024 ඔක්තෝම්බර් මසදී අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසු අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය අවසන් වූ අතර විගණන කමිටුව පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය. |

## විගණන කමිටු වාර්තාව

| |
|---|
| ආර් එම් දමිතා කුමාරි මහත්මිය<br>සභාපති/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ<br>මහා භාණ්ඩාගාර නියෝජිත<br>2024.11.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී. |
| පී බී එස් සී නෝනිස් මහතා<br>සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ<br>(විධායක අධ්‍යක්ෂ - රේගු අධ්‍යක්ෂ ජෙනරාල්)<br>2022.07.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී. |
| යූ එල් අනුර බණ්ඩාර මහතා<br>සාමාජික/ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ<br>2024.10.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී. |
| **කමිටුවේ ලේකම්**<br><br>ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විගණන කමිටුවේ ලේකම් වශයෙන් ද කටයුතු කරයි. පොදු ව්‍යාපාර සඳහා වන ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ යටතේ පනවා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව, ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ. |
| **අනිවාර්යයෙන් සහභාගී විය යුතු නිලධාරීන්**<br><br>• කළමනාකාර අධ්‍යක්ෂ<br>• අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ<br>• මුදල් ප්‍රධානියා |
| **නිරීක්ෂකවරුන්**<br><br>විගණකාධිපතිගේ නියෝජිතයෙක්<br>රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක |

**විගණන කමිටු රැස්වීම්**

විගණන කමිටුව අවම වශයෙන් සෑම කාර්තුවකටම වරක් සහ අවශ්‍ය හෝ සුදුසු යැයි අදහස් කරන සෑම අවස්ථාවකම රැස්වේ. සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් පහක් පවත්වන ලද අතර කමිටු සාමාජිකයින් හා අනිවාර්යයෙන් සහභාගී විය යුතු අයගේ පැමිණීම පහත දැක්වේ.

# විගණන කමිටු වාර්තාව

| නම | සහභාගී වීමට සුදුසුකම් ලැබූ/ සහභාගී වූ | |
|---|---|---|
| | **2024.01.01 - 2024.10.31** | **2024.11.01 – 2024.12.31** |
| **කමිටු සාමාජිකයන්** | | |
| ආර් එම් දමිතා කුමාරි මහත්මිය | - | 1/1 |
| පී ඒ එස් ඒ කුමාර මහතා | 4/4 | - |
| පී බී එස් සී නෝනිස් මහතා | 3/4 | 1/1 |
| යූ එල් ඒ බන්ඩාර මහතා | - | 1/1 |
| එන් ආර් හේවාතන්ත්‍රී මහතා | 4/4 | - |
| පී එස් කේ වටවල මහතා | 3/4 | - |
| අනිවාර්යයෙන් සහභාගී විය යුතු නිලධාරීන් | | |
| ජී හේමචන්ද්‍ර මහතා | - | 1/1 |
| එච් එම් පී ජයන්ත මහතා | 4/4 | - |
| ජී එන් ලියනගේ මහත්මිය | 4/4 | 1/1 |

**කමිටුවේ කාර්යභාරය**

පොදු ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් රජයට අයත් ව්‍යාපාර සඳහා නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ මගින් විගණන කමිටුවේ විෂය පථය පාලනය වේ.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ස්වාධීන හා සමාලෝචනයක් ලබා දීම මගින් විගණන කමිටුව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට සිය රාජකාරී ඉටුකිරීමට සහාය වීම වෙනුවෙනි.

විගණන කමිටු රැස්වීම් වලදී කරන ලද සාකච්ඡා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කර අනුමත කරගන්නා ලද අතර එහිදී සියළුම ප්‍රධාන ගැටළු අවධානයට ලක් කළ යුතු කරුණු, ගන්නා ලද ක්‍රියාමාර්ග අත්කරගත් හෝ අපේක්ෂිත ප්‍රතිඵල පැහැදිලි කර සාකච්ඡා කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගනු ලැබේ.

**2024 වර්ෂයේදී ඉටුකළ කාර්යයන්වල සාරාංශය**

2024 වර්ෂයේදී විගණන කමිටුවේ කාර්යයන් පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ සාරාංශගත කර ඇත.

**මූල්‍ය වාර්තාකරණ හා නියාමන අනුකූලතාවය**

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ඇතුළුව නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කළ යුතු බව සහ එමගින් අධිකාරියේ මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු කිරීම තහවුරු කිරීම සඳහා අධිකාරියේ මූල්‍ය වාර්තා සමාලෝචනය කරන ලදී.

- අධිකාරියේ පාලන යන්ත්‍රණයේ ප්‍රමාණාත්මකබව හා කාර්යක්ෂමතාවය සමාලෝචනය කරන ලදී.

- මූල්‍ය හේතු විශ්ලේෂණයක් සිදු කරන ලද අතර පද්ධති, ක්‍රියාවලි හා අභ්‍යන්තර පාලන වලට දෛනික පදනම මත සහ විශේෂිත අවස්ථා වලදී ඒවාට විසඳුම් ලබා දෙන ලදී.

- අනිවාර්ය හා වෙනත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලබව හා විගණකාධිපති වාර්තාවේ වාර්තාකරන ලද සොයාගත් කරුණු වලට අදාළව ගන්නා ලද පියවර සමාලෝචනය කරන ලදී.

**අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය, අවධානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලියේ ස්වාධීන ඇගයීමක් සිදු කරනු ලබන අභ්‍යන්තර විගණනය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආයතනික පාලනය තුළ ඉතා වැදගත් අංගයකි. එමෙන්ම, නීති, රීති හා අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ ආයතනයේ අනුකූලතාවය අධීක්ෂණය කිරීමද අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ වගකීමකි.

අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කළමනාකාරීත්වයට සිය ආයතනික පාලන වගකීම් ඉටුකිරීම මෙන්ම ආයතනය තුළ ව්‍යාපාර මෙහෙයුම් කිරීමේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර විගණන කමිටුව සහාය වේ.

- ස්වාධීනත්වය, සම්පත්වල ප්‍රමාණාත්මකභාවය, අරමුණුසහගතබව සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ කාර්යසාධනය සමාලෝචනය කරන ලදී.

- විගණනයෙන් ආවරණය වන කරුණු පිළිගත හැකි නියමිත වාර ගණනක් සිදු කර ඇති බවට සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කරන ලද අතර මූල්‍ය වර්ෂය පුරාම විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය පිළිබඳ සමාලෝචනය කරන ලදී.

- වාර්තා වී ඇති දුර්වලතා, ක්‍රියාවලිය උල්ලංඝනය කිරීම්, වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම අවම කිරීම සඳහා පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කරන ලදී.

**බාහිර විගණනය**

අධිකාරියේ බාහිර විගණනය, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපති විසින් සිදු කරනු ලැබේ.

- අතුරු හා මූල්‍ය විගණන වාර්තා වලින් පැන නගින සියළුම අදාළ කරුණු සහ ඒ සඳහා කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සාකච්ඡා කරන ලදී.

- විගණනයෙන් සොයාගත් කරුණු මත කරන ලද නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**අවදානම සහ පාලන සමාලෝචනය**

අධිකාරිය විසින් අනුගමනය කරනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රියාදාමය හා ක්‍රියාවලීන් මෙන්ම සැලකිය යුතු අවදානම් කලාප පිළිබඳ විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇත. තවද, මෙහෙයුම් හෝ

# විගණන කමිටු වාර්තාව

පාලන පරිසරය කෙරෙහි බලපානු ලබන අවදානම් කලාප කමිටුව විසින් නිරීක්ෂණය කරන ලද අතර එවැනි බලපෑම් අවම කිරීම සඳහා උචිත පියවර ගැනීමට උපදෙස් ලබා දෙන ලදී.

**ඉදිරි ගමන් මග**

2024 වර්ෂය තුළ හා ඉදිරියට විගණන විෂය පථය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවීම මගින් විගණන කමිටුව විසින් ධනාත්මක හා කාර්යක්ෂම අභ්‍යන්තර පාලන පරිචයක් ඇති බව තහවුරු කරනු ඇත.

පී ඒ එස් අතුල කුමාර මහතා (සභාපති), නීල් රාජකරුණා හේවාතන්ත්‍රී මහතා සහ පී එස් කේ වටවල මහතා යන කමිටුවේ සාමාජිකයින් කමිටුවට ලබා දුන් අමිල දායකත්වය වෙනුවෙන් විගණන කමිටුවේ ස්තූතිය ප්‍රකාශ කරමු.

විගණන කමිටුව වෙනුවෙන්



**ආර් එම් දමිතා කුමාරි මහත්මිය**
**සභාපති**
**විගණන කමිටුව**

# ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අනුකූලතාවය දැක්වීමේ තත්ත්වය සවිස්තරාත්මකව පහත දැක්වේ.

**1. සේවක අර්ථ සාධක අරමුදල - අධිකාරියේ සහ සේවක දායකත්වය**

සියළුම ස්ථිර සේවකයින්ගේ සේවක අර්ථ සාධක අරමුදලෙහි වරාය අධිකාරියේ 15% ක දායක මුදල සහ 10% ක සේවක දායක මුදල එළඹෙන ආසන්නතම මාසයේ අවසන් දිනට ප්‍රථමශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුද වෙත ප්‍රේෂණය කර ඇත.

සේවකයින්ගෙන් අඩු කරනු ලබන සියළුම දායක මුදල් සහ අධිකාරියේ අදාළ දායක මුදල නියමිත දිනට හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**2. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල**

අධිකාරියේ 3% ක මාසික දායක මුදල නියමිත දිනට හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**3. ආදායම් බදු**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 90 වගන්තිය ප්‍රකාරව උපයනු ලබන ආදායමට අදාළ ආදායම් බදු ගෙවීම, බදු ගෙවිය යුතු ආදායමක් උපයා ඇති සෑම අවස්ථාවකදීම නියමිත දිනවලදී කාර්තුමය වශයෙන් ගෙවනු ලැබ ඇත.

**4. වාර්ෂික බදු වාර්තාව**

අධිකාරිය විසින් පිළියෙල කල වාර්ෂික ආදායම් බදු වාර්තාව පිළියෙල කිරීමේදී 2023.12.31 අවසන් වර්ෂය දක්වා, ආදායම් බදු වාර්තා පිළියෙල කර ඇති අතර, ආදායම් බදු වාර්තාව පසුව එළඹෙන වර්ෂයෙහි, නොවැම්බර් 30 හෝ ඊට පෙර සම්පූර්ණ කර ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

**5. වාර්ෂික වාර්තාකරණය**

වාර්ෂික අයවැය, ගිණුම් සහ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

**6. සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL)**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විසින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගෙවීමට යටත් 2.5% ක පිරිවැටුම් අනුපාතයකට ගෙවා ඇති අතර එම මුදල නියමිත දින හෝ ඊට ප්‍රථම ප්‍රේෂණය කර ඇත.

# වැදගත් මෙහෙයුම් කරුණු

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|
| | කොළඹ | ත්‍රිකුණාමලය | ගාල්ල | **2024** | **2023** |
| **පැමිණි නෞකා සංඛ්‍යාව** | | | | | |
| නැව්බඩු ප්‍රවාහන නෞකා | 2,183 | 66 | 2 | 2,251 | 4,175 |
| වෙනත් නෞකා | 441 | 24 | 5 | 470 | 201 |
| වෙනත් යාත්‍රා | 681 | 6 | 18 | 705 | 779 |
| | **3,305** | **96** | **25** | **3,426** | **5,155** |
| බහළු මෙහෙයුම් ධාරිතාවය | | | | | |
| **බහළු විස්සේ සම ඒකක (ශ්‍රී.ල.ව.අ.)** | | | | | |
| ප්‍රතිනැව්ගත | 2,042,577 | | | 2,042,577 | 1,729,272 |
| දේශීය | 285,204 | | | 285,204 | 208,383 |
| තැන්මාරු මෙහෙයුම් | 85,381 | | | 85,381 | 27,476 |
| **බහළු විස්සේ සම ඒකක මුළු එකතුව** | **2,413,162** | **-** | **-** | **2,413,162** | **1,965,131** |
| **බහළු විස්සේ සම ඒකක (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| ප්‍රතිනැව්ගත | 1,757,097 | | | 1,757,097 | 1,528,824 |
| දේශීය | 229,291 | | | 229,291 | 193,092 |
| තැන්මාරු මෙහෙයුම් | 39,452 | | | 39,452 | 41,947 |
| **බහළු විස්සේ සම ඒකක මුළු එකතුව** | **2,025,840** | **-** | **-** | **2,025,840** | **1,763,863** |
| **බහළු විස්සේ සම ඒකක (සී.අයි.සී.ටී)** | | | | | |
| ප්‍රතිනැව්ගත | 2,515,521 | | | 2,515,521 | 2,496,151 |
| දේශීය | 654,760 | | | 654,760 | 588,531 |
| තැන්මාරු මෙහෙයුම් | 182,786 | | | 182,786 | 136,236 |
| **බහළු විස්සේ සම ඒකක මුළු එකතුව** | **3,353,067** | **-** | **-** | **3,353,067** | **3,220,918** |
| **බහළු විස්සේ සම ඒකක (කොළඹ වරාය)** | | | | | |
| ප්‍රතිනැව්ගත | 6,315,195 | - | - | 6,315,195 | 5,754,247 |
| දේශීය | 1,169,255 | - | - | 1,169,255 | 990,006 |
| තැන්මාරු මෙහෙයුම් | 307,619 | - | - | 307,619 | 205,659 |
| **බහළු විස්සේ සම ඒකක මුළු එකතුව** | **7,792,069** | **-** | **-** | **7,792,069** | **6,949,912** |
| සාම්ප්‍රදායික මෙ.ටො. | 2,067,688 | 2,016,787 | 387 | 4,084,862 | 3,043,461 |
| ද්‍රව මෙ.ටො. | 5,302,293 | 595,935 | - | 5,898,228 | 5,241,358 |
| | **7,369,981** | **2,612,722** | **387** | **9,983,090** | **8,284,819** |
| **නැව් භාණ්ඩ ( මෙ.ටො.) - ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | | | | | |
| බහළුගත නැව්බඩු | 36,487,633 | | | 36,487,633 | 27,986,968 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 2,067,688 | 2,016,787 | 387 | 4,084,862 | 3,043,461 |
| ද්‍රව | 5,302,293 | 595,935 | | 5,898,228 | 5,241,358 |
| **මුළු එකතුව (මෙ.ටො.)** | **43,857,614** | **2,612,722** | **387** | **46,470,723** | **36,271,787** |
| **නැව් භාණ්ඩ ( මෙ.ටො.) - (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| බහළුගත නැව්බඩු | 25,563,582 | | | 25,563,582 | 22,812,891 |
| සාම්ප්‍රදායික නැව්බඩු | | | | - | - |
| ද්‍රව | | | | - | - |
| **මුළු එකතුව (මෙ.ටො.)** | **25,563,582** | **-** | **-** | **25,563,582** | **22,812,891** |
| **නැව් භාණ්ඩ ( මෙ.ටො.) - (සී.අයි.සී.ටී)** | | | | | |
| බහළුගත නැව්බඩු | 45,172,714 | | | 45,172,714 | 42,603,207 |
| සාම්ප්‍රදායික නැව්බඩු | | | | - | - |
| ද්‍රව | | | | - | - |
| | **45,172,714** | **-** | **-** | **45,172,714** | **42,603,207** |
| **මෙහෙයුම් කළ ටොන් ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | |
| බහළුගත නැව්බඩු | 107,223,929 | - | - | 107,223,929 | 93,403,066 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 2,067,688 | 2,016,787 | 387 | 4,084,862 | 3,043,461 |
| වෙනත් | 5,302,293 | 595,935 | - | 5,898,228 | 5,241,358 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **114,593,910** | **2,612,722** | **387** | **117,207,019** | **101,687,885** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (ශ්‍රී.ල.ව.අ.)** | | | | | |
| බහළුගත නැව්බඩු | 59,994,051 | | | 59,994,051 | 53,336,457 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 4,943,512 | 2,150,713 | 22,312 | 7,116,537 | 5,329,707 |
| වෙනත් | 4,827,382 | 876,735 | 56,187 | 5,760,304 | 5,457,781 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **69,764,945** | **3,027,448** | **78,499** | **72,870,892** | **64,123,945** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (එස්.ඒ.ජී.ටී)** | | | | | |
| බහළුගත නැව්බඩු | 37,467,631 | | | 37,467,631 | 42,211,652 |
| සාම්ප්‍රදායික නැව්බඩු | | | | - | 7,966 |
| වෙනත් | | | | - | - |
| **මුළු ටොන් ප්‍රමාණය** | **37,467,631** | **-** | **-** | **37,467,631** | **42,219,618** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (සී.අයි.සී.ටී)** | | | | | |
| බහළුගත නැව්බඩු | 100,254,864 | | | 100,254,864 | 107,793,096 |
| සාම්ප්‍රදායික නැව්බඩු | | | | - | - |
| වෙනත් | | | | - | - |
| **මුළු ටොන් ප්‍රමාණය** | **100,254,864** | **-** | **-** | **100,254,864** | **107,793,096** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (සී.ඩබ්.අයි.ටී.)** | | | | | |
| බහළුගත නැව්බඩු | | | | - | - |
| සාම්ප්‍රදායික නැව්බඩු | 89,881 | | | 89,881 | - |
| වෙනත් | 19,611 | | | 19,611 | - |
| **මුළු ටොන් ප්‍රමාණය** | **109,492** | **-** | **-** | **109,492** | **-** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | |
| බහළුගත නැව්බඩු | 197,716,546 | - | - | 197,716,546 | 203,341,205 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 5,033,393 | 2,150,713 | 22,312 | 7,206,418 | 5,337,673 |
| වෙනත් | 4,846,993 | 876,735 | 56,187 | 5,779,915 | 5,457,781 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **207,596,932** | **3,027,448** | **78,499** | **210,702,879** | **214,136,659** |
| **සේවක මඬුල්ල** | | | | | |
| සේවක සංඛ්‍යාව | **7,042** | **327** | **255** | **7,624** | **8,050** |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| | | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | | **2024** | **2023** | **2024** | **2023** |
| | සටහන | | නැවත සංශෝධනය කළ | | නැවත සංශෝධනය කළ |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **3** | 313,767,892,534 | 272,206,026,515 | 313,642,995,838 | 272,101,264,181 |
| කල්බදු වත්කම් | **3.2** | 47,153,242 | 58,485,470 | 47,153,242 | 58,485,470 |
| අස්පෘෂ්‍ය වත්කම් | **4** | 614,349,807 | 2,712,694,354 | 613,495,182 | 2,711,978,772 |
| ආයෝජන දේපළ | **5** | 210,565,049,327 | 211,887,505,020 | 210,565,049,327 | 211,887,505,020 |
| පරිපාලිත සමාගම් වල ආයෝජන | **6** | - | - | 1,000,000 | 1,000,100 |
| ආශ්‍රිත සමාගම් වල ආයෝජන | **7** | 35,486,065,853 | 36,060,590,549 | 39,196,120,030 | 39,196,120,030 |
| මූල්‍ය වත්කම්වල වෙනත් විස්තීර්ණ ආදායමේ සාධරණ අගය | **8** | 77,056,659,020 | 76,967,867,376 | 77,056,659,020 | 76,967,867,376 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් අයවිය යුතු මුදල | **9** | 23,348,799 | 30,935,829 | 23,348,799 | 30,935,829 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් - මහජන බැංකු ණය | **10** | 2,140,048,561 | 2,469,286,799 | 2,140,048,561 | 2,469,286,799 |
| සේවක ණය | **11** | 7,270,126,541 | 6,264,890,249 | 7,232,069,088 | 6,229,091,683 |
| **ජංගම නොවන වත්කම් - මුළු එකතුව** | | **646,970,693,683** | **608,658,282,161** | **650,517,939,086** | **611,653,535,260** |
| **ජංගම වත්කම්** | | | | | |
| වට්ටෝරුගත භාණ්ඩ | **12** | 5,259,282,461 | 4,701,766,535 | 5,237,627,376 | 4,690,776,969 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | **13** | 19,921,899,127 | 11,089,182,734 | 19,922,416,723 | 11,089,593,769 |
| තැන්පතු සහ අත්තිකාරම් | **14** | 3,098,209,219 | 6,791,524,461 | 3,098,209,219 | 6,791,524,461 |
| පෙර ගෙවූ වියදම් | | 378,492,249 | 420,349,211 | 352,149,952 | 382,218,103 |
| සේවක ණය | **15** | 63,993,332 | 85,941,018 | 44,660,173 | 70,024,442 |
| වෙනත් මූල්‍ය වත්කම් | **16** | 42,493,379,723 | 80,732,494,008 | 41,895,420,510 | 80,732,494,008 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | **17** | 43,320,999,482 | 24,763,454,332 | 43,099,960,237 | 24,021,067,891 |
| **ජංගම වත්කම් - මුළු එකතුව** | | **114,536,255,594** | **128,584,712,299** | **113,650,444,190** | **127,777,699,642** |
| **මුළු වත්කම්** | | **761,506,949,277** | **737,242,994,460** | **764,168,383,277** | **739,431,234,902** |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| යෙදවූ ප්‍රාග්ධනය | **18** | 7,591,379,785 | 7,591,379,785 | 7,591,379,785 | 7,591,379,785 |
| ප්‍රාග්ධන සංචිත | **19** | 113,405,856,806 | 113,405,856,806 | 113,405,856,805 | 113,405,856,806 |
| වෙනත් සංචිත | **20** | 1,125,903 | 1,125,903 | 1,125,903 | 1,125,903 |
| විලම්බිත ආදායම | **21** | 172,033,800,843 | 171,123,863,104 | 172,033,800,843 | 171,123,863,104 |
| ණය නිදහස් කිරීමේ සංචිතය | **22** | 4,613,549,887 | 4,613,549,887 | 4,613,549,887 | 4,613,549,887 |
| ප්‍රත්‍යාගණන සංචිත | **23** | 71,945,706,076 | 73,286,013,685 | 71,945,706,074 | 73,286,013,685 |
| සාධාරණ අගය මත වෙනත් විස්තීර්ණ ආදායම් වලින් ජනිත වන මූල්‍ය වත්කම් | | 59,571,586,537 | 62,485,451,394 | 59,571,586,536 | 62,485,451,392 |
| රඳවාගත් ඉපැයීම් | | 186,883,508,333 | 147,041,794,365 | 189,623,216,758 | 149,424,063,079 |
| **හිමිකම්වල මුළු එකතුව** | | **616,046,514,171** | **579,549,034,929** | **618,786,222,592** | **581,931,303,642** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| ණය ගැනීම් - ශ්‍රී ලංකා රජයෙන් | **24.1** | 51,334,904,544 | 63,279,672,079 | 51,334,904,544 | 63,279,672,079 |
| ණය ගැනීම් - මූල්‍ය ආයතන වලින් | **25.1** | 2,140,048,561 | 2,543,183,809 | 2,140,048,561 | 2,469,286,799 |
| මූල්‍ය කල්බදු වගකීම් | **25.4.1** | - | 9,578,902 | - | 9,578,902 |
| රජයේ ප්‍රදානයන් | **26** | 29,355,904,719 | 29,605,920,226 | 29,355,904,719 | 29,605,920,226 |
| විලම්බිත බදු වගකීම් | **27** | 22,306,907,484 | 18,968,574,917 | 22,304,300,240 | 18,963,101,296 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | **28** | 11,072,941,262 | 9,163,118,739 | 11,041,842,169 | 9,143,102,861 |
| **ජංගම නොවන වගකීම්වල මුළු එකතුව** | | **116,210,706,570** | **123,570,048,670** | **116,177,000,232** | **123,470,662,162** |
| **ජංගම වගකීම්** | | | | | |
| භාණ්ඩ හා සේවා සැපයුම් හා වෙනත් ණය හිමියන් | **29** | 3,452,406,257 | 4,180,852,000 | 3,519,743,366 | 4,249,855,218 |
| ණය ගැනීම් - ශ්‍රී ලංකා රජයෙන් | **24.2** | 6,789,630,405 | 7,821,252,838 | 6,789,630,405 | 7,821,252,838 |
| ණය ගැනීම් - මූල්‍ය ආයතන වලින් | **25.2** | 329,238,237 | 340,539,837 | 329,238,237 | 329,238,237 |
| මූල්‍ය කල්බදු වගකීම් | **25.4.1** | 9,578,902 | 13,685,710 | 9,578,902 | 10,455,933 |
| තැන්පතු සහ ලැබූ අත්තිකාරම් | **30** | 10,895,657,574 | 8,383,707,728 | 10,849,364,352 | 8,322,901,251 |
| ගෙවිය යුතු ප්‍රවර්තන බදු | **31** | (2,328,810,413) | 4,568,590,618 | (2,373,872,177) | 4,499,868,578 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | **32** | 10,101,988,428 | 8,815,242,982 | 10,081,477,367 | 8,795,697,044 |
| මහාභාණ්ඩාගාරයට ගෙවිය යුතු | **32.2** | 39,146 | 39,146 | | |
| **ජංගම වගකීම්වල මුළු එකතුව** | | **29,249,728,536** | **3,412,391,081** | **29,205,160,452** | **34,029,269,099** |
| **හිමිකම් සහ වගකීම්වල මුළු එකතුව** | | **761,506,949,277** | **737,242,994,460** | **764,168,383,277** | **739,431,234,902** |

**පිටු අංක 107 සිට 127 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 128 සිට 156 දක්වා පිටුවල සඳහන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අනුකලනයන් නිර්ම**

**මෙම මූල්‍ය ප්‍රකාශන මගින් 2024.12.31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ලබා දෙනු ලැබේ.**

**ජී එන් ලියනගේ**
**අධ්‍යක්ෂ (මුදල්)**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ .මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර පහත සඳහන් පුද්ගලයන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී .**

**අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික)**
**සභාපති**

**ටී කේ ජී එල් හේමචන්ද්‍ර**
**කළමනාකාර අධ්‍යක්ෂ**

**උපුල් ධම්මික ජයතිස්ස**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

**දිනය : 2025 මැයි 20**
වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| | | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | | 2024 | 2023 | 2024 | 2023 |
| | සටහන | | | | |
| ආදායම | 33 | 74,567,391,882 | 63,261,171,026 | 74,567,391,882 | 63,261,171,026 |
| සෘජු වියදම් | 34 | (36,667,419,196) | (34,302,380,190) | (36,397,060,957) | (34,088,857,992) |
| **දළ ලාභය** | | **37,899,972,686** | **28,958,790,836** | **38,170,330,925** | **29,172,313,034** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 35 | 23,254,035,965 | 20,340,560,361 | 23,275,129,253 | 20,360,251,461 |
| පරිපාලන වියදම් | 36 | (14,831,082,414) | (12,743,112,255) | (15,380,351,112) | (13,202,914,952) |
| **මෙහෙයුම් ලාභය** | | **46,322,926,237** | **36,556,238,940** | **46,065,109,066** | **36,329,649,543** |
| ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ ආදායම | 37 | 1,433,211,680 | 5,444,475,434 | 1,358,964,129 | 5,334,763,397 |
| විදේශ විනියම ලාභ/(පාඩු) | | (689,629,043) | (1,305,169,821) | (689,629,043) | (1,305,169,821) |
| ආශ්‍රිත සමාගම් වලින් ලැබූ ලාභ කොටස් | 7 | (572,864,870) | (640,691,175) | - | - |
| **බදු වලට පෙර ලාභය** | | **46,493,644,005** | **40,054,853,378** | **46,734,444,152** | **40,359,243,118** |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 53 | (607,310,383) | (8,673,689,650) | (607,310,383) | (8,673,689,650) |
| ආදායම් බදු වියදම් | 38 | (7,204,959,408) | (5,674,060,695) | (7,097,550,974) | (5,564,711,200) |
| | | | | | - |
| විලම්බිත බදු වියදම් | 27 | (780,379,618) | (6,179,745,921) | (783,245,995) | (6,180,776,580) |
| **වර්ෂය තුළ ලාභය** | | **37,900,994,596** | **19,527,357,113** | **38,246,336,801** | **19,940,065,689** |
| **මව් සමාගමේ ස්කන්ධ හිමියන් අතර බෙදී යා යුතු** | | **37,900,994,596** | **19,527,357,113** | **38,246,336,801** | **19,940,065,689** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| **වර්ෂය තුළ ලාභය** | | 37,900,994,596 | 19,527,357,113 | 38,246,336,801 | 19,940,065,689 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම | 28.2 | (1,260,277,458) | 4,932,092,247 | (1,253,589,778) | 4,930,562,602 |
| හිමිකම් ගිණුම් ආයෝජකයින්ගේ වෙනත් විස්තීර්ණ ආදායම්වල කොටස් | 7 | (1,659,827) | (3,567,530) | - | - |
| ලැයිස්තුගත ආයෝජන මත සාධාරණ අගයට ගණනය කල වෙනත් විස්තීර්ණ ආදායමේ මූල්‍ය වත්කම් වල අගයේ වෙනස් වීම් | 8.1 | 33,667,341 | (18,582,623) | 33,667,341 | (18,582,623) |
| ලැයිස්තුගතනොවූ ආයෝජන මත සාධාරණ අගයට ගණනය කල වෙනත් විස්තීර්ණ ආදායමේ මූල්‍ය වත්කම් වල අගයේ වෙනස් වීම් | 8.2 | (2,947,532,198) | 4,928,242,933 | (2,947,532,198) | 4,928,242,933 |
| **වර්ෂයේ මුළු වෙනත් විස්තීර්ණ ආදායමේ එකතුව** | | (4,175,802,142) | 9,838,185,027 | **(4,167,454,634)** | **9,840,222,912** |
| **වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායමේ එකතුව** | | **33,725,192,455** | **29,365,542,140** | **34,078,882,167** | **29,780,288,600** |
| **මව් සමාගමේ ස්කන්ධ හිමියන් අතර බෙදී යා යුතු** | | **33,725,192,455** | **29,365,542,140** | **34,078,882,167** | **29,780,288,600** |

පිටු අංක 107 සිට 127 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 128 සිට 156 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා

| | යෙදවූ ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | වෙනත් සංචිත | විලම්භිත ආදායම | ණය නිදහස් කිරීමේ සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | FVOCI හි ඇති මූල්‍ය වත්කම් සංචිත | රඳවාගත් ඉපැයුම් (හර) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **සමූහය** | | | | | | | | | |
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | **7,591,379,785** | **111,886,831,306** | **1,125,903** | **168,535,618,224** | **4,613,549,887** | **74,101,416,216** | **57,575,791,084** | **119,758,773,835** | **544,064,486,239** |
| වර්ෂය තුළ ලාභය | | | | | | | | 7,602,406,852 | 7,602,406,852 |
| MPMC හි රඳවාගත් ඉපැයුම් | | | | | | | | (17,307,671) | (17,307,671) |
| MPMC සමාගමේ ගැලපුම් මත හානිකරණය | | | | | | | | (75,000,000) | (75,000,000) |
| IFRS හි පොලී ගැලපුම් - පෙර වර්ෂය | | | | | | | | 314,016,937 | 314,016,937 |
| සේවක ප්‍රතිලාභ පෙර ගෙවුම්වල ක්‍රමක්ෂය - පෙර වර්ෂය | | | | | | | | (314,016,937) | (314,016,937) |
| ශ්‍රී ලංකා ගෑස් ටර්මිනල් වෙතින් ලැබිය යුතු- ජ'නල් සටහන් | | | | | | | | 11,500 | 11,500 |
| ශ්‍රී ලංකා ගෑස් ටර්මිනල් සමාගමේ රඳවාගත් ඉපයුම් | | | | | | | | (50,646) | (50,646) |
| **ආරම්භක ශේෂය මත ගැලපුම** | **7,591,379,785** | **111,886,831,306** | **1,125,903** | **168,535,618,224** | **4,613,549,887** | **74,101,416,216** | **57,575,791,084** | **127,268,833,870** | **551,574,546,274** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | | | | | | - |
| SLPMCS හි රඳවාගත් ඉපයුම් ප්‍රතිවර්තනය | | | | | | | | | - |
| ලාභාංශ ගෙවීම (රඳවාගත් ඉපයුම් බදු මුදල) | | | | | | | | (3,750,000) | (3,750,000) |
| ගෙවූ අධිභාර බදු | | | | | | | | | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ගැලපුම - කොළඹ | | | | | | (4,598,681) | | 4,598,681 | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ගැලපුම -ත්‍රිකුණාමලය | | | | | | (45,938) | | 45,938 | - |
| ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වලට ඇතුළත් කළ ඉඩම් | | 1,519,025,500 | | | | | | | 1,519,025,500 |
| වෙනත් විස්තීර්ණ ආදායම්වල ආශ්‍රිත සමාගම්වල කොටස් | | | | | | | | (3,567,530) | (3,567,530) |
| පෙර වර්ෂයේ ගැලපුම් (සටහන 45) | | | | | | | | (4,683,815,957) | (4,683,815,957) |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම | | | | | | | | 4,932,092,247 | 4,932,092,247 |
| CICT සමාගමේ මූලික ගෙවීම - ක්‍රමක්ෂය | | | | (103,534,286) | | | | | (103,534,286) |
| ලාෆ් ටර්මිනල් සමාගම මගින් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (658,207) | | | | | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම විසින් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (10,300,000) | | | | | (10,300,000) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) මගින් එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (31,626,840) | | | | | (31,626,840) |
| HIPS සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (731,198,730) | | | | | (731,198,730) |
| HIPG සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (981,799,130) | | | | | (981,799,130) |
| CWIT සමාගම ගෙවූ මූලික ගාස්තුවේ ක්‍රමක්ෂය | | | | (115,714,286) | | | | | (115,714,286) |
| ප්‍රත්‍යාගණන සංචිත මත විලම්බිත බදු ගැලපුම | | | | | | (810,757,911) | | | (810,757,911) |
| NFCL Penna Port Storage සමාගම විසින් එකවර ගෙවූ මුළු මුදල | | | | (6,900,000) | | | | | (6,900,000) |
| ලැයිස්තුගත ආයෝජන මත ගැලපුම | | | | | | | (18,582,623) | | (18,582,623) |
| ලැයිස්තුගත නොකළ ආයෝජන මත ගැලපුම | | | | | | | 4,928,242,933 | | 4,928,242,933 |
| SACLHL සමාගමෙන් ප්‍රතිවර්තනය කරන ලද මුළු ගෙවුම් වාරිකය | | | | 4,611,880,000 | | | | | 4,611,880,000 |
| SACLHL සමාගමේ වාරික මුදලේ ක්‍රමක්ෂය | | | | (41,903,641) | | | | | (41,903,641) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **113,405,856,806** | **1,125,903** | **171,123,863,104** | **4,613,549,887** | **73,286,013,685** | **62,485,451,394** | **147,041,794,365** | **579,549,034,925** |
| වර්ෂය තුළ ලාභය | | | | | | | | 37,900,994,596 | 37,900,994,596 |
| ගෙවූ ලාභාංශ | | | | | | | | (3,750,000) | (3,750,000) |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ගැලපුම - කොළඹ | | | | | | (1,340,297,143) | | 1,340,297,143.18 | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ගැලපුම -ත්‍රිකුණාමලය | | | | | | (10,466) | | 10,466.05 | - |
| වෙනත් විස්තීර්ණ ආදායම්වල ආශ්‍රිත සමාගම්වල කොටස් | | | | | | | | (1,659,827) | (1,659,827) |
| පෙර වර්ෂයේ ගැලපුම් (සටහන 42) | | | | | | | | 1,866,099,048 | 1,866,099,048 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම | | | | | | | | (1,260,277,458) | (1,260,277,458) |
| CICT සමාගම විසින් ගෙවන ලද මූලික ගෙවීම - ක්‍රමක්ෂය | | | | (103,534,286) | | | | | (103,534,286) |
| ලාෆ් ටර්මිනල් සමාගම එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (658,207) | | | | | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (10,300,000) | | | | | (10,300,000) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (31,626,840) | | | | | (31,626,840) |
| HIPS සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (731,198,730) | | | | | (731,198,730) |
| HIPG සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (981,799,130) | | | | | (981,799,130) |
| CWIT සමාගමෙන් ලැබූ මුල් ගෙවුම් ගාස්තුව | | | | 3,053,300,000 | | | | | 3,053,300,000 |
| CWIT සමාගම ගෙවූ මූලික ගාස්තුවේ ක්‍රමක්ෂය | | | | (185,107,468) | | | | | (185,107,468) |
| ප්‍රත්‍යාගණන සංචිත මත විලම්බිත බදු ගැලපුම | | | | | | | | | - |
| NFCL Penna Port Storage සමාගම විසින් එකවර ගෙවූ මුළු මුදල | | | | (6,900,000) | | | | | (6,900,000) |
| ලැයිස්තුගත ආයෝජන මත ගැලපුම | | | | | | | 33,667,341 | | 33,667,341 |
| James Jansen දියත් යාත්‍රාව ලියා ඉවත් කිරීම -ත්‍රිකුණාමලය | | | | | | | | | - |
| ලැයිස්තුගත නොකළ ආයෝජන මත ගැලපුම | | | | | | | (2,947,532,198) | | (2,947,532,198) |
| ගෙවන ලද විශේෂ බදු | | | | | | | | | - |
| SACLHL සමාගමෙන් ලද මුළු ගෙවුම් වාරිකය | | | | - | | | | | - |
| SACLHL සමාගමේ වාරික මුදලේ ක්‍රමක්ෂය | | | | (92,237,600) | | | | | (92,237,600) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **113,405,856,806** | **1,125,903** | **172,033,800,843** | **4,613,549,887** | **71,945,706,076** | **59,571,586,537** | **186,883,508,333** | **616,046,514,169** |

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා

| ශ්‍රීලවඅ | යෙදවූ ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | වෙනත් සංචිත | විලම්භිත ආදායම | ණය නිදහස් කිරීමේ සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | FVOCI හි ඇති මූල්‍ය වත්කම් සංචිත | රඳවාගත් ඉපැයුම් (හර) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | **7,591,379,785** | **111,886,831,306** | **1,125,903** | **168,535,618,224** | **4,613,549,887** | **74,101,416,216** | **57,575,791,082** | **129,304,299,934** | **553,610,012,338** |
| වර්ෂය තුළ ලාභය | | | | | | | | 19,940,065,688 | 19,940,065,689 |
| ලංකා ගෑස් ටර්මිනල් සමාගමේ ජ්නල් සටහන් | | | | | | | | 11,500 | 11,500 |
| MPMC සමාගමේ ගැලපුම් මත හානිකරණය | | | | | | | | (75,000,000) | (75,000,000) |
| IFRS හි පොලී ගැලපුම් - පෙර වර්ෂය | | | | | | | | 314,016,937 | 336,710,548 |
| සේවක ප්‍රතිලාභ පෙර ගෙවූම්වල ක්‍රමක්ෂය - පෙර වර්ෂය | | | | | | | | (314,016,937) | (336,710,548) |
| **ගලපන ලද ආරම්භක ශේෂය** | **7,591,379,785** | **111,886,831,306** | **1,125,903** | **168,535,618,224** | **4,613,549,887** | **74,101,416,216** | **57,575,791,082** | **149,169,377,122** | **573,475,089,526** |
| NFCL Penna Port Storage සමාගමේ 2018 වසරේ ලැබූ එකවර ගෙවූ මුදල | | | | | | | | | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | | | | | | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ගැලපුම - කොළඹ | | | | | | (4,598,681) | | 4,598,681 | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ගැලපුම -ත්‍රිකුණාමලය | | | | | | (45,938) | | 45,938 | |
| ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වලට ඇතුළත් කළ ඉඩම් හා ගොඩනැගිලි | | 1,519,025,500 | | | | | | | 1,519,025,500 |
| **පෙර වර්ෂයේ ගැලපුම් (සටහන 42)** | | | | | | | | (4,680,521,263) | (4,680,521,263) |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම | | | | | | | | 4,930,562,602 | 4,930,562,602 |
| CICT සමාගම විසින් ගෙවන ලද මූලික ගෙවීම | | | | (103,534,286) | | | | | (103,534,286) |
| ලාෆ් ටර්මිනල් සමාගම එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (658,207) | | | | | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (10,300,000) | | | | | (10,300,000) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (31,626,840) | | | | | (31,626,840) |
| HIPS සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (731,198,730) | | | | | (731,198,730) |
| HIPG සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (981,799,130) | | | | | (981,799,130) |
| CWIT සමාගම විසින් ගෙවන ලද මුල් ගෙවුම් ගාස්තුවේ ක්‍රමක්ෂය | | | | (115,714,286) | | | | | (115,714,286) |
| ප්‍රත්‍යගණන සංචික මත බදු ගැලපුම | | | | | | (810,757,911) | | | (810,757,911) |
| NFCL Penna Port Storage සමාගමේ මුල් ගෙවුම් ගාස්තුවේ වාරිකය | | | | (6,900,000) | | | | | (6,900,000) |
| ලැයිස්තුත ආයෝජල න මත ගැලපුම | | | | | | | (18,582,623) | | (18,582,623) |
| ලැයිස්තුගත ආයෝජන මත ගැලපුම | | | | | | | 4,928,242,933 | | 4,928,242,933 |
| SACLHL සමාගෙමෙන් ලද මූල් ගෙවුම් ගාස්තුවේ වාරිකය | | | | 4,611,880,000 | | | | | 4,611,880,000 |
| SACLHL සමාගමේ මුල් ගෙවුම් ගාස්තුවේ ක්‍රමක්ෂය | | | | (41,903,641) | | | | | (41,903,641) |
| **2023 දෙසැම්බ් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **113,405,856,806** | **1,125,903** | **171,123,863,104** | **4,613,549,887** | **73,286,013,685** | **62,485,451,392** | **149,424,063,079** | **581,931,303,642** |
| වර්ෂය තුළ ලාභය | | | | | | | | 38,246,336,801 | 38,246,336,801 |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ගැලපුම - කොළඹ | | | | | | (1,340,297,143.18) | | 1,340,297,143 | - |
| ප්‍රත්‍යාගණන අතිරික්ත ගැලපුම -ත්‍රිකුණාමලය | | | | | | (10,466) | | 10,466 | - |
| **පෙර වර්ෂයේ ගැලපුම් (සටහන 42)** | | | | | | | | 1,866,099,048 | 1,866,099,048 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීම | | | | | | | | (1,253,589,778) | (1,253,589,778) |
| ණය නිදහස් කිරීමේ ගැලපුම | | | | | | | | | - |
| CICT සමාගම විසින් ගෙවන ලද මූලික ගෙවුම් ගාස්තුව | | | | (103,534,286) | | | | | (103,534,286) |
| ටෝකියෝ සිමෙන්ති සමාගමේ මුළු ගෙවුම් වාරික මත, ක්‍රමක්ෂය | | | | | | | | | - |
| ලාෆ් ටර්මිනල් සමාගම එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (658,207) | | | | | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටලරීස් පුද්ගලික සමාගම එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (10,300,000) | | | | | (10,300,000) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති පුද්ගලික සමාගම (ලංකා) එකවර ගෙවූ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (31,626,840) | | | | | (31,626,840) |
| ලාෆ් ගෑස් ටර්මිනල් සමාගම ගෙවූ මූලික ගෙවුම් වාරිකය (21.2) | | | | | | | | | - |
| HIPS සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (731,198,730) | | | | | (731,198,730) |
| HIPG සමාගමේ කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | | | | (981,799,130) | | | | | (981,799,130) |
| CWIT සමාගමෙන් ලැබූ මූලික ගෙවුම් ගාස්තුව | | | | 3,053,300,000 | | | | | 3,053,300,000 |
| CICT සමාගම විසින් ගෙවන ලද මූලික ගෙවීමේ ක්‍රමක්ෂය | | | | (185,107,468) | | | | | (185,107,468) |
| NFCL Penna Port Storage සමාගමේ එකවර ගෙවූ මුදලේ ක්‍රමක්ෂය | | | | | | | | | - |
| NFCL Penna Port Storage සමාගමේ මුළු මුදලේ ක්‍රමක්ෂය | | | | (6,900,000) | | | | | (6,900,000) |
| ලැයිස්තුගත ආයෝජන මත ගැලපුම | | | | | | | 33,667,341 | | 33,667,341 |
| James Jansen දියත් යාත්‍රාව ලියා ඉවත් කිරීම - ත්‍රිකුණාමලය | | | | | | | | | - |
| ලැයිස්තුගත නොවූ ආයෝජන මත ගැලපුම | | | | | | | (2,947,532,198) | | (2,947,532,198) |
| SACLHL සමාගමෙන් ලැබූ එක්වර ගෙවූ මුදලේ වාරිකය | | | | - | | | | | - |
| SACLHL සමාගමේ ලැබූ එක්වර ගෙවූ වාරිකයේ ක්‍රම ක්ෂය | | | | (92,237,600) | | | | | (92,237,600) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **113,405,856,805** | **1,125,903** | **172,033,800,843** | **4,613,549,887** | **71,945,706,074** | **59,571,586,536** | **189,623,216,758** | **618,786,222,593** |

පිටු අංක 107 සිට 127 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 128 සිට 156 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|
| | **2024** | **2023** | **2024** | **2023** |
| **2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය** | | | | |
| **බදුවලට පෙර ලාභය** | **46,493,644,005** | **40,054,853,378** | **46,734,444,152** | **40,359,243,118** |
| ***ගැලපුම්*** | | | | |
| ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස | 572,864,870 | 640,691,175 | | |
| ක්ෂය | 3,864,493,135 | 5,200,745,181 | 3,846,733,666 | 5,185,345,212 |
| බොල්ණය හා අඩමාණ ණය | (77,844,468) | (284,170,248) | (77,852,705) | (284,170,248) |
| අස්පෘශ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය | 191,281,139 | 107,172,731 | 191,095,182 | 101,664,291 |
| කල්බදු වත්කම් ක්‍රමක්ෂය | 11,332,228 | 11,332,228 | 11,332,228 | 11,332,228 |
| වසරේ පාරිතෝෂික ගාස්තු හා අදාළ පිරිවැය | 1,716,508,136 | 2,579,382,371 | 1,711,622,526 | 2,575,006,789 |
| පෙර වර්ෂයේ ආදායම | 2,187,928,247 | (544,967,436) | 2,187,928,247 | (541,672,803) |
| පෙර වර්ෂයේ වියදම | 37,604,632 | (1,751,144,112) | 41,354,632 | 177,645,002 |
| ලාභාංශ ආදායම | (3,481,619,690) | (2,037,252,929) | (3,502,869,690) | (2,058,502,929) |
| පොලී ආදායම | (5,390,538,913) | (12,020,709,194) | (5,309,683,550) | (11,898,462,684) |
| පොලී වියදම | 3,552,160,034 | 4,229,081,793 | 3,546,207,792 | 4,217,894,046 |
| රාජ්‍ය ප්‍රදාන වල ක්‍රමක්ෂය | (461,337,352) | (443,653,710) | (461,337,352) | (443,653,710) |
| උපලබ්ධි නොවූ ශුද්ධ විනිමය ලාභ /පාඩු | (6,800,000,994) | (10,257,631,848) | (6,800,000,994) | (10,257,631,848) |
| CICT සමාගමේ පෙර ගෙවුම් ගාස්තු | (103,534,286) | (103,534,286) | (103,534,286) | (103,534,286) |
| හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදන | 71,186,436 | (1,070,000,428) | 71,186,436 | (1,070,000,428) |
| ලාෆ් ටර්මිනල් පුද්ගලික සමාගමේ වර්ෂය තුළ ක්‍රමක්ෂය | (658,207) | (658,207) | (658,207) | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරිස් පුද්ගලික සමාගමේ වර්ෂය තුළ ක්‍රමක්ෂය | (10,300,000) | (10,300,000) | (10,300,000) | (10,300,000) |
| HIPG/HPS සමාගම් වල කල්බදු අයිතීන් ක්‍රමක්ෂය | (1,712,997,860) | (1,712,997,860) | (1,712,997,860) | (1,712,997,860) |
| NFCL Penna Port Storage සමාගම එකවර ගෙවූ මුළු මුදල | (6,900,000) | (6,900,000) | (6,900,000) | (6,900,000) |
| හානිකරණ මත වියදම් | - | - | 100 | - |
| ටෝකියෝ සිමෙන්ති (ලංකා) සමාගමේ වසර තුළ ක්‍රමක්ෂය | (31,626,840) | (31,626,840) | (31,626,840) | (31,626,840) |
| CWIT වර්ෂය තුළ ක්‍රමක්ෂය | (185,107,468) | (115,714,286) | (185,107,468) | (115,714,286) |
| SALCHL සමාගමේ මුළු මුදලේ වාරිකය | (92,237,600) | (41,903,641) | (92,237,600) | (41,903,641) |
| ස්ථාවර වත්කම් බැහර කිරීමේන් ලැබූ ආදායම | (184,534,330) | (10,546,495) | (184,534,330) | (10,546,495) |
| **කාරක ප්‍රාග්ධන විචල්‍යතාවයට පෙර මෙහෙයුම් ලාභය** | **40,159,764,854** | **22,379,547,336** | **39,862,264,078** | **24,039,854,421** |
| | | | | |
| **කාරක ප්‍රාග්ධන විචල්‍යතාවයන්** | | | | |
| වට්ටෝරුගත භාණ්ඩ | (557,515,917) | (861,674,634) | (546,850,407) | (855,339,550) |
| වෙළඳ ලැබීම් | (7,932,468,315) | 3,938,614,148 | (7,932,460,078) | 3,938,614,148 |
| තැන්පතු හා අත්තිකාරම් | 3,693,315,242 | (1,215,610,458) | 3,693,315,242 | (1,199,078,370) |
| පෙර ගෙවුම් වියදම් | 30,068,151 | 82,202,756 | 30,068,151 | 82,202,756 |
| සේවක ණය / වෙනත් | (974,066,460) | (377,881,594) | (977,613,137) | (377,881,594) |
| භාණ්ඩ හා සේවා සැපයුම් හා වෙනත් ණයකරුවන් | (742,226,345) | 381,294,761 | (730,111,853) | 366,834,847 |
| ලැබූ තැන්පතු හා අතිතිකාරම් | 2,526,463,101 | 4,335,154,816 | 2,526,463,101 | 4,335,154,816 |
| ප්‍රතිපාදන හා උපචිත වියදම් | 1,214,593,886 | (2,872,917,000) | 1,214,593,886 | (2,872,917,000) |
| **මෙහෙයුම් මගින් උත්පාදිත මුදල්** | **37,417,928,196** | **25,788,730,131** | **37,139,668,983** | **27,457,444,474** |
| | | | | |
| ගෙවන ලද පොලී | (3,907,617,685) | (4,038,092,994) | (3,901,665,443) | (4,026,905,247) |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | (607,310,383) | (2,910,329,993) | (607,310,383) | (2,910,329,993) |
| ගෙවන ලද පාරිතෝෂික | (1,066,963,071) | (1,001,554,988) | (1,066,472,996) | (999,512,757) |
| ගෙවන ලද බදු | (14,099,454,751) | (7,406,920,607) | (13,971,291,728) | (7,294,918,768) |
| **මෙහෙයුම් කාර්ය මගින් ලැබූ ශුද්ධ මුදල්** | **17,736,582,306** | **10,431,831,549** | **17,592,928,433** | **12,225,777,709** |
| | | | | |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | | |
| දේපළ, පිරියත උපකරණ පවරා ගැනීම | (448,277,148) | (2,561,990,556) | (410,383,316) | (2,536,179,154) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම | 186,092,322 | 15,672,223 | 186,092,322 | 15,672,223 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | (39,515,859,921) | (25,249,322,968) | (39,515,859,921) | (25,249,322,968) |
| අස්පෘෂ්‍ය වත්කම් පවරා ගැනීම | (40,999,879) | (559,823,636) | (40,674,879) | (559,295,936) |
| ආයෝජන වත්කම් පවරා ගැනීම | - | (5,204,585) | - | (5,204,585) |
| ලැබූ ලාභාංශ | 3,481,619,690 | 2,037,252,929 | 3,502,869,690 | 2,058,502,929 |
| ලැබූ පොළිය | 4,568,028,742 | 10,424,961,571 | 4,487,173,379 | 10,302,715,061 |
| SACLHL ආයතනයෙන් ලැබූ එකවර ගෙවූ වාරික | - | 4,611,880,000 | - | 4,611,880,000 |
| ලැබූ ප්‍රදාන | 212,829,868 | 3,260,231,211 | 212,829,868 | 3,260,231,211 |
| CWIT සමාගමෙන් ලැබූ පෙර ගෙවුම් ගාස්තු | 3,053,300,000 | - | 3,053,300,000 | - |
| SACLHL සමාගම වර්ෂය තුළ කළ ආයෝජන | - | (1,762,634,046) | - | (1,762,634,046) |
| CWIT සමාගම වර්ෂය තුළ කළ ආයෝජන | (3,002,656,500) | (2,711,233,748) | (3,002,656,500) | (2,711,233,748) |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලැබිය යුතු මුදල | 7,587,030 | 10,053,194 | 7,587,030 | 10,053,194 |
| වෙනත් මූල්‍ය වත්කම් මගින් ලැබූ ශුද්ධ ආදායම | 38,239,114,285 | 25,977,417,404 | 38,837,073,498 | 25,579,288,732 |
| **ආයෝජන වලින් ලැබූ (භාවිතා කල) ශුද්ධ මුදල්** | **6,740,778,488** | **13,487,258,992** | **7,317,351,171** | **13,014,472,914** |
| | | | | |
| **මුදල් යෙදවුම් මගින් ලැබූ මුදල් ප්‍රවාහයන්** | | | | |
| ලබාගත් ණය ශ්‍රී ලංකා රජයට ආපසු ගෙවීම | (5,820,931,324) | (6,970,833,269) | (5,820,931,324) | (6,970,833,269) |
| ලබාගත් ණය මූල්‍ය ආයතන වෙත ආපසු ගෙවීම | (85,198,610) | (2,967,011,803) | - | (2,955,710,113) |
| ගෙවූ කල්බදු වාරික | (13,685,710) | (14,654,776) | (10,455,933) | (9,635,860) |
| **මූල්‍ය කටයුතු වලින් ලැබූ (භාවිතා කල) ශුද්ධ මුදල්** | **(5,919,815,644)** | **(9,952,499,848)** | **(5,831,387,257)** | **(9,936,179,242)** |
| | | | | |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ විචල්‍යතා** | **18,557,545,150** | **13,966,590,693** | **19,078,892,347** | **15,304,071,381** |
| | | | | |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ | **24,763,454,332** | **10,796,863,639** | **24,021,067,891** | **8,716,996,509** |
| | | | | |
| **වසර අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ (සටහන 17)** | **43,320,999,482** | **24,763,454,332** | **43,099,960,237** | **24,021,067,891** |

පිටු අංක 107 සිට 127 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 128 සිට 156 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

# පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1 සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු කරුණු

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 1979 අංක 51 දරණ පනත මගින් 1979 අගෝස්තු 01 වැනි දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවනු ලැබූ අතර, ඉන්පසුව මෙම පනත 1984 අංක 07 හා අංක 35 දරණ පනත් මගින් සංශෝධනය කරන ලදී.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

නැව් භාණ්ඩ වාහක, නැව්ගත කිරීම් හා ප්‍රතිනැව්ගත කිරීම්, නැව් භාණ්ඩ ගොඩබෑම හා ගුදම්ගත කිරීම සහ වාප්පු සේවා කටයුතු කාර්යක්‍ෂමව හා අඛණ්ඩව සැපයීම හා නෞකාවලට ජලය, ඉන්ධන හා විදුලිය සැපයීම, ඛනිජතෙල් නිෂ්පාදන හා ලිහිසි තෙල් නෞකා වලට නෞකා වලින් හා ඉන්ධන ගබඩා හා ඩිපෝ අතර මෙහෙයුම් කිරීම හා නියමු කටයුතු හා මූවරිං කටයුතු සඳහා යාත්‍රා බන්කර් සහ ඩිපෝ අතර ගෙනයාම, දිය යට නෞකා අළුත්වැඩියා කිරීම හා ඒ සේවා වලට අනුශාංගික වූ වෙනත් සේවා සඳහා ජලය, ඉන්ධන හා විදුලිය සැපයීම ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් කටයුතු වලට ඇතුළත් වේ.

### 1.3 මුදල් වර්ෂය

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ කාලසීමාව දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වේ.

### 1.4 ලියාපදිංචි කාර්යාලය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය අංක 19, චෛත්‍ය පාර, තැ.පෙ.595, කොළඹ 01 යන ස්ථානයෙහි පිහිටා ඇත.

### 1.5 සේවක සංඛ්‍යාව

2024 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවක සංඛ්‍යාව 7,624 ක් විය. (2023- 8,050)

### 1.6 නිකුත් කිරීම සඳහා අවසරය ලැබූ දිනය

2025.02.20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඉදිරිපත් කල යෝජනාවකට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර ලබා දෙන ලදී.

## 2 විශේෂ ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.1.1 පිළියෙල කිරීමේ පදනම

සමූහයෙහි, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ අධිකාරියෙහි තනි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRSs/LKASs) වලට අනුකූලව වේ. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට හා ඓතිහාසික පිරිවැයට පිළියෙල කරන අතර, සාධාරණ අගය වෙනත් විස්තීර්ණ ආදායම තුළ ගැලපිම යටතේ වර්ගීකරණය කර, ඇති මූල්‍ය උපකරණ මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයට වන අතර, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, පිළියෙල කිරීම සිදු වේ. එහිදී, ගිණුම්කරණ ඇස්තමේන්තු යොදා ගැනීමට ද සිදු වේ. ගිණුම්කරණ ඇස්තමේන්තු යොදා ගැනීමේදී, කළමනාකරණ විනිශ්චයන් භාවිත කරන අතර, එය සමූහයේ ගිණුම්කරණ ප්‍රමිතීන් තුළද, ඇතුළත් කරනු ලැබේ.

### 2.1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට ශ්‍රී ලංකා වරාය අධිකාරිය (සමාගම) සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ද ඒකාබද්ධ කර ඇත.

### 2.1.3 මූල්‍ය ප්‍රකාශන වල සංරචක

මූල්‍ය ප්‍රකාශන සඳහා පහත සංරචක ඇතුළත් වේ.

- වසර අවසානයේදී, සමූහයේ හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ලබා දෙනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

- සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳව තොරතුරු ලබා දෙනු ලබන සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනය.

- සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොටස් හිමිකරුවන්ගේ අරමුදල්වල සිදු වන සියළු වෙනස් වීම් පෙන්නුම් කරනු ලබන ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය.

- සමූහය හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබෙන මුදල් හා ආයතනයෙන් පිටතට ගෙවනු ලබන මුදල් සහ මුදල් හා සමාන දෑ පිළිබඳ තොරතුරු භාවිතා කරන්නන්හට ලබා දෙනු ලබන මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් විස්තරාත්මක තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.

## 2.2 අඛණ්ඩ පැවැත්ම

**2.2.1** අධිකාරිය විසින් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ, අඛණ්ඩ පැවැත්මක් පවතී යන්න පදනම් කරගෙන වේ. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම තීරණය කිරීමේදී, වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් හා සමූහයේ සමාගම් මත ඇති වනු ලබන බලපෑම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය කළමනාකාරීත්වය මගින් තක්සේරු කර ඇත. කළමනාකාරීත්වයේ අදහසට අනුව අඛණ්ඩව පවත්වා ගෙන යැමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඇති හැකියාව පිළිබඳ දැඩි සැකයක් පළ කළ හැකි කිසිදු භෞතික අවිනිශ්තතාවයක් නොමැත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිචාරාත්මක සැලසුම් හා ව්‍යාපාර පැවැත්ම අධීක්‍ෂණය කිරීම සහ අවදානම් අවම කිරීමේ අඛණ්ඩ ක්‍රියාමාර්ග හරහා නුදුරු අනාගතයේදී මෙහෙයුම් තත්ත්වයේ පවත්වා ගෙන යැම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් පවතින බවට කළමනාකාරීත්වය තීරණය කර ඇත.

ඉහත කරුණු තීරණය කිරීමේදී, විදේශ විනිමය අස්ථාවරතාවයන්, සැපයුම් දාම බිඳ වැටීම්, විදේශ විනිමය වෙළෙඳපොල සීමාවන් සහ විචල්‍ය පොළී අනුපාත ඇතුළුව වැදගත් කළමනාකරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන, සාර්ව ආර්ථික අවිනිශ්චිතතාවයන්ගේ බලපෑම් ආදිය වාර්තාකරණ දිනයට සලකා බලා ඇති අතර විශේෂ කරුණු සටහන් යටතේ දක්වා ඇත. “අඛණ්ඩ පැවැත්මේ සංකල්පය” ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

### 2.2.2 වැදගත්කම හා සමාහරණය

සමාන අයිතමයන්ගෙන් යුත් ද්‍රව්‍ය කාණ්ඩ මූල්‍ය ප්‍රකාශන තුළ වෙන්ව පෙන්නුම් කරනු ලැබේ. වැදගත් නොවේ නම් හැර, ස්වභාවයෙන් හෝ ක්‍රියාවෙන් එකිනෙකට වෙනස් අයිතම වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

### 2.2.3 තුලනාත්මක තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අවසර ලබා දෙන්නේ නම හෝ ඉල්ලා සිටින්නේ නම් හෝ හැර, වත්මන් කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියළු මුදල් ප්‍රමාණ සඳහා පෙර වර්ෂයේ තුලනාත්මක තොරතුරු ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලබා දෙන ලැබේ.

## 2.3 ඒකාබද්ධකරණය

### 2.3.1 පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගමක් යනු අයිතියෙන් භාගයකට වඩා කොටස්කාරීත්වය සමඟ මූල්‍යමය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීම සඳහා සමූහයකට බලය ඇති ඒකකයකි. පරිපාලිත සමාගමක පාලනය සමූහයට පවරණ දින සිට පරිපාලිත සමාගම පූර්ණ ලෙස ඒකාබද්ධ කරන ලද සමාගමක් ලෙස සැලකේ. පාලනය අවසන් වන දින සිට එහි ඒකාබද්ධතාවය අවසන් වේ.

ව්‍යාපාර සංයෝජන ගිණුම්ගත කිරීම සඳහා, සමූහය විසින් අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය අනුගමනය කරයි. පරිපාලිත සමාගම සමන්විත වනුයේ පවරනු ලබන වත්කම්වල සාධාරණ අගය හා පරිපාලිත සමාගම විසින් දරනු ලබන වගකීම් වලිනි. පරිපාලිත සමාගම සම්පූර්ණයෙන්ම අධිකාරියට අයිති වන බැවින් පරිපාලිත සමාගෙමේ පාලනයට යටත් නොවන කටයුතු, සමූහය විසින් පිළිගනු නොලැබේ.

අන්තර් ස්ථිතික ගනුදෙනු, ශේෂ, සමූහයේ ස්ථිති අතර සිදුවන ගණුදෙනු මත ආදායම් හා වියදම් අත්හැර දමනු ලැබේ. තවද වත්කම් වලදී හඳුනාගනු ලබන අන්තර් ස්ථිතික ගනුදෙනු වලදී ඇතිවන ලාභ සහ පාඩු ද අත්හැර දමනු ලැබේ. පරිපාලිත සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනුකූල වන පරිදි සකස් කර ඇත.

### 2.3.2 ආශ්‍රිත සමාගම්

ආශ්‍රිත සමාගමක් යනු සමූහය තුළ විශේෂ බලයක් ඇති, එහෙත් පාලන බලය නොමැති සාමාන්‍යයෙන් 20% ක ඍජු හෝ වක්‍ර ඡන්ද අයිතිය ඇති කොටස් හිමිකාරීත්වයක් සහිත ස්ථිතිකයකි. ආශ්‍රිත සමාගමක යොදවන ආයෝජනයක් සමූහය තුළ ගිණුම්ගත කරනුයේ ස්කන්ධ ගිණුම් ක්‍රමය භාවිතා කිරීමෙනි. අධිකාරියෙහි ගිණුම් තුළ ආශ්‍රිත සමාගමෙහි ආයෝජනය පිරිවැයට ක්‍රමයට ගිණුම්ගත කරනු ලැබේ. ස්කන්ධ ක්‍රමය යටතේ, ආයෝජනය මූලිකව පිරිවැය ක්‍රමයට හඳුනාගන්නා අතර, ආශ්‍රිත සමාගමේ ලාභ පාඩු වලට අදාළව අධිකාරිය විසින් ආයෝජිත කොටසට අදාළ වන ලාභ පාඩු ප්‍රමාණය ගලපා, ආශ්‍රිත සමාගමේ ආයෝජනයේ වටිනාකම, සමූහයේ ගිණුම් තුළ ගලපනු ලැබේ.

පසු පැවරුම් මගින් සමූහයේ ලාභයේ හෝ පාඩුවේ කොටස විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගන්නා අතර ආදායමෙහි පසු පැවරුම් කොටස්හි යෙදවුම් ආයෝජනයේ ධාරණ අගයට කරන අනුරූපී ගැලපුම් සහිතව වෙනත් විස්තීර්ණ ආදායම් මගින් හඳුනාගනු ලැබේ.

ආශ්‍රිත සමාගමේ ආයෝජනය හානිකරණය වී ඇත්ද යන බව සනාථ වන විෂයානුබද්ධ සාක්ෂි තිබේ ද යන්න, සමූහය විසින් සෑම වාර්තා කරන දිනයකදීම නිශ්චය කරනු ලබයි. එසේ වී ඇත්නම් හානිකරණ අගය ආශ්‍රිත සමාගමෙන් ලැබිය යුතු මුදලේ සහ එහි ධාරණ අගය අතර පවතින වෙනස ලෙස සමූහය විසින් ගණනය කරන අතර, එම මුදල් ආශ්‍රිත සමාගමෙහි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආසන්න ලාභ/(පාඩු) කොටස වශයෙන් හඳුනාගනු ලැබේ

## 2.4 විදේශ මුදල් පරිවර්තනය

### 2.4.1 ව්‍යවහාරික මුදල් හා ඉදිරිපත් කරන මුදල්

සමූහයේ එක් එක් ඒකක වල මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් වන ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ එම ඒකකය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාරයේ පවතින මුදල් වර්ගය භාවිතා කරමිනි. ඒකාබද්ධ මුදල් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ සමූහය ඉදිරිපත් කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

### 2.4.2 ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් මගින් කෙරෙන ගනුදෙනු, ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කරනු ලබන්නේ ගණුදෙනු සිදු කරන දිනයන්හි පවත්නා විනිමය අනුපාතය භාවිතා කරමිනි. මෙවැනි ගණුදෙනු පියවීමේ ප්‍රතිඵලයක් ලෙස හා විදේශ මුදල් මගින් දක්වන වර්ෂාවසාන මූල්‍ය විදේශ විනිමය ලාභ සහ පාඩු, විදේශ මුදල් ඒකක වත්කම් සහ වගකීම් වලින් විනිමය අනුපාත පරිවර්තනය සවිස්තරාත්මකව ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් (වසර අවසානයේ අවසන් වැඩ කරන දිනයේදී) පල කරනු ලබා තත්‍ය විනිමය අනුපාතය භාවිතා කරමින් ණය හැර (මහා භාණ්ඩාගාරයේ ණය ශේෂ හා ගැළපෙන අයුරින් වසර අවසානයේදී පවතින විකුණුම් විනිමය අනුපාතය භාවිතා කරමින් ණය ගැනුම් පරිවර්තනය කර ඇත) විදේශ විනිමය මූල්‍ය අයිතමනයන් (වත්කම් හා වගකීම) පරිවර්තනය කර ඇත.

මූල්‍ය අයිතමයන් පරිවර්තනය කිරීමෙන් හිමිවන විදේශ විනිමය ලැබීම් හා පාඩු සවිස්තරාත්මක ආදායම් වාර්තාවේ හඳුනාගෙන ඇත.

ක්‍රමක්ෂ පිරිවැය විචල්‍යතාවයට අදාළ පරිවර්තන වෙනස්කම් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගනු ලැබේ.

## 2.5 දේපල, පිරියත සහ උපකරණ

**2.5.1** අදාළ දෙපාර්තමේන්තු විසින් වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කිරීමෙන් පසු නොනිමි වැඩ ගිණුම් වල පවතින පිරිවැය ප්‍රාග්ධනීත කරනු ලැබේ.

**2.5.2** දේපළ, පිරියත හා උපකරණ මූලිකව හඳුනාගනු ලබන්නේ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය/ සමූහය වෙතට යළි ගලා එන බවට අපේක්ෂාවෙන් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි නම් පමණි. වියදම්වල ඇතුළත් පිරිවැය, වත්කම් අවශ්‍ය පරිදි අදාළ ස්ථාන වෙත අවශ්‍ය තත්ත්වයන් මත ගෙන ඒම සමූහයේ කළමනාකාරීත්වය විසින් එම වත්කම් පරිහරණය කරනු ලැබීමට ඇති හැකියාව හා ආකාරය මත ඍජුව ආරෝපනය වේ.

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසුවය. වෙනත් දේපළ, පිරියත හා උපකරණ

තක්සේරු කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසුවය.

පසුකාලීන පිරිවැය වත්කම්හි ධාරණ අගයෙහි ඇතුළත් කිරීම හෝ වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම වත්කම හා බැඳුනු ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ලැබී වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කිරීමට හැකියාව ඇතිවීමෙන් පසුව පමණි. අනෙකුත් සියළු අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඒවා වැය කරන මූල්‍ය වර්ෂය තුළ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

### 2.5.3 ක්ෂය වීම

අයිතමයේ මුළු පිරිවැයට අදාළව වැදගත් පිරිවැය සමඟ දේපළ, පිරියත හා උපකරණවල එක් එක් අයිතමය වෙන් වෙන් වශයෙන් ක්ෂය කරනු ලැබේ.

ඉඩම්වල අගය ක්ෂය නොකෙරේ. වෙනත් වත්කම් ක්ෂය වීම ගණනය කරනු ලබන්නේ සරල ඛේය ක්‍රමය මගින් වන අතර එමඟින් වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය වත ඒවායේ පිරිවැය හෝ පැවති පිරිවැය වෙන් කරනු ලැබේ.

| **වත්කම් කාණ්ඩය** | | **ප්‍රතිශතය** |
|---|---|---|
| මෙහෙයුම් ගොඩනැඟිලි හා ව්‍යුහ | වසර 5 – 115 දක්වා | 0.87% - 20% |
| පාවෙන උපකරණ | වසර 2 – 22 දක්වා | 4.5% - 50% |
| මෙහෙයුම් උපකරණ | වසර 2 - 23 දක්වා | 4.35% - 50% |
| යන්ත්‍ර හා උපකරණ | වසර 1 – 25 දක්වා | 4% - 100% |
| කාර්යාල හා සුහසාධක ගොඩනැඟිලි | වසර 2 – 73 දක්වා | 1.37% - 50% |
| පරිගණක දෘඩාංග | වසර 1 – 15 දක්වා | 6.67% - 100% |
| මෝටර් රථ | වසර 1 – 15 දක්වා | 6.67% - 100% |
| විදුලි හා විද්‍යුත් උපකරණ | වසර 1 – 12 දක්වා | 8.33% - 100% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | වසර 1 – 15 දක්වා | 6.67% - 100% |
| සේවක නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | වසර 13 – 43 දක්වා | 2.33% - 7.69% |
| වෙනත් වත්කම් | වසර 1 – 20 දක්වා | 5% - 100% |

වත්කමක ධාරණ අගය, එහි ප්‍රතිලාභය ඇස්තමේන්තුගත අගයට වඩා වැඩි නම් එම වත්කමේ ධාරණ අගය එහි ඇස්තමේන්තුගත ප්‍රතිලාභ්‍ය අගයට ලියා තබනු ලැබේ..

**හඳුනානොගැනීම**

දේපළ, පිරියත හා උපකරණ අයිතමයන්ගේ ධාරණ අගය වත්කම් බැහැර කිරීමේදී හෝ එම වත්කම් භාවිතා කිරීමේදී හෝ කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා නොකරෙන්නේ නම් හඳුනානොනැගේ. අයිතමයන් හඳුනා නොගන්නා අවස්ථාවේදී වෙළුම (පැණ නගිනු ලබන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ පාඩුවල ඇතුළත් කරනු ලැබේ. ලැබීම් ආදායම ලෙස වර්ගීකරණය නොකෙරේ.

දේපළ, පිරියත හා උපකරණ හඳුනා නොගැනීම තුළින් පැන නගිනු ලබන ලැබීම් හෝ පාඩු බැහැර කිරීමෙන් ලැබෙන ශුද්ධ ආදායමක් තිබේ නම් හෝ අයිතමයක් ධාරණ අගය අතර වෙනස බවට තීරණය කෙරේ.

### 2.5.4 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට අදාළ අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ යළි ආයතනය වෙතට ගලා ඒනම් පමණක් හෝ වත්කමේ පිරිවැය විශ්වාසනීය ආකාරයට ගණනය කළ හැකි නම් පමණක් අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට ගණනය කරනු ලබන අතර සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරනු ලැබේ.

ලබාගෙන ඇති පරිගණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති ප්‍රාග්ධනිත කරනු ලබන්නේ ඒවා සපයා ගැනීමට වැය කල පිරිවැය හා අදාළ මෘදුකාංග හා පද්ධති භාවිතා කිරීමට පදනම් වූ හේතුව පදනම් කරගෙනය. පසුකාලීනව ලබා ගන්නා අස්පෘශ්‍ය වත්කම් සටහන් කරනු ලබන්නේ ඒවාහි සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩුකිරීමෙන් පසුව සහ පිරිවැයටය. එම වත්කම් වල ඇස්තමේන්තුගත ජීව කාලය ඉක්මවා පහත දැක්වෙන පරිදි ක්‍රමක්ෂය කෙරේ.

| | | |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | වසර 1 – 17 දක්වා | 5.88% - 100% |

පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම හා සම්බන්ධ පිරිවැය, යෙදවූ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

### 2.5.5 ආයෝජන දේපළ

ආයෝජන දේපළ හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත යළි ගලා එන්නේ නම් පමණක් නම් හෝ ආයෝජන දේපළවල පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි නම් පමණක් ආයතනයට අයත් ආයෝජන වත්කම් පිළිගනු ලැබේ. කුලියට ලබා දෙන ලද ආයෝජන දේපළ පිරිවැයට ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, 2011 දෙසැම්බර් 31 දිනට පෙර පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ප්‍රත්‍යාගණනය කරන ලද අගයට ආයෝජන දේපළ පවත්වාගෙන යන ලදී. ආයෝජන දේපලවල විකුණුම් අගය සාධාරණ අගයට පුළුල්ව සැසඳුන බැවින්, ආයෝජන දේපල වල ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම ප්‍රත්‍යාගණනය කල දිනට උපකල්පිත පිරිවැයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව ආයෝජන දේපල සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු සමුච්චිත හානිකරණ තුළින් පැන නගින අදේශිත පිරිවැයක් වශයෙනි. ඉන් අනතුරුව අනෙකුත් ආයෝජන දේපළ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩුකළ පිරිවැයක් ලෙස ඇතුළත් කර ඇත.

ඉඩම්වල ක්ෂය ගණනය කරනු නොලැබේ. ගොඩනැගිලි වල ක්ෂය අස්තමේන්තුගත පිරිවැයට හෝ උපකල්පිත පිරිවැයට ප්‍රතිපාදන සැලසීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරනමින් පහත දැක්වෙන ආකාරයෙන් ගණනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ආයෝජන දේපළ | වසර 05 - 100 | 1% - 20% |

### 2.5.6 වත්කම් සමාලෝචනය කිරීමේ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි අංක 51 දරණ ඡේදයට අනුව (දේපළ, පිරියත හා උපකරණ) "වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී හෝ සමාලෝචනය කළ යුතු වේ" ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ වටිනාකම සමාලෝචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්වල

ප්‍රයෝජනවත් ආයු කාලය නැවත සමාලෝචනය කරන අතර, සමාලෝචනය කරන ලද ආයුකාලය පදනම් කරගෙන වත්කම මිලදී ගත් දින සිට ආයතනය මගින් ක්‍ෂය වීම් ගණනය කළේ නම්, මූල්‍ය වර්ෂය අවසාන දිනට පැවතිය යුතු වත්කමේ මුළු සමුච්චිත ක්‍ෂය සහ දැනට පවතින මුළු සමුච්චිත ක්‍ෂය අතර වෙනස ස්කන්ධය වෙනස් වීම යටතේ ගලපනු ලබයි.

### 2.5.7 කල්බදු වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (කල්බදු) ප්‍රකාරව, කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී, කොන්ත්‍රාත්තුව කල්බදු වත්කමක් ද එසේ නොමැතිනම් එයට කල්බදු වත්කමක් ඇතුළත් වන්නේද යන්න පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තක්සේරුවක් කරනු ලැබේ. ගිවිසුමෙහි කිසියම් කාලසීමාවක් සඳහා හඳුනාගත් වත්කමක් පාලනය කිරීමේ අයිතියක් දැක්වෙන්නේනම් එය කල්බදු වත්කමක් ලෙස සලකනු ලැබේ. කොන්ත්‍රාත්තුවෙහි නියමයන් හා කොන්දේසි වෙනස් වේ නම් පමණක් කොන්ත්‍රාත්තුව කල්බදු වත්කමක්ද, එසේ නොමැතිනම් එහි කල්බදු වත්කමක් ඇතුළත් වේද යන බව හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එය ප්‍රති තක්සේරු කරනු ලැබේ.

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ බදු ගැණුම්කරු ලෙස සමූහය**

කල්බදු ගිවිසුමක් ආරම්භයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එම වත්කමෙහි භාවිත අයිතියක් හා කල්බදු වගකීමක් පවතීද යන්න හඳුනාගනු ලබයි. භාවිත අයිතිය ඇති වත්කම මූලිකව එහි මූලික වගකීම් තක්සේරුව, ලබාගත් බදු දීමනාව හැර ආරම්භක දිනයේදී හෝ ඊට ප්‍රථම කල ගෙවීම්, බදු ගැනුම්කරු විසින් වැය කරන ලද ඍජු වියදම් හා පිරිවැය, වට්ටෝරු භාණ්ඩ ලේඛන නිපැයීමට නොගන්නේනම් වත්කම දේපළ විභේදනය කර ඉවත් කිරීම සඳහා වැය කිරීමට ඇස්තමේන්තු කල මුදල ඇතුළත් පිරිවැයට ගණනය කරනු ලැබේ.

ආරම්භක දිනයේදී බදු ගැනුම්කරුවකු බදු වගකීම එදිනට නොගෙවන කල්බදු ගෙවීම් වත්මන් වටිනාකමට තක්සේරු කල යුතුය. තක්සේරු අනුපාතය කෂණිකව තීරණය කල හැකි නම්, කල්බදුයේ සඳහන් පොලී අනුපාතය භාවිතා කරමින් කල්බදු ගෙවීම් වට්ටම් කල යුතුය. අනුපාතය ක්ෂණිකව තීරණය කල නොහැකි නම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි ණය ගැණුම් වර්ධක අනුපාතය භාවිතා කරයි.

**වත්කම් භාවිත අයිතිය හා එහි කල්බදු වගකීම පිළිබඳ පසු තක්සේරුව**

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 ට අනුව, වත්කම් පිරිවැය අඩු කිරීමෙන් පසු සමුච්චිත තක්සේරු පිරිවැය ආකෘතිය අදාළ කරගනිමින් වත්කම් භාවිත අයිතිය තක්සේරු කිරීමද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ට අනුව දේපළ, පිරියත හා උපකරණ හා ඒවාහි සමුච්චිත හානිකරණ ආලභ තක්සේරු කිරීම හා කල්බදු වගකීම් වල ප්‍රති තක්සේරු කිරීම සඳහා අවශ්‍ය ගැලපුම් ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉන් පසුව, ගිණුම් වල විශේෂයෙන් සඳහන් කර ඇති ප්‍රතිගණනය කිරීමක් හෝ බදු විකරණයක් කර ඇත්නම් ඒවා ප්‍රතිවර්තනය කිරීමට හෝ ප්‍රතිශෝධිත ස්ථාවර කල්බදු කුලිය ගෙවීම් ප්‍රතිවර්තනය කිරීමට බදු වගකීම් මත ලැබෙන පොලිය ප්‍රතිවර්තනය කිරීමට බදු වගකීම් මත ලැබෙන පොලිය ප්‍රතිවර්තනය කිරීම සඳහා ධාරණ අගය වැඩි කිරීම මගින් සහ ගෙවන ලද කල්බදු ගෙවීම් ප්‍රතිවර්තනය කිරීම සඳහා ධාරණ අගය අඩු කරමින් කල්බදු වගකීම් තක්සේරු කරනු ලැබේ.

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය බදු දීමනාකරු ලෙස**

කල්බදු ගිවිසුම මෙහෙයුම් කල්බදුකරයක් ලෙස වර්ගීකරණය නොකරන්නේ නම් එමෙන්ම උපකල්පිත වත්කමක අවදානම් හා ප්‍රතිලාභ හිමිකාරීත්වයට පැවරේනම් කොන්ත්‍රාත්තුව ආරම්භයේදී උපකල්පිත අගය මූල්‍ය කල්බදුකරයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වර්ගීකරණය කරයි. එවැනි වර්ගීකරණයක් රඳා පවතිනුයේ කාර්යයේ ද්‍රව්‍යය මත මිස කොන්ත්‍රාත්තුවේ ස්වභාවය මත නොවේ. බදු විකරණයක් ඇත්නම් පමණක් බදු වර්ගීකරණය පසුව ප්‍රතිගණනය කරනු ලැබේ.

**මූල්‍ය කල්බදු**

ආරම්භක දිනයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය කල්බදු යටතේ පවත්වාගෙන යන වත්කම් හඳුනාගෙන ඒවා කල්බදුකරයේ ශුද්ධ අයෝජනයට සමාන ලැබිය යුතු මුදලක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ. කල්බදුයේ අන්තර්ගත අනුපාතිකය කල්බදුයේ ශුද්ධ ආයෝජනය තක්සේරු කිරීමට භාවිතා කරනු ලැබේ.

ඉන් අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කල්බදුකරයේ පවතින ශුද්ධ ආයෝජන මත ලැබෙන නිත්‍ය කාලානුරූපී ආදායම් අනුපාතිකයක් ප්‍රතිවර්තනය වන රටාවක් පදනම් කරගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය කල්බදු කාලපරිච්ඡේදය මත ලැබෙන මූල්‍ය ආදායම හඳුනාගනී.

කල්බදුකරයේ කාලීන මූල්‍ය අදායම ක්‍රමවත් හා ප්‍රමාණුකූල පදනමක් මත වෙන්කර, ආයෝජිත මුල් මුදල හා නොඉපැයූ මූල්‍ය ආදායම අඩු කිරීමට කල්බදුකරයේ දළ ආයෝජනයේ කාලය සඳහා ගෙවීම් කිරීමට අදාළ කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 හි දැක්වෙන හඳුනාගැනීම් අත්හැරීමේ හා හානිකරණ අවශ්‍යතා කල්බදුකරයේ ශුද්ධ ආයෝජනය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදාළ කර ගනී.

මෙම පිරිවැය පහත පරිදි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| කල්බදු මෝටර් රථය | අවු 8 – 15 | 6.67% - 12.50% |

**මෙහෙයුම් කල්බදු**

මෙහෙයුම් කල්බදු සඳහා ගෙවිය යුතු කල්බදු ගෙවීම් සෘජු රේඛීය පදනම මත ලැබෙන ආදායමක් ලෙස හෝ වෙනත් විධිමත් ආකාරයට එනම්, පාදක වත්කම් භාවිතයෙන් ලැබෙන ප්‍රතිලාභ වල අඩු වීම මෙම පදනමින් පෙන්නුම් කරන්නේ නම් හෝ ඒවා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හඳුනාගනු ලැබේ. ක්ෂය වීම ඇතුළුව කල්බදු ආදායම ඉපැයීමේදී වැය වන ඕනෑම පිරිවැයක් වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. මෙහෙයුම් කල්බදු ලබා ගැනීමේදී වැය වන ඕනෑම මූලික සෘජු පිරිවැයක් පාදක වත්කමේ ධාරණ අගයට එකතු කරනු ලබන අතර කල්බදු ආදායම් පදනම මත කල්බදු කාලසීමාව පුරා දිවෙන වියදම් ලෙස මෙම පිරිවැය හඳුනාගනු ලැබේ.

මෙහෙයුම් කල්බදු වලට යටත් ක්ෂය විය හැකි පාදක වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඒ හා සමාන වෙනත් සාමාන්‍ය ක්ෂය ප්‍රතිපත්ති වලට සමානුයෝග වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට අනුව ක්ෂය ගණනය කර මෙහෙයුම් බදුකරයකට යටත් පාදක වත්කමක් හානිකරණය වී ඇත්ද යන්න තීරණය කිරීමට සහ හානිකරණ ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 අදාළ කර ගනු ලැබේ.

### 2.5.8 මූල්‍ය නොවන වත්කම්හි හානිකරණය

සෑම ගිණුම් වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදී, සමූහයේ වත්කම් හානිකරණය වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා දේපළ, පිරියත හා උපකරණ, ආයෝජන දේපළ වල සහ අස්පෘෂ්‍ය වත්කම් වල ධාරණ අගය සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. හානිකරණයක් සිදු වී ඇත්නම්, හානිකරණ අලාභයේ (ඇත්නම්) ප්‍රමාණය තීරණය කිරීම සඳහා වත්කමේ ප්‍රතිලාභ්‍ය අගය ඇස්තමේන්තු කරනු ලැබේ. තනි වත්කමක ප්‍රතිලාභ්‍ය මුදල ඇස්තමේන්තු කිරීමට නොහැකි වේ නම්, සමූහය විසින් මුදල් ජනන ඒකකය නිශ්චය කර වත්කම අයත් වන මුදල් ජනන ඒකකයේ ප්‍රතිලාභ්‍ය අගය ඇස්තමේන්තුගත කරනු ලැබේ.

ප්‍රතිලාභ්‍ය වටිනාමක යනු වත්කමේ සාධාරණ අගයෙන් ඇස්තමේන්තුගත විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන අගයත් වත්කම භාවිතා කිරීමෙන් ලැබෙන අගයහිත් වැඩි අගය වේ. වත්කම භාවිතයෙන් ලැබෙන අගය තක්සේරු කිරීමේදී, අනාගතයෙහි ජනනය වන ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය ගණනය කිරීම සඳහා බදු අඩු කිරීමට පෙර වට්ටම් අනුපාතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කර, වත්කම භාවිතයෙන් ලැබෙන අගය තක්සේරු කරනු ලැබේ. වත්කම භාවිතයෙන් ලැබෙන අගය තක්සේරු කිරීමේදී වර්තමාන තත්ත්වය පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරන අතර, අනාගතයෙහි ඇති වන්නා වූ අවදානම් සැලකිල්ලට නොගනී.

වත්කමක ප්‍රතිලාභ්‍ය මුදල (මූල්‍ය උත්පාදන ඒකකය) එහි ධාරණ අගයට වඩා අඩුවෙන් ඇස්තමේන්තුගත කර ඇත්නම් වත්කමේ ධාරණ අගය (මූල්‍ය උත්පාදන ඒකකය) අයකර ගත හැකි අගය දක්වා අඩු කෙරේ. හානිකරණ පාඩුවක්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙන් ක්ෂණිකව හඳුනාගනු ලැබේ.

## 2.6 මූල්‍ය වත්කම්

### 2.6.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය සිය මූල්‍ය වත්කම් පහත සඳහන් ගණනය කිරීමේ කාණ්ඩ යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

- ක්‍රමක්ෂය පිරිවැය මත තක්සේරු කරන මූල්‍ය වත්කම්
- වෙනත් විස්තීරණ ආදායම මත සාධාරණ අගයට තක්සේරු කරන මූල්‍ය වත්කම්
- ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට තක්සේරු කරන මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් කළමනාරණය හා මූල්‍ය ප්‍රවාහයේ ගිවිසුම් ප්‍රකාර කොන්දේසි මත ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහයේ ව්‍යාපාර ආකෘතිය වර්ගීකරණය මත රඳා පවතී.

සාධාරණ අගය මත තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කම්, ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හෝ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශන වල වාර්තා කරනු ලැබේ. විකිණීම සඳහා නොවන ස්කන්ධ උපකරණ මත කරන ආයෝජන සම්බන්ධයෙන් නම් මෙය රඳපවතිනුයේ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් අදාළ ස්කන්ධ ආයෝජනය ගිණුම්ගත කිරීමට හඳුනාගන්නා මුල් අවස්ථාවේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය විසින් වෙනස් කළ නොහැකි තෝරා ගැනීමක් සිදු කර ඇද්ද යන කරුණ මතය. ආයතනය සහ සමූහය මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එහි ව්‍යාපාරික ආකෘතිය එම වත්කම් කළමනාකරණය කිරීම සඳහා වෙනස් වන අවස්ථාවලදී පමණි.

### 2.6.2 හඳුනාගැනීම සහ මූලික තක්සේරුව

අධිකාරියෙහි හා සමූහයෙහි මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී, සාධාරණ අගයට හඳුනා ගන්නා අතර, මූල්‍ය වත්කම්හි සාධාරණ අගය ලාභ පාඩු ගිණුම හරහා සටහන් කරන මූල්‍ය වත්කම්, මූලිකව හඳුනා ගැනීමේදී සාධාරණ අගය හා මූල්‍ය වත්කම අත්පත් කරගැනීමට ගිය හුවමාරු පිරිවැය යන දෙකෙහිම එකතුව සැලකිල්ලට ගනී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ප්‍රකාරව, සේවකයන්ට ලබා දෙන ලද සේවක ණය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උපකරණවල ආයෝජනයකි. අදාළ පොළී අනුපාතික වෙළෙඳපොළ අනුපාතික වලට වඩා වෙනස් හෙයින්, විලම්භිත වෙනස ගැලපුම් කරමින් සමාන ණය මුදල්වල සාධාරණ අගය හඳුනාගැනීමට අවශ්‍ය වේ. සේවක ණය යනු ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලබන මූල්‍ය වත්කමකි.

### 2.6.3 අපර තක්සේරුව

**ණය ලේඛන වල ආයෝජනය**

ණය ලේඛන මත සිදුකරන අපර තක්සේරු රඳාපවතිනුයේ වත්කම් කළමනාකරණය සඳහා වූ සමූහයේ ව්‍යාපාර ආකෘතිය සහ වත්කමෙහි ගති ස්වභාවයේ මුදල් ප්‍රවාහය මතය. ණය ලේඛන වර්ගීකරණය කරන තක්සේරු කාණ්ඩ තුනක් ඇත.

**ක්‍රමක්ෂය පිරිවැය**

මුල් මුදල හා පොලී ගෙවීම සඳහා පමණක්ම වන කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන වත්කම්, ක්‍රම ක්ෂය පිරිවැයට තක්සේරු කරනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම ක්‍රියාත්මක පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ. හඳුනා ගැනීම අත්හැර දැමීම හේතුකොට ගෙන පැන නගින කිසියම් ලාභයක් හෝ පාඩුවක් විස්තීර්ණ ආදායම් වාර්තා මගින් ඍජුවම හඳුනාගනු ලබන අතර, එම විදේශ විනිමය ලාභ හා පාඩු සමඟ එක්ව ඉදිරිපත් කරනු ලැබේ.

**සාධාරණ වටිනාකම වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ගැලපීම (FVOCI)**

මුල් මුදල හා පොලී ගෙවීම සඳහා පමණක්ම නියෝජනය වන වත්කම් වල මුදල් ප්‍රවාහයන් කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ හා මූල්‍ය වත්කම් විකුණුම් සඳහා මූල්‍ය ප්‍රවාහ සඳහා පවත්වාගෙන යනු ලබන වත්කම්, වෙනත් විස්තීර්ණ ආදායම් වල සාධාරණ අගය මත තක්සේරු කරනු ලැබේ. විස්තීරණ ආදායම්හි හඳුනා ගනු ලබන හානිකරණ ලැබීම් සහ පාඩු, පොලී ආදායම සහ විදේශ විනිමය ලැබීම් සහ පාඩු හඳුනාගැනීම සඳහා මිස, අගයේ වෙනස් වීම් වෙනත් විස්තීර්ණ ආදායම් මගින් පිළිගනු ලැබේ. මූල්‍ය වත්කම හඳුනානොගන්නා විටදී වෙනත් විස්තීර්ණ ආදායමෙහි පූර්වයේදී හඳුනාගන්නා ලද සමුච්චිත ලාභ හෝ පාඩු ස්කන්ධ ආදායමේ සිට විස්තීර්ණ ආදායම දක්වා ප්‍රතිවර්ගීකරණය කර වෙනත් විස්තීර්ණ ආදායමෙහි ලාභ හෝ පාඩු ලෙස හඳුනාගනු ලැබේ. විදේශ විනිමය ලාභ සහ පාඩු වෙනත් ලැබීම්/(පාඩු) සහ හානිකරන වියදම් ලෙස වෙනම රේඛීය අයිතම ලෙස විස්තීර්ණ ආදායමෙහි ගෙනහැර දක්වනු ලැබේ.

**සාධාරණ අගය ලාභ අලාභ ගිණුම තුළින් ගැලපීම (FVTPL)**

ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් මත සාධාරණ අගය සඳහා වූ නිර්ණායකයන්ට අනුගත නොවන වත්කම් ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට තක්සේරු කරනු ලැබේ. ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට පසුකාලීනව තක්සේරු

කරන ණය ආයෝජනයක ලාභය හෝ අලාභය විස්තීර්ණ ආදායම තුළින් හඳුනාගෙන එය පවතින කාලසීමාව තුළ වෙනත් ලාභ/ (පාඩු) ගිණුම ඇතුළත ශුද්ධ ආදායමක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

**ස්කන්ධ උපකරණ වල ආයෝජන**

සියළුම ස්කන්ධ ආයෝජන ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය විසින් පසුකාලීනව සාධාරණ අගයට තක්සේරු කරනු ලැබේ. සමූහයේ කළමනාකාරීත්වය විසින් සාධාරණ අගයේ ලාභ සහ පාඩු වෙනත් විස්තීර්ණ ආදායමෙහි ස්කන්ධ ආයෝජන වල ඉදිරිපත් කිරීමට තෝරාගෙන ඇති බැවින් ආයෝජන හඳුනාගැනීම හේතුකොට ගෙන පසුව විස්තීර්ණ ආදායම සඳහා සාධාරණ අගයේ ලාභ සහ පාඩු ප්‍රති වර්ගීකරණය කරනු නොලැබේ.

ගෙවීම් ලබා ගැනීම සඳහා සමූහයේ අයිතිය තහවුරු වූ විට විස්තීර්ණ ආදායමෙහි වෙනත් ආදායම් ලෙස පවතින ආයෝජන වලින් ලැබෙන ලාභාංශ අඛණ්ඩව හඳුනා ගනු ලැබේ. ලාභ හෝ පාඩු මත මූල්‍ය වත්කම් සාධාරණ අගයට තක්සේරු කිරීම මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ලාභ / (පාඩු) අදාළ පරිදි හඳුනාගනු ලැබේ.

වෙනත් විස්තීර්ණ ආදායම්හි සාධාරණ අගයට තක්සේරු කරනු ලබන ස්කන්ධ ආයෝජන වල හානිකරණ පාඩු (සහ හානිකරණ පාඩු වල ප්‍රතිවර්තනය) සාධාරණ අගයේ වෙනත් මාරු කිරීම් මගින් වෙන් වශයෙන් වාර්තා කරනු නොලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්හට ලබා දෙන ණය, සඵල පොලී අනුපාතික ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලැබේ.

### 2.6.4 හානිකරණය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා සමූහය විසින් ඒවාහි ක්‍රමක්ෂය පිරිවැය හා වෙනත් විස්තීර්ණ ආදායම් වල සාධාරණ අගය මත ධාරණය වන ණය උපකරණ ආශ්‍රිතව සිදු විය හැකි බැර අලාභ තක්සේරු කරනු ලබයි. මේ සඳහා අදාළ කර ගනු ලබන හානිකරණ ක්‍රමවේදය රඳාපවතිනුයේ ණය අවදානමෙහි විශාල වැඩිවීමක් සිදු වී ඇත්ද යන සාධකය මතය.

වෙළඳ ලැබීම් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදාළ කරගනු ලබන්නේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 හි ඇති වෙළෙඳ ලැබීම් වල මූලික හඳුනාගැනීම් වල අපේක්ෂිත දිගු කාලීන අලාභ හඳුනාගැනීමට අවශ්‍ය කරනු ලබන මූල්‍ය උපකරණ මගින් අනුමත කර ඇති සරල ප්‍රවේශය වේ. මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ ලැබීම් වල මූලික හඳුනාගැනීම මගින් අපේක්ෂිත ජීව කාල පාඩු හඳුනාගැනීම වේ. අපේක්ෂිත පාඩු වල අනුපාතය ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් විස්තර හා ලබා ඇති පෙර අනුරූපී බැර පාඩු මත පදනම්ව ගණනය කරනු ලබයි. පෙර අලාභ අනුපාත, සාර්ව ආර්ථික සාධක වල වත්මන් හා ඉදිරි තොරතුරු වල පිළිඹිබු වනසේ ගලපනු ලැබේ. (කළමනාකරණ තීරණ මත වෙනස් විය වේ.

**හඳුනාගැනීමෙන් ඉවත් කිරීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය;

- මූල්‍ය වත්කම් වලින් මුදල් ප්‍රවාහයට කොන්ත්‍රාත්තුමය අයිතීන් වල කාලය ඉක්මයාම, හෝ

- මූල්‍ය වත්කම් මාරු කිරීමෙන් පසු එම මාරු කිරීම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලන අවස්ථාවලදී පමණක්,

මූල්‍ය වත්කම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

**සාධාරණ අගය ගණනය කිරීම**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 13 ප්‍රකාරව කිසියම් වත්කමක් විකිණීමට නියම කරන මිල හෝ වෙළඳපොල හවුල්කරුන් අතර විධිමත් ගනුදෙනුවකදී කිසියම් වගකීමක් පැවරීමට තක්සේරුකරන දිනයේදී ගෙවන මිල, සාධාරණ අගය යනුවෙන් හඳුන්වනු ලැබේ. වත්කමක් විකිණීම සඳහා වන ගණුදෙනුව හෝ වගකීමක් පැවරීම සිදු වනුයේ වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළඳපොළ තුළ හෝ ප්‍රධාන වෙළඳපොළක් නොමැති විටකදී, වත්කම හෝ වගකීම සඳහා වඩාත් වාසිදායක වෙළඳපොළ තුළ බව සාධාරණ අගය ගණනය කිරීම මගින් උපකල්පනය කෙරේ.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගයේ ප්‍රමාණය හා එය භාවිතා කිරීම මගින් වෙළෙඳපොළ හවුල්කරුවෙකුහට එම වත්කම උපරිම ප්‍රයෝජනයට ගත හැකි ලෙස භාවිතා කිරිමට ඇති හැකියාව සැලකිල්ලට ගෙන එය වෙනත් වෙළෙඳපොළ හවුල්කරුවෙකු වෙත විකිණීම මගින් එහි උපරිම හා හොඳම ප්‍රයෝජනය ගැනීමේ හැකියාව නිගමනය කරනු ලැබේ.

සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය සුදුසු තක්සේරු ශිල්පීය ක්‍රම භාවිතා කරන අතර, නිරීක්ෂණය කල හැකි අදාළ යෙදවුම් වල භාවිතය උපරිම කරමින් හා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වල භාවිතය අවම කරමින් ඇගයීම් කිරීම සඳහා ප්‍රමාණවත් දත්ත අධිකාරිය සහ සමූහය සතුව පවතී. ඒ සඳහා පහත සඳහන් යෙදවුම් භාවිතා කරනු ලැබේ.

පළමු වන මට්ටමේ යෙදවුම් : තක්සේරු කරනු ලබන දිනයට ස්ථිතියට ප්‍රවේශ විය හැකි අනන්‍ය වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපොළෙහි පවතින මිල (ගැලපුම් නොකල)

දෙවන මට්ටමේ යෙදවුම් : වත්කම් හෝ වගකීම් සඳහා ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පළමු මට්ටමේ දත්ත වල ඇතුළත්ව පවතින මිල හැර වෙනත් යෙදවුම්

තෙවන මට්ටමේ යෙදවුම් : වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කල නොහැකි යෙදවුම්

**සාධාරණ අගයට ගණනය කරන වත්කම්**

| වත්කම් කාණ්ඩය | සටහන් අංකය | 2024.12.31 දිනට අගය | 01 මට්ටම | 02 මට්ටම | 03 මට්ටම |
|---|---|---|---|---|---|
| **වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයේ මූල්‍ය වත්කම්** | | | | | |
| **ලැයිස්තුගත ආයෝජන** | | | | | |
| කොළඹ ඩොක්යාඩ් (පුද්.) සමාගම | 8.1 | 144,069,987 | 144,069,987 | - | - |
| **ලැයිස්තුගත නොකල ආයෝජන** | | | | | |
| කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම | 8.2 | 16,568,543,120 | - | - | 16,568,543,120 |
| සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් සමාගම | 8.2 | 3,641,250,684 | - | - | 3,641,250,684 |
| හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ් | 8.2 | 47,999,942,173 | | | 47,999,942,173 |
| ලංකා කෝල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් | 8.2 | 11,950,000 | | | 11,950,000 |
| කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ් | 8.2 | 7,205,875,503 | | | 7,205,875,503 |
| දකුණු ආසියා වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍ර සමාගම | 8.2 | 1,485,027,552 | | | 1,485,027,552 |
| | | **77,056,659,020** | **144,069,987** | **-** | **76,912,589,032** |

## 2.7 තොග

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි ඡේද අංක 09 ට අනුව, තොග ගණනන කරනු ලබන්නේ ශුද්ධ උපලබ්ධි අගයට හා පිරිවැයේ අවම අගයට වේ. පිරිවැය තීරණය කරනු ලබන්නේ FIFO ක්‍රමයට හා බරතැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමයට වේ. තොග පිරිවැයට මිලදී ගැනීමේ සියළු පිරිවැය, හුවමාරු කිරීමේ පිරිවැය හා තොග වත්මන් ස්ථානයට හා වත්මන් තත්ත්වයට ගෙන ඒම සඳහා දරණ ලද සියළු පිරිවැය ඇතුළත් වේ.

නෞකා හා නැව් භාණ්ඩ මෙහෙයුම් උපකරණ සඳහා අමතර කොටස් හා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය තොග වලට ඇතුළු වේ. සේවා සැපයීමේදී භාවිතා කරනු ලබන ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් තොග පැවතිය හැක.

වත්මන් විකිණීම හෝ බැහැර කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය අඩු කර පසු වත්මන් විකිණිය හැකි වටිනාකම ශුද්ධ උපලබ්ධි වටිනාකම වේ.

## 2.8 වෙළඳ සහ වෙනත් ලැබීම්

වෙළඳ ලැබීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ඉටුකරන සේවා වෙනුවෙන් පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු හිඟ මුදල්ය. සාමාන්‍ය ව්‍යාපාර පවත්වාගෙන යාමේ මෙහෙයුම් චක්‍රය අනුව ලැබීම් අපේක්ෂා කරන අතර ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වෙළෙඳ ලැබීම් සාධාරණ අගයට හඳුනාගැනීමේදී විශේෂ මූල්‍ය සංරචක ඇතුළත් වේ නම් වෙළඳ ලැබීම් එහි සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර එසේ නොමැති නම් වෙළඳ ලැබීම් මූලිකව ගනුදෙනු මිලට හඳුනාගනු ලැබේ.

කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහයන් ලබාගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා වරාය අධිකාරින් වෙළඳ ලැබීම් රඳවා ගන්නා අතර පසුව සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ඒවා ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

වෙනත් ලැබීම් සාමාන්‍ය වශයෙන් පැන නගිනු ලබන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් වලට පරිබාහිරව සිදු වන මෙහෙයුම් වලිනි.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ප්‍රකාරව, වෙළඳ ලැබීම් මත හානිකරණ අලාභයේ ප්‍රමාණය තක්සේරු කර හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අපේක්ෂිත ණය අලාභ ආකෘතිය Expected Credit Losss Model (ECL) භාවිතා කරනු ලැබේ.

**සරල ප්‍රවේශය (Simplified Approach)**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි වෙළෙඳ ලැබීම් වල හානිකරණ හඳුනාගැනීම සඳහා සරල ප්‍රවේශය අනුගමනය කරයි. සරල ප්‍රවේශය අනුගමනය කිරීම හේතුකොට ගෙන බැර අවදානම් වෙනස්වීම නිරීක්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍යතාවයක් ඇති නොවේ. මූලික පිළිගැනීමේ අවස්ථාවේ සිටම එක් එක් ගිණුම් වාර්තාකරණ දිනයට අපේක්ෂිත ණය අලාභ ආයුකාලය මත පදනම්ව හානිකරණ අලාභ එමගින් හඳුනාගනු ලැබේ.

ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, වෙළඳ ලැබීම් වල හානිකරණ අලාභ නිගමනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ප්‍රතිපාදන න්‍යායක් (Provision Matrix) භාවිතා කරනු ලබයි. වෙළඳ ලැබීම් වල අපේක්ෂිත ආයු කාලය මත පෙර නිරීක්ෂණය වූ ගෙවීම් පැහැර හැරීමේ අනුපාතය ප්‍රතිපාදන න්‍යාය (Provision Matrix) මත පදනම් වන අතර ඉදිරි වාර්තාකරණ දිනයකදීම, පෙර නිරීක්ෂණය කරන ලද ගෙවීම් පැහැර හැරීම් වල අනුපාතය යාවත්කාලීන කරන අතර ඉදිරි කාලීන ඇස්තමේන්තු විශ්ලේෂණය කරනු ලැබේ. මෙම පදනම මත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිණුම් වාර්තාකරණ දිනයට වෙළඳ ලැබීම් මත ප්‍රතිපාදන ඇස්තමේන්තු කරනු ලැබේ. කාලසීමාව තුළ හඳුනාගත් හානිකරණ අලාභ සීමා ගාස්තු අය කිරීම (හෙවත් ගෙවීම් ප්‍රතිවර්තනය) ආදායම් / වියදම් ලෙස හඳුනාගැනේ.

| | | **පදනම** | |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා යුධ හමුදා ප්‍රතිපාදන | මාස 12 දක්වා | ප්‍රතිපාදන නැත |
| | | මාස 12කට පසු | 50% |
| 2 | රජයේ ආයතන ප්‍රතිපාදන | මාස 12 දක්වා | ප්‍රතිපාදන නැත |
| | | මාස 12කට පසු | 100% |
| 3 | අධිකරණමය කටයුතු වලට ලක් වූ නැව් නියෝජිතයන් | | 100% |
| | නැව් නියෝජිතයින් - අතිහිටුවා ඇති සහ අක්‍රිය නැව් නියෝජිතයන් | | 100% |
| | විශාල මුදල් ප්‍රමාණයන් ගෙවීමට ඇති නැව් නියෝජිතයින් (මිලියන 1කට වැඩි) | මාස 12 දක්වා | ප්‍රතිපාදන නැත |
| | | මාස 12න් පසු | 50% |

## 2.9 මුදල් සහ මුදල් හා සමාන දෑ

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ, මුදල් සහ මුදල් හා සමාන දෑට අයත් වන්නේ අත ඇති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු හා මූලික කල් පිරීමේ කාල සීමාව තෙමසක් හෝ ඊට අඩු කාලයක් සහිත කෙටි කාලීන ඉහළ මට්ටමේ ද්‍රවශීලතා ආයෝජනයන් ය.

## 2.10 යෙදවූ ප්‍රාග්ධනය

මෙයට කොළඹ වරාය කොමිසන් සභාව, වරාය නැව් බඩු සංයුක්ත මණ්ඩලය, වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව යන ආයතන වලින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරන ලද සියළු

දේපළ වලට අදාළ අරමුදල් වලට අයත් සියළුම ණය, වගකීම් සහ බැඳීම් ඇතුළුව චංචල සහ නිශ්චල දේපළ මෙයට ඇතුළත් වේ.

## 2.11 මූල්‍යමය වගකීම්

සමූහය විසින් මූල්‍යමය වගකීම් වෙනත් මූල්‍යමය වගකීම් වලට වර්ගීකරණය කරනු ලබයි. සමූහයේ වෙනත් මූල්‍ය වගකීම් වලට අයත් වන්නේ ණය ගැනීම්, වෙළඳ හා වෙනත් ගෙවීම් ඇතුළත් වේ. වෙනත් මූල්‍ය වගකීම් මූලිකව තක්සේරු කරනු ලබන්නේ වෙළඳ පිරිවැය සඳහා සෘජුවම අදාළ මුදල සහ සාධාරණ අගයේ එකතුවෙනි. මූලිකව හඳුනාගැනීමෙන් අනතුරුව මෙම මුල්‍යමය වගකීම්, සඵල පොළී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂ පිරිවැය ලෙස තක්සේරු කරනු ලැබේ. කොන්ත්‍රාත්තුමය වගකීම් නිදහස් කර අවලංගු කර හෝ අවසන් කර ඇති විට සමූහය විසින් මුල්‍ය වගකීම හඳුනාගැනීම අත්හරිනු ලැබේ.

## 2.12 වෙළඳ හා වෙනත් ගෙවීම්

වෙළඳ සහ වෙනත් ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා ලද භාණ්ඩ හා සේවා සම්බන්ධ ගෙවීම් සඳහා ඇති වගකීම් වේ. ව්‍යාපාරයක සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක මෙන් වෙළඳ හා අනෙකුත් ගෙවීම් ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

වෙළඳ හා අනෙකුත් ගෙවීම් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයටය. මෙය ගණුදෙනු මිල වන අතර පසුව තක්සේරු කිරීමේදී මුල් ඉන්වොයිසියේ අගයට තක්සේරු කරන අතර, කෙටි කාලයක් තුළදී ගෙවීම් කිරීම කරන බැවින් මුදල් වල කාලයේ වටිනාකම වැදගත් නොවේ.

## 2.13 ණය ලබාගැනීම්

සමූහයේ ණය ගැනීම් වල ශ්‍රී ලංකා රජයෙන් හා වෙනත් මූල්‍ය ආයතන වලින් වරාය සංවර්ධන කටයුතු සඳහා ලබාගනු ලබන ණය ඇතුළත් වේ. ණය ගැනීම් මූලිකව වැය කළ ශුද්ධ ගනුදෙනුපිරිවැයේ සාධාරණ අගයට හඳුනාගනු ලැබේ. ඉන් පසුව ණය ගැනීම් පසුව ඵලදායි පොලි අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට තක්සේරු කරනු ලැබේ. ගිණුම් වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී පවතින පාවෙන පොළී අනුපාතිකය (ඵලදායි පොළී අනුපාතිකය) භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය ලෙස අස්ථිර අනුපාත ණය ගැනීම් තක්සේරු කරනු ලැබේ.

ණය ගැනීමේ පහසුකම් වෙනුවෙන් ගෙවන ලද ණය මුදල පිළියෙළ කිරීමේ ගාස්තුව, ව්‍යුහාත්මක ගාස්තුව, සැකසීමේ ගාස්තුව සහ කළමනාකරණ ගාස්තුව ණය මුදලේ ගනුදෙනු පිරිවැයට හඳුනාගනු ලැබේ.

ක්‍රමක්ෂ පිරිවැයට ණය මුදලේ ධාරණ අගය තක්සේරු කිරීමේදී ඇති වන විදේශ විනිමය ලාභ සහ පාඩු එක් එක් ගිණුම් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශ මගින් හඳුනාගනු ලැබේ.

## 2.14 ණය ගැනීමේ පිරිවැය

භාවිතා කිරීමට අදහස් කරනු ලබන කාලයට සූදානම් කර තැබීමට නිසැකවම සැලකිය යුතු කාලයක් ගතවන වත්කම් පවරා ගැනීමට, ඉදිකිරීමට හෝ භාවිතයට යෝග්‍යවන අන්දමින් නිෂ්පාදනය කිරීමට නිසැකවම සැලකිය යුතු කාලයක් ප්‍රාග්ධනීකරණය වන ණය ගැනීමේ පිරිවැය, ඒවා භාවිතා කිරීමට අදහස් කරනු ලබන කාලය සඳහා සැලකිය යුතු අන්දමින් සූදානම්ව පවතින තෙක් එම වත්කම්, ඒවාහි පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ.

සුදුසුකම් ලබන වත්කමක සක්‍රිය භාවිතය අවලම්භණය කිරීම දීර්ඝ කරන ලද කාල පරිච්ඡේදය තුළ ණය ගැනීමේ පිරිවැය අවලම්භණය කරනු ඇත.

වෙනත් සියළුම ණය ගැනීමේ පිරිවැය ඒවා යොදවන කාල පරිච්ඡේදය තුළදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

## 2.15 රජයේ ප්‍රදාන

මූල්‍යමය නොවන ප්‍රදාන ඇතුළු රජයෙන් ලැබෙන ප්‍රදානයන් නිසැකවම ලැබෙන බවට හා ඒවාට අදාළ කොන්දේසි වලට සමූහය විසින් අනුකූල වන බවට ප්‍රමාණවත් සහතික වීමක් ලැබුණු විට ඒවා සාධාරණ අගයට හඳුනාගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් පිළිගනු ලැබේ. මෙය වන්දි ගෙවීම් සඳහා අදහස් කරන පිරිවැයට සරිලන පරිදි අවශ්‍ය කාලයේදී සළකා බලනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා අදාළ රජයේ ප්‍රදාන විලම්භිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම් වල ඇතුළත් කර ඇති අතර, ඒවා අදාළ වත්කම් වල අපේක්ෂිත ආයු කාලය අනුව සරල රේඛීය පදනම මත සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගනු ලැබේ.

මූල්‍යමය නොවන ප්‍රදාන, මූල්‍යමය නොවන වත්කම් වල සාධාරණ අගයට තක්සේරු කරනු ලබන අතර ප්‍රදාන සහ වත්කම් වල සාධාරණ අගයට ගිණුම්ගත කරනු ලැබේ.

## 2.16 ජංගම සහ විලම්භිත බදු

අදාළ කාලසීමාව සඳහා බදු වියදම් ජංගම සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. වෙනත් සවිස්තරාත්මක ආදායම් වල හඳුනාගනු ලබන කරුණු වලට අදාළ ප්‍රමාණය හැර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ බදු හඳුනාගනු ලැබේ. මෙම අවස්ථාවේ දී, වෙනත් සවිස්තරාත්මක ආදායම සඳහා ද බදු හඳුනාගනු ලැබේ.

ජංගම ආදායම් බදු ගෙවීම ගණනය කරනු ලබන්නේ වරාය අධිකාරියට, එහි පරිපාලිත සමාගම් වලට අදාළ ගිණුම් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී පනවනු ලබන ගෙවිය යුතු බදු මුදල පදනම් කර ගෙනය. ගෙවිය යුතු බදු මුදල පදනම් කරගෙන කළමනාකාරීත්වය විසින් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

වත්කම් වල හා වගකීම් වල සහ මූල්‍ය ප්‍රකාශන වල ධාරණ අගය අතර පැනනගින තාවකාලික විචල්‍යතාවයන් මත විලම්භිත බදු හඳුනාගනු ලැබේ. ගණුදෙනුව සිදුවන කාල වකවානුවේදී ගිණුම්වලටවත්, බදු ගෙවිය යුතු ලාභයටවත් හෝ අලාභයටවත් බල නොපවත්වන ව්‍යාපාරයකදී සෘජුවම මූලික හඳුනාගැනීම සම්බන්ධයෙන් විචල්‍යතාවයක් පැන නගින්නේ නම් විලම්භිත බදු සැලකිල්ලට ගනු නොලැබේ. වාර්තාකරණ කාලසීමාවේ අවසන් දිනයට පනවා ඇති බදු අනුපාතය උපයෝගී කරගනිමින් විලම්භිත බදු ප්‍රමාණය තීරණය කර, එම විලම්භිත බදු උපලබ්ධි වූ විට හෝ විලම්භිත ආදායම් බදු වගකීම නිරවුල් වූ විට ඒවා අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

තාවකාලික විචල්‍යතාවයන් සඳහා උපයෝගී කිරීමට අනාගත බදු අයකල යුතු ලාභ පැවතිය හැකි ප්‍රමාණය අනුව පමණක් විලම්භිත බදු හඳුනාගනු ලැබේ. ජංගම බදු වගකීම් වලට බදු වත්කම් හා වගකිම් හිලව් කිරීම සඳහා නීතිමය අයිතිය බලාත්මක කර ඇති අවස්ථාවක සහ එම බදු අයකිරීම් අධිකාරිය මගින්ම පනවා ඇති විලම්භිත බදු වත්කම් සහ වගකීම් සඳහා ආදායම් බදු හිලව් කරනු ලැබේ.

## 2.17 සේවක ප්‍රතිලාභ

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සහ නිශ්චිත දායකත්ව සැළසුම් සමූහය සතුව ඇත.

**(අ) නිශ්චිත දායකත්ව සැළසුම**

නිශ්චිත දායකත්ව සැලැසුමක් යනු සමූහය විසින් වෙනම ස්ථිතියක් වෙත නොවෙනස්වන දායකත්වයක් යටතේ ගෙවන ස්ථිර සේවක ප්‍රතිලාභයකි. ඊට වැඩිමනත් ගෙවීමක් කිරීමට නීතිමය හෝ සම්මුතික බැඳියාවක් සමූහයට නොමැත. ගෙවිය යුතු කාලය වනවිට සේවක ප්‍රතිලාභ ලෙස මෙම ගෙවීම් පිළිගනු ලැබේ.

සේවකයාගේ දළ වැටුපෙන් 15%ක් සේවක අර්ථ සාධක අරමුදලට ද 3%ක් සේවක භාරකාර අරමුදලට ද සමූහය විසින් හඳුනාගනු ලැබේ.

**(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම**

නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම සම්බන්ධව සමූහයේ වගකීම වන්නේ ගිණුම් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ පවත්නා නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වත්මන් වටිනාකමය. නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ආයු ගණක ක්‍රමය මගින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම සේවකයා විසින් වර්තමාන සහ පූර්ව කාල පරිච්ඡේදය සඳහා සේවාවන් වෙනුවෙන් උපයාගත් ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභ අඩුකරමින් නිර්ණය කරනු ලැබේ.

ආයු ගණක උපකල්පනයන් වල කර ඇති ගැලපුම් වෙනස්කම් වලින් මතුවන ආයු ගණක ලැබීම් සහ පාඩු ඒවා පැන නගින කාල සීමාව තුළදී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙන් හඳුනාගනු ලැබේ.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බාහිර වශයෙන් අරමුදල් යොදවනු නොලැබේ.

**(ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ**

සේවකයා විසින් ඉටුකරනු ලබන සේවය වෙනුවෙන් ගෙවීමට අපේක්ෂා කරනු ලබන අඩු නොකරන ගෙවීම් මත කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් ගණනය කරනු ලැබේ.

## 2.18 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වත්මන් නීතිමය බැඳීමක් හෝ සම්මුතික බැඳීමක් ඇති අවස්ථාවක පරිමා ප්‍රතිදාන, නෛතික හිමිකම් පෑම් සහ වෙනත් වියදම් හඳුනාගනු ලැබේ. ආර්ථික වත්කම් පිටාර ගලනයක් සමූහයෙන් අපේක්ෂා කිරීමට ඉඩ ඇති අතර වටිනාකම් විශ්වාසනීයත්වයෙන් යුතුව ඇස්තමේන්තුගත කළ හැක.

වර්තමාන වගකීම හා බැඳුනු අවදානම් සහ අවිනිශ්චිතතාවයක් ඇතුළත් ගිණුම්, වාර්තාකරණ දිනයට ලබා ගත හැකි වඩාත් විශ්වසනීය සාක්ෂි මත පදනම් ව වත්මන් වගකීම් පියවීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් මත ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

වර්ෂය අවසානයේදී ප්‍රතිපාදන සමාලෝචනයට ලක්කර වත්මන් ඇස්තමේන්තුවෙහි ප්‍රත්‍යාවේක්ෂණය වීමට ඒ ඒ වාර්තාකරන කාලපරිච්ඡේදය අවසනායේදී ගැලපුම් කරනු ලැබේ. වගකීම් නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභ නිරූපනය වන සම්පත් විශාලනය වීමට වඩාත්

දිගුකාලයක් ගතවන ප්‍රවණතාවයක් තවදුරටත් පවතින්නේ නම්, ප්‍රසම්පාදනය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

සම්පත් පිටාර යෑමේ සම්භාවිතාවය දුරස්ථ නොවේනම් සියළුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ.

## 2.19 ගනුදෙනුකරුවන් සමග කොන්ත්‍රාත්තු වලට එළැඹීමෙන් ලබන ආදායම

1. පාරිභෝගිකයෙකු සමග කොන්ත්‍රාත්තුව හදුනාගැනීම.
2. කොන්ත්‍රාත්තුවෙහි කාර්යසාධන වගකීම් හදුනාගැනීම.
3. ගනුදෙනු මිල තීරණය කිරීම
4. ගනුදෙනු මිල වෙන් කිරීම
5. කාර්යසාධන වගකීම් සම්බන්ධයෙන් ආයතනය සෑහීමට පත් වූ පසු ආදායම හදුනාගැනීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගනුදෙනුකරුවෙකු සමග කොන්ත්‍රාත්තුවට එළඹෙනු ලබන්නේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 හි දැක්වෙන නිර්ණායක සපුරා ඇති අවස්ථාවලදීය. කොන්ත්‍රාත්තුව ආරම්භයේදී ගනුදෙනුකරු සමග ඇති කරගන්නා ගිවිසුම් වලට අනුකූලව සමූහය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිවිසුම්ගත භාණ්ඩ හෝ සේවා තක්සේරු කරන අතර ගනුදෙනුරුහට පැවරීම සඳහා ගිවිස ගනු ලැබූ එක් එක් කාර්යසාධන වගකීම් පැවරීම සඳහා පහත සඳහන් කාර්යසාධන වගකීම්වලින් එකක් හදුනාගත යුතුය.

(අ) නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් (හෝ භාණ්ඩ හෝ සේවා ගණනාවක්); හෝ

(ආ) ගනුදෙනුකරුහට පවරනු ලබන ආකාරයට බෙහෙවින් සමාන ආකාරයේ හෝ එකම ආකාරයේ නිශ්චිත භාණ්ඩ හෝ සේවා ගණනාවක්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආදායම් හදුනාගනු ලබන්නේ සේවාලාභියෙකු වෙත ගිවිසගත් භාණ්ඩයක් හෝ සේවයක් (එනම් වත්කමක්) පැවරීම මගින් ආයතනය කාර්යසාධන වගකීම පිළිබඳ සෑහීමකට පත්වන කල්හිය. වත්කමක් පවරනු ලබන්නේ සේවා ලාභියා එම වත්කමෙහි පාලනය තමන් සතු කර ගන්නා විටදීය.

**නිශ්චිත කාලයට පසු මාරු කරනු ලබන භාණ්ඩ / සේවා**

ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිත 15 යටතේ සමූහය කොන්ත්‍රාත්තුව ආරම්භයේදී කාර්යසාධන වගකීම් සම්බන්ධයෙන් අදාළ කාලය ඉක්මයාමෙන් පසුව හෝ නිශ්චිත කාලයක් තුළදී සෑහීමට පත් වන්නේද යන්න පිළිබඳව තීරණය කරයි. කාලය ඉක්මයාමෙන් පසුව සෑහීමට පත්වන ඒ ඒ කාර්යසාධන වගකීම් සඳහා, භාණ්ඩ හා සේවා පාලනය මාරු කළ විට, කාර්යසාධන වගකීම් පිළිබඳව පූර්ණ සෑහීමට පත්වීමේ ප්‍රගතිය තක්සේරු කර එමඟින් කාර්යසාධන වගකීම් තක්සේරුවක් පිළිබඳ සෑහීමට පත් ව ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආදායම හදුනාගනු ලබයි.

**නිශ්චිත කාලයකදී මාරු කරනු ලබන භාණ්ඩ / සේවා**

ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි ප්‍රමිත 15 යටතේ, කාර්යසාධන වගකීම් පිළිබඳව සෑහීමට පත් වූ පසුව ආදායම හදුනාගනු ලැබේ. වත්කමෙහි පාලනය ගනුදෙනුකරු වෙත මාරුකළ විට නිශ්චිත කාලයක් තුළදී ආදායම හදුනාගැනීම සිදු වේ.

**ආදායම ගණනය කිරීම**

කාර්යසාධන වගකීම ඉටු වූ පසු, එම කාර්යසාධන වගකීම සඳහා වෙන් කරන ගනුදෙනු මිල ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආදායම ලෙස පිළිගනු ලබයි. ගනුදෙනු මිල තීරණය කිරීම සඳහා

කොන්ත්‍රාත්තුවේ නියමයන් සහ භාවිතා කරනු ලබන ව්‍යාපාර පරිචයන් ද සලකා බලනු ලැබේ. ගනුදෙනු මිල යනු තුන්වන පාර්ශ්වයන් වෙනුවෙන් අය කරනු ලබන මුදල අත්හැර, ගිවිසුම් ගත භාණ්ඩ හා සේවා ගනුදෙනුකරුවකු වෙත ලබා දීම වෙනුවට ස්ථිතිය විසින් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභය වේ. ගනුදෙනු මිල තීරණය කිරීමේදී පහත සඳහන් සියළුම කරුණු ශ්‍රී ලංකා වරාය අධිකාරය සහ සමූහය විසින් සලකා බලනු ලැබේ.

- විචල්‍ය ප්‍රතිශ්ඨාව
- විචල්‍ය ප්‍රතිශ්ඨාවේ සංරෝධක ඇස්තමේන්තුව
- කොන්ත්‍රාත්තුවේ පවතින විශේෂිත මූල්‍ය සංරචකයන් පැවතීම
- මූල්‍යමය නොවන ප්‍රතිශ්ඨාව
- ගනුදෙනුකරුවෙකුහට ගෙවන ප්‍රතිශ්ඨාව

ඉටුකරන ලද හඳුනාගත හැකි එක් එක් ප්‍රධාන පෙලේ සේවාවන් හඳුනාගැනීම සඳහා සමූහය විසින් පහත සඳහන් නිර්ණායක අදාළ කර ගනු ලැබේ.

**(අ) ගොඩබෑම් හා භාරදීමේ සේවා**

ආනයන අපනයන නැව්බඩු මෙහෙයුම් සම්බන්ධයෙන් නැව්බඩු පැටවීම්, ගොඩබෑම් හා ගබඩා කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම ආදී සේවාවන් සමූහය විසින් සපයනු ලැබේ. මෙම විකුණුම් සේවා සඳහා කාර්යය හෝ ගනුදෙනු සම්පූර්ණ කිරීම පදනම්ව සේවා සපයන අතර, සපයන ලද සත්‍ය සේවා පදනම් කොට අය කිරීම් තක්සේරු කරනු ලැබේ.

ආදායම එකතු කිරීමේ අවිනිශ්චිතතාවය හේතුකොටගෙන දීර්ඝ කාලයක් තුළ ආයතනවල ගබඩාකර ඇති බහළුම් වලින් ලැබිය යුතු හිඟ බිම් කුලිය අසම්භාව්‍ය ආදායමක් ලෙස හඳුනාගැනේ. එබැවින්, මෙම ආදායම එකතු කළහැකි ආදායමක් ලෙස නිගමනය කළ හැකි වූ පසුව ආදායම හඳුනාගනු ලැබේ.

**(ආ) නාවික හා ආශ්‍රිත සේවා**

ප්‍රදීපාගාර ගාස්තු ප්‍රවේශ ගාස්තු හා අධිපැය ගාස්තු සහ නියමු ගාස්තු, ඒවා ලැබීමට නියම වන අවස්ථාවේදී, එනම් නෞකා පැමිණෙන අවස්ථාවේදි නියම කරනු ලැබේ. නාවික හා අදාළ සේවාවන්ගෙන් ලැබෙන ආදායම එම සේවාව සැපයූ කාලසීමාව තුළ හඳුනාගනු ලබන අතර, අදාළ කාර්යය හෝ ගනුදෙනුව සම්පූර්ණ කිරීමේ පදනම මත සහ සත්‍ය වශයෙන්ම සපයන ලද සේවාවන් මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

**(ඇ) නැව් භාණ්ඩ වාහක සේවා**

බහළු මෙහෙයුම් සහ සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් වලට අදාළව නැව් භාණ්ඩ වාහක සේවාවන්ගෙන් ලැබෙන ආදායම සේවාව සැපයූ කාලසීමාව තුළ හඳුනාගනු ලබන අතර කාර්ය හෝ ගනුදෙනුව සම්පූර්ණ කිරීමේ පදනම සහ සත්‍ය වශයෙන්මසපයන ලද සේවාව මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

**පොලී ආදායම**

ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ. ප්‍රදානය කල ණය මුදලක් හෝ ලැබිය යුතු ආදායමෙන් ණය මුදලක් හානිකරණය සිදු වූ විට, ශ්‍රී ලංකා වරාය අධිකාරි එහි ධාරණ අගය ප්‍රතිලාභ්‍ය අගයට අඩු කරන අතර එය ලේඛනයේ මූලික ක්‍රියාකාරී පොලී අනුපාතයට අඩුකල අනාගත මුදල් ප්‍රවාහය වශයෙන් එහි ධාරණ අගය ලැබිය යුතු අගයට

අඩුකර පොලී අනුපාතිකය වශයෙන් වට්ටම අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. හානිකරණ ණය මත පොලී ආදායම හා ලැබීම් මූලික ක්‍රියාත්මක පොලී අනුපාතය භාවිතා කරමින් හඳුනාගනු ලැබේ. බැංකු ශේෂ හා බැංකු තැන්පතු මත ලැබෙන පොලිය උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

**බදු කුලී ආදායම**

මෙහෙයුම් කල්බදු යටතේ ලැබෙන බදු ආදායම, අසම්භාව්‍ය බදු ආදායම ලැබෙන අවස්ථාවලදී හඳුනාගන්නා බදු ආදායම හැර, බදු කාලසීමාව මත සෘජු රේඛීය පදනම මත හඳුනාගනු ලැබේ. බදු කාලසීමාව යනු බදු ගිවිසුමේ දක්වා ඇති ස්ථාවර කාලසීමව සහ එය තවදුරටත් දීර්ඝ කල හැකි කාලසීමාව වන අතර ඒ සඳහා බදුකරුහට මෙම බදු ගිවිසුව අඛණ්ඩව පවත්වා ගෙන යෑමේ විකල්පය පවතින අතර, කල්බදු ගිවිසුම ආරම්භයේදී බදුකරු විසින් මෙම විකල්පය භාවිතයට ගනු ලබන බවට අධ්‍යක්ෂකරුන් හේතු සහිතව සහතික වේ. බදු ගිවිසුම් අවසන් කිරීම සඳහා ලැබෙන වාරික ලැබෙන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මගින් හඳනාගනු ලැබේ.

**ලාභාංශ ආදායම**

ලාභාංශ ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ ස්ථිතිය වෙන ලැබී, ලාභාංශයේ මුදල් ප්‍රමාණය විශ්වාසනීයත්වයෙන් යුතුව ගණනය කිරීමේ ප්‍රවාණතාවයක් ඇති වී ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

**රාජ්‍යභාග ආදායම**

ආදාළ ගිවිසුමේ අඩංගු කරුණු ප්‍රකාරව, සහ රාජ්‍ය භාග ආදායමට අදාළ ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ලැබීමේ සම්භාවිතාවක් ඇති බව සහ ආදායම විශ්වාසනීය ලෙස ගණනය කල හැකි වීම අනුව රාජ්‍ය භාගය හඳුනාගනු ලැබේ.

**දේපළ, පිරියත සහ උපකරණ විකුණා බැහැර කිරීමෙන් ලබන ලාභ සහ පාඩු**

දේපළ, පිරියත හා උපකරණ විකුණා බැහැර කිරීමෙන් ලබන ශුද්ධ ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කර ඇත්තේ විකුණා බැහැර කිරීමෙන් ලබන ආදායම, වත්කම්හි ධාරණ අගය සහ අදාළ විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය.

## 2.20 වියදම්

මෙහෙයුම් සඳහා දරණු ලබන සියළුම වියදම් ගිණුම් වාර්තාකරණ කාල පරිච්ඡේදයේ ආදායමට එකතු කර ඇත.

## 2.21 වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසුව සිදුවන කරුණු.

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදු වූ සියළුම ප්‍රමාණාත්මක කරුණු සැලකිල්ලට ගෙන සුදුසු ගැලපුම් / හෝ අනාවරණ, මූල්‍ය ප්‍රකාශණයේ අදාළ සටහන් වල දක්වා ඇත.

## 2.22 වගකීම්

වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේදී සියළුම ප්‍රමාණාත්මක වගකීම් හඳුනාගෙන ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශනයේ සටහන් මගින් අනාවරණය කර ඇත.

## 2.23 විශේෂ ගිණුම් ඇස්තමේන්තු සහ නිගමන

මූල්‍යමය ප්‍රකාශන සකස් කිරීමේ දී, කළමනාකාරීත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම පිළිබඳව නිගමන, ඇස්තමේන්තු සහ උපකල්පනයන් ගණනාවක් පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

**2.23.1 මූල්‍යමය ප්‍රකාශන වලට වඩා වැදගත් බලපෑමක් සිදු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාළ කර ගැනීමේදී ගනු ලබන විශේෂ විනිශ්චයන් පහත දැක්වෙන අයුරු වේ.**

**(අ) විලම්භිත බදු වත්කම් හඳුනාගැනීම**

විලම්භිත බදු වත්කම් හඳුනාගත හැකි ප්‍රමාණය කොතෙක්ද යන්න, අනාගත බදු අයකල හැකි ආදායමෙහි සම්භාවිතාවය මත පදනම් වේ.

**2.23.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම මත විශේෂ බලපෑමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත:**

**(අ) ක්ෂය කළ හැකි වත්කම් වල ඵලදායී ජීවකාලය**

එක් එක් වාර්තාකරණ දිනයේදී වත්කම් වල අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත පදනම්ව ක්ෂය කළ හැකි වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ ඇස්තමේන්තුව කළමනාකරණය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව, මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණික උපකරණ වල උපයෝගීතාව වෙනස් කළ හැකි තාක්ෂණික යල් පැනීම් වලට අදාළව සිදු වේ.

**(ආ) සේවක ප්‍රතිලාභ සැලැස්ම**

සේවක ප්‍රතිලාභ සැළැස්මේ වගකීම් වල වර්තමාන වටිනාකම සාධක ගණනාවක් මත රඳා පවතී. මෙය නිර්ණය කරනු ලබන්නේ උපකල්පන ගණනාවක් භාවිතා කරමින් කරනු ලබන ආයුගණක පදනම මත ය. වට්ටම් ඇතුළුව සේවක ප්‍රතිලාභ සැලැස්මෙහි ශුද්ධ පිරිවැය සහ වගකීම නිර්ණය කිරීමේදී මෙම උපකල්පනයන් භාවිතා කෙරේ. මෙම උපකල්පනයන්ගේ යම් වෙනස් වීමක් සේවක ප්‍රතිලාභ වගකීමේ ධාරණ අගයට බලපෑමක් ඇති වේ.

## 2.24 කාලගුණික තත්ත්වයන් ආශ්‍රිත හෙළිදරව් කිරීම්

පාරිභෝගික භාණ්ඩ හා පුළුල් පරාසයකින් යුත් වෙළෙඳ භාණ්ඩ ඇතුළත් බහළුම්ගත තොග නැව්භාණ්ඩ ප්‍රවාහනය හා තෙල් නැව් මගින් රසායනික ද්‍රව්‍ය හා ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැදගත් කාර්යයන් තුළ ඇතුළත් වේ. එබැවින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වායු විමෝචනය අඩු කිරීම, හරිත වරාය යටිතල පහසුකම්, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ තිරසර සේවා සැපයුම් සංවර්ධන ක්‍රියාවලියෙහි යෙදී සිටී. තවද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යටිතල පහසුකම් උස් මුහුදු රළ වලින් හා අතිශය අයහපත් කාලගුණික සිදුවීම්වල බලපෑම්වලින් ආරක්ෂා කිරීමට අවදානම් කළමනාකරණ පියවර ගෙන ඇත.

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**3 දේපළ, පිරියත හා උපකරණ**

| සමූහය | 2024 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම්) | ප්‍රතිවර්ගීකරණය /ගැලපුම | 2024 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| **3.1 පිරිවැයට** | | | | | |
| ඉඩම් | 96,984,096,068 | 60,491,801 | - | (805,740) | 97,043,782,129 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ | 136,198,938,782 | 2,867,571,917 | - | (9,392,000) | 139,057,118,699 |
| පාවෙන උපකරණ | 9,049,268,114 | 11,217,501 | (643,478) | 130,000 | 9,059,972,137 |
| මෙහෙයුම් උපකරණ | 27,919,717,116 | 22,332,369,442 | (1,341,146,200) | (40,000) | 48,910,900,359 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 1,195,600,104 | 93,226,916 | (4,493,489) | - | 1,284,333,531 |
| කාර්යාල හා සුහසාධන ගොඩනැගිලි | 1,457,957,100 | - | - | 9,392,000 | 1,467,349,100 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | 461,048,717 | - | - | - | 461,048,717 |
| පරිගණක දෘඩාංග | 780,887,593 | 39,584,611 | (360,000) | (63,699,666) | 756,412,539 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 3,239,168,998 | 112,727,901 | (1,132,157) | - | 3,350,764,742 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | 241,398,167 | 14,802,742 | (2,785,685) | - | 253,415,223 |
| මෝටර් රථ | 1,277,860,753 | - | (26,610,364) | 160,000 | 1,251,410,389 |
| වෙනත් වත්කම් | 561,755,846 | 21,736,302 | (148,623,833) | (120,000) | 434,748,315 |
| | **279,367,697,358** | **25,553,729,134** | **(1,525,795,207)** | **(64,375,406)** | **303,331,255,879** |

| **3.1.1ක්ෂය** | 2023 ජනවාරි 01 දිනට | වර්ෂය තුළ වෙනස් වීම් | (බැහැර කිරීම්) | ප්‍රතිවර්ගීකරණය /ගැලපුම | 2023 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ | 43,050,957,565 | (95,400,719) | - | (2,199,168,815) | 40,756,388,031 |
| පාවෙන උපකරණ | 6,056,063,495 | 312,000,931 | (616,164) | 129,870 | 6,367,578,131 |
| මෙහෙයුම් උපකරණ | 17,526,071,192 | 1,983,714,798 | (1,339,805,054) | (45,371) | 18,169,935,564 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 833,809,201 | 50,151,709 | (4,483,470) | 1,097 | 879,478,537 |
| කාර්යාල හා සුහසාධන ගොඩනැගිලි | 480,813,776 | 60,077,817 | - | 5,859,594 | 546,751,187 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | 295,680,343 | 12,694,553 | - | - | 308,374,896 |
| පරිගණක දෘඩාංග | 486,176,686 | 72,492,340 | (359,640) | (63,508,018) | 494,801,368 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 2,580,500,874 | 50,288,058 | (1,131,025) | 10,728 | 2,629,668,634 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | 187,409,628 | 14,899,960 | (2,782,900) | 24,904 | 199,551,594 |
| මෝටර් රථ | 833,151,224 | 78,525,701 | (26,583,753) | 159,840 | 885,253,011 |
| වෙනත් වත්කම් | 451,802,845 | 1,786,555 | (148,475,210) | (114,469) | 304,999,721 |
| | **72,782,436,827** | **2,541,231,702** | **(1,524,237,216)** | **(2,256,650,640)** | **71,542,780,673** |

| **3.1.2 ඉදිරියට ගෙන යන ලද ශුද්ධ වත්කම්** | | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| **දේපළ, පිරියත හා උපකරණ** | | | |
| ඉඩම් | | 97,043,782,129 | 96,984,096,068 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ | | 98,300,730,668 | 93,147,981,217 |
| පාවෙන උපකරණ | | 2,692,394,006 | 2,993,204,619 |
| මෙහෙයුම් උපකරණ | | 30,740,964,795 | 10,393,645,925 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | 404,854,994 | 361,790,903 |
| කාර්යාල හා සුහසාධන ගොඩනැගිලි | | 920,597,913 | 977,143,325 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | | 152,673,822 | 165,368,375 |
| පරිගණක දෘඩාංග | | 261,611,171 | 294,710,908 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | | 721,096,108 | 658,668,124 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | | 53,863,630 | 53,988,538 |
| මෝටර් රථ | | 366,157,378 | 444,709,529 |
| වෙනත් වත්කම් | | 129,748,594 | 109,953,001 |
| | | **231,788,475,206** | **206,585,260,530** |
| **නොනිමි ප්‍රාග්ධන වැඩ** | **(සටහන 3.3)** | 81,979,417,327 | 65,507,364,120 |
| | | **313,767,892,534** | **272,092,624,650** |

| සමූහය | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ නිරවුල් කිරීමේ ගිණුම | - | 113,401,865 |
| | **-** | **113,401,865** |
| | **313,767,892,534** | **272,206,026,515** |

1. රු. 65,062,022.07 ක වටිනාකමින් යුත් වත්කම් ආගමික ස්ථානවල භාවිතයේ යොදවා ඇත.
2 වත්කම් ලේඛනයට අනුව 2024.12.31 දින වන භාවිතයේ පවතින පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්වල මුළු වටිනාකම රු. 8,158,176,438.72 කි.
3. පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලයේ සමාලෝචනය තක්සේරු වෙනස්වීමක් ලෙස ගැලපුම් කරන ලද අතර , එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවර්තන වර්ෂයේ ක්ෂය රු. 2,910,297,794 කි.

4 අන්තර් වරාය වත්කම් පැවරුම් වල විස්තර පහත දැක්වෙන පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | කොළඹ | ත්‍රිකුණාමලය | ගාල්ල |
|---|---|---|---|
| පාවෙන උපකරණ | (12,000,000.00) | 2,700,000.00 | 9,300,000.00 |
| පරිගණක දෘඩාංග | (4,044,680) | 424,900 | 3,619,780 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | (1,464,771) | 664,475 | 800,297 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | (112,500) | - | 112,500 |
| මෝටර් රථ | (75,000) | 75,000 | - |
| වෙනත් වත්කම් | (6,750) | - | 6,750 |
| **මුළු එකතුව** | **(17,703,701)** | **3,864,375** | **13,839,327** |

වත්කම් ප්‍රතිවර්ගීකරණ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

| වත්මන් කාණ්ඩය | ප්‍රතිවර්ගීකරණය කරන ලද්දේ | මුදල (රු.) |
|---|---|---|
| ඉඩම් | ආයෝජන වත්කම් - ඉඩම් | 805,740 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ | කාර්යාල හා සුහසාධන ගොඩනැගිලි | 9,392,000 |
| මෙහෙයුම් උපකරණ | මෝටර් රථ | 160,000 |
| පරිගණක දෘඩාංග හා මෘදුකාංග | අස්පෘෂ්‍ය වත්කම් | 63,699,666 |
| වෙනත් වත්කම් | මෙහෙයුම් උපකරණ | 120,000 |

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**3 දේපළ, පිරියත සහ උපකරණ**

| ශ්‍රීලවඅ | 2024 දෙසැම්බර් 31 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම්) | ප්‍රතිවර්ගීකරණය /ගැලපුම | 2024 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| **3.1 පිරිවැය** | | | | | |
| ඉඩම් | 96,984,096,068 | 60,491,801 | - | (805,740) | 97,043,782,129 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ | 136,196,328,488 | 2,867,571,917 | - | (9,392,000) | 139,054,508,405 |
| පාවෙන උපකරණ | 9,049,268,114 | 11,217,501 | (643,478) | 130,000 | 9,059,972,137 |
| මෙහෙයුම් උපකරණ | 27,919,717,116 | 22,332,369,442 | (1,341,146,200) | (40,000) | 48,910,900,359 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 1,107,504,449 | 58,439,501 | (4,493,489) | - | 1,161,450,461 |
| කාර්යාල හා සුහසාධන ගොඩනැගිලි | 1,457,957,100 | - | - | 9,392,000 | 1,467,349,100 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | 461,048,717 | - | - | - | 461,048,717 |
| පරිගණක දෘඩාංග | 772,177,146 | 39,086,813 | (360,000) | (63,699,666) | 747,204,293 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 3,239,168,998 | 112,727,901 | (1,132,157) | - | 3,350,764,742 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | 210,361,941 | 12,194,123 | (2,785,685) | - | 219,770,379 |
| මෝටර් රථ | 1,215,697,324 | - | (26,610,364) | 160,000 | 1,189,246,960 |
| වෙනත් වත්කම් | 561,755,846 | 21,736,302 | (148,623,833) | (120,000) | 434,748,315 |
| | **279,175,081,307** | **25,515,835,302** | **(1,525,795,207)** | **(64,375,406)** | **303,100,745,997** |

| 3.1.1 ක්ෂය | 2024 දෙසැම්බර් 31 දිනට | වර්ෂය තුළ වෙනස් වීම් | (බැහැර කිරීම්) | ප්‍රතිවර්ගීකරණය /ගැලපුම | 2024 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ | 43,050,908,696 | (95,449,588) | - | (2,199,168,815) | 40,756,290,293 |
| පාවෙන උපකරණ | 6,056,063,495 | 312,000,931 | (616,164) | 129,870 | 6,367,578,131 |
| මෙහෙයුම් උපකරණ | 17,526,071,192 | 1,983,714,798 | (1,339,805,054) | (45,371) | 18,169,935,564 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 797,620,498 | 41,994,385 | (4,483,470) | 1,097 | 835,132,510 |
| කාර්යාල හා සුහසාධන ගොඩනැගිලි | 480,813,776 | 60,077,817 | - | 5,859,594 | 546,751,187 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | 295,680,343 | 12,694,553 | - | - | 308,374,896 |
| පරිගණක දෘඩාංග | 480,027,130 | 71,510,433 | (359,640) | (63,508,018) | 487,669,905 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 2,580,500,874 | 50,288,058 | (1,131,025) | 10,728 | 2,629,668,634 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | 173,281,551 | 10,534,185 | (2,782,900) | 24,904 | 181,057,741 |
| මෝටර් රථ | 801,812,711 | 74,320,106 | (26,583,753) | 159,840 | 849,708,903 |
| වෙනත් වත්කම් | 451,802,845 | 1,786,555 | (148,475,210) | (114,469) | 304,999,721 |
| | **72,694,583,110** | **2,523,472,232** | **(1,524,237,216)** | **(2,256,650,640)** | **71,437,167,486** |

| 3.1.2 ඉදිරියට ගෙන යන ලද ශුද්ධ වත්කම් | | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| **දේපළ, පිරියත හා උපකරණ** | | | |
| ඉඩම් | | 97,043,782,129 | 96,984,096,068 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ | | 98,298,218,112 | 93,145,419,791 |
| පාවෙන උපකරණ | | 2,692,394,006 | 2,993,204,619 |
| මෙහෙයුම් උපකරණ | | 30,740,964,795 | 10,393,645,925 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | 326,317,951 | 309,883,950 |
| කාර්යාල හා සුහසාධන ගොඩනැගිලි | | 920,597,913 | 977,143,324 |
| කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි | | 152,673,822 | 165,368,375 |
| පරිගණක දෘඩාංග | | 259,534,388 | 292,150,016 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | | 721,096,108 | 658,668,124 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | | 38,712,638 | 37,080,391 |
| මෝටර් රථ | | 339,538,057 | 413,884,613 |
| වෙනත් වත්කම් | | 129,748,594 | 109,953,001 |
| | | **231,663,578,511** | **206,480,498,196** |
| **නොනිමි ප්‍රාග්ධන වැඩ** | **(සටහන 3.3)** | 81,979,417,327 | 65,507,364,120 |
| | | **313,642,995,838** | **271,987,862,316** |

| ශ්‍රීලවඅ | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ නිරවුල් කිරීමේ ගිණුම | | 113,401,865 |
| | - | **113,401,865** |
| | **313,642,995,838** | **272,101,264,181** |

1. රු. 65,062,022.07 ක වටිනාකමින් යුත් වත්කම් ආගමික ස්ථානවල භාවිතයේ යොදවා ඇත.
2 වත්කම් ලේඛනයට අනුව 2024.12.31 දින වන භාවිතයේ පවතින පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්වල මුළු වටිනාකම රු. 8,158,176,438.72 කි.
3. පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලයේ සමාලෝචනය තක්සේරු වෙනස්වීමක් ලෙස ගැලපුම් කරන ලද අතර , එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවර්තන වර්ෂයේ ක්ෂය රු. 2,910,297,794 කි.

4අන්තර් වරාය වත්කම් පැවරුම් වල විස්තර පහත දැක්වෙන පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | කොළඹ | ත්‍රිකුණාමලය | ගාල්ල |
|---|---|---|---|
| පාවෙන උපකරණ | (12,000,000) | 2,700,000 | 9,300,000 |
| පරිගණක දෘඩාංග | (4,044,680) | 424,900 | 3,619,780 |
| විදුලි හා විද්‍යුත් උපකරණ | (1,464,771) | 664,475 | 800,297 |
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ | (112,500) | - | 112,500 |
| මෝටර් රථ | (75,000) | 75,000 | - |
| වෙනත් වත්කම් | (6,750) | - | 6,750 |
| **මුළු එකතුව** | **(17,703,701)** | **3,864,375** | **13,839,327** |

4.වත්කම් ප්‍රතිවර්ගීකරණ විස්තර පහත දැක්වෙන පරිදි වේ .

| වත්මන් කාණ්ඩය | ප්‍රතිවර්ගීකරණය කරන ලද්දේ | මුදල (රු.) |
|---|---|---|
| ඉඩම් | ආයෝජන වත්කම් - ඉඩම් | 805,740.00 |
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ | කාර්යාල හා සුහසාධන ගොඩනැගිලි | 9,392,000 |
| මෙහෙයුම් උපකරණ | මෝටර් රථ | 160,000 |
| පරිගණක දෘඩාංග හා මෘදුකාංග | අස්පෘශ්‍ය වත්කම් | 63,699,666 |
| වෙනත් වත්කම් | මෙහෙයුම් උපකරණ | 120,000 |

**3.2 කල්බදු වත්කම්**

| සමූහය /ශ්‍රීලවඅ | 2024 දෙසැම්බර් 31 දිනට | එකතු කිරීම් | (බැහැර කිරීම්) | 2024 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| පිරිවැය | 95,948,157 | - | | 95,948,157 |
| ක්ෂය | 37,462,687 | 11,332,228 | | 48,794,915 |

| | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| ශුද්ධ ධාරණ අගය | **47,153,242** | **58,485,470** |

වසර 05 ක් සඳහා මූල්‍ය කල්බදු යටතේ ලබා ගන්නා ලද වත්කම් ඉහතින් නිරූපනය වේ.

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**3.3 නොනිමි ප්‍රාග්ධන වැඩ**

| | ශ්‍රීලවඅ | | | | සමූහය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2024 දෙසැම්බර් 31** | **වර්ෂය තුළ** | **මාරු කිරීම්** | **2024 දෙසැම්බර් 31** | **2024 ජනවාරි 01** | **වර්ෂය තුළ** | **මාරු කිරීම්** | **2024 දෙසැම්බර් 31** |
| **සමූහය /ශ්‍රීලවඅ** | දිනට | වැය කරන ලද/ ගැලපුම් | | දිනට | දිනට | වැය කරන ලද/ ගැලපුම් | | දිනට |
| කොළඹ වරාය සංවර්ධනය | 599,344,022 | 272,691,569 | (492,091,711) | 379,943,880 | 599,344,022 | 272,691,569 | (492,091,711) | 379,943,880 |
| JCT V ව්‍යාපෘතිය | 4,753,514,623 | 1,964,616,935 | (500,000) | 6,717,631,558 | 4,753,514,623 | 1,964,616,935 | (500,000) | 6,717,631,558 |
| කන්කසන්තුරය වරායේ සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය | 227,779,478 | 18,391,166 | (62,074,562) | 184,096,082 | 227,779,478 | 18,391,166 | (62,074,562) | 184,096,082 |
| ගාල්ල වරාය | 39,182,668 | - | - | 39,182,668 | 39,182,668 | - | - | 39,182,668 |
| ත්‍රිකුණාමලය වරාය | 235,033,058 | 142,671,329 | (5,019,200) | 372,685,187 | 235,033,058 | 142,671,329 | (5,019,200) | 372,685,187 |
| වරාය නගර සංවර්ධනය | 2,924,107 | - | - | 2,924,107 | 2,924,107 | - | - | 2,924,107 |
| ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම (දේශීය) | 949,050 | - | - | 949,050 | 949,050 | - | - | 949,050 |
| නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය කිරීම | 16,204,791,683 | 13,479,519,579 | (729,545,552) | 28,954,765,710 | 16,204,791,683 | 13,479,519,579 | (729,545,552) | 28,954,765,710 |
| මෙහෙයුම් ගොඩනැගිලි සංවර්ධනය කිරීම - ECT | 176,111,215 | 673,151,485 | - | 849,262,700 | 176,111,215 | 673,151,485 | - | 849,262,700 |
| පර්යන්ත කළමනාකරණ පද්ධතිය - ECT | | 1,948,243,407 | - | 1,948,243,407 | | 1,948,243,407 | - | 1,948,243,407 |
| මෙහෙයුම් උපකරණ සංවර්ධනය කිරීම - ECT | 41,849,752,569 | 22,715,147,285 | (22,197,430,931) | 42,367,468,923 | 41,849,752,569 | 22,715,147,285 | (22,197,430,931) | 42,367,468,923 |
| හම්බන්තොට වරාය | | 114,078,199 | - | 114,078,199 | | 114,078,199 | - | 114,078,199 |
| ලද ප්‍රදාන වලින් ඉදිකළ වැඩහල් ගොඩනැගිලි සංකීර්ණය (සටහන 60) | 1,417,981,646 | 249,111,573 | (1,618,907,363) | 48,185,855 | 1,417,981,646 | 249,111,573 | (1,618,907,363) | 48,185,855 |
| | **65,507,364,120** | **41,577,622,527** | **(25,105,569,320)** | **81,979,417,327** | **65,507,364,120** | **41,577,622,527** | **(25,105,569,320)** | **81,979,417,327** |

නොනිමි වැඩ ප්‍රතිපත්තිය "වැඩ නිම කිරීමේ සහතිකය අදාළ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල පසු නොනිමි වැඩ ගිණුම්වල පිරිවැය යෙදවුම් ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ." මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වල 2.5.1 යටතේ අනාවරණය කර ඇත.

නැගෙනහිර බහළු පර්යන්තයේ, පර්යන්ත කළමනාකරණ පද්ධතියේ රු. 1,948,243,407/- ක මුදල සහ හම්බන්තොට වරායේ රු. 113,159,199 ක මුදල පිළිවෙලින් අස්පෘශ්‍ය වත්කම් නිශ්කාෂන ගිණුමෙන් සහ ඉඩම් නිශ්කාෂන ගිණුමෙන් නොනිමි වැඩ ගිණුම වෙත ගැලපුමක් ලෙස මාරු කර ඇත . තවද, රු. 919,000 ක මුදල කන්කසන්තුරය වරාය සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ගිණුමෙන් හම්බන්තොට වරාය වෙත නොනිමි වැඩ ගිණුම වෙත ගැලපුමක් ලෙස මාරු කර ඇත .

| | **2024 ජනවාරි 01** | **එකතු කිරීම්** | **(බැහැර කිරීම්)** | **ගැලපුම්** | **2024 දෙසැම්බර් 31** |
|---|---|---|---|---|---|
| **සමූහය** | දිනට | | | | දිනට |
| **4.1 පිරිවැයට** | | | | | |
| පරිගණක මෘදුකාංග | 2,021,759,649 | 129,762,641 | - | 63,699,666 | 2,215,221,956 |
| **එකතුව** | **2,021,759,649** | **129,762,641** | **-** | **63,699,666** | **2,215,221,956** |
| | **2024 ජනවාරි 01** | **වර්ෂය තුළ** | | | **2024 දෙසැම්බර් 31** |
| | දිනට | වෙනස් වීම් | | | දිනට |
| **4.2 ක්‍රමක්ෂය** | | | | | |
| පරිගණක මෘදුකාංග | 1,346,173,581 | 191,179,022 | - | 63,519,545 | 1,600,872,149 |
| **එකතුව** | **1,346,173,581** | **191,179,022** | **-** | | **1,600,872,149** |

| | **2024 දෙසැම්බර් 31** | **2023දෙසැම්බර් 31** |
|---|---|---|
| **4.3 ශුද්ධ ධාරණ අගය** | දිනට | දිනට |
| පරිගණක මෘදුකාංග | **614,349,807** | **675,586,068** |
| **අස්පෘශ්‍ය වත්කම් නිරවුල් කිරීමේ ගිණුම** | - | 2,037,108,286 |
| | **614,349,807** | **2,712,694,354** |

**4 අස්පෘශ්‍ය වත්කම්**

| | **2024 ජනවාරි 01** | **එකතු කිරීම්** | **(බැහැර කිරීම්)** | **ගැලපුම්** | **2024 දෙසැම්බර් 31** |
|---|---|---|---|---|---|
| **ශ්‍රීලවඅ** | දිනට | | | | දිනට |
| **4.1 පිරිවැයට** | | | | | |
| පරිගණක මෘදුකාංග | 2,020,941,949 | 129,539,758 | - | 63,699,666 | 2,214,181,373 |
| **එකතුව** | **2,020,941,949** | **129,539,758** | **-** | **63,699,666** | **2,214,181,373** |
| | **2024 ජනවාරි 01** | **වර්ෂය තුළ** | | | **As At** |
| | දිනට | වෙනස් වීම් | | | දිනට |
| **4.2 ක්‍රමක්ෂය** | | | | | |
| පරිගණක මෘදුකාංග | 1,346,071,464 | 191,095,182 | - | 63,519,545 | 1,600,686,192 |
| **එකතුව** | **1,346,071,464** | **191,095,182** | **-** | **63,519,545** | **1,600,686,192** |

| | **2024 දෙසැම්බර් 31** | **2023 දෙසැම්බර් 31** |
|---|---|---|
| **4.3 ශුද්ධ ධාරණ අගය** | දිනට | දිනට |
| පරිගණක මෘදුකාංග | **613,495,181** | **674,870,485** |
| අස්පෘශ්‍ය වත්කම් නිරවුල් කිරීමේ ගිණුම | | 2,037,108,286 |
| | **613,495,182** | **2,711,978,772** |

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | | 2024 ජනවාරි 01 දිනට | මාරු කරන ලද/ ප්‍රතිවර්ගීකරණය කරන ලද | එකතු කිරීම්/ ගැලපුම් | (බැහැර කිරීම්) | 2024 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|---|
| 5 | අයෝජන දේපළ සමූහය/අධිකාරිය | | | | | |
| | 5.1 පිරිවැයට | | | | | |
| | ඉඩම් | 88,296,732,113 | - | 805,740 | - | 88,297,537,853 |
| | ගොඩනැගිලි | 143,673,330,904 | - | - | - | 143,673,330,904 |
| | **එකතුව** | **231,970,063,017** | **-** | **805,740** | **-** | **231,970,868,757** |

| | 2024 ජනවාරි 01 දිනට | මාරු කරන ලද/ ප්‍රතිවර්ගීකරණය කරන | වර්ෂය තුළ ගැලපුම්/ එකතු කිරීම් | (බැහැර කිරීම්) | 2024 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|---|
| 5.1.1 ක්ෂය | | | | | |
| ගොඩනැගිලි | 20,082,557,996 | - | 1,323,261,434 | - | 21,405,819,430 |
| **එකතුව** | **20,082,557,996** | **-** | **1,323,261,434** | **-** | **21,405,819,430** |

| | 2024 දෙසැම්බර් 31 දිනට | 2023 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| 5.1.2 ශුද්ධ ධාරණ අගය | | |
| ඉඩම් | 88,297,537,853 | 88,296,732,113 |
| ගොඩනැගිලි | 122,267,511,474 | 123,590,772,908 |
| | **210,565,049,327** | **211,887,505,020** |
| | **210,565,049,327** | **211,887,505,020** |

රු. 805,740 ක් වටිනා ඉඩම, දේපළ, පිරියත හා උපකරණ ගිණුමෙන් ආයෝජන දේපළක් ලෙස හඳුනාගන්නා ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ට අනුව (ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තු හා දෝෂ වෙනස් කිරීම්) ගැලපුම් සිදු කරන ලදී.

වර්ෂය සඳහා අය කිරීම්/ ගැලපුම් මුදල වන රු. 1,323,261,434 ක මුදල තුළ වර්ෂයේ ක්ෂය මුදල වන රු. 1,323,261,434 ක් වේ.

| 6 | පරිපාලිත සමාගම්හි ආයෝජන | | | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2024 | 2023 | 2024 | 2023 |
| | ලැයිස්තුගත නොකල | කොටස් ප්‍රමාණය | සමාගම් කොටස්% | | | | |
| | සී/ස ජයබහළු පර්යන්ත සමාගම | 100,000 | 100% | - | - | 1,000,000 | 1,000,000 |
| | මාගම්පුර වරාය කළමනාකරණ සමාගම (සටහන 17) | 7,500,000 | 100% | 75,000,000 | 75,000,000 | 75,000,000 | 75,000,000 |
| | MPMCS හි හානිකරණය 100% | | | (75,000,000) | (75,000,000) | (75,000,000) | (75,000,000) |
| | ලංකා ගැස් ටර්මිනල් පුද්ගලික සමාගම | 1 | 100% | | | 100 | 100 |
| | ලංකා ගැස් ටර්මිනල්හි හානිකරණය 100% | | | | | (100) | |
| | | | | - | - | **1,000,000** | **1,000,100** |

ලංකා ගැස් ටර්මිනල් (පුද්.) සමාගම ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බැවින් අදාළ ක්‍රියාපටිපාටිය අනුගමනය කර එය ගිණුම්වලින් ඉවත් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ට අනුව, වත්කමකින් ලැබෙන සත්‍ය මුදල් ප්‍රවාහය මත ශුද්ධ ලාභ හෝ පාඩු, වෙන්කළ මුදලට වඩා සැලකිය යුතු ලෙස අඩුවන විට පරිපාලිත සමාගමක ආයෝජන සඳහා හානිකරණ ප්‍රතිපාදන සැලසිය යුතු වේ. ඒ අනුව, සී/ස මාගම්පුර වරාය කළමනාකරණ සමාගම අඛණ්ඩව පාඩු ලබන පරිපාලිත සමාගමක් වන අතර එයින් ඍණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් පෙන්නුම් කරයි. එබැවින්, එම සමාගම සඳහා 100% ක හානිකරණ ප්‍රතිපාදන සැලසීම සිදු කරනු ලැබේ.

| 7 | ආශ්‍රිත සමාගම් වල ආයෝජන | | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|---|
| | | | 2024 | 2023 | 2024 | 2023 |
| | ලැයිස්තුගත නොකල | | | | | |
| | සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම | (සටහන 7.1.1) | **84,687,038** | **82,837,560** | **40,030** | **40,030** |
| | හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම | (සටහන 7.1.2) | **35,401,378,815** | **35,977,752,990** | **39,196,080,000** | **39,196,080,000** |
| | | | **35,486,065,853** | **36,060,590,549** | **39,196,120,030** | **39,196,120,030** |
| | **7.1 ආශ්‍රිත සමාගම්හි ආයෝජන වෙනස්වීම්** | | | | | |
| | **7.1.1 සී/ස වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම** | | | | | |
| | **ජනවාරි 01 දිනට ශේෂය** | | **82,837,560** | **82,510,123** | **40,030** | **40,030** |
| | ආශ්‍රිත සමාගම්හි කොටස් වල ශුද්ධ ප්‍රතිඵල | | 3,509,305 | 963,451 | - | - |
| | ස්කන්ධ ගිණුම් ආයෝජිතයින්ගේ වෙනත් විස්තීර්ණ ආදායම් වල කොටස් | | (1,659,827) | (636,014) | | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **84,687,038** | **82,837,560** | **40,030** | **40,030** |
| | **7.1.2 සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම** | | | | | |
| | **ජනවාරි 01 දිනට ශේෂය** | | **35,977,752,990** | **36,622,339,130** | **39,196,080,000** | **39,196,080,000** |
| | ආශ්‍රිත සමාගම්හි කොටස් වල ශුද්ධ ප්‍රතිඵල | | (576,374,175) | (641,654,625.57) | - | - |
| | ස්කන්ධ ගිණුම් ආයෝජිතයින්ගේ වෙනත් විස්තීර්ණ ආදායම් වල කොටස් | | - | (2,931,515.52) | | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **35,401,378,815** | **35,977,752,990** | **39,196,080,000** | **39,196,080,000** |
| | **ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගමේ එකතුව** | | | | | |
| | **ජනවාරි 01 දිනට ශේෂය** | | **36,060,590,549** | **36,704,849,252** | **39,196,120,030** | **39,196,120,030** |
| | ආශ්‍රිත සමාගම්හි කොටස් වල ශුද්ධ ප්‍රතිඵල | | (572,864,870) | (640,691,175) | - | - |
| | ස්කන්ධ ගිණුම් ආයෝජිතයින්ගේ වෙනත් විස්තීර්ණ ආදායම් වල කොටස් | | (1,659,827) | (3,567,529.35) | | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **35,486,065,852** | **36,060,590,549** | **39,196,120,030** | **39,196,120,030** |

**7.2 ආශ්‍රිත සමාගම් වල මූල්‍ය ප්‍රතිඵල වල සාරාංශය සහ එහි එකතුවූ වත්කම් සහ වගකීම්**

**සී/ ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම**

| | කොටස් ගණන | දරණ කොටස්වල % | වත්කම් | වගකීම් | ආදායම | ශුද්ධ ලාභය | වෙනත් විස්තීර්ණ ආදායම්වල බලපෑම |
|---|---|---|---|---|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට | 4,003 | 39.97% | 483,866,375 | 345,819,757 | 230,678,775 | 8,779,848 | (4,152,683) |
| 2023 දෙසැම්බර් 31 දිනට | 4,003 | 39.97% | 318,853,572 | 153,482,157 | 117,588,929 | 2,410,435 | (1,591,228) |

**සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් ස**

| | | | වත්කම් | වගකීම් | ආදායම | ශුද්ධ ලාභය | වෙනත් විස්තීර්ණ ආදායම්වල බලපෑම |
|---|---|---|---|---|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට | 3,919,608,000 | 42% | 166,822,737,808 | 704,046,466 | 1,545,584,735 | (1,372,319,465) | - |
| 2023 දෙසැම්බර් 31 දිනට | 3,919,608,000 | 42% | 183,238,640,025 | 522,193,702 | 1,562,092,742 | (1,527,749,108) | (6,979,799) |

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් කාණ්ඩ**

එක් එක් කාණ්ඩයට අයත් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල ධාරණ අගය පහත පරිදි වේ.

**මූල්‍ය වත්කම්**

| **සමූහය/ශ්‍රීලවඅ** | **වෙනත් විස්තීර්ණ ආදායම් මත සාධාරණ අගය** | | **ක්‍රමක්ෂිත පිරිවැය** | |
|---|---|---|---|---|
| | **2024** | **2023** | **2024** | **2023** |
| ලැයිස්තුගත ආයෝජන | 144,069,987 | 110,402,646 | | |
| ලැයිස්තුගත නොකළ ආයෝජන | 76,912,589,032 | 76,857,464,730 | | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | | | 19,921,899,127 | 11,089,182,734 |
| තැන්පතු සහ අත්තිකාරම් | | | 3,098,209,219 | 6,791,524,461 |
| සේවක ණය | | | 63,993,332 | 85,941,018 |
| රජයේ සුරැකුම්පත්වල හා ස්ථාවර තැන්පත්වල ආයෝජන | | | 42,483,328,896 | 80,732,494,008 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 43,316,708,259 | 24,763,454,332 |
| **එකතුව** | **77,056,659,020** | **76,967,867,376** | **108,884,138,833** | **123,462,596,554** |
| **අධිකාරිය** | | | | |
| ලැයිස්තුගත ආයෝජන | 144,069,987 | 110,402,646 | | |
| ලැයිස්තුගත නොකළ ආයෝජන | 76,912,589,032 | 76,857,464,730 | | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | | | 19,922,416,723 | 11,089,593,769 |
| තැන්පතු සහ අත්තිකාරම් | | | 3,098,209,219 | 6,791,524,461 |
| සේවක ණය | | | 7,276,729,261 | 6,299,116,125 |
| රජයේ සුරැකුම්පත්වල හා ස්ථාවර තැන්පත්වල ආයෝජන | | | 41,895,420,510 | 80,732,494,008 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 43,099,960,237 | 24,021,067,891 |
| **එකතුව** | **77,056,659,020** | **76,967,867,376** | **115,292,735,950** | **128,933,796,254** |

| **ක්‍රමක්ෂිත පිරිවැයට ගණනය කරන ලද මූල්‍ය වගකීම්** | **සමූහය** | | **ශ්‍රීලවඅ** | |
|---|---|---|---|---|
| | **2024** | **2023** | **2024** | **2023** |
| **වෙනත් මූල්‍ය වගකීම්** | | | | |
| **ජංගම නොවන ණය** | | | | |
| ශ්‍රී ලංකා රජය | 51,334,904,544 | 63,279,672,079 | 51,334,904,544 | 63,279,672,079 |
| මූල්‍ය ආයතන | 2,140,048,561 | 2,543,183,809 | 2,140,048,561 | 2,469,286,799 |
| මූල්‍ය කල්බදු වගකීම් | - | 9,578,902 | - | 9,578,902 |
| **ජංගම ණය** | | | | |
| ශ්‍රී ලංකා රජය | 6,789,630,405 | 7,821,252,838 | 6,789,630,405 | 7,821,252,838 |
| මූල්‍ය ආයතන | 329,238,237 | 340,539,837 | 329,238,237 | 329,238,237 |
| මූල්‍ය කල්බදු වගකීම් | 9,578,902 | 13,685,710 | 9,578,902 | 10,455,933 |
| වෙළඳ සහ වෙනත් ණයහිමියන් | 3,452,406,257 | 4,180,852,000 | 3,519,743,366 | 4,249,855,218 |
| තැන්පතු සහ ලැබී ඇති අත්තිකාරම් | 10,895,657,574 | 8,383,707,728 | 10,849,364,352 | 8,322,901,251 |
| **එකතුව** | **74,951,464,480** | **86,572,472,902** | **74,972,508,367** | **86,492,241,256** |

| 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | | සමූහය /ශ්‍රීලවඅ 2024 | 2023 |
|---|---|---|---|
| **8 මූල්‍ය වත්කම්වල වෙනත් විස්තීර්ණ ආදායමේ සාධාරණ අගය** | | | - |
| | | | **26,948,431,176** | **25,213,997,620** | **26,678,072,937** | **25,000,475,422** |
| | **අළුත්වැඩියා සහ නඩත්තු වියදම්** | | | | | |
| | වැටුප්, වේතන හා දීමනා | | 4,899,499,970 | 4,510,459,493 | 4,899,499,970 | 4,510,459,493 |
| | අතිකාල | | 2,577,279,447 | 2,149,379,506 | 2,577,279,447 | 2,149,379,506 |
| | ගමන්, යැපීම් හා ඉන්ධන දීමනා | | 5,384,694 | 5,137,194 | 5,384,694 | 5,137,194 |
| | ඉන්ධන, විදුලිය සහ වෙනත් වියදම් | | 140,198,313 | 203,131,773 | 140,198,313 | 203,131,773 |
| | බාහිර කුලී ගාස්තු/ කොන්ත්‍රාත් | | 445,035 | 1,551,800 | 445,035 | 1,551,800 |
| | අළුත්වැඩියා සහ නඩත්තු සඳහා කොන්ත්‍රාත් වැඩ | | 4,724,938 | 344,421 | 4,724,938 | 344,421 |
| | රක්ෂණ හා ආදායම් බලපත්‍ර | | 17,310,874 | 15,133,979 | 17,310,874 | 15,133,979 |
| | මෙහෙයුම් කටයුතු සඳහා නිකුත් කල අමුද්‍රව්‍ය | | 2,032,809,623 | 2,122,232,521 | 2,032,809,623 | 2,122,232,521 |
| | **ක්ෂය** | | 41,335,126 | 81,011,883 | 41,335,126 | 81,011,883 |
| | | | **9,718,988,020** | **9,088,382,571** | **9,718,988,020** | **9,088,382,571** |
| | | | **36,667,419,196** | **34,302,380,190** | **36,397,060,957** | **34,088,857,992** |

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|
| | | 2024 | 2023 | 2024 | 2023 |
| 35 | **වෙනත් මෙහෙයුම් ආදායම්** | | | | |
| | **වෙනත් සේවා - මෙහෙයුම් නොවන** | | | | |
| | නැව්බඩු මෙහෙයුම් උපකරණ හැර වෙනත් උපකරණ සහ පාවෙන යාත්‍රා කුලියට ගැනීම | 6,539,439 | 5,309,449 | 6,539,439 | 5,309,449 |
| | දේශීය පරිභෝජනය සඳහා ජල සැපයුම | 648,537 | 577,011 | 648,537 | 577,011 |
| | දේශීය පරිභෝජනය සඳහා විදුලි සැපයුම | 141,693,891 | 126,724,390 | 141,693,891 | 126,724,390 |
| | දුරකථන ඇමතුම් හා වෛද්‍ය පහසුකම් | 18,172 | 15,657 | 18,172 | 15,657 |
| | පුහුණු කිරීමේ ගාස්තු | 12,096,486 | 154,500 | 12,096,486 | 154,500 |
| | බාහිර පාර්ශ්වයන් සඳහා ඉටු කරන ලද විශේෂ කාර්යයන් | 668,879 | 475,955 | 668,879 | 475,955 |
| | විශේෂිත කාර්යයන් ඉටු කිරීම මගින් ලැබූ ආදායම | 11,625,895 | 1,069,287 | 11,625,895 | 1,069,287 |
| | ඉන්ධන නිකුත් කිරීම (බාහිර පාර්ශ්වයන්) | 211,041,648 | 414,483,256 | 211,041,648 | 414,483,256 |
| | | **384,332,946** | **548,809,506** | **384,332,946** | **548,809,506** |
| | **වරාය දේපළ** | | | | |
| | බදු දුන් ඉඩම් | 6,020,916,488 | 4,034,184,977 | 6,020,916,488 | 4,034,184,977 |
| | රාජ්‍ය භාගය | 7,665,293,223 | 7,709,647,462 | 7,665,293,223 | 7,709,647,462 |
| | නිවාස යෝජනා ක්‍රමයේ කුලිය | 40,674,790 | 18,884,920 | 40,674,790 | 18,884,920 |
| | සංචාරක නිවාඩු නිකේතන වලින් ලද ආදායම | 1,792,956 | 1,791,825 | 1,792,956 | 1,791,825 |
| | ගොඩනැගිලි/ ගුදම් බදු දීමෙන් ලද කුලිය | 104,046,293 | 103,417,590 | 104,046,293 | 103,417,590 |
| | විවිධ | 1,564,003 | 362,792 | 1,564,003 | 362,792 |
| | ලෙජර් සහ ණය පාලන අංශයෙන් නිකුත් කළ බැර පත් | 326,996 | 291,434 | 326,996 | 291,434 |
| | ශ්‍රවනාගාර සහ පන්ති කාමර කුලියට දීමෙන් ලද ආදායම | 384,322 | 246,522 | 384,322 | 246,522 |
| | CWIT සමාගමෙහි විලම්භිත බදු කුලියෙන් ලද පොළිය | 307,023,948 | - | 307,023,948 | - |
| | මුහුදු ප්‍රදේශ කුලියට/ බදු දීමෙන් ලද කුලිය | 7,446,946 | 4,747,790 | 7,446,946 | 4,747,790 |
| | | **14,149,469,966** | **11,873,575,311** | **14,149,469,966** | **11,873,575,311** |
| | **විවිධ** | | | | |
| | ලැබූ ලාභාංශ | 3,481,619,690 | 2,037,252,929 | 3,502,869,690 | 2,058,502,929 |
| | ගොඩබෑම් සහ භාරදීම් බිල්පත්/නැව් භාණ්ඩ වාහක බිල්පත් මත අය කළ දඩ මුදල් සහ අධිභාර | 213,521,096 | 48,695,266 | 213,521,096 | 48,695,266 |
| | හිඟ බිල්පත් මත අධිභාර | 5,117,040 | 6,061,261 | 5,117,040 | 6,061,261 |
| | වත්කම් විකිණීමෙන් ලද ආදයම | | | | |
| | ටෙන්ඩර් විකිණුම් ආදායම | 150,202,552 | 152,051,378 | 150,202,552 | 152,051,378 |
| | සේවක අධිභාර | 67,850 | (29,294) | 67,850 | (29,294) |
| | අහරු බැඳුම්කර අයිතමයන් සහ ණයගැති ශේෂය මත ගාස්තු | 12,025,820 | 27,244,006 | 12,025,820 | 27,244,006 |
| | දඩ මුදල් සහ රක්ෂණ කොමිස් මුදල් | 7,438 | 15,468 | 7,438 | 15,468 |
| | | **3,862,561,486** | **2,271,291,015** | **3,883,811,486** | **2,292,541,015** |
| | ***මධ්‍යම කොට්ඨාශය*** | | | | |
| | වරාය පිවිසුම් බලපත්‍ර | 13,443,791 | 18,923,990 | 13,443,791 | 18,923,990 |
| | තාවකාලික වරාය බලපත්‍ර ගාස්තු | 281,988,358 | 253,831,724 | 281,988,358 | 253,831,724 |
| | වාර්ෂික වාහන බලපත්‍ර සහ තාවකාලික වාහන බලපත්‍ර | 163,516,665 | 145,778,006 | 163,516,665 | 145,778,006 |
| | භාණ්ඩ සැපයුම්කරුවන්ගේ බලපත්‍ර සහ සමීක්ෂණ ගාස්තු | 63,995,351 | 63,242,086 | 63,995,351 | 63,242,086 |
| | වරාය ත්‍රිත්වයෙහි වාප්පු නිශ්කාෂණ නියෝජිතායතන වලට බලපත්‍ර නිකුත් කිරීම | 91,316,859 | 39,970,519 | 91,316,859 | 39,970,519 |
| | වරාය යාත්‍රා සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 2,673,201 | 2,211,593 | 2,673,201 | 2,211,593 |
| | ස්ථාවර වත්කම් බැහැර කිරිම මත ලාභ | 184,534,330 | 10,546,495 | 184,534,330 | 10,546,495 |
| | සුහසාධක බස් කුලියට දීමෙන් ලද ආදායම | 11,743,314 | 7,481,319 | 11,743,314 | 7,481,319 |
| | ආපන ශාලා වලින් ලද ආදායම | 35,700 | 53,500 | 35,700 | 53,500 |
| | විවිධ | 120,580,984 | 181,819,704 | 120,424,272 | 180,260,805 |
| | පොත් සහ ප්‍රකාශන අලෙවිය | 31,160 | 92,420 | 31,160 | 92,420 |
| | වන්දි ලැබීම් | 4,353,305 | 16,988,637 | 4,353,305 | 16,988,637 |
| | ප්‍රදානයන් මගින් ලද ආදායම | 461,337,352 | 1,764,048,077 | 461,337,352 | 1,764,048,077 |
| | කොළඹ තෙල් බැංකුවෙන් ලද ආදායම | 1,308,855,709 | 1,113,336,867 | 1,308,855,709 | 1,113,336,867 |
| | සී අයි සී ටී සමාගමේ පෙර ගෙවුම් ගාස්තු | 103,534,286 | 103,534,286 | 103,534,286 | 103,534,286 |
| | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දාරකාගාරය සඳහා ඇතුලත් වීමේ මාසික/ වාර ගාස්තු | 529,000 | 587,500 | 529,000 | 587,500 |
| | ජල ශාස්ත්‍රීය සමීක්ෂණ කාර්යාලය- උදම් රළ දත්ත (CPCDP) | - | 1,845 | - | 1,845 |
| | ලාෆ් ටර්මිනල් සමාගම විසින් එකවර ගෙවන ලද මුළු වාරිකය | 658,207 | 658,207 | 658,207 | 658,207 |
| | ලංකා ඩිස්ටිලරීස් සමාගම විසින් එකවර ගෙවන ලද මුළු වාරිකය | 10,300,000 | 10,300,000 | 10,300,000 | 10,300,000 |
| | තොරතුරු පිටපත් කිරීම සඳහා ගාස්තු | - | - | - | - |
| | ටෝකියෝ සිමෙන්ති (ලංකා) සමාගම විසින් එකවර ගෙවන ලද මුළු වාරිකය | 31,626,840 | 31,626,840 | 31,626,840 | 31,626,840 |
| | NFCL පෙනා පෝට් ස්ටෝරේජ් සමාගමේ එකවර ගෙවන ලද මුළු වාරිකය | 6,900,000 | 6,900,000 | 6,900,000 | 6,900,000 |
| | SALCHL හි එකවර ගෙවන ලද මුළු වාරිකය | 92,237,600 | 41,903,641 | 92,237,600 | 41,903,641 |
| | කල්බදු අයිතීන් බදුදීමේ ක්‍රමක්ෂය - HIPS සහ HIPG | 1,712,997,860 | 1,712,997,860 | 1,712,997,860 | 1,712,997,860 |
| | විධායක නිලධාරීන්ගේ ආපනශාලාවෙන් ලද ආදායම | 337,260 | 295,000 | 337,260 | 295,000 |
| | CWIT සමාගමේ පෙර ගෙවුම් ගාස්තු | 185,107,468 | 115,714,286 | 185,107,468 | 115,714,286 |
| | ගාලු මුවදොර පිටිය | 5,036,966 | 4,040,127 | 5,036,966 | 4,040,127 |
| | | **4,857,671,567** | **5,646,884,528** | **4,857,514,855** | **5,645,325,629** |
| | | **23,254,035,965** | **20,340,560,361** | **23,275,129,253** | **20,360,251,461** |

| | | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|---|
| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා** | **2024** | **2023** | **2024** | **2023** |
| **36** | **පරිපාලන වියදම්** | | | | |
| | වැටුප්, වේතන හා දීමනා | 8,822,689,016 | 7,357,669,685 | 8,772,655,867 | 7,321,384,880 |
| | අතිකාල | 2,081,410,457 | 1,585,815,777 | 2,081,410,457 | 1,585,815,777 |
| | ගමන් යැපීම් සහ ඉන්ධන දීමනා | 33,981,656 | 36,767,404 | 33,981,656 | 36,767,404 |
| | ඉන්ධන/විදුලිය සහ වෙනත් වියදම් | 760,340,107 | 736,465,501 | 748,043,486 | 728,448,921 |
| | ජලය සඳහා පිරිවැය | 256,116,357 | 193,179,925 | 254,381,453 | 191,928,182 |
| | බාහිර කුලී ගාස්තු/ කොන්ත්‍රාත් | 119,385,802 | 85,796,081 | 117,361,738 | 84,686,581 |
| | අළුත්වැඩියා සහ නඩත්තු සඳහා කොන්ත්‍රාත් වැඩ | 692,890,653 | 668,987,119 | 692,890,653 | 668,987,119 |
| | සන්නිවේදන වියදම් | 50,158,421 | 56,213,805 | 50,158,421 | 55,147,402 |
| | පරිශ්‍ර කුලී/ගාස්තු සහ බදු | 59,432,474 | 72,675,692 | 59,432,474 | 72,675,692 |
| | රක්‍ෂණ සහ බලපත්‍ර ගාස්තු/නීති ගාස්තු | 44,493,473 | 86,105,234 | 41,546,463 | 79,856,761 |
| | කාර්යාල අවශ්‍යතා/ආරක්‍ෂක ගාස්තු | 113,523,753 | 128,436,998 | 95,498,787 | 91,970,165 |
| | පුහුණු කිරීමේ වියදම් | 71,952,690 | 52,374,556 | 48,009,856 | 51,958,989 |
| | සුභසාධක වියදම් | 696,277,253 | 761,729,329 | 679,956,742 | 746,251,668 |
| | ප්‍රචාරක සහ මහජන සම්බන්ධතා | 34,342,550 | 33,196,179 | 34,342,550 | 33,196,179 |
| | සුළු වියදම් | 156,090,808 | 112,845,035 | 154,928,722 | 112,284,857 |
| | පර්යේෂණ හා සංවර්ධන | 20,427,346 | 1,320,394,366 | 20,427,346 | 1,320,394,366 |
| | හිමිකම් සඳහා ප්‍රතිපාදන (අධි ප්‍රතිපාදන) | 71,186,436 | (1,070,000,428) | 71,186,436 | (1,070,000,428) |
| | ක්‍ෂය | 300,081,630 | 410,831,964 | 290,528,353 | 402,587,038 |
| | කල්බදු වත්කම් වල ක්‍රමක්‍ෂය | 11,332,228 | 11,332,228 | 11,332,228 | 11,332,228 |
| | අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්‍ෂය | 191,281,139 | 101,745,752 | 191,095,182 | 101,643,635 |
| | ව්‍යාපාර ප්‍රවර්ධන/ වෙනත් ගාස්තු | 11,627,185 | 16,218,121 | 10,774,185 | 10,351,018 |
| | බොල් හා අඩමාන ණය | (77,844,468) | (284,170,248) | (77,852,705) | (284,170,248) |
| | එකතුකළ අගය මත බදු වියදම් | 202,944,853 | 176,281,626 | 202,944,853 | 176,281,626 |
| | මුද්දර ගාස්තු | 603,361 | 650,282 | 602,961 | 649,957 |
| | සමාජ ආරක්‍ෂණ බදු වියදම් | 53,211,334 | 53,352,729 | 35,214,569 | 39,255,323 |
| | විගණන ගාස්තු | 4,839,463 | 4,575,250 | 4,177,463 | 4,170,250 |
| | ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති | 6,650,483 | - | 6,650,483 | - |
| | ජයබහළු පර්යන්තය වෙත ගෙවන ලද පරිපාලන සහ යටිතල පහසුකම් ගාස්තු | 0 | - | 719,870,640 | 612,328,282 |
| | වට්ටෝරුගත නොවන වියදම් ගිණුම | 28,393,266 | 17,691,794 | 28,393,266 | 17,691,794 |
| | ඉන්වොයිස් මිල විචල්‍යතා | (484,636) | (960,468) | (484,636) | (960,468) |
| | අධ්‍යක්ෂ ගාස්තු | 1,172,968 | 1,887,108 | - | - |
| | පරිගණක අළුත්වැඩියා හා නඩත්තු | 8,135,929 | 14,858,049 | - | - |
| | බැංකු ගාස්තු | 206,178 | 165,809 | - | - |
| | හානිකරණ මත වියදම් | - | - | 100 | - |
| | අපදා ආශ්‍රිත සිදු වීම් සඳහා කළ වියදම් | 180,093 | - | 180,093 | - |
| | බැහැර කිරීම් මත ලාභ හා පාඩු | 710,969 | - | 710,969 | - |
| | පෙර ගෙවූ ණය වියදම්-SLFRS | 3,341,186 | - | - | - |
| | | **14,831,082,414** | **12,743,112,255** | **15,380,351,112** | **13,202,914,952** |
| **37** | **ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ ආදායම** | | | | |
| | **පොලී ආදායම්** | | | | |
| | ස්ථාවර තැන්පතු සහ ඇරයුම් තැන්පතු වල පොළිය | 4,662,131,747 | 9,342,894,880 | 4,658,106,603 | 9,338,748,982 |
| | සුරැකුම් පත් /ආයෝජන මත පොලිය | 73,031,698 | 116,482,491 | 2,210,397 | 3,746,204 |
| | බාහිර පාර්ශ්වයන්ට දුන් ණය සඳහා පොළිය | 1,694,285 | - | 1,694,285 | - |
| | සේවක ණය මත පොලිය | 289,781,671 | 271,893,919 | 283,772,753 | 266,529,594 |
| | සේවක ණය පොළිය සඳහා සාධාරණ අගය ගැලපීම | 391,014,815 | 2,289,437,904 | 391,014,815 | 404,898,652 |
| | | **5,417,654,217** | **12,020,709,194** | **5,336,798,854** | **10,013,923,432** |
| | **පොලී වියදම්** | | | | |
| | ණය මත පොලීය | (3,552,160,034) | (4,229,081,793) | (3,546,207,792) | (4,217,894,046) |
| | වෙනත් මූල්‍ය ගාස්තු | (39,613,377) | (54,420,752) | (39,095,736) | (53,831,045) |
| | මූල්‍ය කල්බදු යටතේ ගෙවිය යුතු මූල්‍ය ගාස්තු | (1,654,310) | (3,293,310) | (1,516,381) | (2,536,292) |
| | Amortization of Staff Cost on Employee Loan | (391,014,815) | (2,289,437,904) | (391,014,815) | (404,898,652) |
| | | **(3,984,442,537)** | **(6,576,233,760)** | **(3,977,834,725)** | **(4,679,160,035)** |
| | | **1,433,211,680** | **5,444,475,434** | **1,358,964,129** | **5,334,763,397** |
| **38** | **ආදායම් බදු වියදම්** | | | | |

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත (නව ආදායම් බදු පනත) 2018 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මකව පවතී.

| **ආදායම් බදුවල ප්‍රධාන සංරචකයන් පහත දැක්වෙන අයුරු වේ** | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|
| | **2024** | **2023** | **2024** | **2023** |
| වර්ෂය සඳහා ප්‍රවර්තන බදු වියදම් (සටහන 38.1) | 8,097,060,022 | 6,203,060,783 | 7,989,651,588 | 6,093,711,288 |
| පෙර වර්ෂයේ අධි බදු ප්‍රතිපාදන | (892,100,614) | (529,000,088) | (892,100,614) | (529,000,088) |
| | **7,204,959,408** | **5,674,060,695** | **7,097,550,974** | **5,564,711,200** |
| විලම්භිත බදු අය කිරීම / (ප්‍රතිවර්තන) **(සටහන 27)** | **780,379,618** | **6,179,745,921** | **783,245,995** | **6,180,776,580** |
| | **7,985,339,026** | **11,853,806,615** | **7,880,796,969** | **11,745,487,779** |

| 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය 2024 | සමූහය 2023 | ශ්‍රීලවඅ 2024 | ශ්‍රීලවඅ 2023 |
|---|---|---|---|---|
| **38.1 ප්‍රවර්තන බදු වියදම් සහ ගිණුම් ලාභවල ප්‍රතිඵල අතර සැසඳීම.** | | | | |
| බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය | 47,082,401,320 | 40,711,437,127 | 46,734,444,152 | 40,359,243,118 |
| අනුමත නොකළ වියදම් | 19,402,101,336 | 25,351,745,867 | 19,402,101,336 | 25,351,745,867 |
| අනුමත කළ වියදම් | (26,094,198,085) | (24,119,156,827) | (26,094,198,085) | (24,119,156,827) |
| බදු ගෙවීමට සිදු විය හැකි වෙනත් ආදායම් - පොලී ආදායම | 1,030,251,431 | 2,150,291,857 | 1,030,251,431 | 2,150,291,857 |
| අත්හල මුදල හා වෙනත් මාර්ග වලින් ලද ආදායම | (15,572,313,547) | (23,429,753,057) | (15,572,313,547) | (23,429,753,057) |
| පරිපාලිත සමාගම්වල බදු අය කළ යුතු ලාභය | 10,070,945 | 12,304,308 | - | - |
| වෙනත් ගැලපුම් | 1,739,197,054 | - | 1,739,197,054 | - |
| **ව්‍යවස්ථාපිත ආදායම** | **27,597,510,454** | **20,676,869,275** | **27,239,482,341** | **20,312,370,958** |
| **උපයෝජිත බදු අලාභ** | - | | - | - |
| **තක්සේරු කල හැකි ආදායම/ බදු ගෙවිය යුතු ආදායම** | **27,597,510,454** | **20,676,869,275** | **27,239,482,341** | **20,312,370,958** |
| **අඩුකලා:අනුමත කරන ගෙවීම්** | **(607,310,383)** | **-** | **(607,310,383)** | **-** |
| බදු ගෙවිය යුතු ආදායම | 26,879,908,563 | 20,676,869,275 | 26,632,171,958 | 20,312,370,958 |
| **24% හා 30% හි බදු අනුපාතයන් මත අය කරන ව්‍යවස්ථාපිත ගාස්තු** | 8,097,060,022 | 6,203,060,783 | 7,989,651,588 | 6,093,711,288 |
| **14% හා 15% හි බදු අනුපාතයන් මත අය කරන ව්‍යවස්ථාපිත ගාස්තු** | - | - | - | - |
| **සාමාන්‍ය කටයුතු සඳහා ගෙවිය යුතු ප්‍රවර්තන බදු** | **8,097,060,022** | **6,203,060,783** | **7,989,651,588** | **6,093,711,288** |

**39 සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීමේ පිරිවැය**

2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකර කොන්ත්‍රාත්කරුගේ හිඟ මුදල් ගෙවීම සඳහා මහජන බැංකුවෙන් ණය මුදල් ලබා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2017.12.14 දින නිකුත් කරන ලද සහන ලිපියට අනුව ණය ගෙවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන සැලසීමට සහතිකය දී ඇත.

**40 අසම්භාව්‍ය වගකීම්**

සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලිය මගින් පැන නඟින නෛතික හිමිකම් පෑම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අසම්භාව්‍ය වගකීම් ඇත. ප්‍රතිපාදනයක් ලෙස හඳුනානොගතහොත් (සටහන 32) කළමනාකාරීත්වය මෙම හිමිකම් පෑම් අසාධාරණ ලෙස සලකනු ලබන අතර ඒවා නිරවුල් කිරීම සඳහා සම්පත් භාවිතා කිරීමේ හැකියාව ඉතා අල්ප වේ.

**40.1 අංක CA (PHC) APN 45/2006-MV "ජාමි" (JAAMI) දරණ අභියාචනාධිකරණ නඩුව සමතයකට පත් කිරීම**

2017.02.23 දිනැති අංක. Noam/61/2017 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව , ඉහත නඩුව සමතයකට පත් කිරීම සඳහා ඉතිරි ශේෂය (අවම 50% කට සමානුපාතික ලෙස) සුදුසු පරිදි බෙදා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතර , 2017.03.29 දින ශ්‍රී ලංකා නැව් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වෙත නීති කොට්ඨාශය විසින් ලිපියක් ඉදිරිපත් කරන ලදී . එකී යෝජනාවට සී/ස ශ්‍රී ලංකා නැව් සමාගම එකඟවූ අතර මෙම කරුණ 2017.06.29 දින අභියාචනාධිකරණයේදී විමසුමට ගන්නා ලදී . ඒ අනුව, සමතයකට පත් කිරීමේ මෝසම පාර්ශ්වයන් විසින් අභියාචනාධිකරණයේ ගොනු කරන ලද අතර 2018.10.03 දින පැවති නඩු වාරයේදී අවස්ථාවේදී ගෙවීම සම්බන්ධයෙන් එකඟ වූ පරිදි නඩුව මහාධිකරණයේදී විසඳා ගැනීමට (නඩු අංක 11/2005) එකඟ විය. මේ වන විට මෙම නඩුව මහාධිකරණයේ විමසීමට භාජනය වෙමින් පවතින අතර රෙජිස්ට්‍රාර්වරයාගේ වාර්තාව 2020.02.24 වන දින විටද ලැබී නොතිබිණ. මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා (Action in Rem. 11/2005) සිය වාර්තාව 2020.09.25 දින ගොනු කර ඇති අතර එමඟින් ඔහු විසින් මෙම නඩුව සම්බන්ධයෙන් අතිරේක වාර්තාවක් ගොනු කරන ලෙස ඉල්ලීමක් කර ඇත . රෙජිස්ට්‍රාර්වරයා සිය වාර්තාව 2021.03.02 දින ඉදිරිපත් කර ඇති අතර එවැනි මුදලක් මහජන බැංකුවේ ගිණුමේ නොපවතින බව එමඟින් වාර්තා කර තිබිණ . රෙජිස්ට්‍රාර්වරයා තවදුරටත් වාර්තා කරමින් එකී මුදල පිළිබඳ වත්මන් තත්ත්වය සොයා ගැනීමට ඔහු අසමත් බවටද වාර්තා කර ඇත . ඉන් අනතුරුව, මෙම කරුණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන ලෙස විනිසුරුවරයා නියෝග කරන ලදී. නඩුව 2022.02.02 දින කැඳවූ අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කිසිදු නිලධාරියෙකු පැමිණ නොසිටි 2022.03.28 දින අධිකරණයේ පෙනී සිටින ලෙස නියෝග කරමින් ෆිස්කල්වරයා මගින් වාණිජ සහ මූල්‍ය වංචා කොට්ඨාශයේ ස්ථානාධිපති වෙත භාරදීම සඳහා නොතීසියක් ගොනු කරන ලෙස ගරු අධිකරණය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත නියෝග කරන ලදී .

Rem 11/2005 නඩුවේ වත්මන් තත්ත්වය දැනුම් දීම සඳහා CA PHC APN 45/2006 නඩුකරය 2023.06.26 දින සලකා බැලීමට ලැයිස්තුගත කර ඇත.

rem 11/2005 දරණ නඩුව 2023.01.18 දින කැඳවන ලද අවස්ථාවේදී අධිකරණයේ පෙනී සිටීමට නොතීසි නිකුත් කර තිබූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමුද්‍රීය කොට්ඨාශය භාර ස්ථානභාර නිලධාරීවරයා අධිකරණයේ පෙනී නොසිටින ලදී. ඒ අනුව, මෙම කරුණ මෙහෙයවන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට විමර්ශනයේ වත්මන් තත්ත්වය පිළිබඳ වාර්තාවද සමඟ අධිකරණයේ පෙනී සිටින ලෙසට නොතීසි නිකුත් කිරීමට අධිකරණය නියෝග කර සිටින ලදී. මෙම නඩුව, 2023.03.08 දින කැඳවීමට ලැයිස්තුගත කර ඇත.

CA PHC APN 45/2006 දරණ නඩුව 2024.05.29 දින අභියාචනාධිකරණයේදී විමසීම සඳහා කැඳවන ලද අතර , අදාළ පර්ශ්වයන් විසින් 2018.02.12 දිනැති ඒකබද්ධ මෝසමට එළඹ ඇති බැවින් මෙම නඩුවේ විමසුම් අවසන් කළ යුතු බව දැක්වෙන අධිකරණ නියෝගය ප්‍රකාරව , සමතයකට පත්වීමේ නියමයන්ට අනුව කටයුතු කරන ලෙස අදාළ පාර්ශ්වයනට නියෝග කරන ලදී . මෙම නියෝගය දැනටමත් Rem 11/2005 දරණ නඩුවේ තීන්දුව සඳහා යවා ඇත .

Rem 11/2005 දරණ නඩුව - මෙම නඩුව 2024.11.26 දින කැඳවන ලද අතර, එදිනම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය විමර්ශන අංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක නලින්ද හේරත් මහතා , මෙම හිමිකම් පෑම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ සඳහා තවදුරටත් කාලය අවශ්‍ය බව සඳහන් කරමින් අධිකරණයට වාර්තා ඉදිරිපත් කරන ලදී. එබැවින්, මෙම නඩුව 2025.02.10 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා ලබා ගැනීම සඳහා යොමු කර ඇත.

| | |
|---|---|
| **40.2** | **හැටන් නැෂනල් බැංකුවේ ණය ලිපි පහසුකම - MPMC Ltd** |
| | දිස්ත්‍රික් අධිකරණයේ අංක. DDR 1349/2019 දරණ නඩුවේ අවසන් තීන්දුව 2024.09.100 දින හැටන් නැෂනල් බැංකුවට වාසිදායක ලෙස දෙන ලදී . |
| | නඩු තීන්දුවෙන් අසතුටට පත්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2024.11.06 දින බස්නාහිර පළාතේ කොළඹ සිවිල් අභියාචනා මහාධිකරණයේ පෙත්සමක් ගොනු කරන ලදී. තවද, ඊට සමගාමීව ශ්‍රී ලංකා වරාය අධිකාරිය එකී තීන්දුවට එරෙහිව අංක . WP/HCCA/COL/41/24/RA යටතේ 2024.11.06 දින ප්‍රතිශෝධිත අභියාචනයක් ද ගොනු කර ඇත . |
| | එකී අංක WP/HCCA/COL/41/24/RA දරණ ප්‍රතිශෝධිත අභියාචනය විමසීම සඳහා 2025.02.17 දින කැඳවීමට ලැයිස්තුගත කර ඇත . |
| | මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් ගොනු කරන ලද අංක . CHC/97/2021/CO දරණ ඇවර කිරීමේ අයදුම්පත 2024.12.12 දින කැඳවන ලද අතර ඇවර කිරීම පිළිබඳ වැඩිදුර අතුරු වාර්තාවක් සඳහා 2025.02.28 දිනට කල් තබන ලදී. |
| | තවද, එ.ජ.ඩො. මිලියන 1 ක වටිනාකමින් යුතු බැංකු ඇපකරය ඉහත කී නඩුවට යටත්ව පිරිනැමීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පියවර ගෙන ඇත. |
| **40.3** | **බදු අභියාචනාධිකරණය හමුවේ පවරා ඇති නඩු** |
| | 2007/2008, 2008/2009, 2009/2010 සහ 2010/2011 යන තක්සේරු වර්ෂයන් සඳහා 2006 වසරේ අංක 10 දරණ දේශීය ආදායම් බදු පනතේ 22 වගන්තිය යටතේ නම් කර ඇති විදේශ ණය මත අය කරනු ලබන පොලිය අඩුකිරීමට ඉඩ නොදෙමින් සහ දේශීය ආදායම් බදු පනතේ 25(1) වගන්තිය යටතේ විදේශ විනිමය පාඩු මත අඩුකිරීම් සිදු කිරීමට ඉඩ නොදෙමින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව තක්සේරු පිළියෙල කර ඇත . දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිජනරාල්වරයා විසින් 2007/2008, 2008/2009, 2010/2011 යන තක්සේරු වර්ෂයන් සම්බන්ධයෙන් ගන්නා ලද තීරණ පිළිබඳව නොසතුටට පත්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරිය බදු අභියාචනා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කරන ලදී . බදු අභියාචනා කොමිසම අදාළ වර්ෂයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල්වරයා විසින් දෙන ලද අනුමැතිය සනාථ කරන ලදී . බදු අභියාචනා කොමිසම විසින් ලබාදුන් තීරණයට ශ්‍රී ලංකා වරාය අධිකාරිය එකඟනොවන බැවින් , ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙම කරුණ පිළිබඳ මතය විමසීම සඳහා ගරු අභියාචනාවනාධිකරණය වෙත යොමු කර ඇත . 2009/2010 තක්සේරු වර්ෂය සඳහා බදු අභියාචනා කොමිසමේ තීන්දුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාසියට දී ඇති බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මෙම තීරණයට එරෙහිව අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනු කර ඇත . 2018/2019 තක්සේරු වර්ෂයේ මීට සමාන විදේශ විනිමය පාඩු සම්බන්ධ බදු අභියාචනා කොමිසම ඉදිරියේ තීන්දුවකට පැමිණීමට නියමිතව ඇත . |
| **40.4** | **ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC FR/349/19 - ඩබ්. ඒ එස් විජේවර්ධන** |
| | මෙය "පිය පුතු පදනම" මත බඳවා ගන්නා ලදැයි නියනු ලබන ගිණුම් ලිපිකරු තනතුරට පත් කරන ලෙස ඉල්ලමින්, ගිණුම් ලිපිකරු පත්වීම් ලබා දුන් 16 - 40 දක්වා වන වගඋත්තරකරුවන්ගේ නැවත් පත් කිරීම් අවලංගු කරන ලෙස ඉල්ලමින් ගොනු කරන ලද නඩුවකි. කෙසේ වුවද, මේ දක්වාම ශ්‍රී ලංකා වරාය අධිකාරියට නොතීසි ලැබී නොමැති බැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පෙරකලාසිය ගොනු කර නොමැත. |
| **40.5** | **ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/182/23 -කේ ඩබ්. නිශාන්ත ද සිල්වා සහ වෙනත් පෙත්සම්කරුවන් 06 දෙනෙකු** |
| | මෙය කණිෂ්ඨ කළමනාකාරණ සහකාර තනතුරට උසස් කරන ලෙසට සහන ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කාර්ය සහායකයින්ගේ වෘත්තීය සමිතියේ සාමාජිකයින් හා නිලධාරීන් විසින් පවරන ලද නඩුවකි . |
| **40.9** | **අභියාචනාධිකරණය - CA/Tax/09/16- අධ්‍යක්ෂ ජෙනරාල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (පෙත්සම්කරු))** |
| | මෙම නඩුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2009/2010 තක්සේරු වර්ෂය සඳහා වූ 2016.06.14 දිනැති බදු අභියාචනා කොමිසමේ තීරණයට එරෙහිව පවරන ලද නඩවුකි. |
| **40.1** | **අභියාචනාධිකරණ නඩුව - CA (writ) 427/2022 - ඒ ජී ඇන්ටන්, එල් කේ වේ ඩී කේ ආරේවත්ත, එන් ඩී හෙට්ටිආරච්චි** |
| | ශ්‍රී ලංකා වරාය අධිකාරියට විරුද්ධව ශ්‍රී ලංකා රේගුව වෙනුවෙන් සාක්ෂි ලබාදුන් නිලධාරීන් විසින් මෙම නඩුව පවරා ඇති අතර, සෙසු වග උත්තරකරුවන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් භාණ්ඩ ප්‍රකාශ පත්‍රයක් නොමැතිව ආනයනය කරන ලද ගැන්ට්‍රි දොඹකර සම්බන්ධයෙන් පරීක්ෂණ මෙහෙයවූ නිලධාරීන්හට අයිති ත්‍යාග මුදල් ගෙවන ලෙස රිට් ආඥාවක් මගින් සහනයක් ඉල්ලා සිටී. |
| **40.1** | **රේගු විමර්ශනය D/INV/2008/100 - රේගු අධ්‍යක්ෂ ජෙනරාල්** |
| | මෙම නඩුව විසඳීම සඳහා 2020.07.21 දින ගන්නා ලද අතර, නීතිපතිතුමාගේ උපදෙස් ලැබෙන තුරු නැවත පසුවට කල් තබන ලදී. |

**41** **සමූහයේ සැසඳීම් අනුප්‍රාප්ත කිරීම / ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය සංඛ්‍යා**

පරිපාලිත සමාගම් වල සහ ආශ්‍රිත සමාගම්හි විගණිත මූල්‍ය වාර්තා ලැබීමත් සමඟ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂය සඳහා වූ විගණිත මූල්‍ය වාර්තා ලැබීමෙන් පසුව පහත සඳහන් අයිතම අනුප්‍රාප්ත කර ඇත .

| 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ / ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බලපෑම | සමූහය | | ශ්‍රීලවඅ | |
|---|---|---|---|---|
| | 2023 විගණන කළ ගිණුම් සමඟ | 2023 විගණන නොකළ ගිණුම් සමඟ | 2023 විගණන කළ ගිණුම් සමඟ | 2023 විගණන නොකළ ගිණුම් සමඟ |
| පරිපාලිත සමාගම්හි ආයෝජන ** | - | 100 | 1,000,000 | 76,000,100 |
| ජංගම නොවන වත්කම් - සේවක ණය ** | 6,264,890,249 | - | 6,229,091,683 | - |
| ආශ්‍රිත සමාගම්හි ආයෝජන | 36,060,590,549 | 36,064,616,616 | | |
| වට්ටෝරුගත | 4,701,766,535 | 4,714,197,478 | | |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ ** | 11,089,182,734 | 11,143,686,756 | 11,089,593,769 | 11,089,582,269 |
| ජංගම වත්කම් - සේවක ණය ** | 85,941,018 | 6,350,831,267 | 70,024,442 | 6,299,116,124 |
| වෙනත් මූල්‍ය වත්කම් ** | 80,732,494,008 | 99,862,854,798 | 80,732,494,008 | 99,298,516,607 |
| මුදල්, මුදල් හා සමාන දෑ ** | 24,763,454,332 | 7,548,896,141 | 24,021,067,891 | 5,455,045,292 |
| දේපළ, පිරියත හා උපකරණ -MPMC | - | 205,575 | | |
| රඳවාගත් ඉපයුම් | 147,041,794,365 | 139,535,760,394 | 149,424,063,079 | 149,499,051,579 |
| භාණ්ඩ හා සේවා සැපයුම් හා වෙනත් ණයහිමියන් | 4,180,852,000 | 4,077,185,148 | | |
| මූල්‍ය ආයතන වලින් ලබාගත් ජංගම වගකීම් | 340,539,837 | 9,928,025,014 | | |
| ගෙවිය යුතු ජංගම බදු | 4,568,590,618 | 4,571,765,783 | | |
| ප්‍රතිපාදන හා උපචිත වියදම් | 8,815,242,982 | 8,821,291,912 | | |
| මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු | 39,146 | - | | |

** පරිපාලිත සමාගමෙහි (මාගම්පුර වරාය කළමනාකරණ (පුද්.) සමාගම ආයෝජන, වෙළෙඳ හා වෙනත් ලැබීම්, වෙනත් මූල්‍ය වත්කම්, මුදල් හා මුදල් හා සමාන දෑ සහ සේවක ණයවල (ජාගම හා ජංගම නොවන) මුදල් ප්‍රමාණ 2023 වර්ෂය සඳහා නැවත සටහන් කර ඇත.

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්.) සමාගම ඈවර කිරීම හේතුකොටගෙන, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් වන මෙම සමාගමෙහි ආයෝජන නැවත සටහන් කර ඇත. ( අංක 44.1 බලන්න)

**42** **පෙර වර්ෂයේ ගැලපුම්**

| | රු. | |
|---|---|---|
| **රේඛීය විස්තරය** | **සමූහය** | **ශ්‍රීලවඅ** |
| සේවක පාරිශ්‍රමික සඳහා ගැලපුම් | (18,237,097) | (18,237,097) |
| අන්තර් පර්යන්ත බහළු ප්‍රවාහන ගාස්තු(ITT) | 32,452,094 | 32,452,094 |
| වෙනත් ආදායම් -සුභ සාධක බස් රථ ගාස්තු සඳහා සේවකයින් විසින් ගෙවූ තැන්පතු | (12,929,375) | (12,929,375) |
| Nfcl Penna Port Storage පුද්ගලික සමාගම ලැබිය යුතු මුදල ලියා ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමැතිය | 10,807,507 | 10,807,507 |
| වත්කම් ඒකාබද්ධ කිරීමේ ගිණුම් නිවැරදි කිරීමේ ගැලපුම් වශයෙන් | (22,370,354) | (22,370,354) |
| ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි දිගුකාලීනව පැවති අත්තිකාරම් ශේෂ ලියා ඉවත් කිරීම වෙනුවෙන් (අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක PA/HD/23) | 1,529,963 | 1,529,963 |
| රන් පවුම් ගෙවීම් - සුභසාධක කොට්ඨාශය | 38,718,750 | 38,718,750 |
| 2023 වර්ෂයේ බදු දුන් ඉඩම් ප්‍රතිවර්තන ප්‍රතිපාදන | 5,961,303 | 5,961,303 |
| 2023 වර්ෂයේ ගිණුම්ගත කරන ලද SAGT සමාගමේ පහත සඳහන් අන්තර් ලාභාංශ රඳවා ගැනීමේ බදු සඳහා ගැලපීම වශයෙන් | 221,981,025 | 221,981,025 |
| පෙර වර්ෂ සඳහා භාවිතා නොකර තබාගත් උපචිත වියදම් ප්‍රතිවර්තනය (2023 ට පෙර) . | (154,880,529) | (154,880,529) |
| ත්‍රිකුණාමල වරායට අදාළ ප්‍රාග්ධන වියදම් හා අදාළ ගිණුම්වල ප්‍රතිවර්තන වියදම් මාරු කිරීම | 750,000 | 750,000 |
| 2023 දෙසැම්බර් මාසය සඳහා CICT සමාගමේ ලැබිය යුතු අතිරේක රාජ්‍ය භාග ආදායම ගැලපීම වශයෙන් | (203,482,867) | (203,482,867) |
| 2018/2019 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව අතර එළැඹි එකඟතාවය | 98,467,044 | 98,467,044 |
| බස් රථ කුලියට දීම - සුභසාධක කොට්ඨාශය | 3,584,600 | 3,584,600 |
| චෙක්පත් නැවකත නිකුත් කිරීම (අස්ථානගත වූ චෙක්පත්) | 61,097 | 61,097 |
| පෙර වර්ෂයේ පසුදාතම වත්කම්වල ක්ෂය ගිණුම්ගත කිරීම වශයෙන් | 167,222,711 | 167,222,711 |
| නීති ගාස්තු - නීති කොට්ඨාශය | 1,206,000 | 1,206,000 |
| වත්කම් සමාලෝචනය සඳහා ගිණුම් සටහන් ගැලපීම වශයෙන් ( 2023) | 0 | 0 |
| මිලදී ගැනීමේ නියෝග සඳහා සැපයූ භාණ්ඩවල හිමිකම් නොපෑ හිඟ මුදල් වලට අදාළ මාරු කිරීම් වශයෙන් | (5,050,200) | (5,050,200) |
| CICT සමාගමේ ලැබූ කුලී අත්තිකාරම් අවු 13 ක සිට පෙර වර්ෂයේ ගිණුමෙන් 2024 ජනවාරි 01 සිට 2024 නොවැම්බර් 30 දක්වා ගැලපීම වශයෙන් | 1,999,842,169 | 1,999,842,169 |
| ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) ගේ 2024.04.29 දිනැති ලිපියට අනුව පහත සඳහන් ව්‍යාපෘති වලට ආදළව 2023.07.01 දින සිට 2023.12.31 කම්කරු කුලිය මාරු කිරීම වශයෙන් | (4,445,346) | (4,445,346) |
| 2024 දෙසැම්බර් මාසයේ ගිණුම් නිවැරදි කිරීමට අවලංගු වූ චෙක්පතක රු 21, 834.20 ක මුදලක් මාරු කිරීම වශයෙන් | (5,000) | (5,000) |
| ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) ගේ 2024.12.13 දිනැති ලිපියට අනුව පහත සඳහන් ව්‍යාපෘතියට අදාළ කම්කරු ගාස්තු 2022.11.14 - 2024.01.10 වර්ෂය සඳහා මාරු කිරීම වශයෙන් | (35,260,794) | (35,260,794) |
| සුභ සාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශයේ පරිපාලන නිලධාරිනියගේ ලිපියට අනුව සේවක ණය පොළී ගිණුමට 2023 වර්ෂයේදී වැඩිපුර ගෙවූ මුදල නිවැරදි කිරීම වශයෙන් | 398,537 | 398,537 |
| LKAS 20 ට අනුව විලම්භිත ආදායම ජීව කාලය ඔබ්බනේ ක්‍රමක්ෂය කිරීම | (1,508,023) | (1,508,023) |
| 2022 හා 2023 සඳහා CWIT සමාගමනේ ලැබිය යුතු බදු කුලී ගිණුම්ගත කිරීම වශයෙන් | (3,897,814,181) | (3,897,814,181) |
| CWIT සමාගමේ බදු කුලී පොලිය ගිණුම්ගත කිරීම වශයෙන් | (312,095,206) | (312,095,206) |
| ලැබිය යුතු රාජ්‍ය භාගය ගිණුම්ගත කිරීම වශයෙන් | (3,783,222) | (3,783,222) |
| මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ ක්ෂය ගිණුමට (FD/AR/JE/06) වැරදි ලෙස සටහන් කළ මුදල් අදාළ ගිණුම්වලට නිවැරදි කිරීම වශයෙන් | (2,338,119,033) | (2,338,119,033) |
| 2023 වර්ෂයේ පරිගණක දෘඩාංග හා මෘදුකාංග හා විදුලි හා විද්‍යුත් උපකරණ ක්ෂය (FD/AR/JE/70) & (FD/AR/JE/77) ගිණුම් වලට වැරදි ලෙස සටහන් කළ මුදල් අදාළ ගිණුම්වලට නිවැරදි කර සටහන් කිරීම වශයෙන් | 5,712 | 5,712 |
| ප්‍රධාන මුදල් කළමනාකරුගේ ලිපියට අනුව ත්‍රිකුණාමල වරායේ 2024 උපචිත වියදම් ශේෂය පෙර වර්ෂයේ ගැලපුම් ගිණුමට අනුව මාරු කිරීම | (7,477) | (7,477) |
| 2023 ත්‍රිකුණාමල වරායේ වෛද්‍ය වියදම් මුදල් කරගැනීමේ අධි ප්‍රතිපාදන පෙර වර්ෂයේ ගැලපුම් ගිණුමට මාරු කිරීම | (2,070,874) | (2,070,874) |
| 2021 වර්ෂයේ ත්‍රිකුණාමල වරායේ මූවරින් බෝයා ලියා ඉවත් කිරීම අධීක්ෂණය දැන් වත්කම ප්‍රතිස්ථානගත කිරිම | (130) | (130) |
| ත්‍රිකුණාමලයේ අෂ්රෝෆ් ජැටිය පුළුල් කිරීමේ වැඩ ශක්‍යතා අධ්‍යයන අදියරෙහි වියදම් වැරදි ලෙස ඉහත පුළුල් කිරීමේ ව්‍යාපෘති (දේශීය) 2019 ගිණුමට ඇතුළත් කර ඇත. මේ වන විට නියෝජ්‍ය ප්‍රධාන මුදල් කළමනාකරුගේ 2025.01.24 දිනැති විද්‍යුත් තැපෑලට අනුව මෙම පෙර වර්ෂයේ ගැලපුම් ගිණුමට මාරු කර ඇත. | 5,019,200 | 5,019,200 |
| පෙර වර්ෂයේ විලම්භිත බදු ගැලපීම | 2,557,952,949 | 2,557,952,949 |
| **එකතුව** | **(1,866,099,048)** | **(1,866,099,048)** |

**42.1 CWIT හි විලම්භිත බදු කුලිය සහ පොලී ආදායම**

42.1 **CWIT සමාගමේ පලමු වසර තුන සඳහා වූ බදු කුලී ආදායම විලම්භිත කර ඇති අතර පොලිය එම විලම්භිතය සඳහා අය කරනු ලැබේ. (එහි පොලී ආදායම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වේ) 2024 වර්ෂයේදී විලම්භිත බදු කුලිය සහ 2022 හා 2023 වර්ෂ සඳහා වන පොලී ආදායම පහත දැක්වෙන අයුරින් පෙර වර්ෂයේ ගැලපුමක් ලෙස හඳුනාගෙන ඇත.

**විලම්භිත පොලී මුදල (ශ්‍රී ලංකා රුපියල්)**

2022 - 98,105,207
2023 - 213,989,998
**එකතුව - 312,095,206**

**විලම්භිත බදු මුදල (ශ්‍රී ලංකා රුපියල්)**

2022 - 1,786,979,980
2023 - 2,110,834,202
**එකතුව - 3,897,814,181**

**42.1.1 CICT බදු කුලී ආදායම**

2024 වර්ෂය වෙනුවෙන් ලද CICT සමාගමේ කුලී ආදායම 2023 වර්ෂයේ ආදායමක් ලෙස වාර්තා කර ඇත. එබැවින්, 2024 වර්ෂයේ ආදායමක් ලෙස නිවැරදි කරන අතර එය ශ්‍රී ලංකා රුපියල් 1,999,842,169 හි පෙර වසරේ ගැලපුමක් ලෙස වාර්තා කරනු ලැබේ.

ඉහත ගැලපුම්වල ප්‍රතිඵලයක් වශයෙන් රඳවා ගන්නා ලද ආරම්භක ගැලපුම් ශේෂය (2023.01.01) 131,478,743,257.14 ක් සහ 2023 වර්ෂයේ ලැබිය යුතු සාපේක්ෂක මුදලක් ලෙස වෙනස් කරනු ලැබේ. CWIT සමාගමේ මුදල 4,209,909,387 ක් ලෙස වෙනස් කරන අතර වෙළෙඳ තැන්පත් ශේෂය 7,141,171,286 ක් ලෙස වෙනස් කරනු ලැබේ.

**43 විදේශ විනිමය ලාභ/පාඩු**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය අවබෝධ කර ගැනීමට අදාළ වන බැවින් හා වසර අවසානයේදී ශුද්ධ ලාභයට ඉහළ බලපෑමක් ඇති කරන බැවින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව, විදේශ විනිමය ලැබීම්/ පාඩු ගැලපුම් කරන විශේෂ අතිරේක රේඛීය අයිතමය ඉදිරිපත් කිරීම වැදගත් වන බැවින් එය විස්තීර්ණ ආදායම් වාර්තාවට එකතු කර ඇත. මෙහෙයුම් ආදායම ලබා ගැනීමේදී මෙහෙයුම් ආදායම මත ලබා ගන්නා ඩොලර් ණය අනුව ගිණුම් අනුපාතය භාවිතා කරමින් ගැලපුම් කරන අතර, වර්ෂ අවසාන මූල්‍ය අයිතම වාර්ෂ අවසාන තත්කාලීන අනුපාතය භාවිතා කරමින් ප්‍රතිගණනය කරනු ලැබේ.

**44 2024 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් වන සී/ස ජය බහළු පර්යන්ත සමාගම සහ ආශ්‍රිත සමාගමක් වන හම්බන්තොට ජාත්‍යන්තර පෝට් සර්විසස් සමාගම හා ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සේවා සමාගම 2024 වර්ෂය සඳහා වූ විගණනය නොකල මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් වන ලංකා ගෑස් (පුද්.) සමාගම සිය විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මෙතෙක් ඉදිරිපත් කර නොමැත. එබැවින්, ඒකාබද්ධ මූල්‍ය වාර්තා ජය බහළු පර්යන්ත සමාගමේ කෙටුම්පත් මූල්‍ය වාර්තා වලට අනුව පිළියෙල කර ඇත. එබැවින්, 2024.12.31 දිනට ඒකාබද්ධ මූල්‍ය වාර්තා ජය බහළු පර්යන්ත සමාගමේ හා ලංකා ගෑස් ටර්මිනල් සමාගමේ මූල්‍ය වාර්තා වලට අනුව පිළියෙල කර ඇත.

මාගම්පුර වරාය කළමනාකරණ සමාගම දැනට ඈවර කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතින අතර, එහි මූල්‍ය ප්‍රකාශන 2022.12.31 දින දක්වා පමණක් පිළියෙල කර ඇත. එබැවින්, ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිත 10 ( ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන) 837 පරිච්ඡේදයට අනුව 2023 හා 2024 වර්ෂයන් සිට ක්‍රියාත්මක වන පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශන වලින් මාගම්පුර වරය කළමනාකරණ සේවා සමාගම ඉවත් කර ඇත.

**44.1 මාගම්පුර වරාය කළමනාකරණ (පුද්.) සමාගම (MPMC)**

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්.) සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරියට පූර්ණ අයිති පරිපාලිත සමාගමකි. මෙම සමාගමේ 2022 ජූනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් (කොළඹ සිවිල්) වාණිජ මහාධිකරණ නඩු අංක (සිවිල්) 97/2021/CO යටතේ ඈවර කිරීමට නියමිත අතර 2022 ජූනි 1 දින ඈවරකරු පත් කරන ලදී.

ඈවරකරු පත් කිරීමෙන් පසුව, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 290 යටතේ විධිවිධාන පරිදි ඈවරකරු වෙත බලතල පවරන ලදී.

ඈවර කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් මාගම්පුර වරාය කළමනාකරණ (පුද්.) සමාගම විසින් එහි 2022.12.31 දිනට පැවති ද්‍රවශීලතාවය පදනම් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර ද්‍රවශීලතා ක්‍රියාවලිය හේතුකොටගෙන සමාගමේ 2023 හා 2024 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සලකා බැලීම සඳහා ඉදිරිපත් නොකරන ලදී.

ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිත 10 ට (ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන) අනුව, අයෝජන ආයතනයෙහි ඡන්ද අයිතියෙන් බහුතරයක් ආයෝජකයා විසින් දැරුවද, ඡන්ද අයිතිය නිත්‍ය නොවන විට දී ආයෝජකහට ආයෝජන ආයතනය වඩා ඉහළින් බලයක් නොමැති බව සඳහන් වේ . උදා: ඡන්ද අයිතියෙන් අඩකට වඩා ඇති ආයෝජකයෙකුට, අදාළ කටයුතු රජයෙන්, උසාවියක පරිපාලකයෙකු, ඈවරකරුවෙකු හෝ නියමුවෙකුගේ නියෝගයකට යටත් වන්නේ නම් එම ආයතනයහට බලතල ලැබිය නොහැක. .

ඒ අනුව, ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිත අංක 10 හි 20 වන ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියට මාගම්පුර වරාය කළමනාකරණ (පුද්.) සමාගමෙහි තිබූ පාලනය 2022.06.01 දින සිට අහිමි වී ඇත. 2022.12.31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන තිබෙන බැවින්, මාගම්පුර වරාය කළමනාකරණ (පුද්.) සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ ඒකාබද්ධ කිරීම 2022.12.31 දින දක්වා පැවතින. ඒ අනුව, මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ ගිණුම් සමූහයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2023 වර්ෂයේ සිට ඉවත් කරනු ලැබේ.

**44.1.1 අත්හිටවූ මෙහෙයුම්**

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්.) සමාගම 2023 වර්ෂයේ සිට අක්‍රිය තත්ත්වයට පත් කර ඇත. ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි ප්‍රමිත 5 ටඅනුව, (විකිණීම සඳහා ඇති සහ මෙහෙයුම් අක්‍රිය කර ඇති ජංගම නොවන වත්කම්) මගින් කෙරෙන හෙළිදරව් වලට අනුව, 2023 වර්ෂයේ සිට මෙම සමාගම අක්‍රියව ඇති බැවින් ලාභ හෝ පාඩු නොමැත.

තවද, මාගම්පුර වරාය කළමනාකරණ හා සේවා (පුද්.) සමාගමේ ලාභ/පාඩු බැහැර කිරීමක් නොමැත. එමනිසා ලැබීම් සලකා බැලීමක්ද නොමැත.

**45 වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 වන ඡේදයට අනුව, (දේපළ, පිරියත හා උපකරණ) " වත්කමක ඉතිරි අගය හා ප්‍රයෝජනවත් ජීව කාලය අවම වශයෙන් එක් එක් ගිණුම් වර්ෂය අවසානයේදී සමාලෝචනය කළ යුතුය" ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විගණන කමිටුව විසින් අනුමත කර ඇති පරිදි, 2024.12.31 දින වන විටත් භාවිතයේ පවතින, මුළුමනින්ම ක්ෂයවූ ස්ථාවර වත්කම්හි ප්‍රයෝජනවත් ජීව කාලය හා ශේෂ අගය සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ (තාක්ෂණ) විසින් පත් කරන ලද අදාළ සමාලෝචන කමිටු විසින් සිදු කරන ලදී.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්හි ඉතිරි ප්‍රයෝජනවත් ජීව කාලය ඇස්තමේන්තු කළ යුතු අතර, ඇස්තමේන්තු කරන ලද ඉතිරි ප්‍රයෝජවත් ජීව කාලය ඇතුළුව මුළු ප්‍රයෝජනවත් ජීව කාලය මත පදනම්ව වත්කම පවරාගත් දිනයේ සිට ක්ෂය අගය ඇස්තමේන්තුගත කර ඇත්නම්, වත්කම නැවත භාවිතයෙහි යෙදවූ දිනයේ සිට ශේෂ පත්‍රයෙහි ප්‍රත්‍යාවේක්ෂණය වන පරිදි පිරිවැයෙහි හා උපචිත ක්ෂය වටිනාකමෙහි වෙනස ස්කන්ධ යටතේ ගැලපුම් කළ යුතුය.

ඒ අනුව, වත්කම් කාණ්ඩ 11 අතුරින් 07 ක් ගිණුම් වලට ගැලපුම් කරන ලද අතර මෙය අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

**46 හම්බන්තොට වරායේ ආයෝජන වත්කම් වල ජීව කාලය**

කල්බදු අයිතියෙන් ලැබෙන ආදායම එම කාලය තුළදීම ක්‍රමක්ෂය වන බැවින් HIPG සමාගම සහ HIPS සමාගම වෙත වසර 99 ක කාල සීමාවක් සඳහා කල්බදු පදනම මත පවරන ලද දේපළවල ඇස්තමේන්තුගත ජීව කාලය, අවුරුදු 100 ක් ලෙස සලකන ලදී.

**47 හම්බන්තොට වරාය ව්‍යාපෘති ප්‍රදේශය තුළ නොපිහිටි ඉඩමක් සඳහා ගෙවන ලද වන්දිය**

හම්බන්තොට වරාය ව්‍යාපෘති ප්‍රදේශය තුළ නොපිහිටි ඉඩමක් හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම වෙත පැවරීම වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය රු. 113,159,199.33 ක් ගෙවා ඇත. හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩම ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පවරන බැවින් මෙම මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වල ප්‍රාග්ධනිත කර නොමැත. ඉඩම් පැවරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වූ පසුව මෙම මුදල ප්‍රාග්ධනිත කළ හැකි වනු ඇත.

**48 අයෝජන වත්කම්වල සාධාරණ අගය තීරණය නොකිරීමේ හේතුව**

ප්‍රධාන වශයෙන් සමුද්‍රීය සංවර්ධන කාර්යයන් හා නිර්මාණවලට අයත් වන වරාය යටිතල පහසුකම් ආයෝජන දේපළවලට ඇතුළත් වේ. මෙම ස්වභාවයේ භෞතික වශයෙන් නොපවතින වරාය සංවර්ධන කාර්යයන් කිහිපයක් පමණක් ඇත. මෙම හේතූන් මත වෙළෙඳ පොළ වටිනාකම සඳහා න්‍යායාත්මක ඇස්තමේන්තුවක් ලබා ගැනීමේ පදනමක් නොතිබූ අතර පිරිවැය පදනම් වූ වටිනාකමක් සඳහාප්‍රමාණවත් මූලාශ්‍ර දත්ත ඇතුළත් කරගත හැක.

**49 වත්කම් නිරවුල් කිරීමේ ගිණුම්**

වත්කම් නිරවුල් කිරීමේ ගිණුම යනු ප්‍රාග්ධනීකරණය කරන තෙක් මුදල් රඳවා තබන තාවකාලික ගිණුමකි. අදාළ කොට්ඨාශ වෙත භාණ්ඩ භාර දෙන තුරු සහ ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා මුදල් කොට්ඨාශය වෙත ලිපි ලේඛන ලැබෙන තෙක් වත්කම් නිෂ්කාශනය කිරීමේ ගිණුමේ ශේෂය පවත්වා ගෙන යනු ලැබේ.

**50 හිමිකම් සඳහා ප්‍රතිපාදන**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වර්ෂය තුළදී නෛතික හිමිකම් පෑම් සඳහා පොදු ප්‍රතිපත්තියක් වශයෙන් රු.5,308,426,712 ක විශ්වාසනීය ඇස්තමේන්තුවක් තබා ඇත. නොනිමි නඩු පිළිබඳ විස්තර දැක්වෙන සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් පිටු අංක 53 - 60 දක්වා සඳහන් කර ඇත.

**51 අසම්භාව්‍ය ආදායම**

**2024.12.31 දිනට නිෂ්කාශනය නොකළ බහළුම් හා වාහන වලින් ලැබිය යුතු ආදායම**

වරාය පරිශ්‍රයෙන් බහළුම් හා වාහන නිෂ්කාශනය කරන තෙක්, බිල්පත් නිකුත් කර නොමැති අතර ලැබිය යුතු ආදායමක් ලෙස හඳුනාගෙන ද නොමැත. ඒ අනුව, 2023.12.31 දිනට පහත සඳහන් ආදායම් නිෂ්කාශනය නොකළ බහළුම් හා වාහන වලින් ලැබිය යුතු ආදායමක් වශයෙන් ලැබිය යුතුව ඇත.

නිෂ්කාශනය නොකළ බහළුම් 114 ක් සඳහා ලැබිය යුතු කුලිය රු.2,865,133,918 (බදු හැර)
නිෂ්කාශනය නොකළ බහළුම් 114 ක් සඳහා ලැබිය යුතු වාප්පු ගාස්තුව රු. 1,039,207 (බදු හැර)
නිෂ්කාශනය නොකළ බහළුම් 46 ක් සඳහා ලැබිය යුතු කුලිය රු.1,241,203,465 (බදු හැර)
නිෂ්කාශනය නොකළ බහළුම් 46 ක් සඳහා ලැබිය යුතු වාප්පු ගාස්තු රු.511,555 (බදු හැර)

**52 අසම්භාව්‍ය ආදායම**

**2024.12.31 දිනට තහනමනට ලක් වූ/ රඳවාගත් නොපියවූ බිල්**

ශ්‍රී ලංකා රේගුව වෙත යවා ඇති තහනමට ලක් වූ/ රඳවාගත් නොපියවූ රේගු බිල්පත් වෙනුවෙන් මෙතෙක් අයකර ගැනීමට ඇති මුදල රු. 3,957,721 ක් වන අතර අයකර ගැනීමේ අවිනිශ්චිතතාවය හේතුකොටගෙන මෙම මුදල ආදායමක් ලෙස හඳුනාගැනීම වෙනුවට සටහනක් ලෙස හෙළිදරව් කළ යුතුව ඇත.

**53 ඒකාබද්ධ අරමුදලට දායකත්වය**

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරියිය පනතේ 30 (1) (C) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීමේදී රජය විසින් ගෙවන ලද රු . 7,591,379,785 වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලට ගෙවීමට ඇති උපරිම මුදල වසරකට රු . 607 කි. ඒ අනුව, 2024 වර්ෂය සඳහා ඒකාබද්ධ අරමුදලට දායක මුදල් සඳහා රු. 607,310,382.80 ක් වෙන් කර ඇත.

**54 නැගෙනහිර බහළු පර්යන්තයේ උපකරණ සඳහා ණයවර ලිපි පහසුකම**

නැගෙනහිර බහළු පර්යන්තය සඳහා මෙහෙයුම් උපකරණ ආනයනය කිරීම සඳහා එ .ජ.ඩොලර් මිලියන 282.56 ක ණයවර ලිපි පහසුකම් 2021 දෙසැම්බර් 31 දින ලබා ගන්නා ලදී. ඉහත ණයවර ලිපි පහසුකම 2024.12.31 දිනට එ.ජ.ඩොලර් මිලියන 100.00දක්වා අඩු කර ඇත.

**55 2023.12.31 දිනට නොපියවූ අත්තිකාරම්**

සැපයුම්කරුවන්හට ගෙවිය යුතු රු . 30,122,519.26 ක අත්තිකාරම් මුදලින් 2024.12.31 දිනට නොපියවූ ශේෂය රු . 12,281,818.88 ක් විය. තවද, 2025 පෙබරවාරි මාසය දක්වා පියවූ මුදල රු . 230,830 ක් විය.

**56 ලැබීමට ඇති ආදායම් බදු**

අධිභාර සඳහා අධි ගෙවීම 2024.12.31 දිනට රු. 755,334,465 ක් වන අතර එම මුදල ආපසු ගෙවන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් දැනටමත් ඉල්ලා ඇත.

**57 සී/ස ශ්‍රී ලංකා ගෑස් ටර්මිනල් සමාගම**

සී/ස ශ්‍රී ලංකා ගෑස් ටර්මිනල් (පුද්.) සමාගම නම් වූ පරිපාලිත සමාගම ඈවර කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරමින් සිටී. මෙම සමාගම විකිණීම සඳහා ඇති සමාගමක් ලෙස වර්ගීකරණය කරන අවස්ථාව වන විට , ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 05 ප්‍රකාරව, අවශ්‍ය කරනු ලබන හෙළිදරව් කිරීම් ඉදිරිපත් කරනු ඇත . 2007 අංක 07 දරණ සමාගම් පනතේ 394 වගන්තිය ප්‍රකාරව ලියා ඉවත් කිරීමේ ඉදිරිපත් කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශ මූල්‍ය ප්‍රකාශන සඳහා සහ සී /ස ශ්‍රී ලංකා ගෑස් ටර්මිනල් (පුද්.) සමාගම ස්ථාපිත කරන කාලය තුළ අදාළ ගෙවීම් සම්බන්ධයෙන් ලේඛනවල සහතික කරන ලද පිටපත් ඇතුළත් කරමින් 2024.02.09 , 2024.07.10 හා 2024.08.23 වට දිනැති ලිපි මගින් විගණකාධිපති වෙත මුලිකව ඉදිරිපත් කර ඇති අතර ආරම්භයේ සිටම අක්‍රියව පැවැති සමාගමක් බව විගණකාධිපතිගේ තහවුරුව / විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අපේක්ෂාවෙන් පසු වේ.

**58 පූර්ව ශක්‍යතා අධ්‍යයනය**

**කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය**

අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයේ උපදේශක සේවා සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා AECOM Infrastructure & Environment UK සමාගම සමඟ ගිවිසුමකට එළඹ ඇත. එ.ජ.ඩොලර් 3,268,597.78 ක මුළු කොන්ත්‍රාත් අගයකට ඉහත සඳහන් ශක්‍යතා අධ්‍යයනය 2020 පෙබරවාරි මාසයේදී ආරම්භ කර 2023 දෙසැම්බර් මාසයේදී අවසන් කරන ලදී . ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගන්නා ලද ප්‍රවාහන ව්‍යාපෘති ප්‍රාරම්භක පහසුකම් ණය මුදලේ අරමුදල් මගින් අදාළ ගෙවීම් කරන ලදී . ඉදිරියේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට ණය ආපසු ගෙවීම් සිදු කිරීමට නොමැත . තවද, ඉහත සඳහන් තාක්ෂණික සහයෝගය ලබා ගන්නා ලද්දේ පවත්නා කොළඹ උතුරු වරාය, උතුරු දිසාවට ව්‍යාප්ත කිරීමේ හැකියාවක් පවතිනවාද යන්න හඳුනාගැනීමට ශක්‍යතා අධ්‍යයනයක් කිරීම සඳහා බවද සඳහන් කළ යුතුය . එ.ජ.ඩොලර් රජයෙන් ලබාගන්නා ලද ප්‍රදානයෙන් පර්යේෂණ කටයුත්තක් සඳහා වැයකළ මුදලක් ලෙසද සලකනු ලැබ ඇත .

**59 වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය**

වැඩහල් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය යටතේ වැඩහල් සංකීර්ණය ඉදිකිරීමට අදාළව නොනිමි වැඩ වශයෙන් සැලකෙන , කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කරන ලද ගෙවීම 2024.12.31 දිනට රු. 1,618,907,363.49 ක් විය. ඉදිකිරීම් නිම වූ පසු ප්‍රදානය ක්‍රමක්ෂය වනු ඇත .

සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය (ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල)

අධිවේගී ගුවන් මාර්ගය ඉදිකිරීම සඳහා ලබා ගන්නා ලද ඉඩම වෙනුවෙන් වන ගෙවීම් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවනු ලබමින් පවතින අතර , ඉදිකිරීම් නිම වීමෙන් පසුව එහි අගය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වලට ගනු ඇත . වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සමහර ගොඩනැගිලි සම්පූර්ණ හා අර්ධ වශයෙන් කඩා ඉවත් කරන ලදී . අළුතින් ඉදිකරන ලද වත්කම් පිළිබඳව සලකා බැලීමෙන් පසුව , සම්පූර්ණ වශයෙන් හා අර්ධ වශයෙන් කඩා ඉවත් කරන ලද ගොඩනැගිලිවල අදාළ ගැලපුම් ව්‍යාපෘතිය නිමාවීමෙන් පසුව සිදු කරනු ඇත .

**60 වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව , පසුගිය වර්ෂයේ සිදුවීම්වල වත්මන් තත්ත්වය**

2024 අගෝස්තු මාසයේ ගන්නා ලද අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයට අනුව , M/V X-Press Pearl නෞකාව සම්බන්ධයෙන් වූ නැංගුරම් ගාස්තුව වන රු.195,334,269.98 2024 වර්ෂයේදී අය කිරීම අයකිරීමෙන් අත්හැර ඇත .

**61 සේවක ණය අගය කිරීම**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 යටතේ කාර්ය මණ්ඩල ණය මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරන අතර , ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්‍ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ . මූලික හඳුනාගැනීමේදී සාමාන්‍ය වාණිජ කොන්දේසි යටතේ ලබා දෙන සමාන ණය වලට අදාළ වන වෙළෙඳ පොල පොලිය භාවිතා කරමින් ණය අවම්ල කරනු ලබන අතර ණය මුදල් සාධාරණ අගය සඳහා දෙන ලද සත්‍ය මුදල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 අවම්ල මූල්‍ය ප්‍රවාහ ක්‍රමයක් භාවිතා කරමින් සේවක ප්‍රතිලාභ යටතේ සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ .

වට්ටම් සහිත අනුපාත තීරණය කිරීම සඳහා නිරීක්‍ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්ත භාවිතා කරන බැවින් සාධාරණ අගයෙහි අනුපිළිවෙලිහි දෙවන මට්ටමට වඩා අඩුවෙන් සාමාන්‍යයෙන් ගණනය කිරීමත් සමඟ ලබානොගත් ණය සඳහා පවත්නා පොලී අනුපාතය වැනි වෙළෙඳ පොල මත පදනම් වූ යෙදවුම් ඇතුළත් කරමින් වට්ටම් කරන ලද මුළද් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිත 13 මගින් සාධාරණ වටිනාකම තීරණය කරනු ලැබේ .

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ක්‍රමක්‍ෂය කළ පිරිවැය යටතේ කාර්ය මණ්ඩල ණය , මූල්‍ය වත්කම් ලෙස සටහන් කර ඇති අතර ලාභ හෝ අලාභ ප්‍රකාශනය , ආරම්භක සාධාරණ වටිනාමක් ගැලපීම සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස පිළිඹිබු වේ . වට්ටම් අහෝසි කිරීම ණය කාල සීමාව තුළ පොලී ආදායම ලෙස හඳුනාගැනේ.

| සේවක ණය | | | | (රු.) |
|---|---|---|---|---|
| | කොළඹ | ගාල්ල | ත්‍රිකුණාමලය | ශ්‍රීලවඅ |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 3,166,270,601 | 190,325,363 | 158,225,295 | 3,514,821,259 |
| වර්ෂය තුළ ප්‍රදානය කරන ලද ණය | 12,884,687,053 | 340,993,841 | 366,586,206 | 13,592,267,099 |
| වර්ෂය තුළ අයකර ගත් ණය | (11,960,491,284) | (302,311,621) | (351,851,057.00) | (12,614,653,962) |
| පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ ප්‍රතිගණනය | 2,206,294,207 | 39,882,093 | 107,850,679 | 2,354,026,979 |
| පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ නැවත ක්‍රියාත්මක කිරීම | 343,520,192 | 11,726,971 | 35,767,653 | 391,014,815 |
| 2024 වර්ෂය තුළ පෙරගෙවුම් සේවක ප්‍රතිලාභ මාරු කිරීම් | (971,817,497) | (38,363,721) | (95,209,113) | (1,105,390,331) |
| වර්ෂ අවසානයේ ශේෂය | **5,668,463,272** | **242,252,925** | **221,369,663** | **6,132,085,859** |
| **2024.12.31 දිනට පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ** | **1,005,274,484** | **39,054,812** | **100,314,106** | **1,144,643,402** |
| **2024.12.31 දිනට හිඟ සේවක ණය** | **6,673,737,755** | **281,307,737** | **321,683,769** | **7,276,729,261** |
| | | | | |
| **සේවක ණය - ජංගම නොවන** | 6,632,245,597 | 279,517,727 | 320,305,764 | 7,232,069,088 |
| **සේවක ණය - ජංගම** | 41,492,158 | 1,790,010 | 1,378,005 | 44,660,173 |
| | **6,673,737,755** | **281,307,737** | **321,683,769** | **7,276,729,261** |
| | | | | |
| **පෙර ගෙවූ ප්‍රතිලාභ සටහන** | කොළඹ | ගාල්ල | ත්‍රිකුණාමලය | ශ්‍රීලවඅ |
| 2023.01.01 දිනට ශේෂය | 566,438,759 | 17,547,130 | 32,853,077 | 616,838,967 |
| වර්ෂය තුළ හඳුනාගත් | 2,347,866,304 | 73,024,012 | 151,464,233 | 2,572,354,550 |
| පෙර ගෙවූ ප්‍රතිලාභවල ක්‍රමක්‍ෂය (2023 වර්ෂය) | (331,033,678) | (38,270,989) | -35,593,985 | (404,898,652) |
| 2023.12.31 දිනට ශේෂය | **2,583,271,386** | **52,300,154** | **148,723,325** | **2,784,294,865** |
| වර්ෂය තුළ හඳුනාගත් | 971,817,497 | 38,363,721 | 95,209,113 | 1,105,390,331 |
| පෙර ගෙවූ ප්‍රතිලාභවල ක්‍රමක්‍ෂය (2024 වර්ෂය) | (343,520,192) | (11,726,971) | (35,767,653) | (391,014,815) |
| සේවක ප්‍රතිලාභ ප්‍රතිගණනය | (2,206,294,207) | (39,882,093) | (107,850,679) | (2,354,026,979) |
| **2024.12.31 දිනට ශේෂය** | **1,005,274,484** | **39,054,812** | **100,314,106** | **1,144,643,402** |

**62 වත්කම් වගකීම් ගැලපීම (පාරිතෝෂික ප්‍රතිලාභ වගකීම්)**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 19 ට අනුව, සමාගම එහි පාරිතෝෂික ප්‍රතිලාභ වගකීම් අරමුදල් නොසැපයූ වගකීම් ලෙස හඳුනාගන්නා ඇත , ප්‍රමිතිය යටතේ නිර්වචනය කර ඇති පරිදි සැලසුම් වත්කම් පවත්වාගෙන යනු නොලැබේ . කෙසේ වුවද, මූල්‍ය සූදානම තහවුරු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාරිතෝෂික ගෙවීම් කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර සංචිතයක් වන ස්ථාවර තැන්පතු පවත්වාගෙන යනු ලැබේ .

ස්ථාවර තැන්පතු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නෛතිකව වෙන්කර ඇති වත්කම් නොවන අතර ඒවා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඍජු පාලනය යටතේ පවතී . මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මේවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 යටතේ සැලසුම් වත්කම් ලෙස හඳුනා නොගැනේ . ඒ වෙනුවට පාරිතෝෂික වගකීම් හඳුනා ගැනීමට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සංචිතයක් ලෙස වෙන් කරන ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ . සේවයෙන් ඉවත් වන සේවකයින්හට ගෙවනු ලබන පාරිතෝෂික මෙම සංචිතයට ගනු ලැබේ .

අනාගත පාරිතෝෂික වගකීම් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කර ගැනීම සහතික කිරීම සඳහා සංචිතයේ හා ස්ථාවර තැන්පතුවේ ප්‍රමාණවත්භාවය කාලානුරූපීව සමාලෝචනය කරනු ලැබේ .

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**63 අදාළ පාර්ශ්වයන්ගේ අනාවරණය කිරීම්**

ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධ ආයතන, පරිපාලිත සමාගම්, ආශ්‍රිත සමාගම් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධිකාරියේ අදාළ පාර්ශ්වයන්ට ඇතුළත් වේ.

**63 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සිදු කරන ගනුදෙනු**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 24ට අනුව “අදාළ පාර්ශ්ව අනාවරණය කිරීම්“ , සැලසුම් කිරීම", උපදේශනය සහ ඍජුව හා වක්‍රව ආයතනයේ කටයුතු පාලනය කිරීම සඳහා වගකීම් සහිත නිලධාරීන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වේ. ඒ අනුව, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළත් වන අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත.

| **ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ කරන ගනුදෙනු පහත දැක්වේ.** | **2024** | **2023** |
|---|---|---|
| පාරිශ්‍රමික හා වෙනත් කෙටිකාලීන සේවක වරප්‍රසාද | 66,182,965 | 50,308,730 |
| හිඟ ශේෂය - ණය හා අත්තිකාරම් | 391,060 | 441,500 |
| අවසන් කිරීමේ ප්‍රතිලාභ | | |

**63 අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු**

අධිකාරිය විසින් අදාළ විශේෂ පාර්ශ්වයන් සමඟ කරන ගනුදෙනු පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| ආයතනයේ නම | සම්බන්ධතාවය | අධ්‍යක්ෂවරුන්/ නියෝජිතයින්ගේ නම් | ගනුදෙනු වල ස්වභාවය | ගනුදෙනුවේ අගය | ගෙවිය යුතු | ලැබිය යුතු |
|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය | ප්‍රාග්ධන දායක ආයතන | පී ඒ එස් අතුල කුමාර මහතා | ණය ආපසු ගෙවීම | 5,820,931,324 | - | - |
| | | දමිතා කුමාරි රත්නායක මහත්මිය | පොළී ආපසු ගෙවීම | 3,908,594,290 | - | - |
| | | එන් ඒ එච් කේ විජේරත්න මහතා | ප්‍රවාහන දීමනා | 87,500 | - | - |
| | | | භාණ්ඩාගාර මෙහෙයුම්වලින් ලැබිය යුතු | - | - | 329,238,237 |
| | | | | | | |
| සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම | ආශ්‍රිත සමාගම | කමල් ගනේපොල මහතා | ලබා ගත් පවිත්‍රතා සේවා වෙනුවෙන් | 102,529,287 | 18,648,026 | - |
| | | | | - | - | - |
| | | සුරාජ් කතුරුසූරිය මහතා | පැටවීම් හා ගොඩබෑම් සේවා සඳහා | 60,271,179 | 3,472,768 | - |
| | | | මෙහෙයුම්කරුවන් කුලියට ගැනීම | 348,451,557 | 47,392,012 | - |
| | | | මෙහෙයුම්කරුවන් කුලියට ගැනීම | 138,974 | 138,974 | - |
| | | | යාත්‍රා බැඳ තැබීමේ හා මුදා හැරීමේ | 166,297,303 | 29,035,200 | - |
| | | | අන්තර් පර්යන්ත ට්‍රක්රථ | 197,330,718 | 61,866,564 | - |
| | | | ශීතාගාර අධීක්ෂණය | 16,140,672 | 2,899,296 | - |
| | | | පැවරුම් පදනම | 35,665,662 | 18,641,994 | - |
| | | | ක්‍රියාකරවන මෙහෙයුම්කරුවන් | 4,891,179 | 4,891,179 | - |
| | | | සුභසාධක දාරකාගාරය | 4,769,231 | 1,230,769 | - |
| | | | ඉන්ධන සැපයීම | 45,543,219 | - | 9,190,403 |
| | | | ඉන්ධන සැපයීම (ගාලු මුවදොර පරිශ්‍රයේ නිරීක්ෂණ මැදිරිය අළුත්වැඩියා | 1,654,212 | - | 4,300,952 |
| | | | ගාලු මුව දොර ආදායම | 5,036,966 | - | 2,928,579 |

# මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන්

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සීමාසහිත ජය බහළු පර්යන්ත සමාගම | පරිපාලිත සමාගම | ලක්මාල් රත්නායක මහතා | පරිපාලන හා යටිතල පහසුකම් ගෙවීම | 719,870,640 | 67,721,408 | - |
| | | පී එස් උපුල් ප්‍රියන්ත මහතා | ලාභාංශ ලැබීම් | 21,250,000 | - | - |
| | | ජී එස් ජී කෝදාගොඩ මහතා | ඉන්ධන සැපයීම | 7,340,539 | - | 426,991 |
| | | අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික) | ඖෂධ නිකුත් කිරීම | 69,002 | - | 50,981 |
| | | ඉංජි. හේරත් එම් පී ජයවර්ධන මහතා | දුරකථන බිල් | 326,818 | - | 79,106 |
| | | | | | | |
| සීමාසහිත සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් පුද්ගලික සමාගම | ආශ්‍රිත සමාගම | අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික) | කුලී ලැබීම් | 1,123,444,956 | - | 81,545,182 |
| | | ඉංජි. හේරත් එම් පී ජයවර්ධන මහතා | රාජ්‍ය භාග ලැබීම් | 2,326,788,632 | - | 224,704,834 |
| | | | පුහුණු ගාස්තු | 1,171,912,791 | - | - |
| | | | ලාභාංශ ලැබීම් | 177,500 | - | - |
| | | | ලැබිය යුතු කොටස් | - | - | 141,632,944 |
| සී/ස ලංකා කොල් පුද්ගලික සමාගම | ආශ්‍රිත සමාගම | කපිතාන් නිර්මාල් සිල්වා | වර්ෂය තුළ ගනුදෙනු කිසිවක් සිදු වී නොමැත . | - | - | - |
| සී/ස කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම | ආශ්‍රිත සමාගම | අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික) | බදු/ කුලී ආදායම | 2,153,622,385 | - | (1,833,348,327) |
| | | ඉංජි. හේරත් එම් පී ජයවර්ධන මහතා | ලාභාංශ ලැබීම් | 5,272,485,608 | - | 2,491,478,920 |
| | | | විලම්භිත පොලී ලැබීම් | - | - | - |
| | | | පුහුණු ගාස්තු | 208,000 | - | - |
| | | | එකවර ගෙවන ලද වාරික ආදායම | 103,534,286 | - | - |
| | | | ලාභාංශ ලැබීම් | 2,309,625,000 | - | - |
| | | | තාවකාලිකව අඩුක් කිරීම සඳහා ECT අංගනය භාවිතා කිරීම | 89,642,319 | - | 89,642,319 |
| මාගම්පුර වරාය කළමනාකරණ සමාගම | පරිපාලිත සමාගම | | කළමනාකරණ ගාස්තු ලැබීම | 93,137,331 | - | - |
| කලම්බු ඩොක්යාඩ් සමාගම | ආශ්‍රිත සමාගම | | පුහුණු ගාස්තු | 108,000 | - | - |
| | | | | | | |
| සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම | ආශ්‍රිත සමාගම | අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික) | කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | 731,198,730 | - | - |
| | | ඉංජි. හේරත් එම් පී ජයවර්ධන මහතා | HIPS වෙතින් වැටුප් ලැබීම් | 58,796,129 | - | 4,894,598 |
| | | ටී කේ ජී එල් හේවන්ද්‍ර මහතා | | | | |
| සී/ස හම්බන්තොට ඉන්ටර්නැශනල් පෝ | ආශ්‍රිත සමාගම | අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික) | රාජ්‍ය භාග ආදායම | 58,559,118 | - | 61,882,674 |
| | | ඉංජි. හේරත් එම් පී ජයවර්ධන මහතා | කල්බදු අයිතියේ ක්‍රමක්ෂය | 981,799,130 | - | - |
| | | | | | | |
| සී/ස කලම්බු ඉන්ටර්නැෂනල් වෙස්ට් ටර්මිනල් සමාගම | ආශ්‍රිත සමාගම | අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික) | එකවර ගෙවන ලද වාරික ආදායම | 185,107,468 | - | - |
| | | ඉංජි. හේරත් එම් පී ජයවර්ධන මහතා | බදු/ කුලී ආදායම | 1,964,613,958 | - | 5,507,896,206 |
| | | | විලම්භිත බදු කුලී පොලිය | 307,023,948 | - | 588,469,144 |
| | | | වර්ෂය තුළ සිදු කළ ආයෝජන | 3,002,656,500 | - | - |
| දකුණු ආසියා වාණිජ හා සේවා සැපයුම් | ආශ්‍රිත සමාගම | අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික) | එකවර ගෙවන ලද ලැබීම් | 92,237,600 | - | 690,592,140 |
| | | | කුලී / බදු ලැබීම් | 163,580,000 | - | 591,576,120 |
| | | | වර්ෂය තුළ සිදු කළ ආයෝජන | - | - | - |
| ප්‍රවාහන, මහා මාර්ග, වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශය | රේඛීය අමාත්‍යාංශය | | හිටපු අමාත්‍යතුමාගේ නිල නිවසේ ජල හා විදුලි බිල්පත් | - | - | 305,158 |
| | | | ඉන්ධන සැපයීම | 8,763,121 | - | 223,573 |
| | | | ප්‍රවාහන දීමනා | 87,500 | - | - |
| ලංකා ගෑස් ටර්මිනල් සමාගම | ආශ්‍රිත සමාගම | | ලංකා ගෑස් ටර්මිනල් සමාගමෙන් ලැබිය යුතු | - | - | 11,500 |

# මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන්

**මූල්‍ය අවදානම් කළමනාකරණය**

මූල්‍ය උපකරණ භාවිතය හේතුවෙන් පහත සඳහන් අවදානම් වලට මුහුණදීමට අධිකාරියට සිදුවනු ඇත.

1. ණය අවදානම
2. ද්‍රවශීලතා අවදානම
3. වෙළඳපොළ අවදානම (මුදල් අවදානම සහ පොලී අනුපාත අවදානම)

අධිකාරියේ මූල්‍ය උපකරණ ස්කන්ධ වල ආයෝජන (ලේඛනගත සහ ලේඛනගත නොකල), ණයකර වල ආයෝජන, කාලීන තැන්පතු, මූල්‍ය වෙළඳපොළ ආයෝජන සහ මුදල් වලින් සමන්විත වේ. කාලීන තැන්පතු හා මූල්‍ය වෙළඳපොළේ ආයෝජනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ, මෙහෙයුම් සඳහා ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සහ පවත්වාගෙන යාමයි. ස්කන්ධවල සහ ණයකර සුරැකුම්පත්වල ආයෝජන ක්‍රමෝපායික ආයෝජනයන් වන අතර, ව්‍යාපාරික කටයුතු වලින් සෘජුවම පැනනඟින වෙළඳ සහ වෙනත් ලැබීම් හා වෙළඳ සහ වෙනත් ගෙවීම් වැනි වෙනත් මූල්‍ය කටයුතු අධිකාරිය සතුව පවතී. තවද, වරාය පුළුල් කිරීම සහ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ශ්‍රී ලංකා රජයෙන් සහ මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය පොලිය ගෙවිය යුතු වේ.

## 1. ණය අවදානම

ණය අවදානම යනු ගණුදෙනුකරුවෙකු ගිවිසුම් ප්‍රකාර බැඳීම් හමුවේ ගෙවීම් කිරීමට අපොහොසත් වන්නේ නම්, එය අධිකාරියට සිදුවිය හැකි මූල්‍ය පාඩු පිළිබඳ අවදානම වන අතර, මෙය ප්‍රධාන වශයෙන් පැනනඟිනු ලබන්නේ ශ්‍රී ලංකා හමුදා, වෙනත් රාජ්‍ය ආයතන සහ ආයෝජන සුරැකුම් ඇතුළු ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ලැබීම් වලිනි.

**වෙළඳ ලැබීම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රධාන වශයෙන් වෙළඳ කටයුතු කරන්නේ නැව් නියෝජිත ආයතන හා රජයේ ආයතන සමඟය. එහි කළමනාකාරීත්වය නැව් නියෝජිත ආයතන වල තත්ත්වය මැන බලනුයේ එම ආයතන වල පසුගිය වෙළඳ ගනුදෙනු වල අත්දැකීම් හා වෙනත් මූල්‍ය වගකීම් පදනම් කර ගෙනය. ඊට අමතරව, හිඟ ශේෂ අයකර ගැනීම් කළමනාකරණ කමිටු හා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවතින තත්ත්වය පදනම් කරගෙන අධීක්ෂණය කරනු ලැබේ.

වෙළඳ ලැබීම් මත හානිකරණ අලාභ වල අනුමත කල හැකි ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් “සරල ප්‍රවේශය” (Simplified Approach) අනුගමනය කරනු ලබේ. ණය අවධානම පිළිබඳ ඇතිවන වෙනස් කම් අඩුකර ගැනීමට සරල ප්‍රවේශ ක්‍රමය ශ්‍රී ලංකා වරාය අධිකාරිට අවශ්‍ය නොවේ. ඒ වෙනුවට සෑම වාර්තාකරණ දිනකටම ECLs (අපේක්ෂිත බැර පාඩුව) ජීව කාලය මත පදනම්ව අනුමත කල හැකි හානිකරණ ප්‍රමාණයෙ සීමාව, වත්කම් වල මූලික හඳුනාගැනීමෙන් තහවුරු කල හැක. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, ආයතනයේ වෙළඳ ලැබීම් වලින් එහි ආයෝජනයන් මත අනුමත කල හැකි හානිකරණ ප්‍රමාණයේ සීමාව තීරණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රතිපාදන න්‍යාය භාවිතා කරනු ලැබේ. ප්‍රතිපාදන න්‍යාය වෙළෙඳ ලැබීම්වල අපේක්ෂිත ආයු කාලය තුළ එහි නිරීක්ෂණය කරන ලද ඓතිහාසික පැහැර හැරීම් කාලය මත පදනම්ව වන අතර ඉදිරි ඇස්තමේන්තුවල වෙනස්කම් විශ්ලේෂණය කරනු ලැබේ. මෙම කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් හානිකරණ අලාභ ගාස්තු ප්‍රමාණය (හෝ වෙනස්වීම්) ආදායම/ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

**වෙනත් මූල්‍ය වත්කම්**

අධිකාරියේ වෙනත් මූල්‍ය වත්කම්වලින් පැන නගින ණය අවදානම සමන්විත වන්නේ කාලීන තැන්පතු, මුදල් සහ මුදල් හා සමාන වෙනත් දෑ සහ ණයකර වල යොදවන ආයෝජන වලිනි. මෙම මූල්‍යමය ලියකියවිලි වල ඉදිරියට ගෙන ගිය මුදලට සමාන උපරිම අනාවරණයක් සහිතව, ගිවිසුම් ප්‍රකාර පාර්ශ්වයන්ගේ ගිවිසුම් ප්‍රකාර වගකීම් හමුවේ වූ ගෙවීම් පැහැර හැරීම් වලින් පැනනගින මූල්‍ය අවදානම

හේතුවෙන් අධිකාරිය මූල්‍ය අවදානමට මුහුණ දේ. ප්‍රධාන වශයෙන් රාජ්‍ය මූල්‍ය ආයතනවල සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හි අරමුදල් යෙදවීම මගින් මෙම මූල්‍යමය ලියකියවිලි සම්බන්ධයෙන් ඇති ණය අවදානම අධිකාරිය විසින් පාලනය කරනු ලැබේ.

## 2. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු අධිකාරිය විසින් සිය මූල්‍ය වගකීම්, නියමිත කලට ඉටු කිරීමට නොහැකි වීම වේ. ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමේදී අධිකාරියේ වගකීම වන්නේ, සාමාන්‍ය සහ අනපේක්ෂිත අවස්ථාවන් යටතේ, පිළිගත නොහැකි පාඩුවීම් රහිතව හෝ අධිකාරියේ කීර්තිනාමයට හානිවීම පිළිබඳ අවදානමකින් තොරව වගකීම් ගෙවීමට ඇති අවස්ථාවන්හි දී, ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් මුදල් අධිකාරිය සතුව තිබීම හැකිතාක් දුරට සහතික කිරීමයි.

මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහයන් (පුනරාවර්තන අයවැය) සහ ප්‍රාග්ධන අයවැයවල පුරෝකථනයන් වාර්ෂිකව පිළියෙල කෙරේ. මෙහෙයුම් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් අධිකාරිය සතුව ඇති බවට සහතික වනු පිණිස ප්‍රාග්ධන සහ පුනරාවර්තන යන අයවැය ද්විත්වය සහ ද්‍රවශීලතා අවශ්‍යතාවයන් මුදල් කොට්ඨාශය විසින් අධීක්ෂණය කරනු ලැබේ. ගිණුම් වාර්තා සැකසීමේ කාලපරිච්ඡේදය අවසානයේ දී අධිකාරිය රු. 84,981,038,697 (2023 : රු. 104,753,561,899) මුදලක් කාලීන තැන්පතු, කෙටි කාලීන රජයේ සුරැකුම්පත් සහ වෙනත් ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යනු ලැබීය.

ගිණුම් වාර්තා කිරීමේ කාලසීමාවේ අවසන් වන විට, ගිවිසුම් ප්‍රකාරව කල් පිරෙන දිනය දක්වා ඇති ඉතිරි කාලසීමාව මත පදනම්ව අධිකාරියේ මූල්‍ය වගකීම් වල කල්පිරීමේ විශ්ලේෂණ පහත වගුවෙන් නිරූපණය කෙරේ. වට්ටම් නොලැබූ ගිවිසුම් ප්‍රකාර මුදල් ප්‍රවාහයන් වගුවේ අගයන්ගෙන් පෙන්නුම් කෙරේ.

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇත**

| මූල්‍ය වගකීම් | 2024 දෙසැම්බර් 31 | | | 2023දෙසැම්බර් 31 | | |
|---|---|---|---|---|---|---|
| | වසරකට වඩා අඩු | වසරකට වඩා වැඩි | එකතුව | වසරකට වඩා අඩු | වසරකට වඩා වැඩි | එකතුව |
| ණය ගැණුම් / රජය | 6,789,630,405 | 51,334,904,544 | 58,124,534,949 | 7,821,252,838 | 63,279,672,079 | 71,100,924,917 |
| ණය ගැණුම්/ මූල්‍ය ආයතන | 329,238,237 | 2,140,048,561 | 2,469,286,798 | 329,238,237 | 2,469,286,799 | 2,798,525,036 |
| වෙළඳ සහ වෙනත් ණය හිමියන් | 3,519,743,366 | - | 3,519,743,366 | 4,249,855,218 | - | 4,249,855,218 |
| **එකතුව** | **10,638,612,008** | **53,474,953,105** | **64,113,565,113** | **12,400,346,293** | **65,748,958,878** | **78,149,305,171** |

## මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන්

**සමූහය**

| මූල්‍ය වගකීම් | 2024 දෙසැම්බර් 31 | | | 2023 දෙසැම්බර් 31 | | |
|---|---|---|---|---|---|---|
| | වසරකට වඩා අඩු | වසරකට වඩා වැඩි | එකතුව | වසරකට වඩා අඩු | වසරකට වඩා වැඩි | එකතුව |
| ණය ගැණුම් / රජය | 6,789,630,405 | 51,334,904,544 | 58,124,534,949 | 7,821,252,838 | 63,279,672,079 | 71,100,924,917 |
| ණය ගැණුම්/ මූල්‍ය ආයතන | 329,238,237 | 2,140,048,561 | 2,469,286,798 | 340,539,837 | 2,543,183,809 | 2,883,723,646 |
| වෙළඳ සහ වෙනත් ණය හිමියන් | 3,452,406,257 | - | 3,452,406,257 | 4,180,852,000 | - | 4,180,852,000 |
| එකතුව | **10,571,274,899** | **53,474,953,105** | **64,046,228,004** | **12,342,644,675** | **65,822,855,888** | **78,165,500,563** |

### 3. වෙළඳපොළ අවදානම

අධිකාරියේ ආදායමට හෝ මූල්‍ය ලියකියවිලි වල ඉදිරියට ගෙන ගිය රඳවාගත් අගයට බලපෑමක් ඇති කරනු ලබන, විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාත වැනි වෙළඳපොළ මිළ වෙනස්වීමේ අවදානමක් සහිත දෑ වෙළඳපොළ අවදානම ලෙස සැලකේ.

### 3.1 විනිමය මුදල් අවදානම

ගිණුම් වාර්තාකරණ කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය නිදහසේ පාවීමට ඉඩහැරීමෙන් පසුව, ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇ.එ.ජ.ඩොලරයේ වටිනාකම උච්චාවචනය වීම මගින් අධිකාරියේ මූල්‍ය අවදානම පැනනගියි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුදල් ගණුදෙනු වලින් වැඩි කොටසක් සඳහා භාවිත කරන මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වේ. කෙසේ නමුත්, වරාය පුළුල් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති හා ඇතැම් බැංකු ශේෂ සහ නාවික නියෝජිත ලැබීම් (උදා: APL ලංකා පුද්ගලික සමාගම ආදිය) වලට අදාළ පොලී සහිත ණය ගැණුම් විදේශ මුදල් ඒකක මගින් දක්වා ඇත. (ජපන් යෙන් සහ ඇ.එ.ජ. ඩොලර්) ඇ.එ.ජ.ඩොලරය සහ ජපාන යෙන් නිදහසේ පාවීමේ ප්‍රතිඵලයක් ලෙස ණය ගැණුම් නැවත ගෙවීම් සහ නැව් නියෝජිතයින්ට (උදා: APL ලංකා පුද්ගලික සමාගම ආදිය) සැපයූ සේවාවන් ඉන්වොයිස්ගත කිරීම මගින් පැන නැගුණු රු.1,203,463,822 ක මුදල, ඇ.එ.ජ. ඩොලරයට/ ජපන් යෙන් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමෙන් 2024 වර්ෂයේ ගිණුම් වාර්තා කරන කාල සීමාව සඳහා මෙහෙයුම් ප්‍රතිඵල මත බලපෑමක් එල්ල කරන ලදී. කෙසේ නමුත්, එකම මුදල් ඒකකයක් මගින් පවත්වාගෙන යන මුදල් තැන්පතු හරහා ප්‍රති ගෙවීම් සහ ලබාගත් ණය ප්‍රති ගෙවීම සිදුකිරීමට හා මුදල් සංචලනයේ බලපෑම අවම කිරීමට අධිකාරිය විසින් එකම මුදල් ඒකකයක් භාවිතා කරනු ලැබේ.

පොලී සහිත ණය හා විදේශ විනිමය මගින් පාලනය දක්වා ඇති ණය ගැනීම් පිළිබඳ තොරතුරු සඳහා කරුණාකර මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 24 හා 25 බලන්න.

### 3.2 පොලී අවදානම

බැංකු තැන්පතු, රාජ්‍ය සුරැකුම්පත් සහ ස්ථාවර හා සංචරණ පොලී අනුපාත සමඟ පොලී සහිත ණය ගැනීම් හා සම්බන්ධ වෙළඳපොළ පොලී අනුපාතයේ වෙනස්කම් අධිකාරියේ පොලී අවදානමට හේතු වේ.

## මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන්

රු. 57,676,266,448 (2023 : රු. 69,270,504,631) වන අධිකාරියේ පොලී සහිත ණය සහ ලබාගැනීම් වල පොලී වල අනුපාතයට අනුව ගණනය කෙරෙන අතර අනෙකුත් මුදල වන රු. 2,917,555,300 (2023: රු. 4,628,945,322) හි අඩංගු පොලිය ස්ථාවර අනුපාතයට අනුව ගණනය කරනු ලැබේ.

රජයේ සහ රාජ්‍ය බැංකු වල ඇති තැන්පතු ඇතුළුව මුදල් හා බැංකු ශේෂයන් අධිකාරිය සතුව පවතී. අධිකාරිය විසින් ක්‍රියාකාරි ලෙස පොලී අනුපාත වලනයන් අධීක්ෂණය කිරීම තුළින් පොලී අනුපාත අවදානම අධීක්ෂණය කරනු ලබයි.

| **ණය** | **2024 (රු.)** | **2023 (රු.)** |
|---|---|---|
| **වල අනුපාතය** | | |
| කොළඹ වරාය පුළුල් කිරීම (දකුණු වරාය) | 55,206,979,649 | 66,471,979,594 |
| සූරියවැව ක්‍රීඩාංගනය ඉදිකිරීම (මහජන බැංකුව) | 2,469,286,799 | 2,798,525,037 |
| **එකතුව** | 57,676,266,448 | **69,270,504,631** |
| **ස්ථාවර අනුපාතය** | | |
| කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 2,646,667,985 | 4,331,336,962 |
| කන්කසන්තුරය වරායේ ප්‍රතිසංස්කරණය කිරීමේ ණය | 270,887,315 | 297,608,360 |
| **එකතුව** | **2,917,555,300** | **4,628,945,322** |

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**63. ණය ලබා ගැනීමේ පහසුකම් වල කොන්දේසි**

| ණය මුදලේ නම | ණය ලබා දෙන ආයතනය | මුදල් ඒකකය | පොලී අනුපාතිකය | ණය මුදල (ණය ලබාදෙන මුදල් ඒකක වලින්) | 2023.12.31 දිනට හිඟ ශේෂය (රු.) | ණය ගැනීමේ පිරිවැය (රු.) |
|---|---|---|---|---|---|---|
| JBIC ණය SLP-41 | | ජපන් යෙන් | 2.60% | 4,878,185,478 | | |
| SLP-46 | | ජපන් යෙන් | 2.60% | 2,644,187,565 | 1,353,111,467 | |
| SLP-67 i | | ජපන් යෙන් | 1.80% | 1,354,512,318 | 764,257,032 | |
| SLP-67 ii | | ජපන් යෙන් | 0.75% | 217,445,997 | | |
| SLP-85 | | ජපන් යෙන් | 0.30% | 14,495,000,000 | 512,316,788 | |
| කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය ණය | ඉන්දියාවේ එක්සිම් බැංකුව | එ.ජ.ඩො. | 1.75% | 45,270,000 | 268,857,395 | 10,528,047 |
| ADB-2319 | ආසියානු සංවර්ධන බැංකුව | එ.ජ.ඩො. | Libor+0.6% | 300,000,000 | 53,988,616,511 | |
| සූරිය වැව ක්‍රීඩාංගනය ඉදිකිරීම | මහජන බැංකුව | ශ්‍රීලරු. | AWPLR+2.5% | 3,950,858,870 | 2,469,286,799 | |
| | | | **එකතුව** | | **59,356,445,993** | **10,528,047.00** |
| | | උපචිත පොළිය | | | 1,237,375,755 | |
| | | | | | **60,593,821,748** | |
| | | සටහන 24 | ණය ලබා ගැනීම් -ශ්‍රී ලංකා රජයෙන් | | 58,124,534,949 | |
| | | සටහන 25 | ණය ලබා ගැනීම් -මූල්‍ය ආයතනයන්ගෙන් | | 2,469,286,799 | |
| | | | | | **60,593,821,748** | |

මහා භාණ්ඩාගාරය විසින් සනාථ කරන ලද ගෙවිය යුතු ශේෂයට ගැලපෙන පරිදි 2024.12.31 දිනට පැවති විනිමය අනුපාතය භාවිතා කරමින් විදේශ විනිමය ණයට ගැනුම් පරිවර්තනය කර ඇත.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා



# ප්‍රස්ථාරික සමාලෝචනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා






මගේ අංකය / எனது இல. / My No. පීඑස්/ඒ/එස්එල්පීඒ/01/2024/1 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 ජුනි 30 දින

සභාපති

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්හි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ("අධිකාරිය") සහ එහි පරිපාලිත සමාගම්හි ("සමූහය") 2024 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි 4 වන පරිච්ඡේදයේ 4.3 සිට 4.6 දක්වා ඡේද සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 7 (අ) වන ඡේදය අනුව දේපළ පිරියත උපකරණ වත්කම් ලෙස හඳුනාගැනීමට වත්කම සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම සිදුවිය යුතු නමුත් වරාය අධිකාරියට අනාගත ආර්ථික ප්‍රතිලාභ සහ හිමිකමක් නොමැති රු.මිලියන 947.5 ක් වූ අක්කර 02 ක රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ ඉඩම, රු.මිලියන 628.5 ක් වූ අක්කර 2 රූඩ් 3 පර්චස් 9.61 ක් වූ නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා පවරාගෙන තිබූ ඉඩම, රු.මිලියන 83.7 ක් වූ අක්කර 01 රූඩ් 02 පර්චස් 14.9 ක් වූ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන තිබූ ඉඩම සහ රු.මිලියන 19.8 ක් වටිනා අක්කර 4 රූඩ් 3 පර්චස් 3.2 ක් වූ කිඹුලාවල ඉඩමෙහි අධිකාරියට අයත් නොවන කොටසෙහි වටිනාකම ද වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එකතුව අක්කර 11 පර්චස් 27.71 ප්‍රමාණයකින් සහ රු.මිලියන 1,679.5 ක වටිනාකමකින් ජංගම නොවන වත්කම් අධිගණනය වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කර වෙනසක් සිදුවන්නේ නම් එම වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ප්‍රකාරව ගිණුම්වලට ගැලපුම් කළ යුතුය. එසේ වුවද, 2024 දෙසැම්බර් 31 දිනට අධිකාරියෙහි ගාල්ල වරාය හා ත්‍රිකුණාමල වරාය සතුව ඵලදායී ජීව කාලය අවසන් වූ නමුත් තවදුරටත් භාවිතා කළ හැකි පිරිවැය පිළිවෙලින් රු.මිලියන 460.47 සහ රු.මිලියන 362.30 ක් වූ හා මුළු වටිනාකම රු.මිලියන 822.77 ක් වූ වත්කම්වල ඵලදායී ජීව කාලය හා සුන්බුන් අගය 2024 වර්ෂය තුළදී සමාලෝචනයට භාජනය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 හි 21 වන ඡේදය අනුව විදේශ මුදල් ඒකකයන් සහිත ගනුදෙනු මුල්වරට හඳුනාගැනීමේදී (Initial Recognition) ආයතනය විසින් ගනුදෙනුව සිදුකරන දිනට පැවති එතැන් විනිමය අනුපාතය (Spot rate) භාවිතා කළ යුතු වුවද, 2024 වර්ෂය සඳහා කොළඹ අන්තර්ජාතික බහාලුම් පර්යන්ත සමාගමෙන් (CICT) සහ දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගමෙන් (SAGT) අයවිය යුතු පුරස්කාර ආදායම ගිණුම්ගත කිරීමේදී එතැන් විනිමය අනුපාතය භාවිතා නොකිරීම හේතුවෙන් පුරස්කාර ආදායම පිළිවෙලින් රු.මිලියන 49.31 කින් සහ රු.මිලියන 43.49 කින් අධිගණනය වී තිබුණි. එසේම, අධිකාරිය විසින් ආදායම් හඳුනාගැනීමේදී එතැන් විනිමය අනුපාතය (Spot Rate) යොදාගැනීම වෙනුවට, වැඩි අගයක් සහිත විකුණුම් අනුපාතය (Selling Rate) යොදාගෙන තිබීම නිසා නියැදි විගණනයට භාජනය කරන ලද විකුණුම් අනුපාතය මත ගණනය කරන ලද රු.මිලියන 247.21 ක් වූ ඉන්වොයිස්පත් රු. මිලියන 3 කින් අධි තක්සේරු වී තිබුණි.

(ඇ) හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර රාජකාරී වෙනුවෙන් හා ඉඩම් එළිපෙහෙලි කිරීමට අදාලව 2014 වර්ෂයේදී රු.මිලියන 4.39 ක මුදලක් ද, ඉඩම් අහිමි වූවන්ට වන්දි ගෙවීම සඳහා 2015 සහ 2016 වර්ෂයන්හිදී රු.මිලියන 108.77 ක මුදලක් ද හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවා තිබුණි. 2021 අප්‍රේල් 30 දින වන විට අදාල වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාව අධිකාරිය වෙත ලැබී තිබූ නමුත් වැය කරන ලද රු.මිලියන 113.16 ක මුදලට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් නිෂ්කාශන ගිණුම තුළ පැවති ශේෂය ඉඩම් ලෙස ප්‍රාග්ධනිත නොකර 2024 වර්ෂය තුළදී හම්බන්තොට වරාය නොනිමි වැඩ ගිණුමට මාරු කර තිබුණි.

(ඉ) 1999 වර්ෂයේදී SAGT සමාගම ආරම්භ කරන අවස්ථාවේදී අධිකාරිය විසින් ලබා දුන් දොඹකර තුනක අගය හුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 141.63 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් ,අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණු බව මූල්‍ය ප්‍රකාශනවල 13.2 සටහනේ දක්වා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබූ මෙම මුදල හෝ කොටස්වල හිමිකම සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අධිකාරිය වෙත ලබා දී නොතිබූ අතර අදාල සමාගම විසින් කොටස් සඳහා ගෙවිය යුතු මුදලක් නොමැති බවට ශේෂ සනාථ මගින් ලබා දී තිබුණු අතර අධිකාරිය ඉහත ලැබිය යුතු කොටස් වටිනාකම සඳහා හානිකරණ වෙන්කිරීමක් ද සිදුකර නොතිබුණි. තවද මෙම ආයෝජනයට අදාලව අධිකාරිය වෙත 1999 වර්ෂයේ සිට මේ වනතෙක් කිසිම ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි

ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**1. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1. මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ අංක 1.2 (අ),(ඇ) (i), (ii),(ඇ) (ඉ), යන ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති/ විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ II කොටසේ 5 (1) වගන්තිය | සේවායෝජක යටතේ සම්පූර්ණ අවුරුදු 05 කට නොඅඩු සේවා වෙනුවෙන් ආගණනය කරනු ලැබූ පාරිතෝෂිකයක් ඒ සේවය අවසන් කිරීමේ දින සිට දින 30 ක කාලයක් ඇතුළත ඒ කම්කරුවාට ගෙවිය යුතු වුවද 2024 වර්ෂය සඳහා පාරිතෝෂික ගෙවීම් පිළිබඳ පරීක්ෂාවේදී දින 30 ක් තුළ නොගෙවූ වර්ෂ 02ට වැඩි රු.මිලියන 3.66 ක් ද වර්ෂ 1-2 අතර රු.මිලියන 6.5ක් සහ වර්ෂ 1ට අඩු රු.මිලියන 36.37ක් වූ පාරිතෝෂික වටිනාකමක් දක්නට ලැබුණි. |
| (ආ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතෙහි පළමුවන උපලේඛනයේ ii වන කොටසෙහි බදු නිදහස් සේවාවන්හි 4 වන අයිතමය | ජය කන්ටේනර් ටර්මිනල්ස් පුද්ගලික සමාගම වෙනුවෙන් අධිකාරිය සතුව පවතින තෙල් ටැංකිවල ගබඩාකර ඇති ඛනිජ තෙල් නිෂ්පාදන, පොම්ප මඟින් ප්‍රවාහනය කිරීමෙන් උපයන ආදායම (Pumping Charges) බදු නිදහස් කාණ්ඩයක් සේ අධිකාරිය විසින් හඳුනාගෙන තිබුණු අතර ඒ හේතුවෙන් 2023 සහ 2024 වර්ෂයේ පිළිවෙලින් රු.මිලියන 420.1 ක් සහ රු.මිලියන 499.7 ක් වූ තෙල් පොම්ප කිරීමේ ආදායම මත ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ලෙස පිළිවෙලින් රු. මිලියන 10.77 ක් හා රු.මිලියන 12.8 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ), ප්‍රසම්පාදන අත්පොතෙහි 2.14.1 (අතිරේක 35 සහ 40) සහ වරාය ,නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ 2024 ජනවාරි 01 දිනැති අංක MPS/P&D/Dep.Pc-2024 චක්‍රලේඛය | ආයතනයක් වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමය භාවිතා කරන විට රු. මිලියන 10 ක් දක්වා භාණ්ඩ මිලදී ගැනිමේදී මුද්‍රා තබන ලද ලංසු අවම වශයෙන් 5 ක් ද රු. මිලියන 20 ක් දක්වා භාණ්ඩ මිලදී ගැනිමේදී මුද්‍රා තබන ලද ලංසු අවම වශයෙන් 3 ක් ද වන පරිදි ලංසු ඇරයුම් කැඳවීම කළ යුතු වුව ද, අධිකාරිය විසින් මුළුතැන්ගෙවල් අංශය සඳහා රු.මිලියන 65.5 ක් වූ කුකුළු මස් සහ රු.මිලියන 52.63 ක් වූ පොල්තෙල් මිලදී ගැනීම සඳහා ආයතන දෙකකින් පමණක් ලංසු ඇරයුම් කැඳවා තිබුණි. තවද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත ප්‍රසම්පාදනය කිරීමේදී ද එකතුව රු. මිලියන 60.5 ක් වූ |

| | | |
|---|---|---|
| | | අවස්ථා 4 කට අදාළව කුකුළු මස් මිලදී ගැනීම සඳහා අධිකාරි සීමාවන් ඉක්මවා කටයුතු කර තිබුණි. |
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3 වන වගන්තිය, 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (I) දරන චක්‍රලේඛය හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛය | අධිකාරියෙහි කළමනාකාර අධ්‍යක්ෂ, අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්), අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්), අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) යන නිලධාරීන්ද 149 පමණ වූ විවිධ රාජකාරි ස්ථානයන්හි සේවයේ යොදවා ඇති නිලධාරීන් ද , රියදුරන් සහ සේවක සංගම්වලට මුදාහැර ඇති නිලධාරීන් ද මෙම වාර්තාවේ දින වනවිටත් ඇඟිලි සළකුණු යන්ත්‍ර (Finger print Machine) භාවිතයෙන් පැමිණීම හා පිටවීම සනාථ කර නොතිබුණි. |
| (ඉ) | 2010 පෙබරවාරි 03 දිනැති අංක SP/RD/02/10 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 07(3) වගන්තිය | රාජ්‍ය සංස්ථා මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන විසින් බාහිර පාර්ශව වෙත බදු පදනම මත ලබා දෙන ඉඩම් සඳහා අය කරනු ලැබිය හැකි ගාස්තු වේ නම් ඒවා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත පදනම් විය යුතු වුවද, 2024 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් තක්සේරු වටිනාකමක් ලබා නොගෙන රු.මිලියන 48,235 ක් වටිනා අක්කර 215 රූඩ් 3 පර්චස් 25 .18 ක් වූ ඉඩම් කට්ටි 8 ක් බදු දී තිබූ බැවින් නියමිත බදු අදායම අයකර ගත නොහැකි වී තිබුණි. |
| (ඊ) | 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛ අංක 01/2019- ව්‍යාපෘතින්හි මානව සම්පත් හා වැටුප් කළමනාකරණය දරන චක්‍රලේඛය | ව්‍යාපෘති වටිනාකම අනුව එ .ජ.ඩො . මිලියන 100 ත් එ.ජ.ඩො.මිලියන 250 ත් අතර අගයක් ගන්නා ව්‍යාපෘතිවල, ව්‍යාපෘති නිලධාරීන් වෙනුවෙන් ගෙවිය යුතු උපරිම වැටුප රු.200,000 ක් වුවද, නැගෙනහිර බහාලුම් පර්යන්තයේ අදියර II ව්‍යාපෘතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව වසරක කාලයක් වෙනුවෙන් සේවා පැවරුම් ගිවිසුම් යටතේ ව්‍යාපෘතිය සඳහා එම බඳවා ගන්නා ලද සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) සහ සහකාර අභ්‍යන්තර සැලසුම්කරු වෙනුවෙන් චක්‍රලේඛයට පටහැනිව පිළිවෙලින් මසකට දළ වැටුප ලෙස රු.400,000 ක් සහ රු.200,000 ක් එම |

නිලධාරින් බඳවා ගත් දින සිට ගෙවීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ රියදුරු තනතුරක් සඳහාද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා(පුද්) සමාගම (SLPMCS) හරහා සේවකයෙකු බඳවාගෙන තිබුණි.

(උ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 3.2(i) ඡේදය සහ 2013 ජනවාරි 23 දිනැති අංක DMS/F1/3/3-1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ලිපිය | යම් ආයතනයක් විසින් බඳවාගැනීමේ කාර්යය පටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් අධිකාරිය විසින් කෙටුම්පත් බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි සකස්කර තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 3.4 ඡේදය | නව තනතුරක් නිර්මාණය කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාවේ වැඩි කිරීමකට පෙර නියමාකාරයෙන් රැකියා ඇගයීමක් හා අධ්‍යනය කිරීමක් සිදුකළ යුතු ලෙස දන්වා තිබුණ ද අධිකාරිය තනතුරු 196 ක් සඳහා අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයන් 919 ක් වැඩිපුර බඳවාගෙන තිබුණි. මුදල්, සැලසුම් හා සංවර්ධන, සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් (Conventional Cargo), ගාල්ල වරාය, විමර්ශන අංශය, සංඛ්‍යාන (Statistics), සන්නිවේදන හා මහජන සම්බන්ධතා, හාරන අංශය (Dredging Unit) ආදී අංශ වෙනුවෙන් මින් වැඩි ප්‍රමාණයක් බඳවාගෙන තිබුණි. |
| (iii) 3 වන පරිච්ඡේදයේ 3.4 ඡේදයේ ix වන උප ඡේදය | යම් විශේෂිත අවස්ථා වලදී වැඩ ආවරණ තනතුරක් ඇති කරනු ලැබූ විට එය වසරක කාල සීමාවකට සීමා විය යුතු බව සඳහන් වුවද, අධිකාරිය විසින් වැඩ බැලීම සඳහා පත්කල වසරක කාල සීමාව ඉක්මවූ තනතුරු 26 ක් සඳහා 2024 ජූනි 30 දින වන විටද ස්ථිර බඳවාගැනීම් සිදු කර |

නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඍ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ (Guidelines on Corporate Governance for State Owned Enterprises) | |
| | (i) මාර්ගෝපදේශ අංක 2.2.5 සහ 2023 සැප්තැම්බර් 27 දිනැති අංක 01/2021 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ඡේද අංක 2 හා 3 | පරිපාලිත සමාගම් සඳහා මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් (Board approved subsidiary policy) සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු වුවත් අධිකාරිය සතු පරිපාලිත සමාගම් සඳහා එවැනි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර එම සමාගම්වල කාර්යසාධනය අධීක්ෂණයට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. |
| | (ii) මාර්ගෝපදේශ අංක 4.3 | අවදානම් කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂකවරු තිදෙනෙකු (03) නියෝජනය කළ යුතු අතර ත්‍රෛමාසිකව කමිටුව රැස්විය යුතු වුවද, අවදානම් කමිටුව ත්‍රෛමාසිකව රැස් වී නොතිබුණි. |
| | (iii) මාර්ගෝපදේශ අංක 2.3 | උපාය මාර්ගික සැලැස්ම ආවරණය කරනු ලබන කාලය සඳහා සාරාංශගත පුරෝකථනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් උපාය මාර්ගික සැලැස්ම තුල අන්තර්ගත විය යුතු නමුත් අධිකාරිය 2024 සිට 2029 වර්ෂය දක්වා සකස්කරන ලද උපායමාර්ගික සැලැස්ම තුල මෙම සාරාංශගත පුරෝකථන මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව නොතිබුණි. |
| (එ) | 2022 ඔක්තෝබර් 06 දිනැති අංක 06/2022 දරන රාජ්‍ය | වයස අවුරුදු 60 ඉක්මවා දැනට සේවයේ යෙදී සිටින සහ 2022 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර වයස අවුරුදු |

| | | |
|---|---|---|
| | ව්‍යාපාර චක්‍රලේඛයේ iv වන ඡේදය | 60 සම්පූර්ණ වන රජය සතු ව්‍යවසායන්හි සේවකයන් 2022 දෙසැම්බර් 31 දිනට හෝ ඊට ප්‍රථම අනිවාර්යයෙන් විශ්‍රාම ගත යුතු වුවද, අධිකාරියේ සේවය සඳහා ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගම (SLPMCS) හරහා බඳවාගෙන සේවයේ යොදවා තිබූ නිලධාරීන් 11 දෙනෙකුගේ වයස 2024 ජූනි 30 දිනට අවුරුදු 60 ඉක්මවා තිබුණි. |
| (ඒ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන කාර්යය සංග්‍රහයේ 3.2 සහ 1994 ජූලි 15 දිනැති අංක මුකො/ප්‍රවේ/1 දරන ප්‍රධාන මුදල් කළමනාකරුගේ අභ්‍යන්තර චක්‍රලේඛයෙහි 8 වන ඡේදය | අධිකාරියේ නිලධාරීන්ට ණය ලබාදීමේදී ණයකරු වසරක සේවය සම්පූර්ණ කළ සේවයේ ස්ථිර කළ අයෙකු විය යුතු අතර, ඇපකරු වසර 05 ක සේවයක් ඇති සේවයේ ස්ථිර කර ඇති අයෙකු විය යුතුය. නමුත් 2022 ජූනි 08 දින සිට රජයේ ස්ථිර සේවයෙන් වසර 02 ක කාල සීමාවකට තාවකාලිකව මුදාහැරීම මත හිටපු උප සභාපතිවරයාට රු. මිලියන 2.21 ක දස මාස ණය මුදලක් 2022 දෙසැම්බර් 29 දින ලබාදී තිබුණි. ඔහුගෙන් අයවිය යුතු මුළු හිඟ මුදල සේවයෙන් ඉවත් වීමේදී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙම වාර්තාවේ දිනට තවදුරටත් රු.මිලියන 1.15 ක මුදලක් අයකර ගැනීමට ඉතිරිව තිබුණි. |
| (ඔ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 අප්‍රියෙල් 22 දිනැති. අංක 27/2024 චක්‍රලේඛයේ 07 ඡේදය සහ 04 ඡේදය | අධිකාරියේ නිළධාරීන්ට ලබාදෙන නිල නිවාස සඳහා වූ පදිංචි කාලසීමාව, පළමුව නිවාස ලබා දුන් දින සිට වසර 5 ක උපරිමයකට සීමා වන අතර, 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 සිට වර්ෂ 30 ඉක්මවූ කාල පරාසයක් තුල අදාළ නිල නිවාසවලින් ඉවත්වී නොගොස් රැඳී සිටින නිලධාරීන් සංඛ්‍යාව 402 ක් වී තිබුණි. තවද චක්‍රලේඛයෙහි 07 වගන්තිය අනුව නිල නිවාසයක උපරිම පදිංචි කාලය වසර 05 ක් වන අතර මෙම කාලය සම්පූර්ණ වූ පසු නිල නිවාස, අධිකාරිය වෙත ආපසු භාර දිය යුතුවේ. නමුත් චක්‍රලේඛයේ 4 වගන්තිය අනුව කාර්ය මණ්ඩල නිල නිවාස සඳහා කුලී ගාස්තු පළමු වෙන් කිරීමේ දින සිට වසර 25 ක් දක්වා කුලිය වැඩිකිරීමේ පදනම මත පදිංචි කාලය දීර්ඝ කර ඇත. මේ හේතුවෙන් එම වගන්ති දෙක අතර පරස්පරතාවයක් ද |

| | | |
|---|---|---|
| | | නිරීක්ෂණය වන අතර පොරොත්තු ලේඛනයේ රැඳී සිටින අයදුම්කරුවන්ට නිවාස ලබාගැනීමට අවස්ථාව ද අහිමිවී තිබුණි. |
| (ඔ) | 2024 නොවැම්බර් 29 දිනැති අංක මුකො/මුගි/කො/41/2024 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 2.12 ඡේදය | සියළුම කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් විසින් ලබාගත් අත්තිකාරම් මුදල් අදාල වර්ෂය අවසානයට පෙර නිරවුල් කළ යුතු වුවද, 2024 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ගිණුම් අංක 142341 (FA0001) යටතේ පැවති යන්ත්‍රෝපකරණ කොට්ඨාශය (Mechanical Plant Division) විසින් ලබා ගත් රු.මිලියන 0.525 ක අත්තිකාරම් මුදල වාර්තාවේ දින වනවිටත් පියවා නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ළු) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

නැගෙනහිර බහාලුම් පර්යන්ත අදියර II ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදනය කරන ලද නැවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරනු ලබන ඇ.එ.ජ.ඩොලර් මිලියන 103.32 ක් වටිනා දොඹකර (Ship to Shore cranes (STS)) 9 ක් සහ ගොඩබිම මෙහෙයුම් සඳහා යොදාගන්නා ස්වයංක්‍රියව ක්‍රියාකරන ඇ.එ.ජ.ඩොලර් මිලියන 94.12 ක් වටිනා දොඹකර (Automated Rail Mounted Grantry Cranes (ARMG)) 26ක් මේ වන විටත් අධිකාරිය වෙත ලැබී තිබුණද මුළු වටිනාකම රු.මිලියන 22,210ක් වන (ඇ.එ.ජ.ඩො.මිලියන 68.88) STS දොඹකර 6 ක් පමණක් Commissioning කටයුතු අවසන් කොට නැගෙනහිර බහාලුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු සඳහා දායකත්වය සපයමින් තිබුණි. කෙසේ වුවද, අත්තිකාරම් ද ඇතුළුව රු.මිලියන 64,564.89 ක් ගෙවන ලද (ඇ.එ.ජ.ඩො. 183,664,000) මුළු වටිනාකමෙන් සියයට 40 කට වඩා වැඩි වියදමක් මේ වන විටත් දරා තිබූ STS දොඹකර 3 ක් සහ ARMG දොඹකර 26ක් Commissioning කටයුතු අවසන් නොකොට කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යයව (idle) පැවතුණි.

තවද මෙම ප්‍රසම්පාදනයට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 වගන්තිය ප්‍රකාරව සැපයුම්කාර ආයතනය විසින් ප්‍රසම්පාදන අස්ථිත්වයේ ආරක්‍ෂාව පිණිස මුළු

කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 කට අඩු නොවන ලෙස කාර්යයසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර තිබුණද, STS දොඹකර 03ක් සහ ARMG දොඹකර 14 ක් ඇතුලත් 3 වන කාණ්ඩයට (3rd Lot) අදාළ, 2025 මාර්තු 20 දිනෙන් අවසන් වන එම කාර්යයසාධන සුරක්ෂණයේ කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) උතුරු නැගෙනහිර පිවිසුම් කලාප සංකල්පය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දියානු එක්සිම් බැංකුව සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට ගිවිසුම් ගත වී තිබුණි. නමුත් එම ණය මුදල ප්‍රමාණවත් නොවේ යැයි පුරෝකථනය කර ඇ.එ.ජ ඩොලර් මිලියන 16.23 ක අතිරේක මුදලක් සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 61.5 ක් දක්වා එම ණය මුදල ඉහළ නංවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇතත් ඉන්දියානු රජය එය අනුමත කර නොතිබුණි. එබැවින් වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේම ණය මුදලින් ඇ.එ.ජ ඩොලර් මිලියන 0.905 (ඇ.එ.ජ ඩොලර් 905,194.38) ක් පමණක් වැයකර තිබුණු අතර ලබා නොගත් ණය සඳහා කැපකිරීමේ ගාස්තු (commitment charges) ලෙස ගෙවා තිබුණු ඇ.එ.ජ ඩොලර් 43,941.27 (රු.මිලියන 12.8) ක මුදලක් සහ ණය පොළිය ලෙස ගෙවා තිබුණු ඇ.එ.ජ ඩොලර් 53,235.41 (රු.මිලියන 15.94) ක මුදලක් ද අනාර්ථික වියදමක් වී තිබුණි.

තවද ඇ.ඩො. මිලියන 16.23 ක අතිරේක පිරිවැය,රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් (PPP) මත පදනම්ව මූල්‍යයනය කිරීමට කරන ලද ඉල්ලීමට ප්‍රතිචාරිකව 2024 මාර්තු 15 දිනැති රාජ්‍ය තාන්ත්‍රික සටහන මගින් ඇ.එ.ජ ඩොලර් මිලියන 63.65 ක විශේෂ මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට ඉන්දියානු රජය තීරණය කර තිබුණ ද, ඉන්දියානු රජය විසින් එවන ලද අවබෝධතා ගිවිසුමෙහි පැවති ගැටලුකාරි කරුණු මත මේ වන තෙක් අවසාන නිගමනයකට එළඹ නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය මෙතෙක් ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 04 වන දින නෞකාවක් කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්තයෙහි ගැටීම නිසා සිදුවූ අනතුර හේතුවෙන් ජය බහාලුම් පර්යන්තයේ ජල වාරකය (Caisson), වේග වලක්වනය (Fenders), වරාය වේදිකා බිත්තිය (Quay wall) යනාදියට හානි සිදුවී තිබුණි. එම හානිය රු.මිලියන 315.90 ක් ලෙස ඇස්තමේන්තුකර තිබුණි. එසේම ඉහත හානිය වෙනුවෙන් රු.මිලියන 384.42 ක මුදලක් 2019 දෙසැම්බර් 30 දින අධිකාරිය වෙත ලැබී තිබුණ ද වේග වලක්වනය හැර අනෙකුත් අළුත්වැඩියා කිරීමේ කටයුතු මෙතෙක් සිදුකර නොතිබුණි.

(ඈ) 2024 අගෝස්තු 31 දිනට අධිකාරියේ කොට්ඨාශ 35 මගින් ඉදිරිපත් කරන ලද කාර්යය මණ්ඩල විස්තර අනුව තනතුරු 196 කට අදාල අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 919ක් සේවයේ යොදවා තිබුණද අධිකාරියේ මෙහෙයුම් කටයුතු (Operations) සඳහා සෘජුවම සම්බන්ධතාවයක් දක්වන බහාලුම් මෙහෙයුම් අංශයෙහි සේවකයන් 206 දෙනෙකු පුරප්පාඩුව පැවතුණි. එසේම, මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සෘජුවම සම්බන්ධතාවයක් නොදක්වන අංශ 08 ක සේවකයින් 116 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණු අතර 2024 වර්ෂය තුළදී සේවක අතිරික්ත පැවති අංශවල සේවකයින් වෙනුවෙන් ගෙවන ලද රු.මිලියන 1982 ක අතිකාල දීමනා ඇතුළුව වර්ෂය සඳහා සමස්ථ අතිකාල දීමනා ලෙස රු.මිලියන 5,303 ක් ගෙවා තිබුණි.

(ඇ) අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 11 දිනැති අංක DMS/1710/P-VI දරන ලිපියෙහි අනු අංක 02 අනුව අනුමත තනතුරු නාමවලට පරිබාහිරව කිසිදු තනතුරක් සඳහා බඳවාගැනීම්/ අනුයුක්ත කරගැනීම් නොකළ යුතු බව සඳහන් වුවද එම ලිපිය මගින් අනුමත තනතුරු හි ඇතුළත් නොවූ කළමනාකරණ අභ්‍යාසලාභි තනතුරු 50 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් බඳවා ගැනීමට රජයේ විශ්ව විද්‍යාලයක් මගින් ලිඛිත විභාගයක් පවත්වා රු. මිලියන 2.25 ක වියදමක් දරා තිබුණි. 2006 අංක 6 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 1.2.1 (අ), (ආ) සහ (ඇ) ඡේද අනුව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගි වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීම ප්‍රසම්පාදනයේ ඇති මූලික අරමුණු වුවද මෙම තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය පැවැත්වීමට අදාළව ආයතනය තෝරා ගැනීම කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව අදාළ රාජ්‍ය විශ්වවිද්‍යාලය වෙත පවරා තිබීම හේතුවෙන් ප්‍රසම්පාදනයේ අරමුණු ඉටුවී නොතිබුණි. තවද,මෙම බඳවාගැනීම 2024 ඔක්තෝම්බර් 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින්ම කිසිදු නිශ්චිත හේතුවක් නොදක්වා තාවකාලිකව අත්හිටුවීම නිසා මෙම කළමනාකරණ අභ්‍යාසලාභීන් නීතිමය ක්‍රියාමාර්ගවලට ද යොමුවී තිබූ අතර දරනු ලැබූ වියදම ද නිෂ්කාර්ය වියදමක් විය.

(ඉ) 2024 දෙසැම්බර් 31 දිනට ආරවුල් සහිත ණයගැතියන් (dispute debtors) රු.මිලියන 18.6 ක් සහ නැවත විසඳීම සඳහා (re-dispute) යොමු කළ ණයගැතියන් රු.මිලියන 2.8 ක් පැවතුණි. ඉහත ආරවුල් සහිත ණයගැති ශේෂ තුළ මාස හයත්, වර්ෂයත් අතර කාල පරිච්ඡේද තුළ නොවිසඳුණු ශේෂය රු.මිලියන 1.2 ක් වී තිබුණි.

(ඊ) අධිකාරිය විසින් MV Jammi නෞකාව සඳහා ලබාදෙන ලද සේවා සඳහා අයවිය යුතු මුදල් වෙනුවෙන් කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ අතර එහිදී ලද තීන්දුව අනුව රු.මිලියන 197.09 (ඇ.එ.ජ ඩොලර් 1,945,712) ක මුදලක් අදාල යාත්‍රාවෙන් අධිකාරිය වෙත ලැබිය යුතුව තිබුණි. අදාල නෞකාව වෙන්දේසියෙන් ලද මුදල අධිකරණයේ තැන්පත් කර තිබුණු අතර එම මුදල් සඳහා හිමිකම් සහිත විවිධ පාර්ශවයන් වෙත අදාල මුදල් ප්‍රමාණයන් මුදාහැරීමෙන් පසුව ඉතිරි වූ මුදල වන ඇ.එ.ජ ඩොලර් 692,080 ක මුදල සම සමව බෙදා ගැනීමට පෙත්සම්කාර Sri Lanka Shipping Company Limited හා අධිකාරිය 2017 පෙබරවාරි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව එකඟතාවයකට පැමිණ තිබුණි. ඒ අනුව ඉතිරි මුදලෙන් ඇ.එ.ජ ඩොලර් 346,040 හි රුපියල් අගය වූ රු.මිලියන 101.24 ක් ලැබිය යුතු ණයගැති වටිනාකම ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් ලැබිය යුතු මුළු මුදල ලෙස ඇ.එ.ජ ඩොලර් 1,945,712 හි රුපියල් වටිනාකම වූ රු.මිලියන 197.09 ක් ගිණුම් වල දක්වා තිබුණි.

(උ) 2023 අප්‍රියෙල් 21 වන දින වරාය අධිකාරිය හා දකුණු ආසියානු වාණිජ හා සැපයුම් මධ්‍යස්ථානය (SACLH) අතර ඇති කරගත් කල්බදු ගිවිසුමෙහි 1.3 හා 26.4 යන වගන්ති ප්‍රකාරව SACLH විසින් ඇ.ඩො.මිලියන 12 ක කල්බදු අත්තිකාරම් හා ඇ.ඩො.මිලියන 14 ක එක්වරක් පමණක් ගෙවන වාරිකය (Lump Sum Premium) අධිකාරිය වෙත ගෙවනු ලැබුව ද ඊට අදාල එකතු කළ අගය මත බදු (VAT) වටිනාකම වූ රු.මිලියන 1,282.17 ක ශේෂය විගණිත දින වන විටත් පියවා නොතිබුණි. ඒ හේතුවෙන් මෙම වටිනාකම, ලැබිය යුතු ණයගැති ශේෂයක් හා දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වටිනාකමක් ලෙස නිරවුල් නොකර පැවතුණි.

(ඌ) 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 2 (1) (අ) වගන්තිය අනුව, 2020/21 වර්ෂයේ අධිකාරියේ බදු අයකළ හැකි ආදායම වන රු.මිලියන 4,787.77 මත ගණනය කළ සියයට විසිපහක් වූ අධිභාර බද්ද රු.මිලියන 1,196.94 වුවද, අධිකාරිය විසින් අදාළ වර්ෂයේදී රු.මිලියන 1,952.2 ක් අධිභාර බද්ද ලෙස ගෙවා තිබුණි. තවද ලැබිය යුතු ලෙස දක්වා තිබූ මෙම වැඩිපුර ගෙවූ රු.මිලියන 755.33 ක මුදල 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2019 ඔක්තෝබර් 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ කාර්තුවට අදාල බදු වාර්තාවෙහි (Tax Return) සඳහන් ජාතිය ගොඩනැගීමේ අධි බදු ගෙවීම් (Excess Payment) රු. මිලියන 8.88 ක වටිනාකම විගණිත දින වන විටත් ලැබිය යුතු අනෙකුත් බදු ගිණුමෙහි අන්තර්ගතව තිබුණු නමුත් එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) අධිකාරිය සතු කොළඹ 10, ඩී ආර් විජේවර්ධන මාවතේ බහු කාර්ය සන්නිවේදන කුළුණ (නෙළුම් කුළුණ) බටහිර සීමාවට යාබදව පිහිටි ඉඩම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබාදීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය වන රු.මිලියන 37.9 තුළ වර්ෂ 02 ත් 05 ත් අතර සහ වර්ෂ 05 ඉක්මවූ නිරවුල් නොවූ ශේෂ පිළිවෙලින් රු.මිලියන 27.9 ක් සහ රු.මිලියන 10 ක් පැවතුණි. අධිකාරිය විසින් අදාල ආයතනය වෙත දැනුවත් කිරීම් කර තිබුණද, විගණිත දින වන විටත් මෙම මුදල් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණු අතර අධිකාරිය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කල්බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඔ) 2024 දෙසැම්බර් 31 දින වන විට බදු කාලසීමාව අවසන්ව තිබූ රූඩ් 03 පර්චස් 23.54 ක් වන බදු ගිවිසුම් 33 ක් 2025 වර්ෂයේ මුල් කාර්තුව වන තෙක් යාවත්කාලීන කර නොතිබුණු අතර එමඟින් අධිකාරියට ලැබිය යුතු ආදායම අහිමි වී තිබුණි. තවද අධිකාරිය සතුව පවතින අක්කර 05 රූඩ් 03 පර්චස් 33.15 ක ප්‍රමාණයක් සහිත ඉඩම් කැබලි 12 ක් කල්බදු ගැනුම්කරු සමග බදු ගිවිසුමක් රහිතව බදු දී තිබූ අතර එම ඉඩම් ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඕ) රු.මිලියන 3,217 ක් වටිනා අක්කර 33 රූඩ් 03 පර්චස් 37.08 ක් වන ඉඩම් කැබලි 06 ක් බදු දීමට හෝ වෙනත් ඵලදායී කාර්යයකට යොදා නොගෙන සමාලෝචිත වර්ෂය අවසානය වන විටද නිශ්කාර්යයව පැවතුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

# ආයතනික තොරතුරු

**නම**

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**ව්‍යවස්ථානුකූල කාර්ය තත්ත්වය**

1979 අංක 51 දරණ පාර්ලිමේන්තු පනතේ ප්‍රතිපාදන යටතේ කොළඹ වරාය කොමිසම, වරාය(නැව්බඩු) සංස්ථාව, වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට 1979 අගෝස්තු 1 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්ථාපනය කරන ලදී.

**අපගේ ආයතනික අගය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වූ කලී ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ප්‍රධාන දායකත්වය සපයන ආයතනයන්ගෙන් එකකි. ආදායම් උත්පාදනය කරන සහ සේවා සපයන ප්‍රමුඛ ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය එමගින් සපයන සේවාවන්ගේ විශිෂ්ටත්වය සමඟ සෘජුවම බැඳී පවතී. මේ සම්බන්ධයෙන් ගත් කල අධිකාරියේ ඇගයීම් රටාව පරදුභාරකරුවන් සමඟ එහි ඇති මෙහෙයුම් සබඳතාවයේ සාර්ථකත්වයට පදනම වේ. මෙම අගයයන්/ වටිනාකම් පහත පරිදි වර්ග කල හැක.

- විශ්වාසය තැබිය හැකි බව
- කාලානුරූපී බව සහ නිවැරදි බව
- අත්කරගත් ජයග්‍රහණ සඳහා වගවීම
- කණ්ඩායම් හැඟීම
- කැපවීම
- ඵලදායීබව සහ පිළිගැනීම
- සෘජුව කටයුතු කිරීම

ඉහත සඳහන් වටිනාකම්/අගයයන් අධිකාරියේ සෑම මට්ටමකම ප්‍රගුණ කරවීම සභාපති/විධායක නිලධාරී, කළමනාකාර අධ්‍යක්ෂ සහ අනෙකුත් ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලයේ වගකීම වනු ඇත.

**ප්‍රධාන කාර්යාලය**

**කොළඹ වරාය**

අංක 19, චෛත්‍ය පාර
කොළඹ – 01
දුරකථන: (+94 11) 2421201, 2421231
ෆැක්ස්: (+94 11) 2440651

**ගාලු වරාය**

ක්ලෝසන්බර්ග් ජැටිය
මාගාල්ල
ගාල්ල
දුරකථන: (+94 91) 2232213, 2234936

**ත්‍රිකුණාමලය වරාය**

නව ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල
චීන වරාය
ත්‍රිකුණාමලය
දුරකථන: (+94 26) 2222460

**බැංකුකරුවන්**

ලංකා බැංකුව (ප්‍රධාන බැංකුව)
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

**විගණනකරුවන්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක. 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

**වෙබ් අඩවිය**

www.slpa.lk

**විද්‍යුත් තැපැල**

info@slpa.lk